*Nodar Dumbadze*

# Granny, Iliko, Illarion and I



# අත්තම්මයි මමයි ගමයි

නොඩාර් ඩුම්බාඩ්සේ

# අත්තම්මයි මමයි ගමයි

නොඩාර් ව්ලැඩිමිරෝවිච් දුම්බාඩ්සේ (1928-1984) ජෝර්ජියානු ජාතිකයෙකි. ඔහුගේ පියා එහි ප්‍රාදේශික කොමියුනිස්ට් පක්ෂ සංවිධායකවරයා වූ අතර 1937 දී ස්ටාලින් පාලනය විසින් ඔහු අත් අඩංගුවට ගැනුණි. නොඩාර් ඉන් පසු හැදුණේ ඔහුගේ ඥාතීන් ඇසුරෙහි ය.

කවියෙන් ලේඛන කටයුතු ඇරඹූ ඔහු පසුව හාස්‍යමය කතා ලිවීම ඇරඹී ය. ඒ අතර ම චිත්‍රපට තිර රචකයකු හා පුවත්පත් කලාවේදියකු ලෙස ද කටයුතු කිරීම ඇරඹී ය. ඔහු ෂෝටා රුස්ට්වෙලි රාජ්‍ය සම්මානය ද, ලෙනින් සම්මානය ද දිනා ගත්තේ ය.

ඔහුගේ කතා හාස්‍යයෙන් පිරී ඇත්තේ නමුදු ඒ යටින් යුද්ධයේත්, ගැමි දිවියේත්, පොදුවේ මුළුමහත් ජීවිතයේත් කටුක බව හද රිදවන වදනින් වියමන් කරන්නට ඔහු සමත් වෙයි.

අත්තම්මයි, මමයි, ගමයි කතාවෙහි ඇත්තේ ඔහුගේ ම ජීවිත කතාව බව කියැවේ.

## නොඩාර් දුම්බාඩ්සේගේ වෙනත් කෘති

Grandma, Iliko and Ilarioni and I
I Can See the Sun
The Sunny Night
Don't Be Afraid, Mother!
The White Banners
The Law of Eternity

නොඩාර් දුම්බාඩ්සේ

# අත්තම්මයි මමයි ගමයි

පරිවර්තනය

මහින්ද සෙනරත් ගමගේ

සුභාවි
ප්‍රකාශන

Nodar Dumbadze

Granny, Iilico, Illarion and I

අත්තම්මයි මමයි ගමයි

ශ්‍රී ලංකාවේ පළමුවන මුද්‍රණය 2015 වසරේ දී
සුභාවි ප්‍රකාශකයන් විසිනි.

සුභාවි ප්‍රකාශන
අංක 8, සිල්වර්වැලිවත්ත,
කෝරළඉම,
ගෝනපොල හන්දිය.
දුරකථන: 0773161080, 0712585764, 034-2257621
Email: subavipublishers@gmail.com

සිංහල පරිවර්තනයේ අයිතිය © මහින්ද සෙනරත් ගමගේ
ISBN 978 955 1558 57 4

සියලු හිමිකම් ඇවිරිණි.
පරිවර්තකගෙන් ලද පූර්ව අවසරයකින් තොරව
මේ ග්‍රන්ථය මුද්‍රණය කිරීම, එසේ අවසරයකින්
තොරව මුද්‍රණය කරන ලද පිටපත් අලෙවි කිරීම,
නුවමාරු කිරීම හෝ එවැනි කිසිම ආකාරයකින්
භාවිතයේ යෙදීම සපුරා තහනම් වෙයි.

පිටු සැලසුම
නිශාන්ත පරණගම

පිටකවර නිර්මාණය
දිනිඳු සිරිවර්ධන

මුද්‍රණය
සමුද්‍ර ඔප්සෙට් ප්‍රින්ටර්ස්
නො. 572/6,
පිළියන්දල පාර,
ඇරැව්වල.

මගේ ගම දකුණට වෙන්නට ගුබසොව්ලි ගඟ ගලා බසී. වමට වෙන්නට කකුළුවන්ගෙන්, ගොන් ඔළුවලින් සහ පාවහන් නැති කොල්ලන්ගෙන් පිරී ගත් දොළ පහර ය. ගුබසොව්ලි නදී ඉවුරු යා කළ කුඩා පාලමකි. සෑම වසන්තයක දී ම ඇතිවන පිටාර දියෙන් එය ගසාගෙන යන්නේ ය. එවිට එහි ඉතිරි වන්නේ දියෙන් පිටට නෙරූ කළු පැහැ කණු පමණකි.

මගේ ගම එදත් අදත් හැමදාට ම ගුරියාවෙහි ලස්සන ම සහ ප්‍රීතිමත් ම ගමයි. ලොව අන් ඕනෑ ම ගමකට වඩා මම එයට ආදරය කරන්නෙමි. ඒ අත්තම්මාත්, ඉලිකෝත්, ඉලේරියනුත්, මමත් එසේ ම මගේ බල්ලා වන මුරාඩාත් යන අප සැමදෙනා ජීවත් වන්නේ මෙහි බැවිනි.

මගේ අත්තම්මා ඥානවන්ත ගැහැනියකි. ඇ නිතරම මට මෙසේ කියන්නී ය. "තක්කඩියා, නුඹ ඉගෙනගන්ඩ ඕනෑ. නැත්නං නුඹෙන් මෙලෝ වැඩක් නැතිවෙයි."

විද්‍යාව ගැන අත්තම්මාට ඇගේ ම අදහසක් තිබුණි. වරක් මම බැල්කනියට වී ජෝර්ජියානු ව්‍යාකරණ නීති පාඩම් කරමින්, ඒවා ඔප්වට දා ගනිමින් සිටියෙමි. එවිට අත්තම්මා මෙසේ ඇසුවා ය.

"මොනව ද පුතේ නුඹ මහන්සියෙන් පාඩං කරන්නේ?"

"ක්‍රියා පද ආකාර අත්තම්මේ."

"ක්‍රියා පද ආදර්ශ? ඒවායින් මෝස්තර හදනව ද?"

"ක්‍රියා පද ආකාර එක්ක මෝස්තර කිසි සම්බන්ධයක් නෑ."

"එතකොට එහෙනං ඔච්චරට ආදර්ශ මොහොකට ද?"

"මොහොකටවත් නෙවෙයි." මා කීවේ පොත වසා දමමිනි. "අත්තම්මේ ඔයා ක්‍රියා පද ආකාර ගැන මෙලෝ හසරක් දන්නෙ නැති බව පිළිගන්න!"

"මං දන්නේ නුඹ ආදර්ශ කොලුවෙක් නෙවෙයි කියන එක විතරයි. ඕං ඔච්චරයි!"

"ඔයා පාඩම ඉගෙනගෙන නෑ අත්තම්මේ. මං ඔයාට ව්‍යාකරණවලට දෙන්නේ අඩු ම ලකුණු!"

"මං බොට පෙන්වන්නම් බොගේ අඩු ලකුණු, කාලකණ්ණියා. ගිහිං මේ දැන් ම එළුවාව බැඳපිය. නැත්තං මං බොට දෙනවා හොඳ ආදර්ශ කෝටුමස් කිරිල්ලක්."

"යන්ඩ කලිං තව එක ම ප්‍රශ්නයක්, අත්තම්මේ. අසම්භාව්‍ය ක්‍රියා විධියේ දී ක්‍රියා පද ආකාර කොහොම ද වරනැගෙන්නේ?"

"ක්‍රියා විධිය කියලා උඹ මොකක් ගැන ද කියන්නේ? මිනිස්සු මේ දවස්වල ක්‍රියා කරන්නේ හිතේ එකලාසයක් නැති, මහ එපා වෙච්ච විදිහට. ඉතිං මයෙ හිතේ ක්‍රියා පදත් එහෙම වෙන්ඩැති. තක්කඩියා, උඹ ගැන ගත්තොත් නං, උඹට කිසිදාක හරි වැඩක් කරන්ඩ හිතේ එකලාසයක් නං තියෙන එකක් නෑ. ඒක සහතික ඇත්ත."

"එහෙම ඉන්න එක ම කෙනා මං විතරක් නෙවෙයි. ඔට්ටුයි!"

"සහතිකේට ම නෑ තමා. ලියුං කවරවලින් මුද්දර ගලවලා ලියුමට මුද්දර ගහලා නෑ කියලා, මුද්දර ගාස්තුවයි දඩයයි ගෙවන්න තියෙනවා කියන අපේ තැපැල්කාරයත් ඉන්නවා!"

"එහෙම ද! එතකොට ඔයා කියන්නේ මං රස්තියාදුකාරයෙක් කියලා!"

"සහතිකේට ම උඹ එහෙම තමා! ඒ විතරක් නෙවේ, මැරයෙක්, තක්කඩියෙක්, පාදඩයෙක්, කපටියෙක් වගේ ම මිථ්‍යාදෘෂ්ටිකයෙක්!"

මගේ අත්තම්මාට තරම් පොහොසත් කර්කශ වාග් ප්‍රහාර ගබඩාවක් ඇති ගැහැනියක් මුළු ගුරියාවේ ම නැත. ඒත් මට ඒ ගැන ඇත්තේ මඳ සැලකිල්ලකි. ඒ වරක් ඈ අතින් මෙවැන්නක් කියැවුණු නිසා ය. "මගේ කට නුඹට බැණ අඬගහනවා වෙන්ඩ පුළුවනි. ඒත් මගේ හෘදය වස්තුව උඹට ඒ ගාණට ම ආශිර්වාද කරනවා..."

ශිෂ්‍යයෙක් ඉරිදා හැර සතියේ සෑම දිනක ම පැය හයක් පාසලේ ගත කළ යුතු යැයි බල කරන අධ්‍යාපන අමාත්‍යංශයේ මෙතක් නැති නියෝගය ගැන අත්තම්මාට ඇත්තේ ඉතා දුබල ආකල්පයක් බව ද කිව යුතුයි. පැමිණිල්ලකට හේතුවක් මා කිසිදාක ඇයට නොමෙනාවා නොවේ. ඒ, පාඩමක් අවසන් වන තුරු මා ඉවසීමෙන් සිටියේ කලාතුරකින් හෙයිනි. හතරවැනි පැය අවසන් වීගෙන එද්දී මට කාලය ගැනත් අවකාශය ගැනත් හැඟීම සියල්ල නැතිව යන්නේ





ය. එවිට පාඩමක දී කෙනකුගෙන් බලාපොරොත්තු නොවිය හැකි තරම් වූ හඬකින් මා ළඟ සිටින රොමුලිගෙන් මෙසේ අසමි.

"මොනව වෙලා ද රොමුලි, සීනුව කැඩිලාවත් ද නැත්නං මුරකාරයට නින්ද ගිහින්වත් ද?"

පිළිතුරු දෙන ලෙසින් රොමුලි ප්‍රීතිමත්ව නියවයි. ඒ අතරෙහි ගුරුතුමා මා දෙස ඇඟිල්ල දිගුකර මිහිරි හඬින් මෙසේ කියයි.

"නැඟිටලා මේ දැන් ම පන්තියෙන් පිටවෙයන්! මං උඹේ මව්පියන්ට කතා කරනකං ආයෙ මේ පැත්ත පළාතෙ එන්ඩ එපා!"

ඔහු එසේ කියන්නේ ඇයි දැයි මම හොඳින් දනිමි. ඔහු එසේ කියන්නේ කෝප වී ඇති නිසා පමණකි. ඉතිං මම පොත් උරයත් කැප් තොප්පියත් ගෙන දොර දෙසට යමි.

"මං යනවා," මම රොමුලිට කියමි.

"ඉක්මනින් හම්බවෙමු," ඔහු පිළිතුරු දෙන්නේ අත වනමිනි.

පසුදා මම අත්තම්මා පාසලට කැඳවාගෙන යමි. ඉන් පසු අත්තම්මා මා ගෙදරට කැඳවාගෙන එන්නී ය. ඉන් පසු මම අත්තම්මා යළි පාසලට කැඳවාගෙන යමි. ඉන් පසු ඇය මා ගෙදරට කැඳවාගෙන එන්නී ය. ඉතිං මෙය මෙසේ දිගටම සිදුවෙයි. අත්තම්මා මා සමඟ පාසල අතරින් එහා මෙහා ගියේ යැයි කීම වඩාත් හොඳ ය. මා විශ්වාස කරන්නේ, එය මුළු මනුෂ්‍ය ඉතිහාසය පුරාවට ම එසේ සිදු වූ එක ම සිදුවීම බවයි.

මම සාමාන්‍ය ගමේ කොල්ලෙක්මි. මගේ උරයෙහි පලතුරුත්, කැටපෝලයකුත්, සෙල්ලම් පිස්තෝලයකුත් තිබේ. මඩ වළවල් හිම කැටියෙන් වටවන තුරු මා පාසල් යන්නේ කිසිදු පාවහනක් නොමැතිව ය. මට ඇත්තේ අණ්ඩ දැමූ එක් කලිසමක් පමණකි. සෑම වසන්තයක දී ම අඩුගාණේ විභාග දෙකක් මම අසමත් වෙමි. ඒවා සරත් කාලය දක්වා කල් තබමි. ගම්මු මට බලු කුක්කා යැයි කියති. ඒ මා යන කොයි අත වුව මා පසුපස එන මුරාඩා සමඟ මගේ ඇති මිතුරුකම නිසාවෙනි. පාසලේ දී මා ඇමතෙන්නේ තක්කඩියා හෝ කම්මැළියා ලෙසිනි. ඒ අතරෙහි අත්තම්මාට මා දඟයා හෝ නීචයා ය. එසේ මුත් මගේ ඇත්ත නම සුරිකෝ ය.

අත්තම්මා මා සමඟ කෝප වූ විට මිදි පොඩිකරන මඩුවේ රැය ගෙවන මම ඇය මා හා සමාදාන වූ විට ආපසු ගෙදරට ඇදෙමි. දවල් දවසේ අත්තම්මා ඉපලක් ගෙන මා පස්සේ එළවන්නේ මගේ පව්කාර ඔළුගෙඩියට අහසින් හෙණ පාත් වේවායි කියමිනි. රාත්‍රියේ

දී මගේ පා සෝදන ඇය මා නින්දට වැටුණු විට මගේ නළල සිඹින්නී ය. මා මෙය දන්නේ සමහර විට මා හොරට නිදා සිටින බැවිනි.

පාසලේ දී මගේ හැසිරීම කෙසේ ද? ගුරු මණ්ඩලයේ සටහන් යැයි කියන නිල ලියකියවිලිවලට අනුව බැලූ විට ඒවාට මා ගැන කියන්නට ඇති දේ පහතින් එන ආකාරයේ දේවල් ය.

"1940 මාර්තු 18 දින අංක... දරණ පාසලේ ගුරු මණ්ඩල රැස්වීමේ සටහන්!"

"සහභාගීන්වයඃ මුළු ගුරු මණ්ඩල ම!"

"න්‍යාය පත්‍රයඃ 4 වැනි පන්තිය භාර ගුරුවරයාගේ තොරතුරු අනුව සුරාබ් වෂලොම්ඩ්සෙ නම් මේ හතරවැනි පන්තියේ ශිෂ්‍යයාගේ කල්ක්‍රියාව."

"කථිකයෝඃ"

"භෞතික විද්‍යා ගුරුවරයාඃ වෂලොම්ඩ්සෙ ඇවිස්සිය හැකි කිසිදු ශක්ති විශේෂයක් ස්වභාව ධර්මයේ ඇත්තේ නැහැ. මේ ළමයා දියරයක ඔබාපු ඝන වස්තුවක් වගේ හැම බලපෑමකින් ම නිදහස්."

"ගණිත ගුරුවරයාඃ මට නං වෂලොම්ඩ්සෙ කියන්නේ නොදන්නා සංඛ්‍යා සියයක් තියෙන සමීකරණයක ස්වභාවයේ දෙයක්. ඒ වගේ සමීකරණයක් විසඳන්න මට නම් බෑ."

"රසායන විද්‍යා ගුරුවරයාඃ කිසිම ප්‍රතික්‍රියාවක් නැහැ! එයා ඔහේ ඉඳගෙන මගේ දහිරිය තීරු තීරුවලට ඉරනවා. අස්වාභාවික ලිට්මස් කඩදාසියක්, මිනිහා ආන් ඒ ජාතියේ. එයා කවදාවත් රතු පාට වෙන්නෙ නෑ!"

"රුසියානු භාෂා ගුරුවරියඃ මගේ අදහසේ හැටියට නං පල් මෝඩයෙක්."

"භූගෝල විද්‍යා ගුරුවරයාඃ භූගෝලය ගැන වෂලොම්ඩ්සේගේ දැනුම ගණන් ගන්න බැරි තරං. එක්කෝ එයා අස්වාභාවිකයි නැත්තං ඌණපෝෂිතයි."

"ඉතිහාසය ගුරුවරයාඃ එයා විසිවැනි සියවසේ නියෝජනයකට වඩා ගල් යුගයේ ප්‍රාථමික මිනිහෙක්. පාඩමක් වෙලාවකවත් ටිකක් සන්සුන්වෙලා ඉන්නවා කවදාවත් දකින්න ලැබෙනනෙ නැහැ. ඒ වගේ ම කිසිම ප්‍රගතියක් පෙන්නලාත් නැහැ. වෂලොම්ඩ්සෙ කියන්නේ පන්තියේ ගෞරවයට කැලලක්."

"පාසලේ මුරකරුඃ ඇයි ඔහේලා ඒ අසරණ කොලුව පාගලා දාන්නේ? ඔහේලා කියන විදිහට ඒකා මොට්ටයෙක් නං ඇයි පන්තියකින් පන්තියකට උඩට යවලා තියෙන්නේ?"





"ඒක තමුසෙට අයිති කටයුත්තක් නෙවෙයි. තමුසෙගෙ රාජකාරිය හරියට වෙලාවට සීනුව ගහන එකයි," විදුහල්පති කඩා පැන්නේ ය.

"ජෝර්ජියානු භාෂා ගුරුවරයා (ඔහු මගේ සමීප ඥාතියෙකි)ඃ මට ඔහේලා කිසි කෙනෙක්ව තේරුම් ගන්ට බෑ! කෙනකුට හිතෙන්ඩ පුළුවනි මේ වෂලොම්ඩ්සේ ආලේපයකට වැටුණු මැස්සෙක් කියලා. හොඳා එහෙනං ඔය විදිහට කියමු බලන්ඩ මට කවුද වැඩිය හොඳ! සමහර විට ලොකු මහත්තයගේ පුතා? එයාට හැම විෂයකට ම ඉහළ ම ලකුණු තියෙනවා, ඒත් ඊට වඩා ගොබ්බ නිවටයෙක් මං නං දැකලා නැහැ. එයා හරියට බකමූණෙක් බිලේ රිංගාගත්තා වගේ පාඩම වෙලාවට ඔහේ ඉඳගෙන ඉන්නවා!"

"ක්‍රීඩා ගුරුවරයාඃ එහෙනං ඇයි ඔහේ එයාට විශිෂ්ට ලකුණු දුන්නේ?"

"ජෝර්ජියානු භාෂා ගුරුවරයාඃ එහෙම නොදුන්න නං වඩා හොඳා කියලා මං දන්නවා."

"විදුහල්පතිඃ හැමෝ ම කටවල් වහනවාලා. වෂලොම්ඩ්සේ, මොනව ද තමුන්ට තමුන් ගැන කියන්න තියෙන්නේ?"

"වෂලොම්ඩ්සේඃ ජෝර්ජියානු භාෂා ගුරුවරයා හරියට ම හරි!"

"විදුහල්පතිඃ මොට්ටයා! මං අහන්නේ කවුද හරි කවුද වැරදි කියලා නෙවෙයි. තමුන්ට තමුන් ගැන මොනව ද කියන්න තියෙන්නේ?"

"වෂලොම්ඩ්සේඃ මා ගැන? තව සැරයක් සමාවෙන්න, මං මගේ විදිහ හදාගන්න උත්සාහ කරන්නං."

මේ ආකාරයෙන් මගේ චරිතය විස්තර කරනු එක් වරකට වඩා ඇසීමෙන් පසු මම මගේ සෞඛ්‍යය ගැනත් සිහි නුවණ ගැනත් සැක කරන්නට පටන් ගතිමි. ඒත් එක් වාසනාවන්ත අහඹුවක් මගේ සැක සංකා පලවා හැරියේ ය.

වරක් මට මුළු සතියක් ම පාසල් යන්නට නොහැකි විය. ඒ බඩ ඉරිඟු යාය කඩිනමින් උදලු ගෑ යුතුව තිබූ බැවිනි. එවන් විසල් කට්ටි පැනීමකට මා පාසලින් පන්නා දැමිය හැකිව තිබිණි. ඉතිං මා කළ යුතුව තිබුණේ අසනීපව සිටි බවට සහතිකයක් ගෙන යාම ය. ඇත්තට ම අසනීප වී නොසිටියේ නම්, ඒ දිනවල එවන් සහතිකයක් ලබාගැනීම කළ නොහැකි එකකි. ඉතිං අත්තම්මා කළේ මා ඇඳෙහි හොවා වෛද්‍යවරයකු කැඳවීමයි.

උදේ සිට ම මට කෑමට කිසිවක් දුන්නේ නැත. එහෙයින් මගේ පෙනුම සුදුමැලිව ලෙඩ පාටට හැරුණි. තෙත තුවායක් මගේ නලල උඩින් එළූ අත්තම්මා වෛද්‍යවරයා ලෙඩ ඇඳ ළඟට කැඳවාගෙන එන්නට ගියා ය. පැය බාගයකට පසු ඔහු අපේ වත්තට ඇතුළු විය.

"මොකෝ පැංචෝ වෙලා තියෙන්නේ?" ඔහු ඇසුවේ මගේ ඇඳ අද්දරින් වාඩිවෙමිනි.

"මං මැරෙන්ඩ යනවා..." මම කෙඳිරි ගෑවෙමි.

"මොනවා? ඒත් කොහේ ද ඇත්තට ම රිදෙන්නේ?"

එවැනි ප්‍රශ්නයක් ගැන කොහෙත් ම සිතා නොසිටි මම බිය වූ බැල්මකින් අත්තම්මා දෙස බැලුවෙමි.

"එයාගෙ මුළු ඇඟ ම රිදෙනවලු." අත්තම්මා කීවේ ය.

"කෙසුත් රිදෙනව ද?"

"අපොයි ඔව්..." මම කෙඳිරි ගෑවෙමි.

මේ මොහොතේ ඉලිකෝ සහ ඉලේරියන් ඇතුළට ආහ. ඔවුන්ට රහස දැනගන්නට සලස්වා තිබූ හෙයින් ඔවුහු මගේ අසරණ අසනීපය ගැන වැලපෙන්නට වූහ.

"මං දැක්කා දුප්පත් කොලුවා අසනීපෙන් වැටිච්ච හැටි," ඉලේරියන් කීවේ ය.

"විස්තර කරන්න පුළුවන් ද?"

"අපොයි ඇහැකි. එයාගෙ කෑම පිරිය නැතුව ගියා. දවස් තුනකට කලිං මං එයාට ලොබියෝ කටවල් තුනකුයි මොහාදි කටකුයි කවන්න වද වින්ද තරමක්. හිතාගත්තැහැකි ද? වෙන එක ම කටක්වත් කවාගන්ඩ බැරි වුණා!"

"හැබෑට ම?" වෛද්‍යවරයා කීවේ ය.

"මට ඒ ගැන දිවුරන්නැහැකි! එයා පුරුදුවෙලා උන්නෙ වීස් තැල්ලක්... එක කටකට කන්නයි. ඒත් මේ සැරේ නං එයා කීවේ අපෝයි එපා කියලා. එයා කීවේ ගෙදර දී දවල් කෑම කෑවා කියලා."

"ඒක හැබෑ ද?" වෛද්‍යවරයා මගෙන් ඇසුවේ ය.

"හැබෑ ම තමා දොස්තර මහත්තයෝ. මට ලොබියෝ දකිද්දී වමනෙට එනවා."

"එතකොට සුදු ලූනු සෝස් එක්ක බැදපු කුකුළෙක් එහෙම, නැත්තං මින්ට් දාපු හොඳ සුල්ගුනි (චීස් වර්ගයකි), එහෙමත්

---

1 කුළුබඩු දමා බෝංචිවලින් සාදන ආහාරයකි.





නැත්නං තම්බපු කුකුළෙක්... සමහර විට රටකජු සෝස් එක්ක ලූනුට මාළු? මොකද කියන්නේ, මගේ යාළුවා?"

"මේ මොට්ටයා ළමයාව පිස්සු වට්ටනවා." අත්තම්මා මැතිරුවා ය.

මෙවැනි කෑම වට්ටෝරුවක් ඉදිරියේ බොරු උදාසීනකමක් පෙන්වන්නට නොහැකි වූ ඉලිකෝ කඩිමුඩියේ බැල්කනියට පසුබැස්සේ ය. එහෙත් ඉලේරියන් පවුලේ ඡායාරූප ඇල්බමය දෙස පළමු වරට බලන්නාක් මෙන් උවමනාවෙන් බලන්නට විය.

"වෙන මොනව ද එයාට තියෙන අමාරු?" වෛද්‍යවරයා ඇසුවේ සිනාසෙමිනි. ඉන් පසු ඔහු මගේ හිසෙන් තුවාය ඉවත්කොට මගේ කට පිස දැමී ය. ඔහුගේ ගණන් ගැනීමේ හැටියට තුවායෙහි ගලන ගඟක තරම් වතුර පිරී තිබිණි.

"එයා තිස්සේ ම හචිස් අරිනවා." ඉලේරියන් කීවේ ය.

"එතකොට එයාගෙ මුත්‍රා කොහොම ද?"

මෙයින් නම් ඉලේරියන් හොඳහැටි ම හිරවිණි.

"එයාගෙ මුත්‍රා කොයි විදිහ ද?" ඒ වන විට කාමරයට පැමිණ සිටි ඉලිකෝගෙන් ඔහු ඇසුවේ ය.

ඉලිකෝ ස්ථානෝචිතව කතා කළේ ය:

"මං කෙළින් ම කියන්නං. මං එයාගේ මුත්‍රාවලට නං කොහෙත්ම කැමැත්තක් නෑ. පහුගිය ටිකේ ඒවා හොඳටෝ ම නරක්වෙලා."

"ඊට කලින් ඒවා හොඳයි ද?"

"පන්කාදු පහයි!"

"තව මොනව හරි කියන්ඩ තියේ ද, ඉලන්දාරියා?"

"ම..." ඉලිකෝ උගුර පෑදුවේ ය. "... ඒ ඇර එයාට කොහෙත් ම සනීපයක් තිවුණේ නෑ..." එසේ කියමින් ඔහු අවුස්සනසුලු ලෙස කොපුල අසලින් ඇඟිල්ලක් කරකැවී ය.

ඔහු අදහස් කළේ මගේ සිත අවුල් වී ඇති බවයි.

"හැබෑව ම? දැන් ඔයාට ඇඟිලි කීයක් පේනව ද?" වෛද්‍යවරයා ඔහුගේ අල්ල දිගහැර මගෙන් ඇසී ය.

"හතයි!" මෝඩ සිනාවක් පාමින් මම කීවෙමි.

"හරියට හරි!" වෛද්‍යවරයා විස්මයෙන් කෑගැසී ය.

පුදුමයට පත් ඉලේරියන් අතින් කණ්ණාඩි කුට්ටම බිම වැටුණි. අත්තම්මා හීතියෙන් ඇකිළුණා ය. වෛද්‍යවරයා මගේ ඇසිපිය

ගෙහෙට බලා ගෙන ගෙළා, පලි මහොටා මගේ ඇස් තුළට එබී බලා, හිස සලා දුක්බර හඬකින් මෙසේ ඇසී ය.

"ඔයා ඇත්තටම එහෙම අදහ ගන්නව ද?"

"ඔයා දෙය් අනේ, පොඩ්ඩ එහෙමයි," ඉලෝරියන් සුසුමක් හෙළමින් කී ය.

"නැති කෙනෙක් වගේ," ඉලෝරියන් සුසුමක් හෙළමින් කී ය.

"එහෙම ද! මේ මනුස්සයා කවුද?" වෛද්‍යවරයා ඉලිකෝ දෙසට හැරී මගෙන් ඇසී ය.

"ඒ මනුස්සයෙක් නෙවෙයි, අස්සයෙක්නේ," මම වල් මෙයාපලගේ මුහුණත සදා ගනිමින් පිළිතුරු දුනිමි. එයින් ඉලිකෝ ද මහත් පුදුමයට පත් විය.

"ඇ ඉලිකෝ... මම මේ ඉලිකෝ මාමා, තුඹට මාව අඳුනගන්ට බැරි ද?" ඔහු ඇසුවේ සන්තාපයෙනි. මම හිස සොලවා මගේ ම නාස්පොල්ල දෙස දෑස් යොමු කළෙමි.

අන්නම්මා වේ තොල හපමින් හිස බිඳා ගන්නා ය.

"මොනව ද මියලා ලෙඩාට දුන්න බෙහෙත්?" වෛද්‍යවරයා ඇසුවේ ය.

"අපි එයාගෙ කම්මුල්වල වොඩ්කා ගාලා ඇතිල්ලුවා."

"කැරුණකරලා මෝතලේ ගේන්න."

අන්නම්මා බෝතලය ගෙනාවා ය.

"මට පුංචි වීදුරුවක් දෙන්න."

ඔහුට වීදුරුව දෙනු ලැබිණි. වෛද්‍යවරයා එයට වොඩ්කා පිරවී ය.

"ළමයාගෙ තත්ත්වය බරපතලයි. මට බය එයා ගොට උදේ වෙනකං වත් ඉදී ද කියලයි. එයාව මේ දැන්ම ගොටලට ගෙනියන්න ඕනෑ, සැත්කමක් කරන්න."

"මොකවා, ඒ මොකට ද?" මම යටිගිරියෙන් හඬ නගමින් ඇදෙන් පැන්නෙමි.

"අපි එයාගෙ හිස්කබල විවෘත කරන්න ඕනෑ."

"ඒක කරන්ඩ වෙන්නෙ මගේ මිනිය උඩින් තමා!" අන්නම්මා බේරිලෙන් දුන්නා ය. "එයාගෙ හිස්කබල විවෘත කරනවා! ඒක ඔළුවක්, පිචිත්තු ගෙඩියක් නෙම නෙවෙයි! තමුසෙ මොනව ද ලෙඩ ගැන දන්නේ? ළමයා ඉන්නේ වදාපු හැටියෙ තරම් ම සනීපෙට, තමුසෙට ඕනෑ ඒකව ඉස්පිරිතාලෙට දක්කගෙන යන්ඩ. නැතිනම් පුතේ, මේකා උඹව වෙලාසනින් ම මිනීවළට ගෙනියන්ඩ හදනවා!"





"ආන්න එහෙම හොඳා! එතකොට මගේ කියන්නේ එයා හොඳට ම සනීපෙන් කියලා? මං එහෙනං මං මිනේලා හැමෝගෙම ජීවිත සනීපය වෙනුවෙන් සුබ පතනවා," යි කී වෛද්‍යවරයා සිනාසෙමින් වොඩ්කා වීදුරුව ගිල දැමීමේ ය.

"මගේ එක්ක මොනව හරි හපන්ඩ එපායැ," යි කී ඉලෝරියන් ඔහුට පෙයාර්ස් ගෙඩියක් පෑවේ ය.

පෙයාර්ස් ගෙඩියෙන් ලොකු පෙත්තක් හපාකමින්, මගේ කම්මුලට තට්ටු කොට අපෙන් කාරුණික ලෙසින් සමුගත්තේ ය. පිටව යමින් ම ඔහු මෙසේ කී ය.

"සහතිකේට ම මේ ළමයා තමා සෞඛ්‍ය සම්පන්න බව පෙන්නන විත්තුවේ," යි කියමින් ම අශ්වයා පිටට පැන්න ඔහු අපට අත වනා ගිමමේ යන්නට ගියේ ය.

## දඬයම

මගේ ප්‍රාතිහාර්යමය සුවපත්වීමෙන් සතියකට පසු ඉලෝරියන් අපේ වත්තට ආවේ ය. පෙයාර්ස් ගස යට තණගොල්ලෙහි දිගාවුණු ඔහු සිගරට්ටුවක් දල්වාගෙන ජවසම්පන්න ලෙසින් දැත් දෙපා විහිදුවා මෙසේ ඇසී ය.

"ඉතිං බලූ කුක්කෝ, කොහොම ද සැත්කම?"

"තමුසෙට නං හිනා, මං උන්නේ මිනීවළ ගැට්ටේ."

"අහපල්ලකෝ ආන් ඒක! 'මිනීවළ ගැට්ටේ', හැබෑටම! මොකක් ද උඹේ ජීවිතේට බය නැමට තිබ්බ අනතුර, මං අහන්නේ? ඒක්කො එහෙනං මං හිතන්නෙ උන් උඹේ කාලකණ්ණි හිස්කබල විවෘත කරපු හැටියෙ ම ආපහු වැහුවා වෙන්ඩ ඕනෑ. හිස් පෙට්ටියක් අවුස්සන එකේ වලක් තියෙයැ?"

"අනේ යනවා යන්ඩ! 'හිස් පෙට්ටිය'! කෙනකුට හිතෙන්ඩ පුළුවන් තමුසෙයි තමුසෙගෙ යාළුවා ඉලිකොයි දෙන්නා ඉසිවරයො කියලා!"

ටික වේලාවක් කතාබහින් තොරව ගෙවිණි.

"කෝ තාගේ බල්ලා?" ඉලෝරියන් ඇසුවේ ය.

හරියට ම ඒ මොහොතේ ඔහුගේ වදන්වලට පිළිතුරු දෙන්නාක් සේ බල්ලෙක් වේදනාවෙන් නගන තියුණු හඬක් ඇසිණි.

"මම මේ කාලකණ්ණි මුරුගයා මරනවා, මරනවාමයි! ඒයි සුරිකෝ තක්කඩියා උඹ මේ කුණු පර බල්ලාත් එක්කම හැදිගැවියත්! කවදාවත් මේ වගේ දේවල් අහලා තියේ ද? ඉස්සෙල්ලා ම රකින කිකිළියන්ගේ බිත්තර හොරකං කළා, දැන් කුකුළු පැටව් හොරකමට බැහැලා!"

කෙඳිරිගාමින්, පස්සා ගාතය අද්දමින් එන මගේ අසරණ මුරාඩා පසුපස්සේ අපේ අසල්වැසි එෆ්‍රොසිනා දෙවැට අතරින් ගාටමින් ආවේ පොල්ලක් වනමින්, බෙල්ල ගැලවී යන තරමට බෙරිහන් දෙමිනි.

"ඌ අල්ලාපියව්!" එෆ්‍රොසිනාගේ සැමියා ඔවුන්ගේ මිදුලේ සිට බෙරිහන් දුන්නේ ය.

"මොකා ද බොල මේ යක්කු ඇහැරවන්නේ ගෑනියේ?" අත්තම්මා ගෙදරින් එළියට දිව එමින් ඇසුවා ය. "එතකොට අපේ මුරාඩා කුණු පර බල්ලෙක් නේද? හිටපන් මං බොට කියාදෙන්න, ඒකා බොහෝ ම වංසවත් එකෙක් බව. ඒකාට තියෙනවා බොගේ මිනිහටයි බොලාගේ මුළු ගෝත්‍රෙටමයි වැඩිය හොඳ පෙළපතක්! බොට හොඳ මොනව ද කියලා දන්නවා නං, පලයං මෙතැනින් යන්ඩ! කුණු පර බල්ලා! හුහ්... උඹට දැනගන්ඩ ඕන නං දැනගනිං, මට ඕනි නං මං ඌව දීල සීමොන් මෝල්කාරයාගෙන් වීස් කුට්ටි දෙකක් ඉල්ලා ගන්නවා!"

අත්තම්මාට මාරක බියක් දැක්වූ එෆ්‍රොසිනා එකවර ම පසුබැස්සා ය. ඒ අතරෙහි මුරාඩා මගේ පා අසල වැතිරුණේ වේදනාවට පත් වූ අහිංසකත්වයෙනි. පසුබසින එෆ්‍රොසිනාගේ රූපකාය දෙස ඉඳහිට බැලූ ඌ වේදනාවෙන් හඬ තැලී ය. එහෙත් එෆ්‍රොසිනා නොපෙනී ගියාත් සමඟ ම ඌ හඬතැලීම නතර කළේ ය.

"හා කොහොම ද මුරාඩා!" ඉලේරියන් බල්ලා ඇමතී ය. "හොඳයි!" මුරාඩා වදනින් තොරව ප්‍රතිචාර දැක්වූයේ වලිගය වනමිනි.

"ආයෙත් නරි වැඩවලට බැස්සා ඒ?" ඉලේරියන් සිනාසෙමින් කීවේ බල්ලාගේ මුව කෙළවර එල්ලෙමින් තිබූ කුකුළු මස් කැබැල්ලක් ඉවත් කරමිනි. "මෙකෝ උන් බොට පොල්ලෙන් තැලුවේ?"

"කවුරු නං දනී ද!" මුරාඩා වදනින් තොරව කී ය. "මුලින් ම එයාලා කුකුළු පැටවුන්ව කිසි බලාකියා ගැනිල්ලක් නැතිව පාරට



එන්ඩ ඇරලා, ඔන්න එතෙන්ට ගිය හැටියෙ ම පොලු අරගෙන පන්නාගෙන එනවා..."

"ඒකි උඹට හොඳ පාරක් දුන්න ද?"

"අපොයි හොඳ ම ඒවයින්," මුරාඩා කීවේ තම තුවාල වූ කකුල දෙස බලමිනි.

"කමක් නෑ, ඔක හරියාවි."

"හ්ම්, ඒක එච්චරට ම රිදෙන්නේ නෑ තමා. කොහොමටත් එෆ්‍රොසිනා කැමති ගාණෙං බාගයක්වත් රිදෙන්නෙ නෑ." මුරාඩා සිනාපාමින් කියා, දෙකන් සොලවා ඉලේරියන්ගේ අත ලෙවකෑවේ ය.

"ඒකගෙ මූණට මක් වෙලා ද?" ඉලේරියන් මගෙන් ඇසී ය.

"පුච්චාගෙන, මෝඩ තිරිසනා. ඒකා රෑයේ ලිපේ තියෙද්දි ම මොහාදියක් හොරකම් කරලා. ඉතිං මූණේ තියෙන්නේ ඒකෙ අච්චුව."

"හැබෑ ද මුරාඩා?"

"මං ටිකක් කලබල වුණා, ඒක ඇත්ත." සුසුමක් හෙළමින් කී මුරාඩා කට දෙපස ලෙවකෑ ය.

"හොඳා සහෝදරයා, උඹ නං දසලක්සෙකින් හොයාගන්ඩ බැරි බල්ලෙක්. ඒක නං සහතික ඇත්ත," ඉලේරියන් කීවේ ගරුත්වයෙන් යුතුව ය. "මෙකා නිකං ම පර බල්ලෙක් වුණාට – බලහල්ලකෝ මෙකා හැදිලා තියෙන හැඩිදැඩිකම – තමන්ගෙ කෑම බීම හොයා ගන්නවා ඇරුණහම තමන්ගේ අත්තම්මාටත් ඕන කරන කළමනා ටික ගෙනත් දෙනවා. බල්ලෝ උඹ නං කියලා වැඩක් නෑ! හැබැයි අනිත් අතට හොරකම නං නරකයි. හොරකං කරපුවා උගුරෙ ඇලෙනවා. උදාහරණෙකට අපේ ගබඩාවෙ කළමනාකාරයා දැතිකෝ ගනිමුකෝ. මිනිහා ඉන්නේ මර ඇඳේ. ඒ කාලකණ්ණියාට හොරකං කරලා කවදාවත් ඇති වුණේ නෑ. දැන් මොකද වෙලා තියෙන්නේ, උඩුබැල්ලෙන් පතබෑවිලා ඉන්නවා කමකට නැති මළකුණක් වගේ. තේරුණා ද මං කියන දේ?"

"මට හොඳහැටි ම තේරෙනවා, ඒත් මොකක් ද ඒකෙ පලේ? හැමෝ ම හොරකං කරනවා, එහෙව් එකේ මං මොකට ද අනිත් අයට වැඩිය හොඳ වෙන්නේ? ඇරත් මං නිකම් ම බල්ලෙක්," මුරාඩා වදනින් තොරව තර්ක කළේ ය.

"හොඳා එහෙනං ගිහින් අරෙහෙන් දිගාවෙලා හිටහං. හැබැයි උඹේ හම ගලවාගන්න ඕනෑ නැත්තං වත්තෙන් හෙම පිට යනවා නෙවෙයි. බැල්ලිගෙ පුතා!" මම මුරාධාට යාත්තමින් පා පහරක් දෙමින් කීවෙමි.

"පයින් පාරවල් කන එක ලේසියි වගේ!" කියත්තාක් මෙන් මුරාධා දත් විලිස්සා, වලිගය දෙපා අස්සේ ගසාගෙන බලු කුඩුවට රිංගුවේ ය.

තවත් සිගරැට්ටුවක් ඔතාගත් ඉලේරියන් එය උරමින්, "මං අද පාන්දර යාය පැත්තෙ ගියා. සෝයා කරටි මුල්වලට එනකං ම ලැව්ගාලා දාලා. මයෙ හිතේ හාවො වෙන්ඩ ඕනෑ... මං උන්ගෙ අඩින් දැක්කා. අපි හෙට පාන්දර තුවක්කුවකුත් අරන් උන් පස්සෙ යං."යි කී ය.

"මට ඔහේගෙ හාවො එපාවෙලා! ගිය පාර හා අඩි දිගේ කියලා ඔහේ මාව ඇදන් ගියේ එළුවො නටන තැනකට නේ."

"මේ නං හා අඩිමයි, සහතිකයි! හා බෙටිත් තිබුණා, මේ ඇත්තමයි!"

"හොඳා හොඳා, ඔය බෙටිවලින් ආයෙත් සැරයක් ඒ එළුවො කියලා ඔප්පු නුනොත් ඇති!"

"උඹ මට කාරණා කටයුතු උගන්නන්ඩ එනවා ද, තිවටයා! හෙට උදේ වෙද්දී තුවක්කුවයි උඹේ මෝඩ බල්ලායි ලෑස්ති කරගෙන හිටහං. ඔක්කොටමත් වඩා ඌ අපට පල පරෝජන වෙයි." එසේ කියමින් මගේ කැප් තොප්පිය මගේ දෙකන් උඩින් ඇද යන්නට ගියේ ය.

පසුදා උදෑසන අපි දණක් උසැති, පින්නෙන් වර තණකොළ ගොල්ලෙහි ගමන් කරමින් සිටියෙමු. ඉලේරියන් ඉදිරියෙනි. මම ඔහු පස්සෙනි. මුළුමනින් ම තෙමීගත්, දුසිම් ගාණක් තුත්තිරි අමුණාගත් මුරාධා අන්තිමට ය.

"මේකටත් අම්මපා බල්ලෙක් කියනවා?" ඉලේරියන් සමච්චල් කළේ ය. "ඌකා අපිව හාවො පස්සේ අරන් යනව ද, නැත්තං අර විදිහට අපේ අඩි පාර පස්සේ ඔහේ එනව ද? ඕං ඕකට අපි ඉස්සරහිං යන්ට කියාපන්."

"මුරාධා ඉස්සරහිං යමං!" මම අණ කළෙමි. මුරාධා කීකරු ලෙසින් බිම හිඳ ගත්තේ ය.



"ඒකාට මහංසි වගේ. අපි ටිකක් තැවතිලා මොනව හරි කාලා ගියොත් හොඳා නේද?" ඉලේරියන් ඇසුවේ බිම හිඳගන්නට පතන් වෙමිනි. කිසිදු විරෝධයක් නොකිවුණෙත් මම ද ඔහු පසෙකින් බිම හිඳ ගතිමි. තැම්බූ කුකුලෙක්, මොහාදියක්, අලුත් විස් කුට්ටියක් සහ මිදි වයින් බෝතලයක් තම මල්ලෙන් ගත් ඉලේරියන් ඒවා පැතලි ගලක් උඩින් තැබී ය. කෑම වේලට පිකාලි, ලොබියෝ, තැම්බූ අර්තාපල් සහ ලුණු යන දෑ මගෙන් ලැබිණි. ඉතිං අපි කෑමට වැටුණෙමු.

"ඉලේරියන් ඔහොම වච් වච් ගාලා කන්ඩ එපා, හාවො බයවෙලා දුවාවි!" මම කීවෙමි.

"තක්කඩියා මාව විහිළුවට ගන්නව ද? හාවො ඉන්නේ රංචු රංචු පිටින්. ඒත් ඉතිං වැඩේ උන් අල්ලන මොක හරි විදිහක් දැනගෙන ඉන්න ඕනෑ." ඉලේරියන් කීවේ කෝපයෙනි.

ඔහු වොඩ්කා වීදුරුවක් පුරවාගෙන "ඔන්න එහෙනං වාසනාව අත්වේවා!" යි කියමින් බීවේ ය.

"එසේ ම වේවා!"යි කී මම මගේ වීදුරුව ද බීවෙමි. "මොනවා හරි කනවා. නැත්තං බඩවැල් පිච්චිලා යාවි."

"හෝ හෝ! මේ මං ඉස්සෙල්ලා ම වතාවෙ බොනවා කියලා හිතුව ද, තක්කඩියා! මේවා උඹගේ ආතම්මා පෙරාපුවා... හොඳා, අපි තව වඩියක් ගම්මු!"

"ගම්මු!"යි එකඟ වූ මම තව වීදුරුවක් පුරවා පානය කළෙමි. ඒ හා සමඟ ම මට දැනුණේ ලෝකය උඩු යටිකුරු වූ හැටියකි. "ඒවා වකුගඩුවට වදිනනෙ නැද්ද!"

"නැත්තෙ මොකෝ, පන්කාදු වොඩ්කා!"

"අපි තව වඩියක් ගත්තොත් මොකෝ?" මම යෝජනා කළෙමි.

"නියම අදහස!"

තව වීදුරුවක් එක හුස්මට ගිලදමා තමාගේ දුම්කොළ මල්ල පෑවේ ය.

"මගේ පපුව ටිකක් උරලා බලනවකෝ. ඉස්තරම් ඉස්තාම්බුල් දුංකොළ!" මම මගේ දුම්කොළ මල්ල ඔහුට පෑවෙමි.

ඉලේරියන් මගේ මල්ල ගෙන දුම්කොළ ඉවකොට මා දෙස සැකමුසු බැල්මක් හෙළා තමුදු එයින් සිගරැට්ටුවක් ඔතා දල්වා ගත්තේ ය... ඒ සමග ම ඔහු පෙරළී වැටුණේ ය.

"මොකද වුණේ ඉලේරියන්?" බියෙන් මුසපත් වූ මම කෑගසමින් ඔහු වෙත දිව ගියෙමි. ඔහු කඩදාසියක් මෙන් සුදුමැලිව බිම වැතිර හුනි. ඔහුගේ ඇස් වැසී තිබිණි.

"මුරාඩා වතුර ටිකක් අරන් වරෙං!" මම කෑගැසුවෙමි. මේ මොහොතේ හිස සෙල වූ ඉලේරියන් යාන්තම් ඉදගෙන රත් පැහැ වූ දෑස් මා වෙත රඳවාගෙන හුන්නේ ය. අන්තිමේ ගැඹුරු හුස්මක් ගත් ඔහු මරණ දඬුවමට නියම වූ අයකුගේ හඬින් මෙසේ ඇසී ය.

"නුඹ කොහෙන් ද මේ දුංකොළ ගන්නේ?"

"ඒක ඉල්කෝ දීපු තෑග්ගක්. ඇයි?"

ඉලේරියන් වීදුරුව පුරවා, කඳුළු පිස දමා, දෑත් අහසට ඔසොවා ගාම්භීර හඬින් මෙසේ කීවේ ය.

"අහෝ බලවත් දෙවියනි, ලෝකයේ සිටින සියලුම තක්කඩින් සහ වංචාකාරයින් වනසන සේක්වා! මට ඇර වෙන කාටවත් උදව් වෙන්ඩ බැරි වෙන විදිහට වේදනාවෙන් ඇඹරිලා යන්ඩ ඉලිකෝ විගොගිඩසේට දඬුවමක් දෙවන සේක්වා! ආමෙන්!"

"ඉලේරියන් මාමේ, මොකක් ද වැරැද්ද?"

"මේ දුංකොළවලට ගම්මිරිස් දාලා!"

"එහෙනං දෙවියෝ ඉලිකෝට දඬුවම් දේවා කියලා තව වඩියක් ගමු!"යි කී මම මගේ හතරවැනි වීදුරුව ද ගිල දැමීමි. ඒ හා සමඟ ම ඉලේරියන්ගේ දිගු නාසය සිඹින්නට හිටිහැටියේ ම පෙලඹවීමක් මට ඇති විය.

"ඉලේරියන් මාමේ, මට නං මේ ලෝකේ ඉන්න හොඳම කෙනා නුඹයි. නුඹ දන්නවා නං මං නුඹට කොච්චර ආදරේ ද කියලා! නුඹට දිග නාසෙකුයි උණුසුම් හදවතකුයි තියෙනවා. නුඹ හින්දා නොවෙයි නං මට මේ ලෝකේ ජීවත් වෙන එකේ කිසිම පලක් නැහැ. මාව විශ්වාස කරහං, ඉලේරියන් මාමේ! මට නුඹව ඉඹගන්ඩ ඉඩ දියන්!"

"ඡම්, සූරිකෝ, මගේ ආදරණීය කොලුවෝ, අවංකව ම කීවොත්, උඹ නං දාහකින් හොයාගන්ඩ බැරි කොල්ලෙක්. මං උඹට වඩා අවුරුදු තිහක් වැඩිමල් උණාට කාරියක් නෑ! මොකෝ මමත් උඹේ වයසේ උන්නෙ නැතිවායැ? ඔව්, මං එහෙම උන්නා. උඹත් කාලෙක මගේ වයසේ ඉඳීවි ද? ඔව්, ඉන්නවාමයි! ඉතිං මොකෝ අපි දෙන්නා අතර වෙනස? කිසිම දෙයක් නෑ. අපි දෙන්නගෙන් එකෙක්ගේ ඔළුවේ අනිකට වැඩිය කෙස් තිබ්බා කියලා අහවල් කෙංගෙඩියක් ද? අපි යාළුවෝ! ඉතිං අපි තව ටිකක් බොමු!"





දුකට පත් වී ඇවිද යන්නෙමි
බොහෝ ගණනක් මිතුරු කැල මැද...

මම ගීයක් ගැයීමට ගතිමි.

"මොකෝ දුකට පත්වෙලා? මොකෝ දරුවෝ උඹ දුක් වෙන්නේ? මොකෝ උන් උඹට ඉස්කෝලෙ දී හිරිහැර කරනවා ද? මතක තියාගනිං මං ඔය ඉස්කෝලේ අගුරු වෙලා යන්ඩ ගිනි තියනවා. නැත්තං උඹට මොකෙක් හරි හතුරෙක් හැදිල ද? ඒ කවුද කියලා විනරක් මට කියහංකෝ!" තුවක්කුව ඇදගත් ඔහු තර්ජනකාරිව එය හතර අත වැනී ය.

"වෙඩි තියාපන් ඉලේරියන් මාමේ. ලෝකෙ ම දැන ගත්තාවේ අපි මොන ජාතියෙ අය ද කියලා! හෝයියා!"

ඉලේරියන් තුවක්කුවේ කොකා තද කළේ ය. තුවක්කුවෙන් හෙණ හඬ පිටවිණි. එහි දෝංකාරය කූඩුවක හිරවූ කුරුල්ලකු මෙන් කන්දෙන් කන්දට වැදෙමින් වේගයෙන් එහා මෙහා වැදෙමින් තිබී ඉක්බිති පිටවීමේ මඟක් හමුවූවා සේ ඉවත්ව ගියේ ය.

...සිහිය ආ මම දෑස් පිසදමා වටපිට බැලුවෙමි. මුරාඩා උදේ කෑම වේල ගෙන අවසන් වී ඇති සේ ය. මේසය මුළුමනින් ම මෙන් පිරිසිදු කොට ඌ තමන්ගේ කාරියකට කොහේදෝ ගොසිනි. මම ඉලේරියන් ඇවිස්සීමි.

"මට උඩින් හිරගෙදර මුරකාරයෙක් වගේ හිටං ඉන්ඩ එපා! ඔය තුවක්කුව අහකට දාපන්, ඕකෙන් කාට හරි වෙඩි වදින්ඩ කලිං. උඹ ඕකෙන් වෙඩි තිබ්බොත් හෙම මං උඹේ මෝඩ නාහේ තලපයක් වෙන්ඩ දෙනවා!" යහු වුරා පැන්නේ ය.

"මං පොඩ්ඩක් ඇවිදලා බලන්නං, සමහර විට හාවෙක් එහෙම හම්බවුණොත්..."

"හොඳා එහෙනං පලයං. හැබැයි ඉලක්කෙ ගනිද්දි වම් ඇහැ පියාගන්ඩ අමතක කරන්ඩ හෙම එපා!" මා යන අතර ඉලේරියන් හඬ තැළී ය.

මා අඩි දහයක යන්නටත් පෙර ඉලේරියන් පුපුරා හැලෙන හඬ ඇසිණි.

"අනේ බොල උඹව හම ගහන්ඩ, කාලකණ්ණි ප්‍රාණියා, උඹ තොලොංජි වෙලා ම පලයන්! උඹ මොන පලකට නැති බල්ලෙක් ද හැබෑට? නිකං පොඩ්ඩක් වුරන්ඩ බැරි වුණා, පාදඩයා!"

"මොකක් ද වුණේ ඉලේරියන්?" මම ඔහු වෙත දිව එමින් ඇසුයේ තුවක්කුව සූදානමට තබා ගනිමිනි.

"මේ බලාපන් මේ!" හා බෙටි කීපයක් අත්ලෙහි තබාගෙන ඔහු කී ය.

"ඒවා තාම උණුහුම්, හිතාගන්ඩ පුළුවන් ද?" ඔහු ගෙරුවූයේ හා බෙටි නපුරු ලෙස ඇඟිලිවලින් පොඩි කරමිනි. "මේ දැන් ටිකකට කලින් හාවෙක් මෙතන ඉඳලා තියෙනවා. උඹේ මොට්ට බල්ලා කෙඳිරියක්වත් ගෑවේ නෑ!"

"කොහෙන් ද ඕවා ඇහිඳ ගත්තේ?"

"මේං මෙතනදිමයි, අඩි දෙකක් එහායින්! දැන් ම පලයන්! අර බෑවුම දිගේ නැගපං, මං මෙතන ම ඉන්නං. මේ හාවා මේ අහල පහළ ම ඇති!"

කොකා මත ඇඟිල්ල තබාගත් මම සෙමින් බෑවුම නැංගෙමි. ලැටි ගා දැමූ සෝයා කොළ කීපයක් සහ හාවාගේ අඩි ලකුණු ඉක්මනින් ම මට දැක ගත හැකි විය. ඒවා යොමුවූයේ විසල් හේසල් පඳුරකට ය. පඳුර වටා කීප වරක් ඇවිද බැලූ මම ඊට හොඳ පා පහරක් දුන්නෙමි. හිටි හැටියේ ම හාවෙක්, දිගු කන් ද, පිටේ සුදු ඉරි ද ඇති සැබෑ ජීවමාන හාවෙක් පඳුර මැද සිට වේගයෙන් පැන දිවුවේ ය.

"අල්ලනවා!" පිළිස්සුණු අයෙක් සේ බෙරිහන් දුන් මම වෙඩි තැබුවෙමි.

හාවා පල්ලම දිගෙ පිම්මේ දුවමින් හුනි. උගේ කන් දෙක පිටට ඇලී ගොසිනි.

"ඉලේරියන් ඌව අල්ලා ගන්නවා!" මම කෑගැසුවෙමි.

තුවක්කුවේ කොකා ගැස්සීමෙන් පසු, තත්පර කීපයක නිහැඬියාවකි. ඉලේරියන් වේගයෙන් කෙළ ගැසුවේ ය. ඉක්බිති ඇදවැටීමක, සාප කිරීමක හා කෙඳිරිගෑමක හඬකි.

"සූරිකෝ ඔන්න... ඌ උඹ දිහාට දුවගෙන එනවා!" ඔහු බෙරිහන් දුන්නේ ය.

මම උක්කුටියෙන් හිඳ තුවක්කුව මානාගෙන හුනිමි. එක්වන ම වෙඩිල්ලක් පත්තු විය, ඒ හා සමඟම තවත් වෙඩිල්ලකි. ඒ හා සමඟ ම බල්ලකුගේ ලේ කැටිගස්වන මර ලතෝනියකි. මගේ දෑස් ඉදිරිපිට සියල්ල කළු වී ගියේ ය. පිම්මේ දුවගිය මම බිම ඇද වැටුණෙමි.

"මුරාඩා, මගේ හුරතලෝ, අනේ මා දිහා බලාපන්!" මම ඉකි බිඳිමින් මගේ විශ්වාසී මිතුරා සිප ගතිමි.





"අඬන්ට එපා පුතා, මිනිහෙක් හැටියට හිතාපන්." කඳුළක් පිසිමින් ඉලේරියන් කී ය.

මුරාඩා ඇස් අඩක් හැර අප දෙස බැලී ය.

දැන් ඉලේරියනුත්, මුරාඩාත් මමත් තිදෙනා ම අඬමින් හුනිමු.

"උඹට රිදෙනව ද මුරාඩා?"

"උහුලන්ඩ බැරි තරං!" අසරණ බල්ලා සුසුමක් හෙළමින් කී ය.

"අයියෝ... මගේ අත් පණ නැතිවෙලා, මගේ ඇස් අන්ධවෙලා යනවා නං!" ඉලේරියන් වැලපුණේ ය.

"ඕක එච්චර ගණන් ගන්ඩ එපා ඉලේරියන්. ඔහේ හිතලා මට මෙහෙම කළේ නෑනේ, ඒ ඔක්කොම බීම හින්දා... මං දන්නවා ඔහේගෙ තුවක්කුව කොහොම ද කියලා. ඔහේ ඒක එල්ල කළේ හතුරකුට, ඒත් වැදුණේ මිතුරකුට... තමන්ගෙ ම බල්ලා ඒකෙන් මරාපු බවක් ඔහේට මතක් කරගත්තැහැකි ද? ඒක හින්දා හිත අවුල් කරගන්ඩ කාරියක් නෑ... මං ඕක හිතේ තියාගෙන ඉන්නෙ නෑ... ඒත් මට කනගාටු එක දෙයක් ගැනයි. එෆ්‍රොසිනාට හරි සතුටු හිතෙයි! අනික් අතට ඈ..."යි වදනින් තොරව කී මුරාඩා උගේ හිස ඉලේරියන්ගේ දණහිසෙහි ඇතිල්ලී ය.

"ඉලේරියන් මිනිහෙක් කියලා කියද්දී මේ ප්‍රාණියා බල්ලෙක්. මේ ලෝකේ කිසිම සාධාරණයක් තියෙනව ද?" ඉලේරියන් සුසුම් හෙළී ය.

"උහුලගෙන හිටින් මුරාඩා, මගේ පැටියෝ! උඹ සනීප වේවි!" මම බල්ලා වෙත නැමෙමින් කීවෙමි.

"නෑ, මං කම්මුතුයි... මිනිස්සු කියන්නේ නං 'බල්ලෙක් වගේ සනීප වෙයි' කියලා... ඒත් මං මැරෙමින් ඉන්නේ, මං මැරෙනවා, සූරිකෝ..."

"උහුලගෙන ඉඳින්, මුරාඩා! නිර්භීත බල්ලෙක් වගේ හිටිං!" ඉලේරියන් අයැදී ය.

"මිනිස්සු වුණු ඔහෙලට නං මැරෙන එක ලේසියි. ඔහේලා මැරුණහම ඔහේලගේ පවුලෙ අය වැලපිලා වළදානවා. ඒත් බල්ලෙක්ගේ මරණෙට වැලපෙන්නේ කවුද? කිසි කෙනෙක් නෑ. අපිව වළදැම්මත් ඒ වළදාන්නේ මළකුණ ගඳගහන හින්දා..." මුරාඩාගේ සිරුර පුරා ගැස්මක් දිව ගියේ ය.

"ඉලේරියන් උදව් කරන්ඩ! මුරාඩා මැරෙන්ඩ යනවා!" මම කෑගැසීමි.

"ආයුබෝවන්..." අවසන් බැල්ම මා වෙත හෙළූ මුරාඩා දෑස් පියමින් නිසල විය.

"අනේ ඒකා ඉවරයි. මගේ අත් දරදඬු වෙච්චාවයි," නිසලව කී ඉලේරියන් කමිස අතින් කඳුළු පිස දැමී ය.

...අත්තම්මාගේ ඉකිගැසීමත් විලාපයත් මුළු ගම ම නැතිගැන්වී ය. භීතියෙන් මුසපත් වූ අසල්වැසියෝ අපේ ඉඩමට කඩා වැදුණහ. වැලපීමට හේතුව කුමක් දැයි දැනගත් ඔවුහු කෝප ගත්හ.

"අනේ හැබැට උඹලගේ මොළේ හොඳ නැද්ද? මැරිච්ච බල්ලෙක් හින්දා ඔය වගේ කලකෝලාහලයක් කරන්ඩ! මොන පිස්සු පවුලක් ද!"

ඔවුහු යන්නට ගියහ.

ඉලේරියන්ගේ සිරුර පුරා වරදකාරී බව ලියා තිබුණා සේ ය. මිනිමැරුමකින් පසු එල්ලා දමන තුරු බලා සිටින්නෙකැයි කෙනකුට ඔහු දෙස බැලූ විට සිතෙනු ඇත. සැන්දෑවේ දී ඔහු මට කතා කළේ ය.

"අපි එයා හොඳට භූමදානය කරන්ඩ ඕනැ. අන්න අර ගහ යට."

මිනීවළක් කැපූ අපි අපේ මියගිය මිතුරාගේ දේහය ගෞරවයෙන් යුතුව භූමදානය කළෙමු. ඉන් පසු වයින් ජෝගුවක් අපට දෙන්නැයි මම ආතම්මාගෙන් ඉල්ලා සිටියෙමි. අපි මුරාඩාගේ මිනීවළ අසල අවමංගල සංග්‍රහයක් පැවැත්වීමු.

එය ආරම්භ කළේ ඉලේරියන් විසිනි.

"සුරිකෝ පැංචෝ, සනසන්ඩ බැරි සෝකයක් මේ මිනීවළ ළඟට, අපි ළඟට පාත්වෙලා. අපට අපේ සහෝදරයා, මිත්‍රයා වුණු මුරාඩා නැතිවුණා. එයා විශ්වාසවන්ත බල්ලෙක්. එහා ලෝකේ බල්ලන්ගේ පාරාදීසයක් තියේ නං ඒකේ දොරටු මුරාඩාට හායි ගාලා ඇරෙන්ඩ ඕනැ. අපේ හදවතේ එයා ගැන මතකය හැමදාම නිදන් වෙලා තියෙයි. දෙවියන් එයාගෙ ආත්මය සාමයේ සතපවත්වා! අපි බොමු!"

"ස්තුතියි ඉලේරියන්... බොමු!"

"දෙවැනි වීදුරුව මියගිය අපේ පවුලේ අය සහ ඥාතීන් වෙනුවෙන්. මම තුඹලාට ප්‍රීතියත් සෞභාග්‍යයත් පතනවා. මේක තුඹලාගේ අවසාන මරණය වේවා කියා මං පතනවා!"

"ස්තුතියි ඉලේරියන්!"

කළු බල්ලෙක් හොරෙන් මෙන් වත්තට ඇතුළු විය. ඌ මුරාඩාගේ මිනීවළ වටා කීප වතාවක් ඇවිද, ඉක්බිති තරමක් ඈතින් හිඳගෙන උඩුබුරලන්නට වූවේ ය.





"වැලපෙන්නෝ ඇවිත්!" ඉලේරියන් කී ය.

"මේ මුරාඩාගේ අම්මා, සීමොන් මෝල්කාරයාගේ බැල්ලි!" මම කීවෙමි.

"හපොයි දෙයියනේ! මෙහෙට වරෙන් බල්ලෝ!"

බැල්ල ඉලේරියන් වෙත ආවා ය. ඔහු මස් කැල්ලක් ඇය වෙත වීසි කළේ ය. බැල්ල මුහුණ ඉවත හරවාගෙන වැතිර ගත්තා ය.

"බැල්ලියක් වුණාට ඒකිටත් දුක දැනෙනවා." මම කීවෙමි.

"අපි මුරාඩාගේ මව්පියෝ වෙනුවෙන් බොමු. බල්ලෝ මේක උඹේ සරීර සනීපය වෙනුවෙන්. ඒක සම්පූර්ණ මගේ වැරැද්ද, මට සාප වෙයන්!"යි කී ඉලේරියන් බීවේ ය. මම ද බීවෙමි.

තවත් බල්ලෝ සිවුදෙනෙක් එකකුට පසු එකෙක් බැගින් වත්තට රිංගුවෝ ය.

"ආන් බොලේ අසලෝගේ බල්ලා... එතකොට දතිකෝගේ එකයි දෙස්පිනේගේ එකත් ඉන්නවා. ආන් මාකිගේ එකත් අතන. ඒත් කෝ මැට්‍රියෝනාගේ කුක්කා? මොකෝ ඒකා නාවේ?" ඉලේරියන් ඇසුවේ ය.

"ඒකයි මුරාඩායි ගිය අවුරුද්දේ තරහ වුණා. මුරාඩා ඒකව නපුරු විදිහට හපා කෑවා." මම පිළිතුරු දුන්නෙමි.

"හෝ එහෙනං ඒකා මේ පරණ වාඩුවක් අරන්? මං ඔය වගේ බල්ලකුට කෙළ ගහනවා. ඌට කිසිම ගරුත්වයක් නෑ, විනීතකමේ වගක්වත් නෑ, තුහ්!"

"මහත්තයා," කඩුල්ල දෙසින් කටහඬක් ඇසිණි.

"ඒ කවුද?"

"මං ඇතුළට එන්න ද?"

"හා ඒකට මොකද!"

අවුරුදු හතක දරුවෙක් වත්තට ඇතුළු විය. ඔහු මකාරේ ගෝගිචයිෂ්විලිගේ පුතා ය.

"මොකෝ පුතේ!" ඉලේරියන් ඇසුවේ ය.

"ඔයාට විදුලි පණිවිඩයක්!"

"කෝ බලමු!"

ළමයා ඔහුට විදුලි පුවත භාරදුනි. ඉලේරියන් කලබලයෙන් තොරව කණ්ණාඩි කුට්ටම සාක්කුවෙන් ගෙන, එය ලේන්සුවෙන් පරිස්සමින් පිසදා, ඇසෙහි ලාගෙන කියවන්නට විය.

"සීසුගාමි. සුරිකෝ බලු කුක්කා සහ ලොකු නාස් ඉලේරියන් වෙත. අපේ ආදරණීය මුරාඩාගේ ශෝකජනක මරණය වෙනුවෙන් මගේ අවංක ශෝකය පිළිගන්න. මේ වියෝව ගැන මම නුඹලා සමඟ ගැඹුරු ලෙස ශෝක වෙමි. බාගෙට තැම්බුණු දඩයක්කාරයනි, මෝඩ තකතීරුවනි, නුඹලා මකබෑවියල්ලා! ඊළඟ වතාවේ නුඹලා දඩයම් බල්ලෙක් ගෙනියනවා නම්, මාවත් අරන් පලයල්ලා. ආදරයෙන් සිපගනිමි.

මීට, නුඹලාගේ වියෝ වූ මිතුරා."

"අත්සනක් නෑ. කවුරු මේක එවන්ඩ ඇත් ද? මෙහෙට වරෙන් පුතා." ඉලේරියන් දරුවාට හඬ ගෑසී ය. "බය වෙන්ඩ එපා වරෙන්."

කොලුවා තම අත දිග සීමාවට ආ විගසින් ඔහුගේ කනෙන් තපුරු ලෙස අල්ලා ඇදගත් ඉලේරියන් තේ ෆැක්ටරියක සංගුව හැඩවෙන්නා සේ හඬතැලී ය.

"හ්ම් කියාපිය කවුද මේක දුන්නේ?"

"අපොයි කියන්ඩ බෑ, මාව මරාවි!"

"නොකිවුවොත් මං උඹව මරනවා! හ්ම් හිත හදාගෙන කියාපිය!" ඉලේරියන් කීවේ ඔහුගේ කන අඹරවමිනි.

"ඉලිකෝ විගොගිඩ්සේ මට රූබල් තුනක් දීලා කිවුවා විදුලි පණිවුඩේ ගෙනැත් දෙන්න කියලා. හැබැයි කටක් හොල්ලන්න එපා කිවා, එහෙම කළොත් දිව උගුල්ලනවා කීවා!"

"ඉලිකෝ කියල ද නුඹ කීවේ?"

"ආන් හරි!"

ළමයාගේ කන අත හැරි ඉලේරියන් තමන්ගේ ම පපුවට මිටින් ඇන ගත්තේ ය.

"හිටපියකෝ එකැස් යක්ෂයා. මාත් උඹට ඔය හැන්දෙන් ම බෙදනවාමයි!"

මට ඉලිකෝ ගැන දුක සිතිණි.

රය පැමිනුණි. එය සාමාන්‍ය ගමේ රයකි. වටපිටාවේ වූයේ සමාදානමය බවකි. හරියට ම අපේ පවුලේ කිසිවෙක් මියගියේ නැති ලෙසකි.





එක් උදෑසනක මම තවත් පාඩමක් සඳහා ගුරුතුමියගේ ගෙදරට යන්නට සූදානම් වෙද්දී ඉලිකෝ අපේ කඩුල්ලෙන් ඇතුළු විය.

"සුරිකෝව මට දවසකට ණයට දෙන්ඩ ඇහැකි ද ඔල්ගා හාමිනේ?"

"මොකක්, මේ දැන්? එතකොට එයාගෙ රුසියානු බාසා පාඩමට මොකද වෙන්නේ? උඹ ඒකට උගන්නන්ඩ වත්ද යන්නේ?"

"සබ්ලෝනා එයාට දෙන ජාතියේ පාඩං නං මටත් දෙතැකි. මං එයා ලවා මගේ එළවළු පාත්ති ටික උදළුගාවා ගන්නං, ඒක පැය දහයක් විතර කළා ම ඔහේට හිතේවි එයා චීන බාසාව කතා කරනවා කියලා. ඇරත් ඔහේ මට ඒකට මොකවත් ගෙවන්ඩ ඕනැත් නෑ"

"එකැස් යක්ෂයා, උඹේ දිව පැලිලා යන්ඩ ඕනෑ! කියාපන්, ඒකාව ඕනෑ මොහොකට ද?"

"ඒ ගැන ඔහේ කලබල වෙන්ඩ ඕනෑ නෑ හාමිනේ, මා එක්ක එන්ඩ එයාට ඉඩ ඇරියා ම හොඳටෝ ම ඇති!"

"හොඳා එහෙනං රස්තියාදුවා, මේ එකැස් වසංගතේ එක්ක පලයං. අනේ උගේ ඉතුරු ඇහැටත් කපුටෝ කොටාපුවාවේ! අපි බලමුකෝ ඒකා උඹට උගන්නන හැටි."

"පෙර්ර්...ට." ඉලිකෝ රුසියන් බසින් අණ දුනි. මම හනිකට කඩුල්ල වෙත දිව්වෙමි.

"මොකෝ ඉලිකෝ?" ගේට්ටුවෙන් පිටතට ආ කළ මම ඇසීමි.

"මට නුඹ ලවා දෙයක් කරවාගන්ඩ තියෙනවා, සුරිකෝ. ඉලේරියන් ගාවට යතැකි ද...?"

"ඒ මොහොකට ද?"

"නුඹ එයාට කියලා මට එළු හම් මලු තුනක වයින් දෙන්න කැමති කරවා ගන්ඩ ඕනෑ. මුළු ගමේ ම හොඳම වයින් හදන්නේ ඉලේරියන් නොවෑ!"

"ඇයි අත්තම්මගෙන් ඉල්ලන්නැත්තේ? එයා නොදී ඉන්නෙ නෑ."

"බොහෝම ස්තූතියි, මට ඕනෑ වයින් මිසක් විනාකිරි නෙවෙයි. මම මේ කැකිරි අච්චාරු හදන්ඩ යනවා නෙවෙයි."

"හිටිං මං ගිහින් අත්තම්මට කියන්නං ඔහේ එයාගෙ වයින් ගැන කියාපුවා."

"එහෙම කළොත් මං උඹේ මේ ලොකු කට මහනවා, එතකොට ඔක්කොම හරියයි. උඹ මං කියාපු දේ කරහංකෝ. ගිහිං ඉලේරියන්ගෙන් මට වයින් ඉල්ලාපන්. මං ඒකට සල්ලිවලිං

ගෙවනවා. නැත්තං අලුත් අස්වැන්නෙන් වයින් මලු තුනක් හිලව්වට ගෙවනවා. එයා නුඹට ගරු කරනවා, බැහැයි කියන්නේ නෑ…"

"වයින් ඕනෑ ඔහේටයි. ඉතිං ඔහේ ම ගිහින් ඉල්ල ගන්නවා."

"සූරිකෝ, අනේ යාළුවා, ගිහින් මා වෙනුවෙන් මේක කරහංකෝ. අනේ… මං කියාපු විදිහට කරහංකෝ. අර විදුලි පණිවුඩේට පස්සේ ඉලේරියන් මට වෙඩිල්ලක් වදින දුරට මෙහායින් ළඟට එන්ඩ දෙන්නේ නෑ… ඉතිං ඒකා බෑ කිවුවොත්, එතකොට…"

"එතකොට මොක ද?"

"එතකොට නුඹ කරන්න ඕනෑ එයා 'සොලිකව්රි' වයින් දාන කල්දේරමට ලකුණක් තියලා එන එක. මං එතකොට පොඩි වැඩක් කරනවා. මුළු ගම ම ඒ ගැන කතා කරාවි."

"මොන ජාතියෙ වැඩක් ද?"

"මේන් මෙහෙ ම එකක්. නුඹ ලකුණු කරන කල්දේරමේ වයින් මම මහ රෑට මගේ කල්දේරමට මාරු කරනවා. තේරුණා ද?"

"ඔහේට පිස්සු ද ඉලිකෝ?"

"බෙරිහන් දෙන්ඩ එපා බලු කුක්කෝ! උඹට අමතක වුණා ද උඹ කාගේ දූංකොළ ද උරන්නේ කියලා?"

"අනේ තමුසෙගෙ දූංකොළ! ඒවා පෙණහැලි වනසනවා!"

"ඔය විකාර ඇති! අපි වැඩේ ගැන කතා කරමු. මං නුඹට දූංකොළ අහුරු දහයක් ම දෙනවා. නුඹ කට වහගෙන ඉන්ඩ ඕනෑ, ගනුදෙනුව හරි නේද?"

"දූංකොළ ටික වැඩේ කළ ගමන් ම ලැබෙනව ද?"

"සත්තකින්ම."

"හරි එහෙනම් ඔහේ ගෙදර යනවා, මං ඉලේරියන් ගාවට යනවා. මං ඇවිත් කියන්නං එයා මොනව ද කීවේ කියලා."

"මං බලාගෙන ඉන්නවා."

"හොඳා මං යනවා."

ඉලිකෝ මගේ නළල සිඹ, කම්මුලට තට්ටු කොට, තනි ඇසින් මා විදගෙන යන ලෙසින් බලා නාට්‍යානුරූපීව මෙසේ කී ය.

"මතක තියාගනිං සූරිකෝ, ඉලිකෝ චිගොගිඩ්සේ පාවා දෙනවා කියන්නේ උඹේ මව්බිම පාවා දෙනවා වගෙයි. ඒක අමතක කරන්න එපා…"

"මේ… ඔහේ මං කවුරු කියලා හිතුව ද?" මම කෝපයෙන් හඬතැලීමි. බිය සැක දුරු වූ ඉලිකෝ ඔහුගේ නිවෙස දෙසට බර අඩි තැබුවේ ය. මම ඉලේරියන් හමුවන්නට ගියෙමි.





පෙති කපා, වේළෙන්නට බැල්කනියේ බිම පුරා විසුරුවා තිබූ ඇපල් හිරු එළියෙන් ලස්සන දුඹුරු පැහැයක් ගෙන තිබුණි. බිම එළූ පලසක අඩක් හාන්සි වීගෙන ඉලේරියන් සතියක් පරණ පුවත්පතකට ඇලීගෙන කියවමින් හුනි. ගමේ අපට අද, ඊයේ හෝ පෙරේදා පුවත්පත් කවදාවත් ලැබුණේ නැත. අපිට ලැබෙන අලුත් ම පුවත්පත් වන්නේ සතියක් පරණ වූ ඒවා පමණකි.

"ඉලේරියන් කොහොම ද?"

"ආ සුබපැතුම් සූරිකෝ! එකැස් යක්ෂයාට උදේ ජාන්දරින් ම උඹ ලවා මොනව ද කරවාගන්ඩ ඕනෑ කළේ?"

"ආ… එයා නිකං ආවා."

"හැබැට, මොනව ද ඔය තක්කඩියා කීවේ?"

"එයා කීවා එයාට වයින් ඕනෑලු. මට කීවා ඇවිත් ඔහේට කියන්ඩ කියලා වයින් මලු තුනක් එයාට විකුණන්ඩ කියලා."

"ඒකා ආස නැද්ද ඒ වෙනුවට මී පාසානං ටිකකට එහෙම?"

"නෑ, එයා කීවේ වයින් ඕනෑ කියලා."

"ඔය හිල් මුට්ටියට දාලා නාස්ති කරන්ඩ හදාපු වයින් මා ගාව නෑ."

"ඔන්න ඔහේ එයාට අනුකම්පා කරලා වයින් ටිකක් විකුණලා දාන්ඩ."

"ඒකා අපට අනුකම්පා කළා ද අර ගම්මිරිස් කලවම් කරපු දූංකොළ නුඹට දෙද්දී? එතකොට නුඹට අමතකයි ද විදුලි පණිවුඩේ ගැන?"

"නෑ, අමතක නෑ."

"එහෙනං මගේ අනුකම්පාව ඇතිකරවන්ඩ හදන්ඩ එපා."

"ඔහේ දන්නවා ද එයා මට කීව දේ?"

"මොකක් ද ඒ?"

"එයා මට කීවා, ඔහේ වයින් දෙන්ඩ බෑ කීවොත් හොඳම වයින් තියෙන කල්දේරමට ලකුණක් තියලා එන්ඩ කියලා. එයා මහ රෑට ඇවිත් වඩි දෙකෙන් ඒක හිස් කරනවා කිවා."

"හෝ එහෙමයි වැඩේ ආ! සූරිකෝ මට නුඹේ උදවුව ඕනෑ!"

සැන්දෑවේ මම ඉලිකෝ සමඟ පොරොන්දු වූ දුම්කොළ ගැන හෙට්ටු කරමින් උනිමි.

"මේන් පුරෝලා පුරෝලා දෙකක්, ඕනවටත් වැඩියි."

"මොකක් ද දෙකක් කියන එකේ තේරුම? මං අර කල්දේරමට ලකුණක් තිබ්බේ නිකං ම නිකං ඉන්ඩ ද?"

"හොඳා හොඳා, එහෙනං හතරක් ගන්නවා!"

"දහයක්!"

"හතරයි!"

"දහයක්!"

"උඹේ පෙණහලු ගැන අනුකම්පා කරහන් මෝඩයෝ! දුම්බොන එකෙන් උඹව මැරේවි!"

"මගේ පෙණහලුවලින් කාරියක් නෑ! ඔහේ පොරොන්දු වුණේ දහයක්. දුන්නැත්තං මං මේ දැන්ම වැඩේ එළි කරනවා!"

"පහයි!"

"එක්කෝ මට පුරවලා අහුරු දහයක් දෙනවා, නැත්තං මං මේ මොහොතේ ම ගිහින් ඉලේරියන්ට කියනවා කතාව!... එහෙනං ආයුබෝවන්!"

"ගනින්, ගනින්. නොදකින් කීවොත් කීවමයි යක්ෂයා. පෙරේතකමට උඹේ බඩ පුපුරලා ගියාපුවාවේ!"

රත්තරං වටිනා දුම්කොළ අහුරු දහයක් රවමින් මැන්න ඉලිකෝ මෙසේ ද කීවේ ය. "එහෙම නං උඹත් අද රෑට මේ වැඩේ කරන්ඩ මට උදවුවට එන්ඩ ඕනෑ."

මහ රෑ මැදියමේ මමත් ඉලිකෝත්, ඉලේරියන්ගේ වයින් ගබඩා මඩුව කිට්ටුව වැටේ හිඩැස්සක් අසල පින්නෙන් තෙමුණු තණ ගොල්ලෙහි වැතිරී සිටියෙමු.

"හච්චී... ස්!... හා...ච්චී...ස්!.. හච්...ච්චී...ස්!" මම එක දිගට කීප වරක් කිවිසුම් හැරියෙමි.

"ඔය හත්තිලව් හවිස් ඇරිල්ල නවත්තාපන්. නැත්තං ආයි තව අඟලක් උස යන්ඩ උඹට හම්බ වෙන එකක් නෑ." ඉලිකෝ නපුරු ලෙසින් කෙඳිරූයේ මගේ ඉළ ඇටවලට බලවත් පහරක් අනිමිනි. "අඩි හයක එකෙක් වෙලත් තාම නාහෙ පාලනේ කරගන්ඩ බෑ!"

"ආන් අතන තමා කල්දේරම, ගැලුම් සීයේ එක... පේනව ද අර පොළොවට ඇනපු කෝටුව?" මම ඉලිකෝට රහසින් කීවෙමි.

වැටේ හිඩැස්ස ලොකු කොට එතුළින් රිංගූ ඉලිකෝ පොළොවට ඇලී ගනිමින් මෙන්, මා පෙන් වූ කල්දේරම දෙසට බඩගාන්නට විය. සම් මල්ල බඩතුරේ ගසාගත් මම ඔහු පසුපස්සේ ඇදුණෙමි.





"හ්ම්, දැන් පටන් ගනිමු!" රහසින් අණදුන් ඉලිකෝ මට උදැල්ලක් දුන්නේ ය.

අපි හඬ නොනැඟෙන සේ වේගයෙන් වැඩ කළෙමු. විනාඩි පහළොවකින් පමණ කල්දේරමේ පියන දකින්නට ලැබිණි.

"ඒක අරිනවා!" ඉලිකෝ කීවේ සම් මල්ල සූදානම් කර ගනිමිනි. අප දෙදෙනාට ම බැසිය හැකි තරමට කල්දේරමේ කට ලොකු එකක් විය.

මම බොහෝ අමාරුවෙන් පියන එසැවීමි. ඉලිකෝ පහත් වී හිස කල්දේරම තුළට දමා බලා, එක් වරම කෝපයෙන් ගෙරෙව්වේ ය.

"මේ මොක ද මේ? මේක හිස්නේ!!!"

"වෙන්ඩ බෑ ඉලිකෝ, හොඳට එබිලා බලනවා!"

ඉලිකෝ හොඳ හැටි පහත් වී බැලී ය.

"මෙන්න හොරූ...!" හිටිහැටියේ ම බෙරිහන්දීමක් ආවේ ය. "ඔහේ හිටපියවු, මංකොල්ලකාරයෝ!"යි කෑගසමින් අසල ගසක සිට ඉලේරියන් බිමට පැන්නේ ය. "දුවන්ඩ එපා, මං වෙඩි තියනවා!"

"දුවමු!"යි බෙරිහන් දුන් මම ඉලිකෝගේ කකුල්වලින් ඇද්දෙමි.

භීතියෙන් මුසපත් වූ ඔහු ගැස්සිණි... ඒ හා සමඟ ම ඔහු කල්දේරම තුළට ඇදගෙන වැටුණේ ය. ඉලේරියන් මගේ උරිස්සෙන් අල්ලා ගති.

"කවුද උඹ? කියාපිය, නැත්තං මං උඹව මෙතන ම මරනවා!"

"මේ මම, සුරිකෝ! මාව මරන්ඩ එපා ඉලේරියන් මාමේ!" මම අයැදීමි.

"එතකොට කෝ අනිකා?"

"මං දන්නෙ නෑ!"

"කියාපිය, නැත්තං මං උඹව පණ පිටින් හම ගහනවා!"

"මම දන්නෙ නෑ, ඉලේරියන් මාමේ!"

"කවුද ඒ?"

"මම දන්නෙ නෑ!"

"දන්නෙ නෑ? ඒ කොහොම ද බොල, උඹලා දෙන්නා එකට නෙවෙයි ද උන්නේ?"

"මම දන්නෙ නෑ!"

"කල්දේරමේ පියන මේ දැන්ම වහපන්, උඹේ බඩවැල් එළියට අදින්ඩ කලියෙන්! මං උඹට අතුරුපස ගන්ඩ ටිකක් පහුවෙලා දෙන්නංකෝ!"යි කී ඉලේරියන් මගේ හිසට ටොක්කක් ඇන්නේ ය.

එය අපේ සැලැස්මේ කලින් සඳහන්ව නොතිබූ බලාපොරොත්තු නොවූ පහරක් විය. එහෙත් මා ඊට අඬමින් ආඩපාලි නොකියා වේදනාව පෙන්වන මහ හඬකින් බෙරිහන් දුනිමි.

මම වේගයෙන් පියන වසා, බර ගලක් ඒ මත තබා, උදැල්ල ගෙන කල්දේරම පසින් වසන්නට සූදානම් වුණෙමි. එවිට ම එහි පත්ලේ සිට කටහඬක් ආවේ ය.

"සර්ව බලධාරී දෙවියනි, සියලු සාන්තුවරයිනි, පොළොව පැළී ගොස් ප්‍රතිපත්තියක් නැති එවුන්, තක්කඩියන් සහ මූණු දෙකේ උන් ගිල ගනිත්වා! ඉලේරියන් ෂෙවර්නාඩ්සේගෙයි සූරිකෝ වෂලොම්ඩ්සෙගෙයි ඔළු ගෙඩිවලට හෙණයි අකුණුයි පාත්වේවා! මිථ්‍යාදෘෂ්ටිකයෝ, උන් මාව රැවැට්ටුවා!"

"කවුද ඔතන? කතා කරනවා, නැත්තං ඔළුව ගැලවෙන්ඩ වෙඩි තියනවා!" තුවක්කු කට කල්දේරම් කටට යොමු කරමින් ඉලේරියන් හඬ තැළී ය.

"මම මේ ඉලිකෝ! ඔය තුවක්කුව අහකට ගනින්, නාහෙ දිග යක්ෂයෝ! උඹේ ආත්මෙට තවත් පවක් එකතු කරගන්ඩ එපා!"

"හොරා කියන්නේ උඹේ දෙවෙනි නම ඉලිකෝ! උඹ ඔය හිස් කල්දේරම අස්සේ මක් කරනව ද?"

මට බකස් හඬින් හිනාවක් පැන්නේ ය.

"ඉලේරියන් උඹට මාව පණපිටින් වළලන්ඩ බෑ! උඹට අපායේ සදාකාලික ගිනි දැල් ගැන බයක් නැද්ද?"

"මොන ම ඉලව්වකටවත් බයවෙන්ඩ මට කිසිම හේතුවක් නෑ. දෙවියන් නොඅදහන පව්කාරයෙක් ලෝකෙන් අයින් කරලා දැම්මොත් නං දෙවියෝ මට ඒකට ස්තුති කරාවි."

"මට එළියට එන්ඩ දියන් ඉලේරියන්!"

"සූරිකෝ ගිහින් අහල පහළ අයව ඇහැරවාපන්. මේ එකැස් මුගටියාව මම මගේ කල්දේරමට කොටු කරගත්ත හැටි එයාලට බලාගන්ඩ අරිමු!"

"ඉලේරියන් ෂෙවර්නාඩ්සේ! මට ගම්මුන්ගේ ඇස් ඉස්සරහ නින්දා කරවන්ඩ එපා! මං මේ කුණුවෙච්ච කල්දේරම අස්සේ හුස්ම හිර කරගෙන ඉන්න එක ම මදි ද ඔහේට! ඔහේ දැන් සතුටු වුණා නෙව, ඉතිං මට යන්ඩ අරිනවකෝ!"

"මට කොහෙත්ම සතුටු වෙන්ඩ තරං හිතක් ඇත්තේ නෑ. මං උඹව මේ පියන යට මාසයක් තියෙන්ඩ අරිනවා. ඊට පස්සේ උඹේ සුන්බුන්වලින් වොඩ්කා පෙරනවා. ඒවා හොඳ සැරට හිටීවි!"





"අහස තරං උසට ගඳගහන වොඩ්කා කාට ද ඕනෑ? ඒවා සම්පූර්ණ විස වේවි." මම කීවෙමි.

"එහෙනං උඹ මාව පාවා දුන්නා සූරිකෝ ඈ' හරියට එළුවෙක් වගේ වික්කා නේද, සර්පයා!"

"ඔය කල්දේරම අස්සේ ඉඳගෙන ගෙන්දගං හුස්මට අරගන්න ගමන් වඩා හොඳා නේද අර ගම්මිරිස් දාපු දුංකොළ ගැන හිතන එක!"

"මට වද දුන්නා මදි ද බොලව් දෙවියන් ගැන නොදන්න මිථ්‍යාදෘෂ්ටිකයිනේ? මං මගේ ජීවිතේ ඉතුරු කාලෙම මේ කල්දේරම අස්සේ ගෙවන්ඩ ද?"

"අපි එයාට එළියට එන්ඩ දෙමු. මට මිනිහා ගැන දුකයි." මම කීවෙමි.

"ඔව්, එහෙම කළොත් හොඳා මයි හිතේ. ඒත් හැබැයි එයා මහ සද්දෙට තමන් පල් මෝඩයෙක් කියලා කෑගැහැව්වොත් විතරයි."

"ඔහේ එකඟ ද?" මම ඉලිකෝගෙන් ඇසුවෙමි.

"මම මහ පල් මෝඩයෙක්!" පරාජය පිළිගනිමින් ඉලිකෝ කෑගැසී ය.

කල්දේරමෙන් පිටතට ආ විගසින් ඔහු රැ තෙතබර වාතයෙන් ගැඹුරු හුස්මක් ඇද්දේ හරියට ම දිගු වේලාවක් දියේ ගිලී සිටි සබ්මැරීනයක් ගොඩ ආ විට එහි සේවකයකු හුස්ම අදින පරිද්දෙනි. ඉක්බිති තම සම් මල්ල ඇහිඳ ගත් ඔහු දබරැඟිල්ල නමමින් කතා කළේ ය.

"බොහොම හොඳා, එහෙනං උඹලා දිනුවා!"

එසේ කී ඔහු හැරී කඩුල්ල දෙසට ගමන් ගනිමින් මොනවාදෝ මැතිරී ය.

"කොහේ ද උඹ ඔය යන්නේ අකෘතඥයා? උඹ අපට පින් දීලා යන්නෙ නැද්ද?" ඉලේරියන් කෑගසා ඇසී ය.

"උඹලාට දේව පිහිට ලැබේවා, බොහෝ ම ස්තූතියි. උඹලා බොහෝ ම කාරුණික වුණා," ඉලිකෝ කී ය.

"එහෙම හරියන්නේ නෑ!... සූරිකෝ මේන් මෙතන තියෙන කල්දේරමේ පස් අහක් කරහන්කෝ!" ඉලේරියන් වයින් පිරුණු වෙනත් කල්දේරමක් ඇති තැන පෙන්වී ය.

උදැල්ල ගන්නට පෙර මම මගේ පැස ගෙන ඉලිකෝගෙන් ලැබුණු දුම්කොළවලින් සිගරැට්ටුවක් ඔතන්නට වීමි.

"දුම් බොන්ඩ එපා සූරිකෝ, ඔය දුංකොළවලත් ගම්මිරිස්," ඉලිකෝ ගොළු ලෙසින් කී ය.

...පසුදා කපුටන් කෑගසන තුරු ම ඉලේරියන් පිරිනැමූ වයින් නිසා ගීත ද, සච්දිය පිරීම් ද, සිපගැනීම් ද පැවතිණි.

පසුදා උදෑසන මමත් ඉලේරියනුත් සිහිනැතිවන තුරු බී සිටි ඉලිකෝත්, වයින් පිරවූ එළු සම් මල්ලත් ඉලිකෝගේ ගෙදරට ඇදගෙන ගියෙමු.

## මුරකරුවා

දිනක් මම පාසල ඇරී තේ වත්ත හරහා කෙටි මඟින් එමින් සිටියෙමි. ඉදුණු නිල් පැහැ ඉසබෙලා මිදි පොකුරු අතු අස්සෙන් මා දෙස ලැජ්ජාවෙන් එබී බැලී ය. අන්තිමේ මට තවත් නම් ඉවසාගෙන සිටිය නොහැකි විය. පොත් මල්ල අත්තක එල්ලූ මම ගසේ මුදුනට ම බඩගෑවෙමි. මිදි ඉතා රසවත් විය! සමහර නගරවැසියන් කියන්නේ ඉසබෙලා මිදි මකුණු ගඳ ගසන බවයි. මට ඒ ගැන තීන්දුවක් දිය නොහැකි ය. ඒ ම විසින් කිසිදාක ඇඳ මකුණකුගේ රස බලා නැති නිසා ය. ඒත් උන්ගේ රසත් මේ මිදි වාගේ නම්, මකුණන්ගේ කිසි නරකක් තිබිය නොහැකි ය! මුල දී මම මිදි ගෙඩි පිටින් ම ගිල්ලෙමි. ගිජුකම ගියායින් පසු සෙමින් මිදි කන්නට ගත් මම ඒවායේ සාරය දිව දිගේ ගලන්නට හැර ඇට සහ පොතු කෙළ ගැසුවෙමි.

"ඒයි ඔය ගහේ ඉන්න එකා! කවුද සමූහ ගොවිපොළෙන් හොරකං කරන්නේ?" හිටිහැටියේ ම හෙණ පහරක් වැනි හඬක් පැමිණියේ ය. බියෙන් සලිත ව ගිය මා ගසෙන් වැටෙන්නට ම ගියේ ය. යාන්තමින් අත්තක් අල්ලා ගන්නට සමත් වුණු මම ඇදගත් හුස්මෙන් යුතුව එසේ ම සිටියෙමි.

"ඒයි... මං කියන දේ ඇහෙන්නෙ නැද්ද? නැත්තං බීරි ද?"

මම පහත බැලුවෙමි. ඒ ඉලිකෝ ය. ලොකු ගැට්ටක් ඇති පිදුරු තොප්පියක් පැලඳ සිටි ඔහුගේ උරහිසේ කඹයක් ද, බඳපටියට සම්බන්ධ වූ පොරොවක් ද විය. පසෙකින් කෙට්ටු එළුවෙකි. ඌ මා කෙළ ගැසූ මිදි පොතු කමින් සිටි.





"උඹට ඇහෙන්නේ නැද්ද? උඹ කවුද, මේ දැන් ම කියාපන්! හිතුව ද ඔහොම සමූහ ගොවිපොළේ ගහකට නැගලා මිදි කන්ඩ පුළුවන් කියලා? මොකෙක් ද උඹ භූතයෙක් ද? වහා ම කියාපන්?"

"ආන් හරි, මං භූතයෙක් තමා."

"උඹ තුන් සැරයක් ම භූතයෙක් වෙච්චාවේ! උඹ දැනගන්ඩ ඕනෑ සමූහ ගොවිපොළේ වගාවල් කියන්නේ හැම බඩගිනි බැල්ලිගෙ පුතකුට ම මිදි කඩාගෙන කන්ඩ පුළුවන් ආදම්ගේ උයනක් නෙවෙයි කියලා! බහින්ඩයි කිවුවේ දැන්ම ම, නැත්තං උඹ වැටෙනකං මං ගහ හොල්ලනවා!"

"වඩා හොඳයි නෙව උඩට ඇවිත් මා එක්ක පොඩි කතා බහක් දාන එක!"

"බැහැපන් බිමට කිවුවම!"

"මම බහින්නෙ නෑ!"

"බහින්නෙ නැද්ද?'

"ජීවිතේට බහින්නෙ නෑ!"

"හොඳා බලමු එහෙනං. ගහට ම වෙලා හිටපන්. බලමු උඹ කොච්චර කල් ඉඳී ද කියලා. මට කිසි හදිස්සියක් නෑ."යි ඉලිකෝ කීවේ ගස යටින් හිඳ ගනිමිනි. යාන්තමින් හෝ කනස්සලු නොවූ මම දිගට ම මිදි කෑවෙමි.

පැයක් ගෙවිණි. අන්තිමේ ඉලිකෝ මට හඬගෑ ය.

"ඒයි භූතයා, උඹ උඩටවෙලා මොකද කරන්නේ?"

"මම මේ මට කූඩුවක් හදනවා," මම පිළිතුරු දුනිමි.

"උඹ සමාදානෙන් බිමට බැහැලා මට උඹව කාර්යාලෙට එක්ක යන්ඩ අරින එකයි වඩා හොඳ."

"මගේ බඩ පිරෙනකං ඒක වෙන්නෙ නෑ."

"උඹ මනුස්සයෙක් ද නැත්තං මිදි මිරිකන මැසිමක් ද? වහාම බිමට බැහැපන්!"

"මම බහින්නෙ නෑ!"

"එතකොට උඹ බලධාරීන්ට අවනත වෙන්නෙ නෑ, එහෙනං?"

"ඔව්!"

"බොහොම හොඳා එහෙනං, මේ කඹෙයි පොරොවයි අරගෙන උඹ ම වගාව මුරකරපන්."

"ඔහේ මොකෝ මේ මට වද දෙන්නේ? තමුන්ගේ වැඩක් බලාගෙන යනවාකෝ!"

"මම මේ අන්තිම අවවාදය දෙන්නේ. වහාම නොබැස්සොත් මම මිනිස්සුන්ට ඇහෙන්ඩ කෑගහනවා." ඒ මොහොතේ ම, ගසක එල්ලා තිබූ මගේ පොත් මල්ල ඉලිකෝ දුටුවේ ය.

"හො හෝ! දැන් මං උඹව අල්ලා ගත්තා. මං පටස්ගාලා හොයා ගන්නං උඹ කවුද කියලා."

හරිබරි ගැසී බිම හිඳගත් ඉලිකෝ පොත් මල්ලේ මුල්ලකින් අල්ලා එහි වූ දෑ බිමට හැලුවේ ය.

"ඩිකාමෙරොන්..."යි මහ හඬින් කියැවූ ඔහු ඒ පොත පසෙකට කළේය. "වානේ පන්නරය ලැබූ හැටි... මිනිමස් බුදින්නන් මැද තනිව... ට්‍රිස්ටන් සහ අයිසොල්ඩේ... කොටි හමක් පෙරවූ නයිට්වරයා... උඹ කවුද හැබෑට ම ඉලව්වේ? මල්ලේ එක ම පැන්සලක්වත්, ලියන පොතක්වත් නැති උඹ මොන ජාතියේ ශිෂ්‍යයෙක් ද?" මා හඳුනාගැනීමේ මඟ ලුහුටා ගිය බව පෙනීමෙන් කෝපයට පත් ඉලිකෝ කී ය.

"ඒ මේ මම, සුරිකෝ, ඉලිකෝ මාමේ!"

"ඈ... බොල උඹව පුපුරලා යන්ඩ එපායැ, සාපලත් තක්කඩියා! උඹ මාව පිස්සු වැට්ටුවා! දැන් ඉතිං මට ලොකුවයින් මිදි වලු දෙකකුත් කඩාගෙන විගහින් බිමට බැහැපන්!"

ගසින් බැස්ස මම ඉලිකෝ වැළඳගතිමි.

"කොහොම ද කාරණා කටයුතු ඉලිකෝ මාමේ?"

"අහපල්ලකෝ, අහන්නේ එයා, ලැජ්ජා නැති බලු දණ්ඩා! මුළු පැයක් ම මා එක්ක හැංගිමුත්තං කළා! ඒකෙන් හොඳ ම වාසනාවක් නැතුව ගියා!"

"මොන වාසනාවක් ද?" ගැටලුවට පත් මම ඇසුවෙමි.

"උඹ දන්නවනේ පහුගිය මාස හයක ඉඳන් සමූහ ගොවිපොළේ මුරකාරයෙක් හැටියට මං වැඩ කරනවා කියලා?"

"ඔව්, මං දන්නවා, ඉතිං ඒකේ ඇති දේ මොකෝ?"

"ඉතිං මට අශ්වයෙක් ව දුන්නා... ඒකා අස්සයෙක් නෙවෙයි යක්ෂ ප්‍රතිරූපයක්. දවස් කීපෙකට ඉස්සෙල්ලා නොණ්ඩි සිනිටෝගේ එළදෙන වගාවට වැදුණා. මං අස්සයා පිටෙන් පැනලා එළදෙනව වලිගෙන් අල්ලා ගත්තා. එහෙම කරලා අනිත් පැත්ත බලනකොට මෙන්න අශ්වයා හැල්මේ යන්ඩ යනවා. ඉතිං මං ඌ පස්සේ පන්නලා යාන්තං අල්ලා ගත්තා. ඒ අව් අස්සේ එළදෙන ඉබාගාතේ යන්ඩ ගිහිං. ඉතිං මං අස්සයා අත ඇරලා එළදෙන





පස්සේ දිව්වා. එළදෙනව අල්ලා ගත්තා. ඒත් අස්සයා නෑ! ඒ ගමන එළදෙන අතෑරලා අස්සයා පස්සේ දිව්වා. ඒත් එතකොට එළදෙන නෑ. වෙන විදිහකට කිවුවොත් මුළු දවස පුරාම මං එළදෙනගේ ළඟ ඉඳලා අශ්වයා ළඟටයි, ආයෙත් අනෙක් අතටයි දුව දුවා උන්නා. බොරු නං මගේ දිව එළියට ඇදෙන්ඩ ඕනෑ. අන්තිමේ මුං දෙන්නා ම මගෙන් ලුහුටලා ගියා. ඒ අස්සේ රීයේ සභාපති මට දෝස් මුරයක් දැම්මා. එයා කියනවා එක්කෝ මං රාජකාරිය සිහිකල්පනාවෙන් කරන්ඩ ඕනැලු නැත්තං මාව පොට්ටනි ගහලා යවනවා කීවා."

"ඉතිං ඒකෙන් මට තියෙන කාරිය මොකක් ද?"

"ආන් ඒක තමා. මෙතන ගහ උඩ හොරෙක් ඉන්නවා කියලා දුටුව වෙලේ, මං හිතුවා, මගේ වටිනාකම පෙන්නන්න හොඳම වෙලාවක් තමා කියලා. මම හොරාව අල්ලගෙන කාර්යාලෙට අරගෙන යනවා. එතකොට බලමු සභාපති කියයි ද කියලා මං හරියට රස්සාව කරන්නේ නෑ කියලා. ඒත් නුඹ ඒ ඔක්කොම නරක් කළා."

"හොඳා, ඇයි ඉතිං මාව කාර්යාලෙට ගෙනියන්නෙ නැත්තේ?"

"නුඹට පිස්සු වැහිල ද? නුඹට ඕනෑ නුඹේ අත්තම්මා ලවා මගේ එකම හොඳ ඇහැත් දොට්ට ගන්ඩ ද?"

"ඉතිං දැන් මොකක් ද කරන්නේ?"

"මම මේ එළුව ව සභාපති ගාවට ගෙනියනවා. එයා ඌ එක්ක කැමති දෙයක් කරගත්තාවේ."

"ඒත් මේ කාගෙ එළුව ද?"

"කාගෙ එළුව ද කියලා අහන එකේ තේරුම මොකක් ද? ඒකි මගේ! ඒකිව මීට කලින් දැකලා නැද්ද?"

"ඒත් ඒකට රැවුළක් තිබුණා නේද?"

"තිබුණා තේන්නං. මං ඒක කපලා දැම්මා."

"ඒ මොකට ද?"

"මිනිස්සුන්ට ඌ මගේ කියලා අඳුනාගන්ඩ බැරිවෙන්ඩ. මුරකාරයෙක් එයාගෙ ම එළුවා අල්ලාගන්න එක හරි නැහැ නෙව."

"ඔහේට ඌව ඕනෑ නැද්ද?"

"මොන එහෙකට ද? මේකගෙන් මට මෙලෝ පලක් නැහැ. කැමති නං ඌට කිරි බොන්ඩ දෙනෑකි, ඒත් උගෙන් නං කිරි බිංදුවක් ලැබෙන්නෙ නෑ. මසට විකුණන්ඩත් බෑ, ඒ තරමට ඇට ගැහිලා. වියදම ඇරෙන්ඩ වෙන මොකවත් බලාපොරොත්තු වෙන්ඩ බෑ."

"ඒකිව අඳුනගත්තොත් හෙම මක් වෙයි ද?"

"කොහෙත් ම නෑ. මෙකා මගේ ද කියලා මටවත් අඳුනාගන්ඩ බැරි තරමයි… හොඳා, උඹ යන අතක පලයං පුතේ, බොහොම ස්තුතියි මේ මිදිවලට. මගේ උගුර ඒ තරමට වේළිලා තිබ්බේ!"

"ආයුබෝවන් ඉලිකෝ!"

"හොඳා ආයි හම්බවෙමු. මේ ගැන ඉලේරියන්ට හෙම දොඩෝනවා නෙවෙයි, ඒකා මාව විනාස කරලා දාවි." ඉලිකෝ අයැදී ය.

"ඒ ගැන බය වෙන්ඩ එපා ඉලිකෝ, මං කියන්නෙ නෑ."

මසකට පසුව ඉලිකෝගේ විශිෂ්ට සේවය වෙනුවෙන් සමූහ ගොවිපොළ පාලක මණ්ඩලය විසින් එම එළුවා ම ඔහුට තෑගි කරන ලදී. ඒ වන විට උගේ ඇටසැකිල්ල මත මස් ටිකක් වැඩී තිබිණි.

## පොදු රැස්වීමක්

අපේ ගම අසල කන්දක හුදකලාවේ වැඩුණු ෆර් ගසක් තිබේ. ගලවා දැමූ පරණ පල්ලියට අයිති සීනුවක් එහි එල්ලී තිබේ. මේ පල්ලිය දැන් ගලවා දැමූ එකකි. උදෑසන දී එය පාසල් යෑම සඳහා නාද කෙරෙයි. සවසට එය නාද කෙරෙන්නේ එක්කෝ ගින්නක් ගැන අනතුරු හැඟවීමට හෝ සමූහ ගොවිපොළ ගොවීන් රැස්වීමකට කැඳවීමට ය.

පවුලේ සිටි එක ම පිරිමියා මා වූයෙන් නිතර ම මට එවන් රැස්වීම්වලට ඇරයුම් ලැබේ. එහෙත් මට අයිති එක් තීරණාත්මක ඡන්දයක් පමණකි.

එදින හැන්දෑවේ සීනුව නාද විය. ගින්නක් හෝ දුමක් දකින්නට නැති නිසා, එහි අදහස පොදු රැස්වීමකට මිනිසුන් කැඳවන බවයි.

"නුඹ එනව ද සුරිකෝ?" ඉලේරියන්ගේ කටහඬ ඇසුණි.

"ඔව් ඉලේරියන්, මං එනවා!"යි කෑගැසූ මම දඬුවැට උඩින් පැන්නෙමි. ඊළඟ මොහොතේ මම ඔහු පසෙකින් හුනිමි.

"රැස්වීම මොකට ද කියලා දන්නවා ද?" මම ඇසුවෙමි.

"දැනගන්ඩ ඇත්තේ මොනව ද? ආයෙත් ඉතිං කාර්යාලෙ ගැන වෙන්ඩැති."





අප ළඟා වන විටත් රැස්වීම ඇරඹී තිබිණි. පසුපස පේළියේ හිඳගත් අපි සවන් දුනිමු. කථිකයා වූයේ, රැස්වීමේ සභාපතිත්වය දැරූ සමූහ ගොවිපොළේ ගණකාධිකාරිවරයා ය.

"ඉතිං කාරණේ මෙහෙමයි, ගැමියනි! අපි අව්ක්සෙන්ටි සභාපති හැටියට තෝරාගත් වෙලේ එයා අණකළා කාර්යාලය ගලවලා එයාගේ ගේ කිට්ටුවට ගෙනියන්න කියලා. ඊළඟට ඔබට මතක නම්, අපි සභාපති හැටියට තෝරා ගත්තේ කිරිල්ව. එයා කාර්යාලය අලුත් තැනකට මාරු කළා. ගිය අවුරුද්දේ කාර්යාලය තිබුණේ දිමිත්‍රිගේ ගේ ඉස්සරහා. එතකොට දැන් අපේ අලුත් සභාපති ෂල්වා ඉල්ලා හිටිනවා ඒක එයාගෙ ගෙදරට ගෙනියන්න කියලා. කාට හරි කියන්න මොනවා හරි තියෙනවා ද? හැබැයි එක කථීයෙක් විනාඩි පහකට වැඩිය ගන්ඩ එපා කියලා මම අවවාද කරනවා. මම දන්නවා ඔහේලාගේ හැටි. ඔහේලා මෙතනට ආවහම කිසි කෙනකුට එළවා ගන්ඩ බෑ…"

"මට ප්‍රශ්නයක් තියෙනවා!"

"කතා කරන්න ට්‍රිෆොන්!"

"ගරුතර ෂල්වා, ඔහේ වැඩිය කැමති මොනොකට ද – අලුත් කාර්යාලයක් ඔහේගේ ගේ ඉස්සරහ හදන්ට ද, නැත්තං පරණ එක ගලවං ඇවිත් අලුත් වහලක් ගහන්ට ද?"

"ට්‍රිෆෝන් සිකරුලිඩ්සේ!" සභාපති බෙරිහන් දෙමින් උඩ පැන්නේ ය. "මෙක හිනාවට ගන්ඩ එපා. නැත්තං මං තමුසෙව නියම තැන තියනවා! කාර්යාලය ගලවලා මගේ ගේ ඉස්සරහට ගේන්න ඕනෑ. ඒක පැහැදිලි ද? එහාටයි මෙහාටයි ගාටලා මට කාලෙ නාස්ති කරන්ඩ බෑ! මං උදේ පාන්දරින් පිටත් වුණත් හැන්දෑ වෙද්දී කාර්යාලෙට ළඟා වෙන්නෙ නෑ!"

"ටිකක් වේගෙන් ඇවිදිනවා ෂල්වා!"

"කවුද ඒක කීවේ? එනවා ඉස්සරහට කවුද බලාගන්ඩ!"

"සහෝදරවරුනි, වල්පල් කියෙව්වා ඇති! තව ප්‍රශ්න තියෙනව ද?"

"මට එකක් තියෙනවා,"යි කී මකාරි සිය ස්වර තන්තු කැඩෙන තරම් බලවත්ව උගුර පෑදී ය.

"කියන්ඩ මකාරි!"

"මං ගිය අවුරුද්දේ සැම්-ට්‍රෙඩියාවල ඉඳලා ගෙනාපු උසස් පෙළපතේ වැස්සිට මොක ද වුණේ?"

"අනේ අසරණී අපේ ගරුතර සභාපතිට පුතෙක් දෙන්ඩ තරං කල් ජීවත් වුණේ නෑ."

"කවුද ඒක කියාපු එකා? නැගිටපිය හොරා. මිනිස්සු කේන්ති ගස්සන එකා!"

"මට යෝජනාවක් තියෙනවා! කරන්ඩ ද?" ඉලේරියන් ඇසී ය.

"ඉලේරියන්ට ඉඩ දෙනවා!"

"සහෝදරවරුනි, එක එක දේ ගැන ශෝකවෙන එකේ ඇති පලක් නෑ. වැස්සිට මොක ද වුණේ, ගොඩනැගිලි ද්‍රව්‍ය සභාපතිගෙ ගේ හදන්ඩ වියදං කළේ මොකට ද, ගොවිපොළේ වයින් කොහොම ද සභාපතිගෙ කල්දේරම්වල තිබිලා හම්බ වුණේ වගේ දේවල්... ඒවයේ ඇති පලේ මොකක් ද? මේ වගේ දේවල් මිනිස්සු දැන ගත්තොත් හෙම අපි මුළු දිස්ත්‍රික්කෙම හිනාවට ලක්වේවි... කුණු යට ඇඳුම් ප්‍රසිද්ධියේ හෝදන්නෙ කවුද?"

"ඉලේරියන් වහාම ඉඳගන්නවා! අපහාසෙට මං තමුසෙට නඩු දානවා!"

"මිනිහාට කියලා ඉවරකරන්ඩ දෙනවා! එයා කියන්නෙ ඇත්ත මිසක් වෙන මොකුත් නෙවේ!" ඉලිකෝ මැදිහත් විය.

"මගේ යෝජනාව මේකයි: ඇයි සභාපතිගෙ ගේ ගලවලා ඒක කාර්යාලෙ ළඟට අරන් එන්න බැරි?"

"එයාගෙ ගෙදරට අලුත් වහලක් ගැහැව්වා විතරයි. ඉතිං කොහොම ද ඉලේරියන් ගේ ගලවන්නේ?"

"එහෙනං අපි සභාපතිව කාර්යාලෙට මාරු කරලා එයාගෙ ගේ කාර්යාලෙට ගනිමු!"

"තමුසෙට පිස්සු වැහිල ද?" සභාපති පුපුරා හැලුණි. "අර කුණුවෙච්ච මඩුව වෙනුවට මගේ අලුත් අපූරු ගේ මාරු කරන්ඩ!"

"එහෙමනං මට තව යෝජනාවක් තියෙනවා! අපි සභාපතිගේ ගේ ගලවලා කාර්යාලය තිබුණු තැන හදමු, ඊට පස්සෙ කාර්යාලය ගලවලා ගේ තිබුණු තැන හදමු."

"තැන් මාරු වුණා කියලා එකතුවේ වෙනසක් නෑ," ගණිත ගුරුවරයා කී ය.

"ඔච්චර තමා. ඊට වඩා දෙන්ඩ යෝජනා මා ළඟ නෑ,"යි කී ඉලේරියන් හිඳ ගත්තේ ය.

"මට තව එකක් තියෙනවා," මාගරිටා වන්තුරියා කීවා ය. "ටබිලිසිවල ඉඳලා හෙට මෙහේට සංචාරක කණ්ඩායමක් එනවා.





සමාජ ශාලාවක් හදන්ඩ තිබුණු ගොඩනැගිලි ද්‍රව්‍ය සභාපතිගේ ගෙදෙට්ට ගිය හින්දා, මං යෝජනා කරනවා ප්‍රසංගය එයාගෙ ගෙදර තියන්ඩ ඕනෑ කියලා."

"තමුන්ව කණ්ඩායම් නායක හැටියට පත්කරාපු ගුණේ තමා ඔය!"

"මට ප්‍රශ්නයක් තියෙනවා." කවුදෝ කී ය. "ඉස්කෝලෙ ගොඩනැගිල්ල අලුත්වැඩියා කරන්ඩ සභාපති බලාපොරොත්තු වෙන්නෙ කවද් ද? පන්ති කාමර කඩාවැටෙන්ඩ ඔන්න මෙන්න."

"එයාට පන්ති කාමරවලින් ඇති පලේ මොකක් ද? එයා හදමින් ඉන්නේ පන්ති සමාජයක්!" ඉලේරියන් ප්‍රකාශ කළේ ය.

සභාපතිවරයා සුදුමැලි විණි. කලබැගැනිය වැඩිණි.

"මට හොඳ යෝජනාවක් තියෙනවා." ඉලිකෝ අතක් ඔසොවමින් කී ය.

"කතා කරනවා!"

"මිතුරනේ, අපි ආයෙත් ප්‍රශ්නෙන් ඇත්වෙලා: ඒ කියන්නේ කාර්යාලය කොහේ ද තියන්නේ කියන එක."

"මොකක් ද ඔහේගේ යෝජනාව?"

"කාර්යාලය කොහෙත් ම ගලවලා අයින් නොකර හිටියොත් මොක ද? සම්මාදමක් එකතු කරලා අපි අපේ සභාපතිට කාර් එකක් ගත්තොත් මොක ද?"

"ඒක නං කොහෙත්ම හරියන්නේ නෑ! ඔහේට ඕනෑ අපිව සම්පූර්ණයෙන් වනසන්ඩ ද? අනතුරක් හෙම වුණොත් මොනවා කරන්ඩ ද, දෙවියෝ කමත්වා! අසරණ අනාථ අපි මොනවා කරන්ඩ ද සභාපති නැතිව? හැමදාම උදේට හොඳ හයිය හත්තිය තියෙන දෙන්නෙක් එයාගෙ ගෙදරට යවලා එයාව කාර්යාලෙට උස්සාගෙන එක වඩා හොඳයි."

"එයා අපිව ඌරු පිටේ දක්කන එක මදිවාට ද, තව අපිට එයාව දැන් උස්සාගෙනත් යන්ඩ වෙලා ද?"

"හොඳා හොඳා, එහෙනං තව යෝජනාවක් තියෙනවා... කෝ අපේ රියදුරා?"

"මං මෙතන ඉන්නවා, ඉලිකෝ!"

"ඉතිං කොහොම ද, ඔහේගේ කාර් එක හොඳින් ද?"

"ස්තූතියි, කාර් එකයි මායි දෙකම හොඳින්... කොහොම ද ඔහේට?"

"ස්තුතියි. කියන්ඩ වැරැද්දක් නෑ. ඔහේ ගාව වැරදිලාවත් අමතර රෝද හතරක් හෙම ගන්ඩ නැද්ද?"

"ඔහේට රෝද මක් කරන්ඩ ද?"

"අපි කාර්යාලෙට රෝද හයි කරලා එහාටයි මෙහාටයි තල්ලු කරන්ඩයි යන්නේ!"

මුළු සභාවම සිනාවෙන් පුපුරා ගියේ ය.

"ඉලිකෝ විගොගිඩ්සේ!" තර්ජනාත්මකව ගුගුරමින් සභාපති නැගිට්ටේ ය. "අද හැන්දෑව උඹ හොඳට මතක තියාගනින්... උඹ මගේ මූණට කෙළ ගැහැව්වා, ඒකට කනගාටු වෙන්ඩ උඹ ජීවත් වෙයි ද බලමු!"

"සන්සුන් වෙන්ඩ ආදරණීය ෂල්වා, සන්සුන් වෙන්ඩ... මං ඔහේගෙන් ඉල්ලුවේ තැපැල්කාරයෙක් කරන්ඩ කියලා, ඔහේ ඒ වෙනුවට මාව මුරකාරයෙක් හැටියට පත් කළා... මං වගේ එක ඇහැක් තියෙන එහෙකුට, ආබාධිතයකුට ඊට වඩා නපුරු දඬුවමක් බෙදන්ඩ ඔහේට පුළුවන් ද?"

"උඹට ඕනෑ මං ලවා උඹව සභාපති කරවන්ඩ ද?"

"මොකෝ බැරි? ඔහේ හිතන්නේ මටත් මගේ ගේ සමූහ ගොවිපොළේ ගඩොල්වලින් හදාගන්ඩ බෑ කියල ද? ඔහේ හිතන්නේ මගේ කැම රුචිය ඔහේට වඩා නරකයි කියල ද?"

සභාපතිවරයාට උත්තර නැතිව ගියේ ය.

"මොකක් ද සභාවේ තීරණය?" ගණකාධිකාරිවරයා ඇසී ය.

"මං කතා කරන්ඩ ද? මට යෝජනාවක් තියෙනවා!" මගේ නිර්භීතකම ගැන බියපත් වෙමින්ම මම අවිචාරී ලෙස කීවෙමි.

"කට වහගනින්, හොටුවා!" හැම පැත්තකින්ම මා නිහඬ කරන්නට උත්සාහ කෙරිණි.

"එයා කතා කරපුවාවේ!" ඉලිකෝ කෑගැසී ය. "රැස්වීමේ කාටත් තමන්ගෙ දේ කියන්ඩ අයිතිය තියනවා!"

"හොඳා එහෙනං කතා කරපන් තක්කඩියා!" සභාවෙන් කටහඬවල් පැමිණියේ ය.

"මට යෝජනාවක් තියෙනවා... මුළු ගම ම මෙතනට එක්කහු වෙලා තියෙන හින්දායි, රැස්වීම ඉවරවේගනත් එන හින්දායි... ඔක්කෝටමත් වඩා තීරණයක් නැතුව අපට යන්ඩ බැරි හින්දායි..."

"පඳුරට තළන එක නවත්තාපන්! යෝජනාව කියාපන්!"





"අනේ මට බොන්ඩ වතුර වීදුරුවක් දෙනව ද?" මම අසීරුවෙන් කියා ගතිමි. මගේ උගුර හිටි හැටියේ ම වියළී ගොසිනි.

"ඒකාට වතුර වීදුරුවක් දීපල්ලා, ඔය කාඩයා නැතිවෙලා යන්ඩ!"

දිය බඳුනෙන් අඩක් කලබලයෙන් තොරව බීවූ මම තොල් පිසදා දිගට ම කතා කළෙමි:

"අපිට සාමූහික තීරණයකට එන්ඩ බැරි බව ජේන්ඩ තියෙන හන්දා..."

"තක්කඩියා, ඕක කොටින් කියාපන්! අපේ ඉවසීම හිඳෙනවා..."

"මං යෝජනා කරනවා අපේ පරණ සභාපතිව පොට්ටනි ගහලා එළවලා දාලා කාර්යාලෙ කිට්ටුව ජීවත් වෙන කෙනෙක් ව අලුතින් සභාපති කරමු කියලා."

ගැඹුරු නිහැඬියාවක් ඒ හා සමඟ ම ඇති විය. හෙණයක් වදිනු ඇතැයි මම බලාගෙන සිටියෙමි. මගේ දණිස් වෙවුලී ය.

හෙණය පිපිරුණි. මගේ යෝජනාව මහත් ඝෝෂාවකින් යුතුව අනුමත කෙරිණි. පොදු රැස්වීමක දී ම විසින් සිදුකළ පළමුවැනි යෝජනාව ඒකමතිකව ස්ථිර විණි.

"අන්තිමේ, දෙවියන්ට ස්තුති වේවා, අපි ගාව මොළේ තියෙන එකෙක්වත් උන්නු එකට. එයා නැත්තං අපි මෙතන ලෝක විනාස වෙන දවස වෙනකම් ම ඉඳගෙන ඉන්ඩ තිබුණා. අපි හෙට අලුත් සභාපතිව තෝරා ගන්නවා. එහෙනං දැන් රැස්වීම අවසානයි!"

ඉලේරියන් මා වෙත පැමිණ මගේ නළල සිප ගත්තේ ය.

## කබා, සපත්තු සහ මේස්

ඒ අවුරුද්දේ සිසිරය ඉතා රෞද්‍ර එකක් විය. මුළු කාලය පුරා ම හිම වැටිණි. බිත්තිවල සෑම සිදුරක් සහ පැළුමක් ම තුළින් සීතල සුළඟ කා වැදුණි. අත්තම්මා ඒවා රෙදි කැබලිවලින් වසා දැම්මා ය. රෙදි කැබලි ඉවර වූ විට ඈය මගේ ගෙදර වැඩ ලියන පොත් ඊට යොදා ගත්තා ය. මගේ අධ්‍යාපනික අසමර්ථතා කියැවෙන ඒ ලැජ්ජාකාරී ලිපි ලේඛන වඳකර දැමීමට මම කොතරම් සතුටින් ඇයට උදවු කළේ දැයි ඔබට සිතාගත නොහැකි ය.

අන්තිමේ මුළු නිවෙසේ ම වූ පැළීම් හා හිල් වසා දැමිණි. ගෙතුළ උණුසුම රැඳුණි. එහෙත් ගෙන් පිටත හිම කුණාටුව වියරුවෙන් නැටී ය. අත්තම්මාත් මමත් උදුන අසල හිඳගෙන සිටියෙමු. මට කතාවක් කියමින් සිටි ඇය, මා අසා සිටින්නේ දැයි ඉඳහිට නෙතු හෙළා බැලුවා ය. මම කම්මැළි ලෙසින් මගේ ම වූ සිතුවිල්ලක ගැලී පැතලි ලෙවිෂ් පාන් ගෙඩියක් හැපුවෙමි. තරුණ කුමාරයා මුරකරුවන් මරා දමා දියමන්ති මාලිගයේ ගුප්ත දොර වෙත පැමිණියේ ය. එහි සිරගත කොට සිටි ලස්සන කුමාරිය සිපගන්නට ඔහු සැරසෙනවාත් සමඟ ම, ගෙය පිටතින් කවුදෝ අඩි තබා එන හඬ පැමිණියේ ය. "කවුද?" ආතම්මා ඇසුවා ය.

මම ජනේලයෙන් බැලීමි. ඉලිකෝත්, ඉලේරියනුත් තම කබාවලින් සහ තොප්පිවලින් හිම ගසාලමින් දොරකඩ උන්හ. මම දොර හැර ඔවුන් ගෙතුළට කැඳවීමි.

"සුබ සැන්දෑවක්!"යි ඉලේරියන් කීවේ අලුත් හිම සපත්තු යුවළක් මුල්ලට වීසි කරමිනි.

"කොහෙන් ද ඉලේරියන් මේ හිම සපත්තු ගත්තේ?" මම ඇසුවෙමි.

"උදේ ඉඳලා හිම වැටෙනවා. නුඹ කොහොම ද ඉතිං ඉස්කෝලේ යන්නේ? ඕවා දාලා බලාපන් මෝඩයා! ඒවා උඹටයි ගෙනාවේ..."

ඉලේරියන් වැළඳගත් මම ඔහුගේ රැවුළු තුඩු ඇනෙන, සීතල කොපුල සිපගතිමි. ඉක්බිති මම ආයාචනාත්මකව ආතම්මා දෙස බැලුවෙමි. අවබෝධාත්මක සිනාවක් පෑ ඇය, අමාරුවෙන් නැඟී සිට රහස් ගබඩාව දෙසට ගමන් කළා ය. කුමක් හෝ හේතුවක් නිසා ඇය එයට කීවේ 'කැෂියරය' කියා ය. මිනිත්තුවකට පසු නොලැස් මෙසයක් උදුන අසල සූදානම් කෙරිණි. ඒ මත වොඩ්කා බෝතලයක්, මිදි සිරප්වල බහා තැම්බූ රටකජු, පැණිරස කැම, ඇපල් සහ පෙයාර්ස් සහිත පිඟානක් යන දෑ විය.

"අනේ මොකට කරදර වෙනව ද ඔල්ගා හාමිනේ. අපි මේ පොඩි කයියක් ගහලා යන්ඩ ආවා විතරයි!" ඉලේරියන් කී ය.

"අනේ එහෙම ද, නුඹලා කැමති නැත්තං ඉතිං එහෙනං මං මේ ඔක්කොම ගෙනියන්නං,"යි කී අත්තම්මා බෝතලය වෙත අත දිගු කළා ය.

"උඹට එපා නං නිකා ඉඳින්, කවුරුත් බල කරන්නෙ නෑ. ඒත් අනුන් වෙනුවෙන් උඹ හොට දාන්ඩ එපා,"යි ඉලේරියන් වෙත ගිගිරූ ඉලිකෝ බෝතලය ඩැහැ ගත්තේ ය.





"මොනවා, නුඹ වොඩ්කා බොනව ද?" ඉලේරියන් කීවේ ඔහුගේ මුහුණේ දූරාතීත අද්භූත සත්ත්වයකු දුටුවා වැනි පුදුමයක් මුහුණේ රඳවා ගනිමිනි.

"මේ වගේ කාලගුණේක දී උණකටුවක් උණත් ගිලින්ඩ හැකි, එහෙව් එකේ ඇඟ රත්කරගන්ඩ වොඩ්කා වීදුරුවක් බිව්වහම මොකෝ!"යි කී ඉලිකෝ සිය වීදුරුව පුරවා ගති.

"හැබෑට ම හීතලයි නං තමා,"යි කී ඉලේරියන් ද වීදුරුවක් පුරවා බීමෙන් පසු ඇපල් ගෙඩියක් සපන්නට විය. "දැන් බලන්ඩ ඔල්ගා හාමිනේ, මේ ඇපල් සරත් කාලෙදි කොච්චර ඇඹුල් ද කිවුවොත් ඌරෙක් වුණත් එකක් කාලා බැලුවට පස්සේ ආයි නං ඒ දිහා බලන්නෙත් නෑ. ඒත් දැන් බලමුකෝ, ඒවා මෙච්චර රසවුණේ කොහොම ද?"

"නුඹ නං හැබෑටී මිනිස්සුන්ගේ හිඟපාඩු පුරවන්ඩ ම උපන් එකෙක්,"යි ආතම්මා කීවේ කුලුණුබර සිනාවකිනි. "එක වොඩ්කා වීදුරුවක් දුන්න ගමන් සීනි වගේ පැණිරස වෙනවා."

ඔවුහු තවත් වීදුරුවක් පුරවා බීහ. ඉක්බිති තෙවැන්න ද අවසන් කළහ.

"අද තැපැල්කාරයා මාව බලන්න ආවා," එසේ කීවේ ඉලේරියන් ය. "එයා ගෙනාවේ මරණයක් ගැන දැනුම්දීමක්... ගෙරාසිම්ගේ පුතා... එයාට ඒක ගෙරාසිම්ට කියාගන්ඩ බෑ... 'අනේ ඉලේරියන්, ඒක එයාට කියාපන්' කියලා මට කීවා..."

"අපොයි දෙයියනේ! අවාසනාවන්ත තාත්තට මොන දුකක් ද!... අසරණ ගෙරාසිම්!" අත්තම්මා වැලපෙන්නට වූවා ය.

"එයාව කෙර්ච්වලදියි මරලා තියෙන්නේ, අසරණ කොලුවා... ඒ අපේ ගමේ හත්වැනි මරණය..." ඉලේරියන් දිගට ම කීවේ ය.

"ඉතිං ගෙරාසිම්ට කීව ද?" මම ඇසුවෙමි.

"මං කොහොම කියන්ඩ ද? ඒ දුප්පතා පුතා ආපහු එනකං ඇඟිලි ගැණ ගැණ ඉන්නේ, එහෙව් එකේ මං කොහොම ද ඒක කියන්නේ?"

"අපොයි දෙයියනේ, හිට්ලර් මුරුගයාට දඬුවම් දෙනු මැනවි... ඒකාගේ මුළු ජීවිතේට ම කිසිම සතුටක් ඇති කරවන්න එපා. ඌට විතරක් නොවේ, උගෙ මුළු පවුලටමත් එහෙම වේවා!" ආතම්මා දිගට ම වැලපුණා ය.

"දැන් ඉතිං මොකක් ද කරන්නේ?" මම ඇසුවෙමි.

"කරන්නෙ මෙකයි!" ඉලේරියන් තම සාක්කුවෙන් නැමූ කඩදාසියක් ගෙන, එදෙස ටික වේලාවක් බලා සිට සැණින් එය ගින්නට වීසි කළේ ය. ගිනිදැල් ඔහුගේ මුහුණ ආලෝකවත් කළේ ය. රැවුළ කොට ඇති ඔහුගේ කපොල දිගේ විසල් කඳුළු කැට ගලා බැස්සේ ය.

"කොලුවා පණපිටින් ඉන්නවා නං එයා ඉක්මනින් හරි පහුවෙලා හරි ඒවි. එයා හැබැවට ම මැරිලා නං, කොහොම වුණත් එයාගෙ අවාසනාවන්ත තාත්තා එයා එන තුරු ඔය විදිහට ම බලා උන්නාවේ. මිනිස්සු ජීවත් වෙන්නේ බලාපොරොත්තුවලින්. සූරිකෝ, මේ ගැන කට හොල්ලනවා හෙම නෙවෙයි!"

"මම කියන්නෙ නෑ."

"ඔල්ගා!" කටහඬක් පිටතින් පැමිණියේ ය.

"කවුද? ඇතුළට එන්ඩ!"

ග්‍රිගෝරි වෂකිඩ්සේ කාමරයට ඇතුළු විය.

"මෙච්චර හැන්දෑවෙලා ආවාට සමාවෙන්ඩ ඕනෑ, ඒත් මේක හදිසි කටයුත්තක්."

"ඇවිත් ගිනිගොඩ ළඟින් ඉඳගන්ඩ." අත්තම්මා ආගන්තුක සත්කාරීව කීවා ය.

"ඉතිං මොනව ද ආරංචි? කොහොම ද පෙරමුණේ තත්ත්වේ?" ඉලේරියන් ඇසුවේ ය.

"පෙරමුණේ සටන් හොඳින් සිදුවෙනවා. සතුරා ඉදිරියට එන එක නවත්තලා. ක්ෂණික ප්‍රහාරයක් දෙන්ඩ හිට්ලර් කරපු සැලැස්ම වැනසිලා!" ග්‍රිගෝරි දැනුම් දුන්නේ ය.

"පොඩ්ඩක් ඉඳිමු. අපි ඔය ආරංචිය පත්තරයක තිබිලා කියෙව්වා මාසෙකට කලිං. අපිට කියනවාකෝ හැබෑට ම අලුත් මොනව හරි!"

"අලුත්? මට ඔහේලා එක්ක බරපතළ දෙයක් තියෙනවා කියන්ඩ. අහගන්ඩ!"

"කියමු බලන්ඩ." ඉලේරියන් කී ය.

ග්‍රිගෝරි නැඟිට උගුර පාදා, දහස් ගණනක් සිටින රැස්වීමක් අමතන්නා සේ කතා කළේ ය.

"සහෝදරවරුනි! අපේ සමාජවාදී මාතෘභූමිය අනතුරේ! අනුකම්පා විරහිත සතුරා අපේ නිදහසේත්, අපේ ස්වාධීනත්වයේත් ගෙල උගේ ලේ වැකි ගාත්වලින් සිරකරන්ට උත්සාහ දරනවා!





නිර්භීත රතු හමුදාව පොඩි පට්ටම් කරනසුලු පහරවල් එල්ල කරමින් සිටිනවා..."

"ඒයි... පත්තරකාරයෝ අපට බෙදන දේ ම බෙදන එක නවත්තාපන්!" කුපිත වූ ඉලිකෝ බාධා කළේ ය. "කෙළින් කියාපන් ඇයි උඹ ආවෙ කියලා."

ග්‍රිගෝරිගේ මුහුණේ පෙනුම මැලවිණි.

"ඉතිං කියාපන්කෝ මොකෝ?" ඉලේරියන් ඔහු පෙලැඹ වී ය.

"මෙකයි, අපි රතු හමුදා හටයින්ට තෑගි එකතු කරනවා... සමහර විට නුඹලාත් මොනවා හරි දේවි මගෙ හිතේ?" අන්තිමේ ඔහු කියා ගත්තේ ය.

"ඇයි ඉතිං උඹ ඕක කෙළින් ම නොකීවේ පුතේ?" අත්තම්මා සිනාපාමින් ඇසුවා ය.

"මොන ජාතියේ තෑගි ද එකතු කරන්නේ?" ඉලිකෝ ඇසී ය.

"ඕන ජාතියක්: පලතුරු, චොකලට්, උණුසුම් රෙදි, අත්වැසුම්, උණුසුම් මේස්... අද බ්‍රහස්පතින්දා. එනකොට සඳුදාට අපේ ගමෙන් වාහනයක් පුරවලා තෑගි පෙරමුණට යවනවා... ඉතිං ඔහේලා මොනවා හරි පරිත්‍යාග කරන්ඩ කල්පනා කරනවා නං, මෙහේට. ඒ කියන්නේ ඔල්ගා හාමිනේගේ ගෙදරට අරන් එන්ඩ. අපේ කොල්ලෝ හෙට මෙහාට ඇවිත් ඒවා අරන් යාවි."

ග්‍රිගෝරි අපෙන් සමුගෙන යන්නට ගියේ ය.

බොහෝ වේලාවක් තිස්සේ හිඳගෙන හුන් අපි රතු හමුදා හටයින්ට මොනවා තෑගි දිය යුතු දැයි කල්පනා කළෙමු.

මුලින් ම නිහැඬියාව බින්දේ ඉලිකෝ ය.

"මොනව ද මට තියෙන ධනය? මගේ බුර්කා කබාය විතරයි. ඒක ආන් එළියේ දොරකඩ. සූරිකෝ ඒක අරං වරෙන්කෝ!"

විස්මය පත් මම ඉලිකෝ දෙස බැලීමි.

"මොකෝ උඹ මා දිහා ඇස් උඵප්පන්නේ? මං වගේ නාකි බාස් කෙනෙක් එයාගෙ කබායෙන් වෙන් වුණා කියලා මොකද, ලෝකෙ බල්ලට යනව ද?"

මම එසැණින් මගේ දොරකඩ වූ ඉලිකෝ ගේ ලොම් කබාය ගෙන ආවෙමි. එය අලුත් ම එකක් මෙනි. බ්ලැන්කෙට්ටුවක් වෙනුවට එය ප්‍රයෝජනයට ගත් ඉලිකෝ සිය ඇස මෙන් ආදරයෙන් රැකගත් අතර ඉලේරියන්ට හෝ එය ණයට දුන්නේ නැත.

"ගෙනාව ද? එහෙනං ඕක මුල්ලෙන් තියාපන්. නැගි එකතු කරන කට්ටිය ආවහම එයාලට එක දීහං." කබාය දෙස නොබලා ම ඉලිකෝ කී ය.

"අපේ දෙවියන් වහන්සේ ලැජ්ජා වෙන්ඩ ඕනෑ, නුඹෙන් එක ඇහැක් පැහැරගත්ත එකට, ඉලිකෝ. ඇත්තට ම මං දැනං උන්නා උඹට රත්තරං හදවතක් තියෙනවා කියලා. ඒත් මං කොහෙත් ම හිතුවේ නෑ උඹේ ඔය ගිලුණු පපුව අස්සේ රත්තරං කැටියක් ම තියේ ය කියලා,"යි කී ඉලේරියන් හිස කැසුවේ ය. ඉක්බිති පුටුව උඩ නළියමින් හුන් ඔහු හිටිහැටියේ ම උඩපැන නැගිට වේගයෙන් ගෙන් පිටතට දිවුවේ ය.

"මං දන්නවා ලොකු නාස් පොල්ලා කොහෙද ගියේ කියලා." ඉලිකෝ විරිත්තමින් කී ය.

"කොහේ ද?" අත්තම්මා ඇසුවා ය.

"ගෙදර! දන්නෙ නැද්ද එයාගෙ විදිහ? දැන් ගේ අනිත් පැත්ත පෙරළාවි මට වඩා හොඳ දෙයක් දෙන්න. ඒත් දුප්පතා එයාගේ හිස් ගෙයි මොනවා හොයන්ඩ ද?"

විනාඩි පහක් යන්නට පෙර ඉලේරියන් ආපසු ආවේ ය. ඔහු නිහඬව, ඔහු සතු වූ එකම අලුත් බූට් සපත්තු යුගල ඉලිකෝගේ කබාය පසෙකින් තැබී ය.

"උඹට පිස්සු ද නීචයෝ?" ඉලිකෝ උඩ පනිමින් හඬනැළී ය.

"දැන් ඉතිං යමං බං. මුළු රෑ ම මෙහේ ඉන්ඩ ද කල්පනාව?"යි කී ඉලේරියන් දොර දෙසට පා නැගී ය.

...මඳ සර සර හඬකින් මම අවදි වුණෙමි. අත්තම්මා ඇගේ ඇඳ අද්දර හිඳ නිසලව හැඳ ගනිමින් උන්නා ය. ඉක්බිති ඇය ඇඟිලි තුඩින් 'කැෂියර්' වෙත ගොස් ආපසු ආවේ ගෙතුම් කටුවක් රැගෙන ය. එය උදුන අසලින් තැබූ ඇය ඇගේ ඇඳ වෙත ගොස්, මෙට්ටය ඉරා එතුළ වූ ලොම් කැටි කීපයක් එළියට ඇදගත්තා ය. ඉක්බිති බිම එළා තිබූ එළු සම මත වාඩි වූ ඇය ඒවා ගොතන්නට වූවා. ඒ අතර මුළු කාලය පුරා ම ඇය එහාටත් මෙහාටත් වැනෙමින්, ඊට ගැළපෙන සේ ඒකතානමය වූ කිසිවක් සෙමින් මිමිනුවා ය.

දිගු වේලාවක් තිස්සේ මම ඇය දෙස නිහඬව බලා සිටියෙමි. මගේ ඇසේ කඳුළු උනමින් තිබිණි. ගල් ගැසෙන තරම් වූ ඒ සිසිර රැයේ සීතල නිසා වෙවුලන අතින් මගේ අත්තම්මා ගොතන උණුසුම්





මේස් යුවළ හිමිවන ඒ නොදන්නා සෙබළාගේ පින්තූරයක් මවා ගැනීමට මම උත්සාහ දැරීමි.

## කවි ගායනය

අපි නිතර ම මෙන් සිසිර සැන්දෑවන් ගෙවූයේ ඉලිකෝගේ ගෙදර ය. උදුනේ ගින්දර ප්‍රීතියෙන් පට පට හඬ නගයි. බඩගිනි ඇතිකරවන පුසුඹක් විහිදුවමින් තාච්චියේ බෝකන් වර වරයක් ඇති කරන අතරෙහි ගින්න අසල වයින් ජෝගුවක් උණුසුම් වෙමින් සිටගෙන සිටියි. අපි එක්කෝ නාර්ඩි නමැති සෙල්ලම කරමු. නොඑසේ නම් මහ හඬින් පොත් කියවමු. එහෙත් අපි වැඩියක් ම කළේ යුද පුවත් සාකච්ඡා කිරීමයි. අපේ සිත්වල ඉහළින් ම තිබූ එය කිසිදා අප හැර නොගියේ ය: ඒ 1942 සිසිරයයි.

ඉලේරියන් සෝවියට් තොරතුරු බියුරෝවේ නිල වාර්තාව මහ හඬින් කියැවී ය. ඉක්බිති එය නමා තැබූ ඔහු මෙසේ නිවේදනය කළේ ය:

"ඒ තමා හිට්ලර්ගේ අවසානය!"

"මොකද පත්තරේ කියන්නේ, ඉලේරියන්?"

"උන් මොස්කව් දිහාට අඟලක්වත් ඇවිත් නෑ."

"දෙවැනි පෙරමුණ ගැන මොකුත් නැද්ද?"

"මිත්‍ර හමුදාවල කිසි කඩිමුඩියක් නෑ... එංගලන්තේ කපටියි... උන් ඇමරිකාවට කියනවා, සෝවියට් දේශය අමතක කරලා ඒ වෙනුවට උන්ට උදවු කරන්න කියලා."

"එතකොට ඇමරිකාව මොකද කියන්නේ?"

"උන් කියනවා උඹල උඹලගේ වැඩක් බලාගනිල්ලා කියලා!"

"ඒ අව් අස්සේ ජර්මනිය උත්සාහ කරනවා තුර්කියයි ජපානෙයි කැමති කරවාගන්න උන් ස්ටාලින්ග්‍රාදය අල්ලා ගන්න හැටියෙම අපට පහර දෙන්න."

"උන් හිතනවා ඇති හිතුව හැටියේ ස්ටාලින්ග්‍රාදය අල්ලන්ඩ පුළුවන් කියලා මයෙ හිතේ?"

"මං නං තුර්කියේ ප්‍රතිපත්තියට එච්චර කැමති නෑ, ඕං."

"තුර්කිය ද?... උන් මහ කට්ට කපටියි... ජර්මනිය උන් දිහා ඇස් ගහන් ඉන්නවා කියලා පෙනුණොත් උන් තමන්ගෙ ම පස්ස වුණත් හපාකයි."

"තුඹ එහෙම හිතනව ද? මට නං සැකයි."

"මං කියපු විදිහට ඔක්කොම සිද්ධ නොවුණොත් උඹට මගේ රැවුළ බෑවැහැකි."

"එතකොට ජපානේ?"

"ජපානෙ ද? ජර්මනිය ඒක පොලඹෝනවා – උඹ මොකෝ බලා ඉන්නෙ, ඇවිත් පොරේට එක්කහු වෙයන්! – ඒත් ජපානේ කියන්නේ උඹ නං කතා කරන්ඩ හරි එකෙක් තමා! උඹ මොස්කව් ළඟට වෙලා කොච්චර කල් 'කල් බලනවද' කියලා දන්නේ දෙයියො තමා! දැන් ඇවිත් අපට එක්කහු වෙන්ඩලු! ඒකෙන් මට ඇති පලේ මොකක් ද?"

"එතකොට ඒකට හිට්ලර් මොකද කියන්නේ?"

"හ්ම්, හිට්ලර් නේද... හිට්ලර් දැනටමත් ස්ටාලින්ග්‍රාද් අල්ලා ගත්තා කියලා දෙසැරයක් ම දැනුම් දීලා තියෙනවා නෙව. ඒත් ජපානෙ කියන්නෙ කොහෙත් ම මෝඩයෙක් නෙවෙයි. ඔය ජපන්නු ඇවිත් හරි කපටියි... ජර්මාන්නු ඒ ගැන දන්නවා."

"මයෙ හිතේ තුඹ හරි. වීදුරුවක් වක්කරහං සුරිකෝ!"

සාමය වෙනුවෙන් සටන් වදින්නවුන්ගේ ජයග්‍රහණය පතා අපි සව්දිය පිරුවෙමු.

"මං ඊයේ කවියක් ලිවුවා!" මම නොසිතා ම කියා දැම්මි.

ඉලේරියන් කොතෙක් වික්ෂිප්ත වී ද යත් ඔහු අතින් උෟරු මස් කැබැල්ලක් බිම වැටිණි. වයින් පිටි උගුරේ යාම නිසා ඉලිකෝ කුකුළ කුසක් සේ නිල් වී ගියේ ය.

"මොකක් ද තුඹ කීවේ?" ඉලිකෝ යළි හුස්ම ගන්නට සමත් වූ සැටියේ ඇසී ය.

"මම කවියක් ලීවා... යුද්දෙ ගැන!"

ඉලිකෝත් ඉලේරියනුත් එකිනෙකා දෙස බැලූහ.

"එහෙනං අපටත් කියවාපන්!"

සාක්කුවෙන් කඩදාසි කොළයක් ගත් මම, නැගිට, වම් අත්ල දිගු කොටගෙන මහ හඬින් කවිය ගායනා කළෙමි.





දෝහී වූ මහ සතුරු කැළක්
අපේ රටට දුන්නෝ පහරක්.
කිසිදා උන් හට නැත දිනුමක්

දිරියෙන් යුතු අප විරු දරුවන්
හෙමිහිට යුද වැංකිද සමගින්
සිටිතිය පෙරමුණ වෙත ඇදෙමින්.

මව්බිම හඬගා කීවෝතින්
මාගේ රුධිරය හෙළනෙමි මං

කවි කීම අවසන් කළ මම, මගේ මිතුරන්ගේ විනිශ්චය ලැබෙන තුරු කැළඹීමෙන් බලා හුනිමි.

"ඔ... ව... ඒක... ඒක... හොඳ... හොඳ... සද්දයි!" ටික වේලාවක නිහැඬියාවකින් පසු ඉලේරියන් පැය බාගයක් තරම් වේලා අදිමින් කී ය.

"සද්දෙන් එච්චර ඇති කාරියක් නෑ. ඒක මොළොක් විදිහටත් කියන්ඩ පුළුවනි... ඒත් දැන් එයාට මොකද වෙන්ඩ යන්නෙ?" ඉලිකෝ ඇසුවේ මා දෙස අනුකම්පාවෙන් බලමිනි.

"තුඹට ඔය කවි උණ හැදිලා හුගක් කල් ද?" ඉලේරියන් ඇසී ය.

"මාසයක් විතර."

"ඉතිං ඇයි ඕක අපට කලිං නොකීවේ? අපි දැන් මොකද කරන්නෙ? මට උඹේ අසරණ අත්තම්මා ගැන කනගාටුයි. මං දැනං උන්නා තුඹ මේ දවස්වල මොකක්දෝ ගුඩ දේක එරිලා ඉන්න වග." ඉලිකෝ අත වනමින් කී ය.

"දැන් ඉතිං කියහංකෝ කොහොම ද ඕක කරන්නෙ, කවි පද ලේසියෙන් එනවා ද?"

"අපොයි හරි ලේසියෙන්... මං දවසකට කවි අටක් නැත්තං නමයක් හදනවා. සමහර වෙලාවට මට කඩදාසි තිබුණොත් ඊටත් වැඩිය ලියනවා."

"ඒක එච්චර ගොඩක් නෙවෙයි,"යි ඉලිකෝ කී ය.

"අත්තම්මා දන්නව ද?" ඉලේරියන් ඇසී ය.

"නෑ."

"එහෙනං එයාට කියන්ඩ එපා. එයාට කරදර වෙන්ඩ තියෙන දේ මදෑ... නුඹ ගාව තව කවි තියේ ද?"

"ඔව්, ආලය ගැන!"

"එහෙනං කියවාපන්."

මම දෙගිඩියාවෙන් යුතු බැල්මක් ඉලිකෝ වෙත හෙළීමි.

"කමක් නෑ, කියවාපන්, දැන් ඉතිං ඒකෙන් කිසි වෙනසක් ඇති වෙන්නේ නෑ."

මම තවත් කඩදාසියක් සාක්කුවෙන් ගෙන කෝමල ස්වරයෙන් ගායනා කළෙමි.

*රැයයි මේ, බබළයි සඳ ඉහළ අහසේ*
*හිම ද සුළඟ ද කුණාටු ද හමයි දසතේ*
*ගෙයින් පිටතට එමි, සරන්නට අඳුරේ*
*පිටාරව උතුරා ගලන තුරු හද මගේ*
*නිදන්නට නොහැක, මම ප්‍රීතියෙන් වැලපෙමි*
*සිත විකල් වී දැයි කියා බිය වෙමි*

නිහැඬියාව විනාඩි පහක් පමණ පැවතිණි. ඉලිකෝත්, ඉලේරියනුත් වික්ෂිප්තව එකිනෙකා දෙස බැලූහ.

"ඉතිං නුඹ මොකද කියන්නේ?" අන්තිමේ ඉලේරියන් ඇසී ය.

"අන්තිම පදේ හරි ම හැඟීම්බරයි."

"ඒත් එයා කීවේ ඒක ආදරය ගැන කවියක් කියලා, ඒත් ආදරේ ගැන ඒකේ එක වචනයක්වත් නැනේ!"

"කොලුවා ලැජ්ජයි!"

"ඒ තමා කවිත්වය, ඉලේරියන්!" මම පැහැදිලි කරන්නට උත්සාහ කළෙමි. "හැම වචනයක් ම කවිය ඇතුළට දාන්ඩ බෑ."

"පළමුවෙනියට ම ගත්තොත් 'මම පර්සියාවේ ෂා' කවි පෙළට වඩා ඒකෙ කොහෙත් ම කවිත්වයක් නෑ. දෙවෙනියට නුඹ ආදරය ගැන ලියන්ඩ බාරගන්නවා නං අඩුගාණේ ඒක සඳහන් කරන්ඩ ඕනෑ."

"ඔහේ දන්න තරම!" මම පිළිකුලෙන් කීවෙමි. "කෙනකුට රෑට නිදාගන්ඩ බැරි නං, ඔහේ ඇවිදිනවා නං, හිත විකල් වෙලා යනවා නං, ඒක ආදරේ නැතිව වෙන මොකක් ද?"





"එහෙනං මං මේක නුඹට කියන්නම්කෝ යාළුවා: අවුරුදු ගාණකට කලිං ඉලිකෝගේ සිහිය විකල් වුණා. එයා රෑ පුරා ඔහේ ඇවිද්දා... ඒකෙන් කියවෙනව ද එයා ආදරෙන් කියලා?" ඉලේරියන් කී ය.

"කියන්නෙ මොනව ද කියලා දැනගෙන කියාපන් නාකියා." ඉලිකෝ හඬ තලමින් උඩ පැන්නේ ය. "කොල්ලා කොළ කැල්ලක වල්පල් වගයක් කුරුටු ගාලා. තමුසේ මොකට ද මාව ඒකට රිංගවන්නේ? ඒකත් එක්ක මට ඇති වැඩේ මොකක් ද? ඔය කුකවියත් අරන් පලයන් යන්ඩ, මගෝඩියා!" ඔහු ම වෙත කඩා පැන්නේ ය.

"පොඩ්ඩක් හිටිං, අපි ඉස්සෙල්ලම කවිය විස්තර ඇතිව බලමු." ඉලේරියන් ඔහුට බාධා කළේ ය. "දැන් මෙහේ බලාපන්, නුඹ එක ජේළියක කියන්නේ සඳ බබළමින් තියෙනවා කියලා, ඊළඟ ජේළියේ හිම කුණාටුව හමනවා කියලා. ඒක වෙන්නේ කොහොම ද?"

මෙයින් මගේ නොසැලකිලිමත් බව අසුවිය.

"එහෙනං මේකඃ නුඹට නිදාගන්ඩ බෑ, හුළඟයි, හිමයි, ලෝකය බල්ලාට ගිහින්. එහෙනං මොකට ද නුඹ සතුටු වෙන්නේ? නුඹව සතුටින් අඬවන්නේ මොකක් ද මොට්ටයෝ?"

"උඹලා මොනව ද දන්නේ කවිකම ගැන මෝල්ලුනේ!" මම කෝපයෙන් පිඹිමින් කීවෙමි.

ඉලිකෝ තව වයින් ටිකක් වත් කළේ ය. ඉලේරියන් තම වීදුරුව ඔසොවා, මගේ උරහිස වටා අත යවා මෘදු ලෙස මෙසේ කී යඃ

"මම දන්නවා උඹට මොකක් ද වෙලා තියෙන්නේ කියලා, මගේ කොල්ලෝ... මම දන්නවා ඇයි මිනිස්සු හිටිහැටියේ කවි ගොතන්ඩ පටන් ගන්නේ කියලා... මාත් උඹ වගේ කොල්ලා කාලේ ඔහොම ම කවි ලියන්ඩ පුරුදු වෙලා හිටියා... නුඹට මතක ද ඉලිකෝ?"

*සිටින්නට නොහැකිය සොඳුරිය නොමැතිව*
*ආදරේ ගින්දර මගේ හදවත දවයි*
*මැට්‍රියෝනා ලබන්නට නොහැකි නම් මට*
*දෙන්න මට රයිෆලයක් හා උණ්ඩයක්!*

ඉලිකෝ අනුමත කරන ලෙසින් හිස නමා කොක් හඬලා සිනාසුණි.

"ඔව්, මං හිතුවේ ඔහේගේ සිහිය විකල්වෙලා ගිහින් කියලා. ඒත් ටික දවසකින් හරි ගියා. එයාටත් ඒකමයි වෙලා තියෙන්නේ."

"ආන් එහෙමයි පුතා ඒක. ඒත් නුඹේ කවි ලියවෙන එක නවතින්ඩ දෙන්ඩ එපා... මේක දඬුවං දෙන්ඩ වැරැද්දක් නෙවෙයි... උඹේ ගෑනු ළමයාත්, ඒකිත් උඹ වගේ ම මෝඩ නං, ඒකට කැමති වේවි. ඈ අකමැති වුණත් ඒ ගැන කරදර වෙන්ඩ එපා. ආදරේ කියන මේ පුංචි කුරුල්ලා නුඹේ හදවතේ බිත්තරයක් දාලා. කාලෙ ආවහම පුංචි කුරුලු පැටික්කා බිත්තරෙන් එළියට ඇවිත් ඉගිලෙන්ඩ ඉගෙන ගනීවි. එතකොට නුඹ ආදරෙන් ආතුර වෙලා ලෝකෙ පුරා ඔහේ කරක් ගහවි... එහෙනං ඕන් මගේ පුතේ, නුඹේ ආදරයට!"

ලැජ්ජාශීලී නිහැඬියාවකින් යුතුව ඉලේරියන්ට සවන් දී සිටිද්දී මට දැනුණේ ඔහු මගේ හදවත කුලුණුබරව ඔහුගේ දෑතට ගෙන, එහි ලියැවී ඇති සියල්ල කියවන බවකි.

## පළමු ආලය

"විගොගිඩ්සේ!"

"ඉන්නවා!"

"කාවොන්ඩඩ්සේ!"

"ඉන්නවා!"

"සිකරුලිඩ්සේ!"

"සිකරුලිඩ්සේ අසනීප වෙලා! විකෝතියායි, ටිසෙන්ටිරාඩ්සේයි, බුර්චුලාඩ්සේයි, කොරිඩ්සේයි, තිතිඩ්සේයි, ග්ලොන්ටියි එයා බලන්න ගිහින්."

"නුඹලා ඔක්කෝම එහේ නොගිය එකයි මට පුදුම..." ගුරුවරයා නුරුස්නා ලෙසින් කීවේ ය. "වෂොලොමිඩ්සේ! වෂොලොමිඩ්සේ! ව-ෂ-ලො-මි-ඩ්-සේ!!!" ගුරුවරයා මිටින් මේසයට තඩිබාමින් බෙරිහන් දුන්නේ ය.

"මම ඉන්නවා!"

"උඹ උන්නත් නැතත් වෙනසක් තියෙනවා වගේ හරියට!"

"ඉන්නව ද, නැද්ද, ආන් ඒකයි ප්‍රශ්නේ!" රොමුලි ගාම්භීර ලෙසින් උච්චාරණය කළේ ය.





"රොමුලි කලන්ඩාඩ්සේ, වහාම පන්තියෙන් පිටවෙනවා!"

"එළියේ සීතලයිනේ සර්!"

"තමුසෙගෙ දර පත්ගුවත් අරන් යනවා යන්ඩ!" මම ගුරුවරයාගේ සහායට කීවෙමි.

රොමුලි මා දෙස තීව බැල්මක් හෙළා පිට විය. ඊළඟ මොහොතේ කුණාටුව කඩා වැදුණේ මගේ හිස මතිනි.

"වෂලොමිඩ්සේ අද පැවරුම් මොනව ද?"

"සෝඩියම් බයිකාබනේට්වල ප්‍රයෝජන..."

"මෙහෙට ඇවිත් ඒ ගැන විස්තර කරමු!"

හිඳුණු දිරියෙන් යුතු වූ මම ලැසි ගමනින් කළුලැල්ල වෙත ගියෙමි.

"ඉතිං...?"

"සෝඩියම් බයිකාබනේට් ප්‍රයෝජනයට ගත හැකි මාර්ග බොහෝ තිබෙනවා." මම පටන් ගතිමි. "ඉලිකෝ විගොගිඩ්සේ එයින් බිඳක් දිව අග්ගිස්සේ තියලා වතුරත් එක්ක ගිලිනවා. ඉලේරියන් ෂෙවර්නාඩ්සේ වඩා කැමති ඒවා උණු වතුර වීදුරුවක දියකරලා බොන්නයි. එතකොට අපේ අත්තම්මා..."

"වෂලොමිඩ්සේ, මේ දැන් ම පන්තියෙන් පිටවෙනවා! කවුද මෙයාගෙ ගෙදර ළඟ ඉන්නේ?"

"මම!" මේරි සිකුරුලිඩ්සේ කීවා ය.

"නුඹ පාඩම් ඉවර වුණාට පස්සේ මං දෙන ලියුම එයාගෙ අත්තම්මාට ගෙහින් දෙන්ඩ ඕනෑ... මොකෝ තමුසේ තාම ඔතන හිටගෙන? යනවා එළියට!"

"හොඳමයි, එහෙනං මං යන්නං. ඒත් කවුද පන්තියේ ඉතුරු වෙන්නේ?"

"යනවා..." තීන්ත කුඩුව දෙස ගිජුව බලමින් ගුරුවරයා කෙඳිරුවේ ය.

මම කඩිනමින් එතැනින් දුරීභූත වුණෙමි. කොලොම්බස් ඇමරිකාව දැකීමෙන් සතුටු වූ තරම්ම මා දැකීමෙන් රොමුලි සතුටු වෙතැයි මම සැක කළෙමි.

"උඹටත් පයින් පාර වැදුණ ද?"

"ඔක්කොම උඹ හින්දායි!"

"ඒකත් එක්ක මගේ ඇති සම්බන්දෙ මොකක් ද? උඹ කිසිම දෙයක් ඇහෙන්නෙ දකින්නෙ නැතිව, ඔළුව වලාකුළු අස්සේ

ගහගෙනෙනේ පාඩම මැද්දේ උන්නේ... උඹ හිතන්නේ මං දන්නෙ නැයි කියල ද... උඹ ආදරෙන් බැඳිලා!"

"කා එක්ක ද, මොට්ටයෝ?"

"මේරි එක්ක!"

"ඕක උඹ ආයෙත් කිවුවොත් හෙම දත් ටික බඩට අරිනවා."

"ඒ මොකද මගේ විතරක්? මුළු පන්තිය ම ඒ ගැන කතා කරනවා."

"උඹට පිස්සු වැහිල ද? අවුරුදු දාහතරෙ දී කවුද ආදරේ කරන්නෙ?"

"මොකෝ නැත්තේ? මගේ අත්තම්මා බැඳලා තියෙන්නේ අවුරුදු දාහතරෙදි!"

"ඉතිං, මොක ද?"

"මොකවත් නෑ, උඹ කැමති නං මං අහන්නං?"

"මගේ හිතේ ආදරයක් තියේනං, ඒක මම ම එයාගෙන් අහනවා!"

"උඹ නං මහ ඉලව්වක් බං! ආදරේ කියාපානවා කියන්නේ පාඩමක් කියනවා වගේ නෙවෙයි. කරන්ඩ තියෙන්නේ ලියුමක් ලියන එකයි."

"උඹ කවදා හරි එහෙම ලියුම් ලියලා තියේ ද?"

"නැතුව! කීයක් ද කියන්ඩ බැරි තරං!"

මම රොමුලි දෙස විමසුම්කාරී බැල්මක් හෙළීමි – මෙකා මගේ කකුලෙන් අදිනවාවද්ද? නමුත් ඔහුගේ දෑස් උණුසුම් හා අකපට විය. ඉතිං මගේ රහස සඳහා ඔහු කෙරේ විශ්වාසය රැඳවීමි.

"රොමුලි, උඹ මගේ එක බඩවැල කඩන් ආව සහෝදරයෙක් වගේ... එහෙම එකක් නැහැයි කියන එකේ පලේ මොකක් ද.... මට උදවු කරහං! මං ඈ ගැන හොඳටෝ ම ආදරෙන් බැඳිලා, උඹට ඒක තේරුම්ගන්ඩ පුළුවන් ද?"

රොමුලි මහත් ප්‍රීතියෙන් කොක්හඬලමින්, සිය මුළු ශක්තිය යොදා මා වැළඳ, මා පොළොවෙන් ඉහළට ඔසොවා, ඉක්බිති බිම තබා මෙසේ කීවේය:

"ඔක්කෝම අපූරුවට සිද්ධ වේවි! මං කියන දේ විතරක් කරහංකෝ!"

අපට ඕනෑ තරම් කාලය තිබිණි. අපි හිස් පන්ති කාමරයක් සොයා ගතිමු. මම මේසයට හිඳ ගතිමි. ඒ අතර රොමුලි මට අණ දෙමින් කළුලෑල්ල ඉදිරිපිටින් එහාටත් මෙහාටත් පියවර තැබී ය.



"හරි... දැන් අපි පටන් ගනිමු... 'මගේ වටිනා ආදරිය! ආදරය කියන්නේ ශ්‍රේෂ්ඨ හැඟීමක්. එයින් කෙනෙක් බිහිරි වෙයි, ගොළු වෙයි, අන්ධ වෙයි, එසේ ම පිස්සු වැටෙයි!..."

"ඒක ඇත්ත නෙවෙයි." මම බාධා කළෙමි.

"මම දන්නවා, ඒත් එහෙම තමා කියන්ඩ ඕනෑ... ලියනවා: '...ඔබ මගේ ඇසගැටුණු පළමු දා සිටම සුන්දරත්වයේ පරම සත්‍යය මම ග්‍රහණය ගත්තෙමි. මම පවතින්නේ ඇයි දැයි මම තේරුම් ගත්තෙමි, ආධ්‍යාත්මික සුන්දරත්වයෙහිත්, සෞන්දර්යාත්මක ප්‍රීතියෙහිත් අභිවන්දනය ලෙසින් මට ඔබව දැනිණි..."

"ඒයි රොමුලි, තමුසේ කොහෙන් ද ඔය වචන ඉගෙන ගත්තේ?" මම විස්මයෙන් ඇසුවෙමි.

"ටිබිලිසිවලින් ආව විද්‍යාල ශිෂ්‍යයෙක් මගේ සහෝදරිට ලියපු ලියුම්වලින්. එයා ඈ එක්ක ආදරෙන් බැඳිලා."

"ඈ එයාව බඳින්ඩ ද යන්නේ?"

"එහෙම තමා හිටියේ, ඒත් ටිබිලිසිවල අපේ යාළුවෙක් ලියා එව්වා එයා උන්මන්තකාගාරෙක ඉඳලා තියෙනවා කියලා... හ්ම් ඉතිං ලියනවා: 'මම මගේ ජීවිතයටත් වැඩියෙන් ඔබට ආදරය කරන බව සැඟවීමේ කිසිදු තේරුමක් නැහැ. මගේ ආධ්‍යාත්මික මිතුරිය වෙන්නැයි මම ඔබගෙන් අයැදිමි. ඔබගේ ස්වර්ගීය දෑස්වලින්, ඔබගේ සේදමය ඇසිපියවලින්, ඔබේ මුතුවන් දත්පෙළින්, ඔබගේ පබළු පැහැ තොල්වලින්, ඔබගේ අගස්තිමය වරලසින්, ඔබගේ ඇඟිලිවලින්, ඔබගේ දෑත්වලින් කොටින් ම සම්පූර්ණ ඔබ විසින් මගේ සාමය සොරාගනු ලැබ තිබේ. එක්කෝ ඔබ මට සදහටම හිමි විය යුතු ය, නොඑසේ නම් මා මිය යා යුතු ය. ආයුබෝවන්..."

"හ්ම්... කොහොම ද ඒක?" රොමුලි ඇසුවේ අහංකාරී ලීලාවක් ආරෝපණය කර ගනිමිනි.

"එයා නුඹ සහෝදරියව බඳින්ඩ ම තරං ළංවෙච්ච එක ගැන මම නං පුදුම වෙන්නේ නෑ." මම කීවෙමි.

"ඒක ගලක් වුණත් අඬවනවා!" රොමුලි කීවේ ය.

තැපැල් කාර්යාලයට දිවූ මම ලියුම් කවරයක් ගෙන, ලියුම එහි බහා, ගැටිය දිව ගා කවරය අලවා සාක්කුවේ දමා ගතිමි.

අන්තිම පාඩම අවසන් වෙන්නට ආසන්නයේ දී කිසිවකු බලා නොසිටින මොහොතක් බලා, මම මිනියක් සේ මුළුමනින් ම හිරිවැටී ගනිමින් ලියුම මේරිගේ පොත් මල්ලට තල්ලු කළෙමි. සීනුව නාද

වෙනවා මට ඇසුණේ නැත. එසේම මගේ මිතුරන් ගෙදර යනු ද මම නොදුටුවෙමි. පන්ති පිරිසිදු කරන්නිය පැමිණෙන තුරු ම මම සිහිමුළා ගතියෙන් දිගට ම පන්තියේ හිඳගෙන සිටියෙමි.

"මොකෝ වෂලොම්ඩසේ? කවදා ඉඳන් ද ඉස්කෝලෙට මෙච්චර ආදරෙන් ගෙදර යන එක නැවැත්තුවේ? කකුල් උඩට ගන්න, මට බිම අතුගාන්න තියෙනවා."

"සුබ උදෑසනක් මාකා නැන්දේ!"

"ඉලව්වේ... ඇයි අද දවසේ මීට කලින් අපි මුණගැහුණේ නැද්ද?"

"ආයුබෝවන්, මාකා නැන්දේ!"

"සර්ව බලධාරී දෙවියනේ!" කුරුසිය ලකුණු කරගත් ගැහැනිය මා දෙස බියපත් බැල්මක් හෙළමින් කඩිමුඩියේ කාමරයෙන් පිට වූවා ය.

සැන්දෑවේ මම ඉලිකෝගේ නිවෙසෙහි යළිත් නාර්ඩ් සෙල්ලමෙහි යෙදී සිටියෙමි. මම ඊට කොතෙක් ගැලී සිටියෙම් දැයි යත් මට ලිපිය ගැන මුළුමනින් ම මෙන් අමතකව ගියේ ය.

"ඉතිං... ඊට පස්සේ තව කවි ලිවුවේ නැද්ද නුඹ?" ඉලිකෝ මගෙන් ඇසී ය.

"අපි ගැන කාරුණික වෙලා, එකක් අපට කියවාපන්කෝ." ඉලේරියන් විරිත්තමින් මැදිහත් විය.

"ඉලිකෝ!" පිටතින් හඬක් ආවේ ය.

"කවුද?"

"මේ මම. ඔල්ගා. අපේ තක්කඩියා මෙහේ ද?"

"ඇතුළට එන්න ඔල්ගා හාමිනේ. එයා මෙහේ!"

මුළුමනින් ම කුදු ගැසී ගනිමින් ඇතුළට ආ අත්තම්මා හිස වටා වූ සාටකය ඉවත් කොට, හැරමිටිය මුල්ලෙන් තබා, ජනේලය බඩ හිඳගෙන, මඳක් සිට කතා කළා ය.

"සූරිකො, මගේ කොලුවෝ, නුඹලගෙ රසායන විද්‍යා ගුරුවරයා කොච්චර විතර වයස ද?"

"තිහක්, බාගදා තිස් පහක්... ඇයි?" මම මහත් ඕනෑකමින් ඇසුවෙමි.

"එයා හොඳ සිහියෙන් ද ඉන්නේ? මං අහන්නේ එයාගේ ඔළුව හොඳින් ද කියලා?"

"මේ සූරිකෝ වගේ ශිෂ්‍යයෙක් ඕනෑ කෙනකුගේ ඔළුව නරක් කරනවා," ඉලිකෝ කී ය.



"නෑ අත්තම්මේ, එයා බොහොම සනීපෙන්. එයාගේ මොළේ කනෙනුත් බේරෙනවා." මම කීවෙමි.

"ඉලේරියන්, රත්තරනේ, මෙන්න මේ කොළ කෑල්ල බලාපන්. නුඹට හිතාගත්තැහැකි ද ගුරුවරයෙක් තමන්ගේ ශිෂ්‍යයාගේ අත්තම්මාට මෙහෙම ලියාවි කියලා?"

මා සීතල වී ගියේ ය.

ඉලේරියන් කණ්ණාඩිය ඇස ලා, ලියුම දිගහැර කියවන්න විය.

"කවුද මේ ලියුම නුඹට ගෙනැත් දුන්නේ ඔල්ගා?"

"ලාඩෝ සිකරුලිඩ්සේගේ දුව, මේරි."

ඉලේරියන් කලබලයෙන් තොරව කියවන්නට ගති.

"'මගේ වටිනා ආදරිය'..."

"එයා මේ ලියන්නේ ඔහේට ද?" ඉලිකෝ ආතතම්මාගෙන් ඇසී ය.

"සර්ව බලධාරී දෙයියම්පල්ලා, එහෙම තමා!"

මගේ මුව වියළී ගොස්, දැත් අයිස් මෙන් සීතල වී තිබිණි. නළල පුරා දහදිය මතුවෙලා ය.

මේ අතර ඉලේරියන් දිගට ම කියැවී ය. "...'ඔබ මගේ ඇස ගැටුණු පළමු දා සිට ම සුන්දරත්වයේ පරම සත්‍යය මම ග්‍රහණය ගත්තෙමි...'"

"මේ සාපලත් මෝලා මාව දැක්කේ කොහේදි වෙන්ඩ ඇත් ද?" අත්තම්මා කොක්හඬලමින් ඉලිකෝ දෙසට හැරුණා ය. ඉලිකෝ සිටියේ විශ්වාස කොටගත නොහැකිව මුව හයාගනිමිනි.

"...'මම පවතින්නේ ඇයි දැයි මම තේරුම් ගත්තෙමි, ආධ්‍යාත්මික සුන්දරත්වයෙහිත්, සෞන්දර්යාත්මක ප්‍රීතියෙහිත් අභිවන්දනය ලෙසින් මම ඔබව දැනිණි...'" ඉලේරියන් කියවාගෙන ගියේ ය.

"මට ඒක තේරුණේ නෑ." අත්තම්මා කීවා ය.

"ආදරය තේරුම් ගන්ඩ හරි අමාරුයි, ඔල්ගා රත්තරනේ."යි ඉලිකෝ කීවේ ය.

"එයා කවද්ද ඈ ගැන ආදරෙන් බැඳුණේ?" ඒ ඉලිකෝ ය.

"අපේ නීවයා හින්දා ඈට ඉස්කෝලේට එන්ඩ කියනවා. ඒ හින්දා එයාට ඕනෑ තරං ඒකට අවස්ථාවල් තියෙනවා."

"...'ඔබගේ ස්වර්ගීය දෑස්වලින්...'"

"ඒකා කණ වෙච්චාවේ!" ඉලිකෝ කීවේ ය.

"...'ඔබගේ සේදමය ඇසිපියවලින්...'" ඉලේරියන් දිගට ම කියවී ය. ඉලිකෝ බිම පෙරළුණි. ඔහුට සිනාව කොහෙත්ම නවතා ගන්නට බැරි විය. ඉලේරියන්ට ඉක්කාවක් වැළඳිණි. එහෙත් ඔහු කියවීම දිගට ම කළේ ය. "...'ඔබේ මුතුවන් දත්පෙළින්...' හැබැයි මං හිතන්නේ මෙතෙන් දී නං වැඩිකරලා කියලා වගෙයි," ඉලේරියන් කීවේ ය.

"මොන දත් ද, ඒකා මැරිලා වැටිච්චාවේ, ඒකා මගේ දත් දැක්කේ කොහේදිද?" අත්තම්මා හඬගෑවා ය.

"...'ඔබගේ පබළු පැහැ තොල්වලින්, ඔබගේ අගස්තිමය වරලසින්, ඔබගේ ඇඟිලිවලින්, ඔබගේ දෑත්වලින් කොටින් ම සම්පූර්ණ ඔබ විසින් මගේ සාමය සොරාගනු ලැබ තිබේ...'"

"ඕක දැන් ම ම නවත්තාපන්. මට තවත් නං අහගෙන ඉන්ඩ බෑ!" ඉලිකෝ දුබල ලෙසින් කී ය. ඉලේරියන් කියවීම නවතා ඉලිකෝ ප්‍රකෘතියට ගෙන එන්නට යත්න දැරී ය.

ආතම්මා ද නවතාගත නොහැකි තරම් කොක් හඬලා සිනාසුණා ය. මම පමණක් සිනා නොවීමි. මම එතැන ම මුල් ඇදගෙන ගලක් වී සිටගෙන උන්නෙමි.

"සුරිකෝ, නුඹ අත්තම්මාව ඉක්මනට ම බන්දලා දාන්ඩයි යන්නේ! නුඹ මටත් මඟුල් ගෙදෙට්ට එන්ඩ කියාවි කියලා මං හිතනවා!" ප්‍රකෘති තත්ත්වයට පත්වෙන්නට ඉලිකෝ සමත් වූ නමුත් යළිත් පොදියක් සේ බිම ඇද වැටුණේ ය.

"මට නං පේන්නේ මේක බොහොම අන්තරායකාරී කටයුත්තක්." ඉලේරියන් කීවේ කල්පනාකාරී ලෙසිනි. "මං කීවේ තරුණ මිනිහෙක් මේ වගේ පිස්සු වට්ටන එක, වොල්ගා හාමිනේ!"

"ඉලිකෝ මාමේ!" කටහඬක් පිටතින් ආවේ ය.

"කවුද?" ඉලිකෝ පිළිතුරු දුන්නේ බිම සිට නැඟිට ගනිමිනි.

මේරි කාමරයට ආවා ය. හිමපතනය නිසා ඇය රෝස පැහැ ගැන්වී තිබිණි. ඈ මඳ වේලාවක් දොරකඩ සිටගෙන, සීතලෙන් ගල් වූ අත්ලට පිඹ කිහිලි යටට ගන්වා දෙපා කිහිපවරක් මාරුවෙන් මාරුවට බිමට තද කළා ය. මඳක් උණුසුම් වූ පසු ඇය කතා කළා ය.

"මං මේ ඔල්ගා අත්තම්මාව හොයමින් ආවේ..."

"මං මෙහේ කෙල්ලේ. අර උඹ මට අරන් ආව ලියුම... ඒක මේ අපි මේ වැඩිහිටියෝ තුන්දෙනාව ම නොමරා මැරුවා,"යි අත්තම්මා එය ඇයට ආපසු දෙමින් කීවා ය.





"අත්තම්මේ ගුරුතුමාගේ ලියුම මේක... අරක වෙන එකක්... ඒක කොහොම මගේ මල්ලට ආව ද කියලා මං දන්නෑ."

"අපොයි දෙයියනේ, තවත් ලියුමක් නෙවෙයි නේද? අනේ ඉලේරියන් ඕක කියවාපන්කෝ."

"'ඔබේ මුණුපුරාගේ සාහසික හැසිරීම් ගැන සාකච්ඡා කරගැනීමට කරුණාකර ඔබට පහසු පරිදි හැකි ඉක්මනින් පාසලට එන්න.'"

"ආයෙමත්? මාව ආයෙත් ලැජ්ජා කරන්ඩ ද බොල, තීවයා?!"

අත්තම්මා හැරමිටිය ඇද ගත්තා ය. මම ගෙයින් පිටතට දිවුවෙමි.

"මැරැටියා, උඹ අද ගෙදර හෙම එනවා නෙවෙයි! මම උඹව ගෙට වැද්දගන්නෙ නෑ!" අත්තම්මා මට ඇසෙන්නට මොර දුන්නා ය.

ඉක්මනින් ම මේරි ඉලිකෝගේ ගෙදරින් එළියට ආවා ය. ඈ ඇවිද ආවේ සෙමිනි, හිස පහත්කොට ගනිමින් හා දෑත් හිම සීතලට නිරාවරණය කරමිනි. ඇගේ හිස බැඳි රෙදිකඩ උරහිස දක්වා ලිහුවා තිබූ අතර කෙහෙ රොද නළල හරහා වැටිණි. ඈ කිසියම් ප්‍රසිද්ධ චිත්‍ර ශිල්පියකු විසින් අඳින ලද සිතුවමක් ලෙසින් පෙනිණි. ඈ ඇවිද ආවේ මා සිටින බවක් එතරම් නොදුටු ලෙසිනි.

"මේරි!" මම මෘදු ලෙසින් කතා කළෙමි.

ඈ මඳ දුරකින් නැවතුණා ය. මම ඇය වෙත ගොස් සෙමෙන් ඇගේ නළලේ වූ කෙහෙ රොද නිසි ලෙසින් සැකසුවෙමි. ඇය මඳකුදු නොසෙල්වුණා ය.

"ඔයා ලියුම කියෙවුව ද?"

මේරි කිසිවක් නොකීවා ය. ඈ මා දෙස කල්පනාකාරී බැල්මක් හෙළුවා පමණෙකි. ඉක්බිති ඈ යන්නට ගියා ය.

"මේරි!"

ඇය යළි නැවතුණා ය.

"ඒක සම්පූර්ණයෙන් ම රොමුලිගේ වැරැද්ද... එයා තමා ඕක ලියන්න බලකළේ. මට ඕන කළේ ඒක වෙන විදිහකට කියන්ඩයි. ඒත් එයා තමා කීවේ කරන්ඩ ඕනෑ එහෙමයි කියලා."

"ඒ වගේ විහිළුවක් කෙනකුට කරන එක හොඳ සෙල්ලමක් නෙවෙයි, සුරිකෝ..."

"ඒක විහිළුවක් නෙවෙයි මේරි!... මම... මං ඒ වගේ නරක කෙනෙක් කියලා හිතන්ඩ එපා, මේරි!..."

"ඔයා නරකයි කියලා මං හිතන්නෙ නෑ...!"

අලුතින් වැටුණු හිම මතින් අපි සෙමෙන් උරෙනුර ගැටෙමින් ගමන් කළෙමු. දිගින් දිගට ම හිම වැටුණි. සීතල සුළඟ බලවත්ව හැමී ය. අපි කතා නොකළෙමු. අපි මගේ ගෙය ද මුරාඩා වැළලූ තැන අසල ගස ද පසු කළෙමු. ගස හිම බ්ලැන්කට්ටුවකින් එතී තිබිණි.

"මගේ මුරාඩා වැළලුවේ මෙතන…"

"මං දන්නවා."

"මං මුරාඩාට බොහොම හිතේසිව උන්නේ. මං එයාට, අත්තම්මටයි, ඉලේරියන්ටයි, ඉලිකෝටයි තරමට ම ආදරේ කළා…"

"මම දන්නවා, සුරිකෝ."

"මං එයාට හුඟාක් ආදරෙන් උන්නේ, මුරාඩාත් මට ආදරේ කළා. මං එයාට මනුස්සයකුට වගේ කතා කරන්ඩ පුරුදු වෙලා උන්නේ… එයා මළා ම මං උන්නේ සිය දිවි හානි කරගන්න තරං තත්තවෙක… ආදරෙන් මිනිහෙක් හැබෑට ම පිස්සු වැටෙන්ඩ පුළුවන්!… ඔයාට හිතල ද?"

"ඔව්..."

"මට නං නෑ!"

මගේ බැටළු සම් කබාය ගලවා එය මේරිට පැළඳ වූ මම මගෙ අත ඇගේ උරහිස වටා රැඳෙන්නට ඉඩ හළෙමි. අපි කතා බහකින් තොරව අලුත් හිම මතින් ඇවිද ගියෙමු… අපි මේරිගේ ගෙය ද පසු කළෙමු.

"ඔයාට දැන් උණුසුම් ද?"

"ඔව්, සුරිකෝ."

"ඔයා මගේ මුරාඩාව දැනං උන්නා නේද?"

"ඔව්…"

"එයා ඔයාට බොහෝම මනාපෙන් උන්නේ. එයා නිතර ම මට කීවේ: 'මේරි හරිම හොඳ කෙල්ලක්, එයා තමයි හැම කෙල්ලකුට ම වඩා හොඳ. වෙන කිසිම කෙල්ලකුට එච්චර ලස්සන ඇස් නෑ. මේරි කියන්නේ කාරුණික වගේම බුද්ධිමත් කෙල්ලෙක්…' මුරාඩා මට තරම් ම ඔයාටත් ආදරේ කළා. බාගදා මටත් වැඩිය වෙන්ඩ පුළුවනි. එයා කවදාවත් ඔයාට බිරුවේ නෑ… ඔයත් එයාට ආදරේ කළා නේද?"

"ඔව් සුරිකෝ මං එයාට බොහොම මනාපෙන් උන්නා!"

"මේරි!"

"මොකද සුරිකෝ?"



මම මගේ දෑත මේරි වටා යවා, ඇය මා වෙත ඇඳගෙන මගේ මුහුණ ඇගේ කෙහෙ රැලි අතර ඔබා ගතිමි. මේරි සිවියේ හඬමිනි. මම ද හඬමින් සිටියෙමි. විසල් හිම පියලි වැටෙමින් තිබිණි. සුළඟ බලවත්ව හැමුවේ ය. එහි සඳ ද, හිරු ද, ආදරය ද, කඳුළු ද, අතිමහත් වූ හිම තලාවක් ද විය. ඉලිකෝට සවන් දෙද්දී සතුටු වන්නට මා සතුව කිසිවක් නොතිබිණි. තිබුණේ සුළඟ සහ හිම පමණකි, ලෝකය ම බල්ලන්ට ගොස් තිබිණි. එහෙත් සුළඟින්, සඳෙන්, ඉරෙන්, මගේ ආදරයෙන් සහ අර අතිමහත් සුදු හිම තලාවෙන් මම ඉමහත් ප්‍රමෝදයට පත් වීමි.

## ධාන්‍ය ශ්‍රේණි එකොළහ

පිරිසිදු යෝක්ෂයර් වර්ගයට අයත්, ඉතා විශාල පැතලි කන් ද, කුඩා ඉදිමුණු දෑස් ද, උඩට කරකැවුණු හොම්බක් ද ඇති ඊරියක් ඉලිකෝට සිටි. ඔහුගේ ප්‍රියතම සත්ත්වයා ය ඒ. ගමේ සැම දෙනකු විසින් ම ඇය හඳුන්වනු ලැබුවේ සෙර්පියෝනා ලෙසිනි.

ඇය අවුරුද්දකට දෙවරක් එනම් වසන්තයේ දී සහ සරත් සමයේ දී පැටවුන් වැදුවා ය. ඒ සැම වරක ම ඇය කුඩා රෝස පැහැ ඌරු පැටවුන් දොළොස් දෙනකු ලෝකයට ගෙන ආවා ය. ඉලිකෝ උන් විකුණා හොඳ මුදලක් උපයා ගත්තේ ය. යුද්ධය පැවති අවුරුදුවල ඉලිකෝ ඌරු පැටවුන් ධාන්‍යවලට හුවමාරු කිරීම ඇරඹී ය.

ඉලිකෝ තමාගේ මේ යෝක්ෂයර් ඊරිය, තම ධන සපයන්නිය යැයි අමතමින්, සිය ඇස මෙන් ආදරයෙන් රැක බලාගැනීම පුදුමයක් නොවේ. ඔහු ඇය දෑතට නොගත්තා පමණෙකි. තමන් බඩගින්නේ සිටිය ද ඔහු ඊරිය කිසිදා බඩගින්නේ සිටින්නට නොහළේ ය. ඉලිකෝ සමඟ හාද වීමට අවැසි නම් කළ යුතු එකම දෙය ඔහුගේ ඊරිය වර්ණනා කිරීම පමණ ය. ඔබට හොඳම වයින් වීදුරුවකින් ගම්මිරිස් නොලෑ දුම්කොළ බීඳකින් ද එක සැණින් සලකන ම මීළඟ පැටව් ගැසීමේ දී හොඳ ම ඌරු පැටවා ඔබට දෙන්නට පොරොන්දු වෙනු ඇත. ඉලේරියනුත් මමත් ඔහුගේ මේ දුර්වලත හොඳින් දැන සිටි හෙයින් ඊරිය වර්ණනා කරන්නට ලැබෙන කුම අවස්ථාවක් හෝ අත නොහැරියෙමු. එදාත් අපි ඉලිකෝගේ මිදු

වූ කොළවලින් පිරී ඇපල් ගස යට හිඳගෙන, අසලක අලස ලෙස වැතිර සිටි සෙර්පියෝනා දෙස ගෞරවයෙන් පිරි බැලුම් හෙළමින් කඩිමුඩියෙන් තොර කතාබහක යෙදී උන්නෙමු.

"කොහොම ඊරියෙක් ද අම්මපා! මං නං මගෙ මුළු ජීවිතේට මෙහෙම වෙන එකෙක් නං දැකලා නැහැ!" ඉලේරියන් කී ය.

"මට හම්බකරලා දෙන එකී! මගේ නිදානේ!" ඉලිකෝ සෙරපියෝනාගේ කුස මෘදු ලෙස කිතිකවමින් පුරු පුරුගායි. ඊරිය දෑස් පියාගෙන මහත් ප්‍රමෝදයෙන් ගෙරවූවා ය. ඉලිකෝ කෘතවේදීව ඇගේ රත් පැහැව ඉදිමී ඇති තනපුඩු දෙස බැල්මක් හෙළී ය. තනපුඩු දොළහක්! හොඳ පරම්පරාවක ඌරු පැටව් දොළහක්! දෙවියන්ගේ කැමැත්ත, සෙරපියෝනා දවසකින් නැතිනම් දෙකකින් පැටවු ගසනු ඇති. එවිට රත්තරං ධාන්‍ය මලු දොළහක් ඉලිකෝට හිමි වනු ඇත.

"නුඹ ඇව කොහෙන් ද මිලේට ගත්තේ ඉලිකෝ? ඔහොම උසස් පෙළපතක් තියෙන එකෙක්ව?" මම ඇසීමි.

"ඒක දිග කතාවක්, මගේ ආදණීය කොලුවෝ... සෙරපියෝනාගේ මුත්තම්මාව මගේ අත්තම්මා වුණු කලෙන්තිට – දෙවියෝ ඇගේ ආත්මය සාමයේ සතපවත්වා! – දෑවැද්දට ලැබුණා. ඒකිගේ හැබැයි කයිවාරු ගහන්ඩ තරං දෙයක් නැහැ කියලා තමා කියන්නේ. බොහෝම ලෙඩ ගැහිච්ච ප්‍රාණියෙක්. ඒ වගේ මන්දපෝෂණේ හැදුණු ලෙඩ තිරිසනෙක්ව තියාගන්ඩ කාරිතොං ආතා ලැජ්ජා වුණා. ඉතිං ඒකිගෙන් නිදහස් වෙන්ඩ කල්පනා කළා."

"මසට ගන්ඩ මරන එක හොඳා කියලා හිතන්ඩ ඇති." ඉලේරියන් කීවේ ය.

"ලෙඩ ඌරෙක්ගෙ මස් ඕනැ කාට ද? මේ දැන් ඉන්නවා වගේ අමාරුකං තියෙන කාලෙක නෙවෙයි එතකොට අපි උන්නේ."

"ඔව් මේක යුද්ධ කාලේ... හැමෝම ඉන්නේ හරිම අමාරුකං ඇතිව." මම කීවෙමි.

"ඒක හැබෑව... මිනිස්සු ඉන්නේ මහ අමාරු කාලයක...මෙහේ එච්චරට ම අමාරුවක් නෑ, ඒත් ලෙනින්ග්‍රාද් නගරේ ජර්මාන්නු වටලාන හිටි කාලේ එහේ බළල් මසුත් කෑවාලු."

"ලෙනින්ග්‍රාද් කියන්නේ හුඟාක් දුර ඇත. ඒත් මට මගේම ගේ ඇතුළේ හිනාවෙන්ඩත් බයයි." ඉලේරියන් කී ය.

"ඒ මොකෝ?" ඉලිකෝ ඇසී ය.





"මං කට ඇරිය හැටියේ මගේ දත් දැකලා අර මගේ මොට්ට කුකුළු තඩියා දුවගෙන එන්නේ හරියට උකුස්සෙක් වගේ, ඒවා ධාන්‍ය ඇට කියලා හිතාගෙන. ආන් ඒකයි."

"එහෙනං ඒකගෙන් හදමු සුප්!" මම උපදෙස් දුනිමි.

"එතකොට උඹ ද උදේට උදේට ඇවිත් අඬලලා මාව ඇහැරවන්නේ?" ඉලේරියන් ඇසී ය.

ඉලිකෝ තම කතාව දිගටම කියන්නට විය.

"ඉතිං කාරිතොං ආතා කියා උන්නා අර ඊරිට තමන්ගෙ වත්තේ නං ඉන්ඩ දෙන්න නෑ කියලා. එතකොට අපේ කාලෙන්ති අත්තම්මා උන්නේ පුපුරන තරමට කේන්තියෙන්. එයා බෙරිහන් දුන්නා. 'හරිම මොළේ ඇති මිනිහා. ඔහේ ඌරෙක්ගේ වැදගත් ම දේ දන්නේ නෑ. මේකී හොඳ උසස් පෙළපතක එකියක්. ඒකී ඉස්සරහ දි පෙන්නාවි ඒකිව හැදිලා තියෙන්නෙ කොහොම දේවලින් ද කියලා.' ඉතිං නුඹලා මොකද හිතන්නේ? අත්තම්මා හරි. මගේ සෙරපියෝනා පැවත එන්නේ ඒ ලෙඩ ඌරු පැටවාගෙන්."

"හප්පේ, ඒකී හරිම අපූරු සතෙක් නොවැ!" මම කීවෙමි.

"නුඹ හරිම දක්ෂ කොලුවෙක්, සුරිකෝ." ඉලිකෝ දීප්තිමත් සිනාවක් පෑ ය. "දැන් මට මේක අවංකව ම කියාපන්... ඉහළම ගෞරවය ලබන්ඩ තරං සෙරපියෝනා වටින්නෙ නැද්ද?"

"මං හිතන්නේ ඉලිකෝ ඔහේ ඇට සාධාරණය ඉෂ්ට කරලා නෑ කියලා. මොන ඇන්නෑවකට ද අර කෑදර විදිහට ඇස් උළුප්පාගෙන ඉන්න කාරිතොං ආතාගේ පින්තූරේ බිත්තියේ එල්ලාගෙන ඉන්නේ? ඔහේ වඩා හොඳා අර පවුලූෂා ෆොටෝකාරයාට කියලා සෙරපියෝනාගේ පින්තූරයක් අරන් දෙන්ඩ කියන එක. ඒක ඔහේගේ සාලෙ බිත්තියේ එල්ලන්ඩ වටිනවා," ඉලේරියන් කී ය.

"ඉලේරියන් ෂෙවර්නාඩ්සේ, මං ඒකිව මිනීපෙට්ටියක දාලා ගෙයින් අරන් යනවා, මේ ඉන්න ඊරි උඹට වඩා වටින සතෙක් නොවුණා නං,"යි කී ඉලිකෝ ඉලේරියන් දෙස දැඩි බැල්මක් හෙළුවේ ය. එය කෙතරම් කෝප සහගත බැල්මක් දැයි යත්, දරුණු ගාලගෝට්ටියක් අත ළඟ බව මට දැනුණි. ආදරණීය වයින් බෝතලය අත ළඟටම විත් ලුහුටා යන හැටියකි. මම ඉලේරියන් තවදුරටත් විහිළු කිරීම වැළැක්වීමට ඔහුට ඇසක් ඉඟිමරා මෙසේ කීවෙමි: "එයාව ගණන් ගන්ඩ එපා ඉලිකෝ! ඔහේගේ ඊරී මිනිහෙක් තරමම හොඳයි, එකම දේ ඒකිට කතා කරගන්ඩ බැරි එක විතරයි."

ඉලිකෝ මා දෙස සැකමුසු බැල්මක් හෙළී ය. මම ඔහු දෙස අවංක දෑසින් බැලුවෙමි. ඉක්බිති නැගිට සිටි ඔහු තමාට ම මොනවාදෝ මුමුණාගනිමින් ගෙතුළට ඇදුණි. ඔහු ගියේ බෝතලයක් ගෙන එන්නට ය.

"ඔහේට ඕනෑ එයාව කේන්ති ගස්සන්ඩ ද?" මම කෝපයෙන් ඉලේරියන්ට කෙඳිරුවෙමි.

"අනේ මේ උඹලා රොත්තට ම හෙණ ගහච්චාවයි!" ඉලේරියන්ට කඩා පැන්නේ ය. "කෙනෙක් හැම වෙලේම අඩිය තියන්නේ කොහේ ද කියලා කල්පනාවෙන් ඉන්ඩ ඕනෑ. උඹ කැමති ඇති මං අර ගඳගහන ඊරි ඉස්සරහා දණගහනවා නං නේද?"

ඉලිකෝ වොඩ්කා බෝතලයක් ද, වීදුරු තුනක් ද, හපන්නට දෑ ද රැගෙන ආවේ ය. අපි පළමු වීදුරු දෙක නිහඬව පානය කළෙමු. ඒවා ගිල දමන්නට පෙර අපි එකිනෙකාට හිස පහත් කළෙමු. එහෙත් අපි තුන්වැනි වරට වීදුරු පුරවා ගනිද්දී ඉලිකෝ කතාවක් කළේ ය:

"සුරිකෝ, නුඹ දැන් උගත් මිනිහෙක්. නුඹ නුඹටමත්, නුඹේ ගුරුවරුන්ටත් මහ කරදර ගොඩක් විඳින්ට දීලා හරි දැන් නමවැනි පන්තියටත් ඇවිත්. දැන් මට දැනගන්ඩ ඕනෑ නුඹ අහලා තියේද සමහර විට ඉගෙනගෙන තියේ ද මිනිහා පැවත එන්නේ වානරයින්ගෙන් කියන එක."

"වඳුරාගෙන් ඇර වෙන මොන එකාගෙන් උඹ පැවත එන්ඩ ද?" ඉලේරියන් මැද්දට පැන්නේ ය. සිය හදවත තෘප්තිමත් වන ලෙසින් ඔහුට විහිළු කළ හැකි විය. දැන් කිසිදු අවදානමක් නැත. බෝතලය සුරක්ෂිතව, සැප සේ ඔහු ඉදිරිපිට තිබේ. ඉලිකෝ ඔහු කී දේ නෑසුණා සේ දිගටම කතා කළේ ය:

"මං විද්‍යාව ගැන එච්චර විශාරදයෙක් නොවෙන්ඩ පුළුවනි, ඒත් මං හිතන්නේ ඒක හරියට ම හරි නැහැ කියලයි. මං හිතන්නේ වෙනස් වෙනස් මිනිස්සු පැවත එන්නේ වෙනස් වෙනස් සතුන්ගෙන් කියලයි. අපි ගනිමුකෝ සෙරපියොන් සෙපෙර්ටෙලාඩ්සේ. මට නං ස්ථිරයි ඒකා පැවත එන්නේ ඌරකුගෙන් කියලා. මගේ සෙරපියෝනායි, සෙරපියොන් සෙපෙර්ටෙලාඩ්සේයි දිහා බලනවා, දෙන්නා නිවුන්නු වගේ නෙවෙයි ද පේන්නේ? සෙරපියෝනාට කතා කරන්ඩ බැරි ද? ඉතිං මොකෝ? සමහර මිනිස්සුත් ඉන්නේ උපතින් ම ගොළු. මගේ සෙරපියෝනා ආන් ඒ වගේ..."





"හිටිංකෝ... මං සෙරපියොන් සෙපෙර්ටෙලාඩ්සේට උඹ කී කතාව කියනකං." ඉලේරියන් කීවේ ය. "එයා උඹට පෙන්නාවි කවුරු කාගෙන් පැවත එනව ද කියලා."

"ඉතිං ගිහින් කියාපන්. නුඹ හිතන්නේ එයා ඒක දන්නෙ නැහැ කියලද!" ඉලිකෝ එකටෙක කී ය. "දැන් ඉතිං සුරිකෝ මගේ කොලුවෝ, මට තව දෙයක් කියන්ඩ ඉඩ දියන්කෝ. නුඹට මෙතන ඉන්න ඉලේරියන් පේනවානේ."

ඉලේරියන් සැකමුසුව බැලී ය.

"ඔව් මට පේනවා!"

"නුඹ දන්නවා ද එයා කොච්චර මුරණ්ඩු ද කියලා?"

"හොඳා හිතමුකෝ දන්නවා කියලා."

"නුඹ එයා මහ සද්දෙට හිනාවෙනවා අහලා තියේ ද? ඒක බූරුවෙක් කෑගහනවා වගේ නෙවෙයි ද?"

මට එය ද ප්‍රතික්ෂේප කළ නොහැකි විය.

"නුඹට එයාගෙ දිග කන් පේනවා ද?"

සත්තකින්ම ඉලේරියන්ට වූයේ දිගු කන් නිසා මට කිසිවක් කිව නොහැකි විය.

"ඉතිං දැන් නුඹ නැහැයි කියනව ද ඉලේරියන් පැවත එන්නේ බූරුවකුගෙන් කියන එක?"

ඉලේරියන්ට හපමින් සිටි දෑ උගුරේ සිරවිය. ඔහු කහින්නට විය. යළි හුස්ම ගැනීමට හැකි වූ විට නැගී සිටි ඔහු තොප්පිය ගෙන, කිසිදු වදනක් නොදොඩා ගේට්ටුව දෙසට යන්නට ගියේ ය. අඩ දුරක් ගිය ඔහු කනගාටුදායක ලෙසින් බෝතලය දෙස බලා, ආපසු පැමිණ, වීදුරුවක් පුරවාගෙන ගිලදමා, තවදුරටත් කතාබහකින් තොරව නැවත ගේට්ටුව දෙසට යන්නට ගියේ ය. ගේට්ටුව වෙත ළඟා වූ විට පමණෙකි, ඔහු ආපසු හැරී මෙසේ කෑ ගැසුයේ:

"එකැස් යක්ෂයා, බලන් හිටපිය! මං තොට තොගේ ම වචන ගිල්ලෝනවා!"

ඉලිකෝ තෘප්තියෙන් හිකි හිකි ගෑවේ ය.

...පිරිසිදු යෝක්ෂයර් උරුමය ඇති තවත් පැටව් බිහිවීමේ දිනය අත ළඟම පැමිණෙමින් තිබිණි. ඌරු හිමියන් වීමට කැමැත්තෝ ධාන්‍ය ගෝණිය බැගින් ගෙන ඉලිකෝගේ මිදුලේ පොදි ගැසුණාහ. ඒ සෑම අයකුට ම පොරොන්දු නෝට්ටුව බැගින් දෙනු ලැබිණි. ඒවායේ මෙලෙස සඳහන් විය:

"ඉලිකෝ විගොගිඩ්සේ වන මම, පිරිමි (හෝ ගැහැනු) පැටවකු ඌ උගේ මවගෙන් කිරි උරා බීමෙන් පසුව ලබා දෙන බවට පොරොන්දු වෙමින්, ඒ සඳහා ගාස්තුව ලෙස පුරවැසි අහවලාගෙන් ධාන්‍ය මල්ලක් ලබා ගතිමි."

එකඟතාවන් ඇතිකරගනු ලැබූයේ මිත්‍රශීලී සහ අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුතු වටපිටාවක සුහදශීලී අයුරකිනි. එහෙත් එක් අවස්ථාවක මෙවැන්නක් සිදුවිය: සැම ගැනුම්කරුවකුට ම ගැහැනු සතකු ඕනෑ විය.

"එහෙම ඉල්ලන්නේ කොහොම ද?" ඉලිකෝ වැලපුණි. "ගැනු පැටව් දොළහක් ම වදන ඊරියකුව දැකලා තියෙන්නේ කවුද?"

"ඇයි නැත්තේ? කුවුලියා ටිසින්ට්සාඩ්සේට දූලා ම දොළහක් ඉන්නවා," කවුදෝ කී ය.

"එහෙනං ගිහිං ඒ ගැන කුවුලියා එක්කයි, සෙරපියානෝවා එක්කයි කතා කරගන්නවා, කුවුලියා නුඹට පොරොන්දු නෝට්ටුවක් දීපුවාදෙන්. මට පාඩුවේ ඉන්ඩ දෙනවා."

"ඉලිකෝ විගොගිඩ්සේ, ඔහේ තව ටිකක් බාලවෙලා උන්නා නං හෙම, මං තමුසෙගේ කුණු දිව ඉරනවා," කුවුලියා කෝපයෙන් දිලිසුණි.

"මං ටිකක් තරුණ වෙලා, හයි හත්තියට උන්නා නං, මං ගලවන්නේ තමුන්නේ මූට්ටු!" ඉලිකෝ එකට එක කීවේ ය.

ගනුදෙනුකරුවන්ගෙන් සමහරෙක් සෙරපියෝනා ම ගන්නට ඉල්ලා සිටියහ. එහෙත් තම තනි ඇස තුළින් දකිද්දී ඉලිකෝට ජීවිතය නැත වූයේ මැදහත් දැක්මකි. ඔහු තම ආත්මය විකුණා දමනු ඇත, එහෙත් සෙරපියෝනා නම් විකුණනු නැත.

"දැන් ඔහේට තවත් මොනව ද ඕනෑ?" සුරෙබිහි සිට පැමිණි ආසියානුවෙක් ඔහුට කරදර කළේ ය. "මං ඔහේට තිබ්බේ වටින ලංසුවක් නෙවෙයි ද? එක ඌරකුට අශ්වයකුයි, හොඳම ලී උළු කැට දෙසීයකුයි! ඉතිං වෙන මොනව ද?"

"අනේ මේ යනවා ගිහින් වෙනින් මෝඩයෙක්ව හොයා ගන්නවා තමුසේ! යුද්ධ කාලෙට අස්සයෙක්ව බලෙන් ගෙනියන්ඩ පුළුවනි, අශ්වාරෝහක බළකායට ගන්ඩ. ඒත් කිසි කෙනෙක් මගේ සෙරපියෝනා නං මගෙන් අරන් යන එකක් නෑ."

"ඌරාව මට විකුණනවා දැන්ම, නැත්තං ඉතිං පරක්කුවෙලා දුක්වෙන්ඩ වෙයි!" ආසියානුවා උත්සාහ කළේ ඉලිකෝ





බයගැන්වීමට ය. "ඌව බොහොම ඉක්මනට බේකන් කරාවි ජර්මානුන්ගේ කෑමට. හිට්ලර් ඉන්නේ ගලක් ගහන දුරින්!"

"හොඳා මහත්තයෝ, අපි ඉඳලා බලමුකෝ. බාගදා මගේ ඌරා හින්දාම හිට්ලර් අපට පහර දෙනවා කියලාවත් ඔහේට ආරංචි වුණා ද?" ඉලිකෝ විමසී ය.

මහත් කෝපයෙන් අත වැනූ ආසියානුවා යන්නට ගියේ ය.

එක් සැන්දෑවක ධාන්‍ය ගෝණියක් ගෙන අපේ ගෙදරට ආ ඉලිකෝ එය රට කරඹ ගස යටට හෙළී ය.

"මොකෝ ඉලිකෝ ධාන්‍ය මල්ලක්?" අත්තම්මා ඇසුවා ය.

"ඊයේ මං සෙරපියෝනාගේ පැටව් වෙනුවට පොරොන්දු නෝට්ටු එකොළහක් දුන්නා ධාන්‍ය ගෝනි එකොළහකට. ඒකෙන් මාව ඊළඟ සරත් කාලේ එනකං ඉතුරු වේවි."

"ඇයි එකොළහක්? සෙරපියෝනා හැම සැරේ ම පැටව් දොළහක් දෙනවානේ?"

"මං එක පැටියෙක්ව මෙන්න මේ මගෝඩියාට තෑගි කරනවා. එතකොට මේ ධාන්‍ය ගෝණියත්. ඔහේ දන්නවානේ ඔල්ගා හාමිනේ, මං මේ කම්මැලි දණ්ඩාට කොච්චර ආදරේ ද කියලා."

"සර්වබලධාරී දෙවියනි, ඉලිකෝ විගොගිඩ්සේටයි, ඔහුගේ පවුලේ අයටයි සතුටත්, ප්‍රීතියත් එවනු මැනවි! ඔහුට වැඩි වැඩියෙන් ලැබේවා, නිරෝගී සුව ලැබේවා!" මහත් සොම්නසට පත් ආතම්මා වැලපී, ඉලිකෝ ගේ නළල සිප ගත්තා ය.

"අපි අද රෑට ගිහින් මේ ධාන්‍ය ටික කොටමු." ඉලිකෝ මට කී ය. "පැයකින් මා එක්ක යන්න වරෙන්,"යි කී ඔහු යන්නට ගියේ ය.

...පිටි මලු කරගසාගෙන ඉලිකෝත් මමත් මෝලෙන් පිටවෙන විට හිමිදිරි පාන්දර වී තිබිණි. ගස් අතු උඩ තම අන්තඃපුර කිකිළියන් සමඟ ලැග උන් කුකුළෝ හඬලන්නට උත්සාහ කරමින් උන්හ. හිටිහැටියේ ම මහත් බියජනක යටිගිරි හඬක් අපට ඇසිණි.

"මෂිකෝගේ කටහඬ!" ඉලිකෝ කී ය. "අසරණීට පුතාගේ මරණ දැන්වීමවත් ලැබිල ද?"

අපි පියවර ඉක්මන් කළෙමු.

"අපොයි දෙයියනේ, මොන එහෙකට මේ සාපලත් ඊරි මගේ ඉඩමේ මැරෙන්ඩ ආව ද!" මෂිකෝ වැලපුණා ය. "මං දැන් අර එකැස් යක්ෂයාට කොහොම ඒත්තු ගන්නන්ඩ ද මට ඒකට කරන්ඩ දෙයක් නෑ කියලා!"

භයංකර පෙරනිමිත්තක ඉව වැටුණු ඉලිකෝ ධාන්‍ය මල්ල අතහැර බිමට බරවුණි. මෂිකෝගේ වත්තට දිව ගොස් වැට දෙස බැල්මක් හෙළූ මම භීතියෙන් ගල්ගැසී ගියෙමි. සෙරපියෝනා කවුල්ල අසල දුබල ලෙස කෙඳිරිගාමින් වැටී උන්නා ය. ඇය හඳුනා ගත නොහැකි තරමින් කෙට්ටු වී උන්නා ය. ඒ අසල මියගිය කුඩා පැටව් දොළොස් දෙනකු තැන තැන විසිර තිබිණි.

"මොකද වුණේ මෂිකෝ?" මම මුව හයා ගනිමින් ඇසුවෙමි.

"අනේ, අපට වෙච්ච විපතක් සුරිකෝ! මේ මෝඩ තිරිසනා වැටේ අර හිඩැස්සෙන් රිංගන්ඩ හදලා, ඔන්න ඉතිං ප්‍රතිඵලේ... කී සැරයක් නං අර නාකි යක්ෂයට කිව ද එයාගෙ ඊරි දිහා ඇහැ ගහන් ඉන්ඩ කියලා, ඒකි කැමති කැමති තැන්වල යන්ඩ අරින්ඩ එපා කියලා. ඒත් ඒකා ඇහැව්ව ද? දැන් ඉතිං ඒකා තමුන්ට ම පයින් ගහගත්තාවේ!"

ඉලිකෝගේ අවාසනාවට ගොදුරු වූවෝ ද, කනගාටුවන්නෝ ද, හුදෙක් කුතුහලය නිසා ම බලන්නට පැමිණියෝ ද ලෙසින් අසල්වැසි සෙනඟක් රැස්ව උන්හ. වත්තට අන්තිමට නොණ්ඩි ගසමින් ආවේ, සුදුමැලිව ඇදීගිය ඉලිකෝ ය. ඔහු දිගු වේලාවක් නිස්සේ සෙරපියෝනා දෙස බලා සිට, ඉක්බිති කෝපයෙන් තොප්පිය ඇද බිමට දමා ගැසී ය.

"මේක ද දිව්‍යමය සාධාරණය, දෙවියනේ? ඔහේට හදවතක් නැද්ද? දැන් මං මොනවා කරන්ඩ ද?"

"හිත අවුල් කරගන්ඩ එපා ඉලිකෝ." මිනිස්සු සනසනසුලුව කීහ. "හැමදේම නැත්තට ම නැති වුණේ නැහැනේ. ඔක්කෝටමත් වඩා ඊරි පණපිටින් ඉන්නවානේ. ඔක්කෝම හරියාවි. ඇගේ ජන්ම ගතියෙ හැටියට..."

"එතකොට මං මගේ ණයකාරයින්ට මොනවා කරන්ඩ ද?" ඉලිකෝ වැලපුණි.

"නුඹට මොනවා හරි එකඟතාවකට එන්ඩ පුළුවනි."

"අසල්වැසියනේ, හොඳ මිනිස්සුනේ, ඔහේලා ඊළඟ වතාවේ පැටව් ගහනකං ඔහේලා ඉවසනව ද?" ඉලිකෝ ණයකරුවන් අමතා ඇසී ය.

නුහුරු නිහැඬියාවක් එළැඹිණි.

"හොඳා, අපි බලා ඉඳිමු ද?" එක් ණයකරුවෙක් අනෙක අයගෙන් ඇසී ය. "වෙන මොනව ද අපිට කරන්ඩ ඇහැක්? අපිට ධාන්‍ය ටික





ආපහු ගන්ඩත් බෑ. කොහොමටත් එයා අපිට ඒවා දෙන එහෙකුත් නෑ!"

සෙනඟ සිනාසුණහ. ඉලිකෝ පවා සිනාසුණි. සිදුවීම ප්‍රීතිමත් විසඳුමක් දෙසට ඇදෙමින් තිබූ බවක් පෙනුණි. එහෙත් මේ මොහොතේ සෙරාපියොන් සෙපෙර්ටෙලාඩ්සේ සෙනඟ පීරමින් පෙරට ආවේ ය.

"එකැස් යක්ෂයා!"යි ඔහු කඩා පිනුයේ ය. "මං බොට අනතුරු අඟවන අන්තිම අවස්ථාව මේකඃ එක්කෝ උඹ ඔය හෙණගහච්ච ඊරිගේ නම වෙනස් කරපන්, නැත්තං මම තොපි දෙන්නාගෙම ඔළුගෙඩි දෙක එකට හප්පලායි පොඩි කරන්නේ! මං එහෙම කීවා කියලා මෙතන ඉන්න මේ සෙනඟ සාක්කි දරාපුවාවේ!"

"මොකෝ මේ නුඹ බෙරිහන් දෙන්නේ? උඹේ මොළේ අවුල් වෙලා පිස්සු හැදුණ ද, නැත්තං වෙන මක්වෙලා ද?" ඉලිකෝ කඩා පැන්නේ ය.

"බලහල්ලකෝ ඒකා දිහා, මගෙන් අහනවා මොකද බෙරිහන් දෙන්නේ කියලා? ගමෙන් බාගයක් ම මගේ ගෙදෙට්ට ඇවිත් උන්ගේ ශෝකය පළ කරනවා. අසරණ සෙර්පියොන්, මළ ඌරු පැටව් දොළහක් දාපු එක මොන අවාසනාවක් ද කියලා උන් කියනවා! උඹ මට ගමේම උන් ලවා හිනස්සනවා! මං උඹවයි, මගේ නම ගඳගස්සන නම තියෙන එකියි දෙන්නාම මරනවා ම යි!"

මුළු සෙනඟම සිනාවෙන් පිපිරුණි. අනෙක් සියල්ලන් සේ ම ඉලිකෝ ද මුළු හදින්ම සිනාසුණේ ය. කිසියම් වික්ෂිප්ත බවකට පත් සෙර්පියෝන් වෙහෙසින් යුතුව ගෙදර බලා යන්නට ගියේ ය.

"ඔක්කොම පැටව් ගැනූ සත්තු වෙච්ච එක ගැන හිතනකොට... ඒ වගේ දෙයක් කවදාවත් අහලා තියෙනවා ද?"යි ඉලිකෝ කීවේ කුවුලියා ටිසිටිස්නාඩ්සේ දෙස වපරැසින් බැල්මක් හෙළමිනි.

අසල්වැසියෝ කෙමෙන් විසිර ගියහ. ඉතිරි වූයේ ඉලිකෝත්, ඉලේරියනුත්, සෙරපියෝනාත් මාත් පමණකි.

"ඒකි මාව විනාශ කළා!" ඉලිකෝ කී ය.

"අපි ගෙදර යමු." ඉලේරියන් කීවේ ය.

"ඉලිකෝ යමු." මම ද කීවෙමි.

එදින රැයෙහි අපි, අකලට මියගිය ඌරු පැටවුන් වෙනුවෙන් අවමංගලෝත්සවයක් පැවැත්වූයෙමු.

## පාසල හැරයාම

අත්තම්මා උණු අළු මත පිළිස්සූ බනිස් මෙන් එකකට එකක් වෙනස් ලෙසින් හා එකකට පසු එකක් ලෙසින් දවස් ගෙවෙමින් කාලය ග මන් කළේ ය. යුද බිමේ සිට පැමිණෙන පියවරුන්, සැමියන්, පුතුන් සහ සහෝදරයින් නිසා සෑම දවසක් ම අලුත් ප්‍රීතියක් ගෙන ආවේ ය.

යුද්ධයට ගිය ළඟ ඥාතියකු මට නොසිටියත්, මම අනෙකුන් සමඟ සෑමදා ම මහ මඟ වෙත ගියෙමි. ඒ පපුව පදක්කම්වලින් සරසාගත්, කමිස අත් වටා පටි පැලඳි සෙබළුන් ලොරිවලින් ගෙදර එනු බලන්නට ය. මම ඔවුන් වැලඳගනිමින් හෘදයංගම බවින් සිපගතිමි. අනෙක් පිරිස ද එසේ ම කළහ.

අමුත්තෝ වික්ෂිප්තව සිනා පෑහ. අසල්වැසියෝ මගේ කොපුලට තට්ටු කොට මා කොතරම් වැඩී ඇති දැයි පවසති. මින් අවුරුදු හතරකට පෙර හිටිහැටියේ ම අපේ ගමෙන් පිටව ගිය සතුට, ප්‍රීතිය සහ සාමය දැන් ආපසු පැමිණෙමින් තිබිණි. මවක තමන්ට අහිමි වී සිට හිටිහැටියේ ම යළි හමු වූ තම ආදරණීය පුතු පිළිගන්නා සේ ගම ද ඔවුන් ආශිංසනයෙන් යුතුව පිළිගත්තා ය.

ඒ 1945 වසන්තයයි...

හිරුගේ කාරුණික හිරු රැසින් සිය සිසිර නිද්‍රාවෙන් අවදි වූ සොබාදහම මල්ඵල දරමින් උන්නා ය. දුර ඈත, විල්ලුද වන් කඳුකර බෑවුම්හි ගව රංචු තණ උලා කනු දකින්නට හැකි විය. වාතලය වනමල් පුසුඹින් පිරිණි.

පාසල් කාලය නිමා විය. අපි පාසල හැරයාමේ විභාගය සඳහා පාඩම් කරමින් සිටියෙමු.

සෑම උදෑසනක ම ගම කෙළවර වූ අත්හැර දමනු ලැබූ මෝල වෙත යන මේරිත් මමත් එහි වූ උස වොල්නට් ගස යට සෙවණෙහි හිඳගෙන අපේ පෙළපොත් වෙත ඇසත් හිතත් යොමු කරන්නෙමු.

අප කැමතිම ඒ ස්ථානයේ හිඳගෙන අපි දිනක් විභාගය සඳහා ජෝර්ජියානු සාහිත්‍යයට සූදානම් වෙමින් සිටියෙමු.

"ඔයාට නං මේක කටපාඩම් ඇති, ඔන්න අහගන්න, මේක ගැලැක්ෂන්ගේ කවියක්,"යි කී මේරි ගායනා කළා ය.





*සැඟව ඇත සිහිනයක් මගේ හදවත තුළ*
*හිමිදිරිය පළොල්වන් දියරැළකි*
*තරුණයා අයැදියිඃ "රැදෙනු මැන පෙම්බරිය!"*
*යුවතිය කෝපයෙන් කියන්නීඃ "ක්නේව් නුඹ දුරිහුතව යනු!"*

"මගේ ආතම්මා නං කියනවා ඇත්තේඃ 'තෝව මහපොළොව ගිලගත්තාවේ, ලැජ්ජා නැති නීචයා' කියලයි." මම කීවෙමි.

මේරි සිනාසී ඇයට මා බාධා නොකරනු වස් ඇගේ අත්ලෙන් මගේ මුව වැසුවා ය.

ඉක්බිති, විභාගයට නියමිත එකක් නොවුණ ද, මගේ ප්‍රියතම වූත්, ඇත්තවශයෙන් ම විභාග පරීක්ෂකවරුන් ඉදිරියේ මා කීමට බලාපොරොත්තු වූත් කවිය කීවෙමි.

*සානි ගඟබඩ යළිත් මල් පිපෙයි*
*බිඟු නදින් වාතලය පණගැසෙයි*
*මී පැණි ද පරාග ද රස විඳිමි*
*යළිත් මම ඔබෙ මියුරු රතදරින්*

මේරි ඇගේ දණිස් වැලඳ හිඳගෙන සිටියේ, වලාකැටි පාවෙන දුර ඈත නිල් අහස්තලය දෙස බලමිනි. මම තවත් කවියක් හඬ නඟා කීවෙමි.

*දහස් ගණනක් අවුරුදු පුරා*
*එන්න! අයැදුම කළෙමි ඔබ හට*
*අකුණු පහරක් වී ඔබ එන විට, මම*
*මහත් වූ කැමැත්තෙන් වන්නෙමි අළු මිටක්.*

"නුඹ ආයෙමත් කවි ලියන්ඩ ගත්ත ද?" එක් වනම ඇසුණු හඬින් තිගැස්සී සතෙක් විද්දාක් සේ මම උඩ පැන නැඟිට්ටෙමි. ඉලේරියන් මට කට පුරා විරිත්තමින් හුනි.

"අපි මේ විභාගෙට ලෑස්ති වෙනවා. සුබ උදෑසනක් ඉලේරියන්!"

"විභාගෙට ලෑස්ති වෙනවා කියන්නේ මේකට ද? හොඳා හොඳා... නුඹලා දෙන්නාට ම සුබ උදෑසනක්!"යි කී ඉලේරියන් හි ගත්තේ ය. "කොහොම ද ඉතිං කාරණා කටයුතු?"

"අපි දැන් ඔක්කොම වගේ ඉවර ගාණයි." මේරි කීවා ය.

"ඔක්කොම ඉවර ගානයි ද යාන්තං පටන් ගත්තා විතර ද?"

"ඔහේ මොනව ද කියවන්නේ ඉලේරියන්! තව මේ විභාගෙ විතරයි ඉතුරුවෙලා තියෙන්නේ!" මම හඬ තැළීමි.

"නෑ මගේ රත්තරනේ, නුඹලාගේ විභාග තාම පටන් ගත්තා විතරයි. මං කීවේ මොකක් දැයි තේරුණේ නෑ කියලා බොරු කරන්ඩ එපා!"

ඔහු කීවේ කුමක්දැයි මට හොඳින් ම වැටහුණි. එහෙත් මම තවදුරටත් ඔහු දෙස ප්‍රශ්නකාරී බැල්මකින් බලා උරහිස් හැකිළුවෙමි.

ටික වේලාවක් කෝටුවකින් බිම හෑරූ ඉලේරියන් ඉන් පසු දුම්කොළ ටිකක් ගන්නට තිබේ දැයි මගෙන් ඇසී ය. නැතැයි මම කීවෙමි. එවිට තමාගේ ම පසුම්බියෙන් දුම්කොළ ගෙන කඩිමුඩියෙන් තොරව සිගරැට්ටුවක් ඔතා, එය දල්වා උරා බී, දුම් වලාවක් පිඹහැර හිටිහැටියේ ම, මා කිසිදා ඔහු වෙතින් අසා නැති අන්දමේ කතාවකට පිළිපන්නේ ය.

"මගේ ආදරණීය දරුවනේ, මනුෂ්‍ය ජීවිතේ හරියට ජල-රෝද මෝලක් වගේ. ඒ ජල-රෝදේ නුඹලට දකින්ඩ හැකි ද? ඒ තමා ඉරණම, පහළට වැටෙන වතුර තමා මනුෂ්‍ය ජීවිතේ. වතුර කියන්නේ මහ යෝධ බලයක්, ළමයිනේ. ඒක ගින්දරට වැඩි ශක්තිමත්, හුළඟට වැඩි ශක්තිමත්, ඒකට ගලක් වුණත් හිල් කරලා දාන්ඩ පුළුවන්. මේ බලය හරවන්නේ කොහාට ද කියන එක බාර උඹලටයි... හැම ජාතියක ම මිනිස්සු මෝලට එනවා: සමහරු තමන්නේ ධාන්‍ය ටික පිටි කරගන්ඩ, අනික් අය ඒවායේ පොතු ඇරගන්ඩ, තවත් අය ඔහේ එනවා, ඒ අයට එතැනින් කරගන්ඩ දෙයක් නෑ. එයාලා ඇඹරුම් ගල් ඇඹරෙන සද්දේ දවස තිස්සේ අහන් ඉඳලා යන්ඩ යනවා... මට මතකයි අපේ පුංචි ලවාෂේ ගඟේ අපේ සමූහ ගොවිපොළට මෝලක් ගොඩනගාපු කාලේ. වතුර දැඟලුවා, දැඟලුවා... ඒත් ඒකට රෝදේ කරකවා ගන්ඩ තරං හයියක් තිබ්බේ නෑ. එතකොට අපි කළේ ගඟේ අනිත් අතු ගංගාව ඒකට සම්බන්ධ කරපු එක. මෙන්න වැඩේ පන්කාදු පහට හරිගියා. රෝද කිරි කිරි ගාගෙන කැරකෙන්ඩ වුණා! දන්නවා ද ඇයි මේ කතාව මං උඹලා දෙන්නට කියන්නේ කියලා? ගංගා දෙමහකට පුළුවනි තනි ගඟකට වඩා දේවල් කරන්ඩ, නැද්ද? උඹලා තව දවස් කීපෙකින් ඉස්කෝලෙ ගමන ඉවර කරනවා. මං හිතන්නේ උඹලා තව ඉස්සරහට ඉගෙන ගන්ඩ හිතනවා වෙන්ඩ





ඇති කියලා... ඒක හොඳට ම හොඳා... ඒත්... මොකක්දෝ හේතුවක් හින්දා මිනිස්සුන්ට නගරෙට ගිය හැටියෙම ගම අමතක වෙලා යනවා. උන්ට තමන්ගෙ යාළුවොත් අමතක වෙනවා... නුඹත් නගරෙට යනව ද මගේ කෙල්ලේ?" ඉලේරියන් හිටිහැටියේ ම මේරිගෙන් ඇසී ය.

"මං එහෙම හිතන්නෙ නෑ ඉලේරියන් මාමේ... නගරෙ විද්‍යාලෙකට මං ඇතුළු වෙයි කියලා මං හිතන්නෙ නෑ..."

"එහෙනං ඔක්කොම හරි. ඒ කියන්නේ සුරිකෝත් අපිව දාලා යන්නෙ නෑ කියන එක," මගේ උරහිසට පහරක් ගැසූ ඉලේරියන් නැගිට්ටේ ය.

මේරි වික්ෂිප්තව බිම බලාගෙන උන්නා ය.

"මුළු ලෝකෙම උඹලාට ඇරිලා, ළමයිනේ, ඔව් මුළු ලෝකෙ ම! එතකොට ඉලිකෝයි මමයි හරියට මේ පරණ හැතැප්ම කණුව වගේ,"යි ඉලේරියන් කීවේ තණගොල්ලෙහි වැටී තිබූ පැරණි හැතැප්ම කණුවකට ඇඟිල්ල දිගු කරමිනි. විශාල කටුස්සෙක් ඒ මත දිගාවී අව්ව තැප්පේ ය. උගේ ඇස් පියැවිලා ය.

... ප්‍රජා ශාලාව මෙන් දෙගුණයක් වූ තේ සම්පාදක කාර්යාලයේ දී, ගරු ගාම්භීර වටපිටාවක් මැද අපගේ පාසල් හැරයාමේ සහතික අපට ප්‍රදානය කෙරිණි.

අපේ පාසලේ වාදක වෘන්දයක් නොතිබූ හෙයින් පාසල හැර යන එක් එක්කෙනාට සහතිකය පිරිනැමෙන විට තූර්යඝෝෂයක් වාදනය කිරීම පිණිස නගරයේ අවමංගල ගීතිකා කණ්ඩායමකට ඇරයුම් කොට තිබිණි. උත්සවය ඇරඹීමට පෙර, රොමුලිගේ ඉල්ලීම පිට ගීතිකා කණ්ඩායම 'පොඩි පුතෙක් උන්නේ ය අම්මාට' නම් ගීතය වාදනය කළේ ය. ඊට වඩා ප්‍රීතිමත් ගීයක් වාදනය කරන මෙන් මම සංගීත කණ්ඩායමේ නායකයා වූ ක්ලැරිනට් වාදකයාගේ සාක්කුවට රූබල් හතක් බලෙන් ම එබුවෙමි. සංගීත කණ්ඩායම 'හා... ස්පිරිදොන් සොයුරේ...' ගීතය වයන්නට විය. කිසිවෙක් ගැමි ගීයක් ගයන්නැයි කීහ. එහෙත් නායකයා කියා සිටියේ ඔවුන් සතුව ගැමි ගී සඳහා අවැසි සංගීත භාණ්ඩ නැති බව ය.

සියල්ලන් රැස්වූ විට උත්සවය ඇරඹිණි. ගුරුවරු සහ හොඳම සිසුන්ගේ මව්පියෝ වේදිකාව ඉදිරිපිට ම වූහ. මගේ අත්තම්මා මෙයට සහභාගි නොවූවා ය. ඇය එදින සිටියේ අසනීප ගතියකිනි.

කියලා. මිනිහකුට සැලැස්මක් තියෙන්ඩ එපායැ, නගරෙ දී මෝඩයෙක් වගේ පේන්නෙ නැතුව ඉන්ඩ නං.” ඉලේරියන් කීවේ ය.

“විශ්වවිද්‍යාලෙ මොන අංශෙට ද තුඹ යන්ඩ හදන්නේ?” ඉලිකෝ මගෙන් ඇසී ය. මම උරහිස් හැකිළීමි.

“මගේ මුණුපුරා දොස්තර කෙනෙක් වෙන්ඩ ඕනෑ.” අත්තම්මා ප්‍රකාශ කොට සිටියා ය. “මම දැන් නාකි ගෑනියෙක්. මට හොඳ දොස්තර කෙනෙක්ගේ බලා කියාගැනීම ඕනෑ!”

“ඒ කියන්නෙ ඔහේට ඕනෑ මේකාගේ අත් දෙක උඩ මැරෙන්ඩ ද?” ඉලිකෝ ඇසී ය.

“ඉතිහාස අංශෙට ඇතුළු වුණොත් හෙම මොක ද?” ඉලේරියන් ඇසී ය.

“මම වුණා නං, මං තෝරාගන්නේ නීතිය! බලනවා අපේ නඩුකාරයා දිහා. මිනිහා දැන් හැම පැත්තෙන් ම මිනිහෙක් වෙලා. අපේ ගමට මුලින් ම එද්දී එයා ඇන්දේ ඉරිච්ච අත් මේස්. දැන් කොහොම ද, ඉස්තරම් හම් කබාය, පන්කාදු බූට් සපත්තු!” ඉලිකෝ කියා සිටියේ ය.

“නෑ, නෑ, නීතියෙ දේවල් කරන්ඩ තරං එයා කරුණාබර වැඩියි. එයාට කවදාවත් අපරාධකාරයෙක් ව අත් අඩංගුවට ගන්ඩ බැරිවේවි.”

“සාහිත්‍යය විශේෂ කරලා ඉගෙන ගත්තොත් හෙම මොකද? එයාට හොඳට කතා කරන්ඩ පුළුවනි වගේ ම කවිත් ලියනවා. වෙන මොනව ද ඒකට ඕනෑ.”

“කෙනෙක්ව කෙළින්ම මහාචාර්ය කෙනෙක් කරන විද්‍යාලයක් එහෙම නැද්ද?” අත්තම්මා ඇසුවා ය.

“ඇත්තවශයෙන් ම තියෙනවා!” ඉලේරියන් ප්‍රමුදිතව කීවේ ය. “අපේ ඉලිකෝ උපාධිය ගත්තේ ඒකකින් තමා.”

“හැබැට තුඹට මක්වෙලා ද, දිව ගිලිලා ගිහින් ද?” ඉලිකෝ මා වෙත බුරා පැන්නේ ය. “තුඹ කරන්ඩ හිතා ඉන්නේ මොකක් ද කියලා කෙළින් ම අපට කියාපන්. පේන්නැද්ද මේ නාස්-දිග නීචයා උගේ දෙබෑවෙච්ච දිව අදින හැටි!”

“මම නළුවෙක් වෙනවා!” මම නොසිතා ම කියා දැමීමි.

එහි ඇති වූයේ මාරක නිහැඬියාවකි.

“මගේ දුප්පත් නාකි ඇස් පොට්ටවෙලා පලච්චාවේ! ඒකෙන් ජීවිතේ මහ නොසන්ඩාල වෙනවා!” අත්තම්මා වැලපුණා ය.





“මේකගේ සිහිය අවුල්වෙලා වගේ!” ඉලේරියන් කීවේ ය.

කළුවර වැටෙන තුරුම වාදය පැවැතියේ ය. අන්තිමේ දී අපි ඉලේරියන්ගේ යෝජනාවට එකඟ වූයෙමු. එනම් අමාරු අඩියක සිටින මිනිසෙක් තමන්ගේ අනාගත යහ පැවැත්ම සඳහා මොනවා හෝ උපයන වැඩකට යා යුතු බවයි.

අත්තම්මා ඇගේ කරෙන් රිදී මාල පොට ගැලවූවා ය. එහි රඳවා තිබූ ලොකු පැතැලි යතුරෙන් ඈ අපේ පරණ පෙට්ටගමේ අගුල හැර, පියන ඔසොවා, සීයාගේ කොළ පැහැ විල්ලුදයෙන් කළ, අසුන් පිට යද්දී අඳින කොට කලිසම ද, වානේ අඩියෙන් යුතු කදිම යෝධ හම් බූට් සපත්තු යුගලක් ද, විසල් සාක්කු අල්ලා මැසූ ලෝම උඩුකය ඇඳුමක් ද, රිදී බඳ පටියක් සහ උස් අස්ත්‍රඛාන් තොප්පියක් ද ගාම්භීර ලෙසින් එළියට ගත්තා ය. මේ ඇඳුම් පැළඳුම් මා ඉදිරිපිටින් තැබූ ඈ ඒප්‍රණයෙන් කඳුළක් පිසදමා කතා කළා ය.

“මේවා ඇඳගනින් පුතේ. නොදන්න නගරෙකට උඹව හිස් අතින් යවන්ඩ දෙන්ඩ බෑ මට. උඹ මුළු කාණ්ඩෙන් ම හොඳට ම ඇඳගෙන ඉන්න මිනිහා වෙන්ඩ ඕනෑ මගෙ කොල්ලෝ.”

අත්තම්මා වැලඳගත් මම ඇගේ දෑස් මෘදු ලෙස සිපගෙන, අනෙක් කාමරයට දුවගොස් ඉක්මනින් ඇඳුම් මාරුකොට ‘කොමිසම’ ඉදිරියේ පෙනී සිටියෙමි.

“බලහල්ලකෝ! සිමෝනා ඩොලිඩ්සේමයි, කිසි අඩුවක් නෑ!” ඉලිකෝ විරිත්තමින් කී ය.

…ඉරිදා උදේ පාන්දර ම අත්තම්මාත්, ඉලිකෝත්, ඉලේරියනුත් මමත් මහපාර අද්දර සිටගෙන සිටියෙමු. ඒ මෝටර් රියක් නවතා ගන්නට බලමිනි. සිහින් වැසිපොදක් ඇල හැඩැතිව ඇද වැටෙමින් තිබිණි. වෙවුලුම්කන සීතල සුළඟකි.

“වාහනේට නැග්ගම ඩ්‍රැයිවර් ළඟින් ම ඉඳගන්ඩ ඕනෑ හොඳේ!” අත්තම්මා කීවා ය.

“හුගක් සුදු ලූනු කන්ඩ අමතක කරන්ඩ හෙම එපා. නැත්තං මොනවා හරි විෂබීජවලට ලෙඩ වෙන්ඩ බැරි නෑ.” ඉලේරියන් මට අවවාද කළේ ය.

“වාහනේට ගොඩවුණ හැටියෙම සැන්ට් ටිකක් ඉහගන්න එක හොඳා. මකුණන්ගෙන් බේරෙන්න හොඳම විදිහ ඒකයි. ඔය වාහනවල හැම ජාතියෙම නීචයො ඉන්නවා.” ඉලිකෝ අනතුරු හැඟවිය.

"මං තොට ලියුමක් එනකං බලා ඉන්නවා." ඒ අත්තම්මා ය.

"වැලිහුම් එකක් එවන එක වඩා හොඳා. නැත්තං ඔය මේ පැත්තට එන කවුරු හරි අතේ තුණ්ඩු කැල්ලක් එව්වත් ඇති!"

"ඔය නගරෙ හාදයො එක්ක පැහෙන්නෙ බලාගෙන!"

"ඉක්මනට ආපහු එන්ඩ ඕනෑ හොඳේ!"

"නුඹට වයින් ටිකක් එහෙම ඕනෑ වුණොත්, මට ලියා එවන්ඩ ඕනෑ. ලැජ්ජා වෙනවා හෙම නෙවෙයි!"

අන්තිමේ දී අපේ වියරු අත් වැනීමට ප්‍රතිචාර දෙමින් ලොරියක් නැවැත්වී ය. ගැහැනියක් සහ ළමයෙක් එතුළ හිඳගෙන උන්හ. ඇස්වන දෝසවලින් මා ආරක්ෂා වනු පිණිස අත්තම්මා මා තුන් වටයක් කරකැවූවා ය. ඉලිකෝත්, ඉලේරියනුත් දෙදෙනා ම හාදයාංගම ලෙසින් මා සිපගත්හ. මම ලොරියේ පිටුපසට බඩගා ගතිමි. ලොරිය පිටත් විය.

හිටිහැටියේ ම පොදියක් අතින් ගත් ගැහැනු ළමයකු පාරේ පෙනෙන්ට විය. ඈ උන්නේ හැකි තරම් වේගයෙන් දුවමිනි. ලොරිය වේගය වැඩි කළේ ය. ඇය ද තවත් හයියෙන් දුවන්නට වූවා ය. එහෙත් කෙමෙන් ඇගේ වේගය අඩුවිය. මගෙන් සමුගැනීමට ඇයට නොහැකි විය. දිගු වේලාවක් දැසින් ලොරිය හඹා ආ ඇය ඉක්බිති ඉවත හැරී ඉලිකෝගේ ජැකට්ටුව වෙත හිස ඔබා ගත්තා ය. මා ද සිටියේ හඬමිනි. මුළු ලෝකයෙන් ම ම විසින් වැඩියෙන් ම ආදරය කරනු ලබන සිවුදෙනාගෙන් වඩාත් ඈතට ඈතට මා ගෙන යමින් ලොරිය තව තවත් වේගය වැඩි කළේ ය.

සිහින් සිරිපොදයක් වැටිණි, සුළඟ වෙවුලුම්කනසුලු ය. මට සීතල දැනිණි. දුර ඈත එහි දැන් මිනිසුන් සිවුදෙන සිටගෙන සිටිති. ගැහැනු ළමයා ඉලිකෝගේ පපුවට හේත්තු වී අඬන්නී. මම ද හඬන්නෙමි. මම එකවිට හඬමින් සහ ප්‍රීතියෙන් ඉපිලෙමින් සිටිමි. ඈ හඬනු ඇත්තේ මා වෙන්ව ගිය නිසා විය යුතු ය. වැස්ස තිබිණි, සුළඟ තිබිණි, හිරු ද තිබිණි, ආදරයේ සහ ප්‍රීතියේ කඳුළු ද තිබිණි. අහසෙහි සඳ සහ හිමපියලි ද තිබිය යුතු බවට ඉලිකෝ පවා විරෝධය නොදක්වනු ඇත. මේ ප්‍රීතියේ කඳුළු මැද මට නිදාගන්නට නොහැකි ඇයි, මා වාසනාවන්ත මිනිසකු නොවේ ද?

ලොරිය දිගට ම දිගට ම පෙරට පෙරළී ගියේ ය. දැන් මට පාරේ කිසිවකු දකින්නට නොහැකි ය. මම ලොරිය පිටුපස නැඟී සිට මිමිණුවෙමි.





"ගිහින් එන්නම් අත්තම්මේ!"

"ගිහින් එන්නම් ඉලේරියන්!"

"ගිහින් එන්නම් ඉලිකෝ!"

"ගිහින් එන්නම් මේරි!

## දුම්රිය

ලොරි රියැදුරා මා මකරාඩ්සේ දුම්රියපොළට ගෙනගොස් ගාස්තුව ඉල්ලා සිටියේ ය. රිදී බඳපටිය ගැලවූ මම මගේ බුරුල් උඩුකය වැස්මේ වාටිය උස්සා කලිසම ගලවන්නට ගත්තෙමි. රියැදුරා හීතියෙන් වටපිට බලා මගේ අතින් අල්ලා ගත්තේ ය.

"නුඹට මක්වෙලා ද මේ?"

"ඇයි ඔහේ මට කීවා නෙව ද ගෙවන්න කියලා!"

"ඉතිං මට ගෙවන්ඩ කලිසම ගලවන්ඩ ඕනෑ ද?"

"සාක්කුවට අත දාන්ඩ පුළුවන් ඇතුළෙන් විතරයි,"යි විස්තර කළ මම දිගට ම ඇඳුම් ගැලවීම සිදුකළෙමි. අන්තිමේ දී රහස් සාක්කුවට අත දමාගන්නට මට හැකි විය. එක අතකින් කලිසම අල්ලාගත් මම අනිත් අතින් සාක්කුවේ වූ මුදල් ඇදගන්නට උත්සාහ කළෙමි. අන්තිමේ මුදල් එළියට ඇද ගාස්තුව සඳහා ගණින්නට ගන්නවාත් සමගම, ලොරිය කීප වතාවක් කිවිසුම් හැර දම් පැහැ දුමාරයක් මගේ මුහුණට දමා ගැසී ය. මා යළි පියවි ලොවට එද්දී, ලොරිය වටයක් කරකැවී එක්වර ම මා ඉදිරිපිට නැවතුණි. සිනාවකින් දෙකඩ වී තිබූ රියැදුරුගේ රත් පැහැ මුහුණ රියෙන් එළියට එබුණි. ඔහු මගේ තොප්පිය මගේ දැස් වැසෙන සේ තදකොට මහ හඬින් සිනාසී කතා කළේ ය.

"ගාස්තුවෙන් කමක් නෑ, ඔය කලිසම ඇඳගන්නවා, මට තමුසෙගෙ සල්ලි ඕන නෑ."

ඇන්ජිම තවත් කිවිසුමක් පිට කළේ ය. ලොරිය වේගයෙන් යන්නට ගියේ ය.

"ආයුබෝවන්!" මම රියැදුරුට හඬගා කීවෙමි.

කලිසම අඩක් පහතට හෙළාගෙන සහ සිහිමුළා ගතියෙන් ඇස් හයා වටපිට බලන මා චතුරශ්‍රය මැද ඉතිරිකොට රියැදුරා මිතුරු ලීලාවෙන් අත වනා යන්නට ගියේ ය.

ප්‍රවේශපත් කාර්යාලය ළඟ දී ඇති වූ කෙටි කතාබහකින් මා දැනගත්තේ ටිබිලිසි දක්වා යෑමට ප්‍රවේශපතක් ගන්නවාට වඩා ප්‍රවේශපතක් නොමැතිව යාම වඩා පහසු බවයි. ඉතිං ප්‍රවේශපතක් ලබාගැනීමේ අදහස ඉවත දැමූ මම කෙළින් ම පදික වේදිකාවට ඇතුළු වුණෙමි.

පැයක් ඇතුළත දුම්රියක් පැමිණුණි. මගීහු මා අල්ලා මැදිරියට නගින පඩිපෙළට තද කළහ. මා පොඩිපට්ටම් විණි. මට මහ හඬින් කෑගැසීමට ඕනෑ විය. එහෙත් කොන්දොස්තරගේ සපත්තු අඩිය නිසා මගේ කට නැවතුණි. හිසෙන් අල්ලා එල්ලා ගැනුණු කුකුළ පැටවකු මෙන් මට හැකිවූයේ අසරණව අත් පා ගසන්නට පමණෙකි. ඒ මදිවාට කාගේදෝ දණ මගේ කොන්දේ ඇනෙමින් තිබිණි. ඉන් පසු කවුදෝ මගේ කෙස්සෙන් අදින්නට විය. මගේ 'පරිණත සහතිකයට' හානි වෙතැයි ඇති වූ භීතියෙන් මම කොන්දොස්තරගේ සපත්තු අඩිය හැකි වෙර යොදා අල්ලා ගතිමි. දුම්රිය ඇන්ජිමත් කොන්දොස්තරත් එක සමව හඬතැළී ය. කෑගැසුම් හඬ උස්ව නැඟිණි.

"තමුසේ මොකෝ ඔතන හිටන් ඉන්නේ! ඉස්සරහට තල්ලු කරගෙන යනවා!"

"තමුසෙගෙ කකුල මගේ ඔළුව උඩින් අහකට ගන්නවා!"

"කරදර වෙන්ඩ එපා මහත්තයා, මං කකුල හොඳට හෝදලා ඉන්නේ!"

"එහෙනං අනික් කකුලත් එතනින්ම තියනවා!"

"හිල් කරනවා!"

"ඒ මොකට ද මාව හිල් කරන්නේ?"

"තමුසෙව නෙවෙයි, තමුසෙගෙ ටිකට් එක!"

"මහත්වරුනේ, මට ඇතුළට යන්ඩ දෙනවා, මට ටිකැට් එකක් තියෙනවා!"

"ඒක හයියෙන් අල්ලගෙන තියාගන්නවා!"

"මගෙන් හොරකං කරලා!"

"ඔය සූට්කේස් දීපන් බැල්ලිගෙ පුතෝ! ඒකෙ පෙයාර්ස් ඇරෙන්ඩ වෙන මොකුත් නෑ!"

"පොලිස්! වෙඩි තියන්ඩෝ!"

"කාට ද? කොහෙද තමුසෙගෙ හොරා?"

"එහෙනං මට වෙඩි තියනවා!"





"එහාට වෙනවා!"

හීන් නළා හඬක් නැඟිණි. ඉක්බිති සීනුවක් දෙවරක් හැඬවිණි. එවිට ම කිසිවකුගේ ආශිර්වාද ලත් තල්ලුවකින් මා දොරින් ඇතුළට යැවුණි. ඒ මොහොතේ ම ඇන්ජිම හරියට ම මා දුම්රියට ඇතුළු වන තුරු බලා සිටියාක් මෙන්, එක්වර ම ගැස්සී, ඇතුළට එන්නට බැරි වූවන්ගේ බෙරිහන්දීම් සහ වැලපීම් ගිල්වා දමමින් එක්වර ම ගැස්සී හූවක් තැබුවේ ය.

කෙමෙන් කලබැගෑනිය අඩුවිණි. මම උඩින් වූ රාක්ක තට්ටුවට නැඟ ගතිමි. සාමාන්‍යයෙන් ඒවා වෙන් කොට ඇත්තේ නිදාගැනීමට ය. මම මගේ බඩු පොදිය කොට්ටයක් සේ තබාගෙන අස්ත්‍රඛාන් තොප්පියෙන් මුහුණ වසා ගතිමි... දුම්කොළ දුම මගේ දෑස් පුපුරු ගැස්වී ය. මැදිරිය එහාට මෙහාට වැනෙමින් කිරි කිරි හඬ නැංවී ය. රෝද ඒකතානමය හඬකින් කට කටස් කට කටස් හඬ දුනි. මේ හඬ ඉතා ළඟ වූත්, ඉතා දුර වූත් කිසිවක් මට සිහිපත් කළේ ය. එය කොතෙක් දුර එකක් දැයි යත් මට එය සිහිකර ගත නොහැකි විය. මම දෑස් පියාගතිමි... මම පාවෙමින් හුනිමි... මගේ දෑස් ඉදිරියේ මීදුමක් නැඟිණි... නිදිබර බව දැනෙන විට ලෝකයේ ඇති බරැති ම දේ ඇසිපිය ය... ඒත් අර කට කටස් හඬ නඟන්නේ කුමක් ද? ආ, මම සිටින්නේ ජල-රෝදයෙන් දුවන මෝල ළඟ ය. ඒ හඬ එන්නේ ඇඹරුම් ගලෙනි. මගේ ධාන්‍ය ටික අඹරන වෙලාව එන තුරු මම නින්දට වැටුණෙමි. එකවරම ආත්තම්මා කතා කරනු මට ඇසුණිඃ

"සූරිකෝ!"

"එනවා!"යි කෑගැසූ මම උඩ පැන නැඟිට්ටෙමි.

"සූරිකෝ!" අත්තම්මා යළිත් කතා කළේ අත හිරු එළියට මුවා කරගනිමිනි.

"එනවා ආත්තම්මේ, මම එනවා!" මීදුමෙන් වැසුණු කඳු පාර උඩහට දුවමින් මම කෑගැසුවෙමි.

"හූ, සූරිකෝ! නුඹ කොහේට ගියා ද? හූ!" දුම්රියේ හූ හඬ අත්තම්මාගේ චින්තාපර හඬ සමඟ එකට මුසු විය.

"ඉල්...ලේ...රී...යන්.... ඉල්....ලීකෝ... ඉල්...ලේ...රී...යන්. ඉල්...ලීකෝ..." රෝද හඬ නැඟී ය.

"පාලම!" දුර ඈතින් කිසිවෙක් කියනු මට ඇසිණි.

"ඒයි කවුරුහරි ජනේලෙ අරිනවා, මෙක අස්සෙ හුස්ම ගන්ඩ බෑ." තවකකුගේ හඬ විඥානයට ළඟා විය.

"අපි මාරුවෙන් මාරුවටවත් හුස්ම ගනිමු, නැත්තං ටිබිලිසිවලට යනකං හුලං ඇතිවෙන එකක් නෑ." තුන්වැන්නෙක් මහ හඬින් කී ය.

"කාගෙ ද මේ සූට්කේස් එක? ගන්නවා මගේ කකුල් උඩින් ඒක, නැත්තං මං වීසි කරනවා ජනේලෙන් එළියට!"

මේ මොහොතේ දී අවදි වූ මම, මේ කේන්තියෙන් යුතු මගියා දෙස බලන්නට පහතට නැමුණෙමි. ඔහුට වූයේ කෙටේරියක් වන් නාසයකි. මුහුණේ ඉතිරි සියල්ල ද කිසියම් ලෙසකින් ඉතා තියුණු විය.

"හොඳා එහෙනං කරලා බලනවා! මම තමුසෙවත් ඒ පස්සෙම ජනේලෙන් එළියට වීසි කරනවා!" ඔහුගේ ළඟ සිටි මගියා ගෙරවී ය. මහත දෙහෙත ඇති මිනිසකු වූ ඔහුගේ මුහුණ කළුකුම් බිත්තරයක මෙන් ලපවලින් පිරුණේ විය. "මේ සූට්කේස් එක එනකං ටිබිලිසිවල මෝල්ලු හතර දෙනෙක් බලා ඉන්නවා හරියට ස්වර්ගයෙන් දිව්‍ය භෝජන එනකං වගේ."

"තමුසෙගෙ මොට්ටයෝ ගැන බකමූණු හූවක් තරංවත් මට ඇති කාරියක් නෑ. ඒත් මගේ ඉරිඟු අයිති මටයි. මේ සූට්කේස් එක මගේ කකුල උඩින් අරගන්නවා, මං නොකිවුවා කියන්ඩ එපා, මං මේක ජනේලෙන් වීසි කරනවා ම යි!" කෙටේරි මුහුණා යළිත් අනතුරු හඟවනසුලුව කී ය.

කළුකුම් බිත්තරයා නොකැමැත්තෙන් සූට්කේසය ගෙන හිස එසැවී ය.

"ඒයි, ඔහේගේ නම මොකක් ද?" ඔහු මා ඇමතී ය.

"සූරිකෝ!"

"වහාම බහිනවා බිමට! හරියට තමන්ගෙ ඇඳ වගේනේ අතපය දිගෑරගෙන දපලා ඉන්නේ! ඔය රාක්කෙ තියෙන්නේ සූට්කේස් තියන්ඩයි, ජේනව ද?"

"මං ඔහේගෙ සූට්කේස් එකට වඩා නරකයැ?"

"කිසිම සැකක් නෑ. මේ සූට්කේස් එකට තුන්දාහකට හරියන තරං කෑම ජාති අල්ලනවා. එතකොට ඔහේගේ ඔළුගෙඩියට අල්ලන්නේ මොනව ද?"

"මොකෝ මහත්තයා අපහාස කරන්නේ?"

"අනේ සමාවෙන්ඩ ඕනෑ, මහාර්ඝ උතුමාණනි! දැන් ඔය රාක්කෙන් බහිනවා, හ්ම්, ඉක්මනට!"





"මම ඉන්නේ මම ඉන්න තැන ම යි! ඔහේ හිතන්නේ මටත් ගෙදර සූට්කේස් එකක් නෑ කියල ද? මටත් තියෙනවා, ඒත් මං ඊට වඩා දන්නවා ඒක අරන් එන එක ගැළපෙන්නේ නෑ කියලා. සූට්කේස් එකක් කෝච්චිවල ගමන් යන්නේ මොහොකට ද? ඒකෙ තැන තමයි සෝපාව යට. ඕක ඔහේගෙ පයිප්පෙට දාලා දුං උරනවා!"

"බලහල්ලකෝ මේකා මට කතා කරන නැහැදිච්ච විදිහ. මොට්ටයා! දැනගන්නවා, මට පුත්තු ම හතරක් ඉන්නවා, ඒ හැමෝ ම තමුසෙට වැඩිමහල්!" කළුකුම් බිත්තරයා පුපුරා හැලුණි.

"එතකොට එයින් එක්කෙනෙක්ව එයා ඉන්න තැනින් එළවලා දානවා දකින්ඩ ඔහේ කැමති ද?" කෙටේරි මුහුණා ඇසී ය.

"හෝ, එහෙම ද ඔහේට දැනෙන්නේ? බොහොම හොඳා එහෙනං, ඔය කුක්කා එතන ම දපාපුවාවේ. මං මගේ සූට්කේස් එක තමුසෙගෙ කකුල උඩම තියනවා! ඒක කොහේ තිබුණම මට මොකෝ?" කළුකුම් බිත්තරයා එසේ කියමින් හිඳ ගත්තේ ය

"ඒයි හොටුවා, බහිනවා බිමට! මේ දැන්ම බහිනවා!" මා හෝ තමාගේ කකුල යන දෙකින් එකක් බේරාගත යුතු බව පෙනුණු කෙටේරි මුහුණා බෙරිහන් දුන්නේ ය.

"මම බහින්නෑ." මම සිවිලිම දෙස බලමින් කීවෙමි.

"කොන්දොස්තර!" කළුකුම් බිත්තරයා හඬතැලී ය.

කොන්දොස්තරවරයා පළමුව සිය ලන්තෑරුම මැදිරියට තල්ලු කළේ ය. ඉන් පසු ඔහුගේ නාසය ද, මුළු සිරුර ද මැදිරියට තල්ලු විණි. ඔහු ප්‍රවේශපත් පරීක්ෂා කරන්නට ඉල්ලී ය. ඊළඟ මොහොතේ ඔහුට ම ආවේණික වාම් බවකින් සිනා පෑ ඔහු ගාස්තු සඳහා මුදල් සූදානම් කරගන්නා මෙන් අපට කියා සිටියේ ය.

ප්‍රවේශපත් ඇති මගීන් දෙදෙනකු සිටි බව සොයා ගැනුණි. කොන්දොස්තරවරයා ඔවුන් දෙස සැකමුසු ඇසින් බලා යන්නට ගියේ ය.

මැදිරියේ වූයේ නිහැඬියාවකි. සෑම අයකු ම සිටියේ තමන්ගේ ම වූ දේ ගැන කල්පනා කරමිනි. දුම්රියේ රිද්මයානුකූල පැද්දීමෙන් නැළවීමට පත් මම, අයුතු ලෙස අල්ලා ගැනීම්වලට එරෙහිව ම විසින් රැකගත් තට්ටුව මතම යළිත් නින්දට වැටුණෙමි... පිටේ ඉරිඟු මල්ලක් එල්ලාගෙන අපේ වත්තට ඉලිකෝ ඇතුළුවෙනු මම සිහිනෙන් දුටුවෙමි. රට කරඹ ගස යටින් මල්ල අතහැරි ඔහු සෙවණෙහි හිඳගෙන, සිගරැට්ටුවක් ඔතා දල්වා ගති.

"මටත් දුමක් දෙනවකෝ ඉලිකෝ!" මම ආයාචනා කළෙමි. එහෙත් ඉලිකෝ මා දුටු බවක් නොපෙනිණි. ඔහු ඔහේ දුර ඈත දෙස නෙතු හයා බලා සිටියා පමණෙකි.

"ඉලිකෝ මාමේ, අනේ රත්තරනේ, මට දුංකොළ ඇබින්දක් දියංකෝ! නුඹට මාව අඳුනාගන්ඩ බැරි ද? මේ මම ඉලිකෝ!"

ඉලිකෝ නැගිට මීදුම තුළට අතුරුදන්ව ගියේ ය.

"ඉලිකෝ...ඕ...ඕ...!" මම ඔහුට අඬ ගැසුවෙමි.

"කවුද ඔය කෑගහන්නේ?"

මම තිගැස්සී අවදි වීමි. මගීහු නිදිකිරා වැටෙති. මැදිරියේ ජනේලවලට වැසි බිඳු තදින් පහර දෙයි. තෙතැති ගස් වේගයෙන් පසුපසට ඇදී නොපෙනී යයි. එක්වර ම සීතල බිඳුවක් මගේ නළලට ඇද වැටුණි. ඉක්බිති තව එකකි. එයිනුදු පසුව දිගට ම එක සීරුවෙන් දිය බිඳු වැස්සිනි. මම එතැනින් මෑත් වුණෙමි. ඉක්මනින් ම තට්ටුව මත දියවළක් සැදුණි. මම ඇඟිල්ලෙන් එහි සිට දිය පාරක් ඇඳගෙන ගියෙමි. ඒ දිගේ ගලාගිය ජලය කිසිවකුගේ හිසට බිඳෙන් බිඳ වැස්සෙන්නට විය.

"මොකද වෙලා තියෙන්නේ කාලකණ්ණියෝ!" ඊට ගොදුරු වූ මිනිසා හිස පිස දමමින් ද ඉන් තෙත් වූ අත්ල සැකමුසුව ඉවකොට බලමින් ද බෙරිහන් දුන්නේ ය.

"මට මොකවත් වෙලා නෑ. වහලෙ හිල්වෙලා."

"එහෙනං හිතා බලනවා මොනවා හරි..."

"මං මොනවා හිතන්ඩ ද? බැහැලා වහලේ හරිගස්සන්ඩ ද?"

"දෙඩවිල්ල නවත්තාපන් මෝඩයෝ! තමුසෙට බැරි ද ඔය හිල වහන්ඩ?"

හිඳගත් මම සිවිලිම පුරා ඇඟිල්ල දුවවා, හිල සොයා එතුළට මගේ ඇඟිල්ල එබුවෙමි. දිගහැරගෙන තිබූ අත දිගේ වතුර ගලාවිත් මගේ උඩුකය වැස්ම තුළට වැදුණේ ය. බඳපටිය බුරුල් කළ මම එම දිය ගලා යන්නට හැරියෙමි. ඉක්මනින් ම මගේ බූට් සපත්තු අඩක් ම දියෙන් පිරී ගොස් ඇති බව මට දැනුණි.

"වැඩක් වෙන්නේ නෑ." මම තට්ටුවෙන් පහතට නැමී කීවෙමි.

"මේ වගේ වතුර බේරෙන කරත්තෙක යන්ඩ අපෙන් හොඳ සල්ලිත් ගන්නවා නෙවැ හැබැට!" ප්‍රවේශපත හිමි මගියා කෝපයෙන් කීවේ ය.





"ඔහේගෙ උගුල වහගන්නවා හොඳා, අපි නං දැක්කේ නෑ තමුසේ කිසිම හොඳ සල්ලියක් ගෙවනවා." ප්‍රවේශපත් නැති අයගෙන් අයෙක් කඩා පැන්නේ ය.

මා බිමට පනිද්දී මගේ සපත්තුවලින් උල්පතකින් මෙන් ජලය විහිදී ගියේ ය.

"ඔය බූට් සපත්තු ගලවා දමාපන් කොල්ලෝ, හෙම්බිරිස්සාව හැදේවි. කෝ කකුල දික්කරනවා, මං ඒවා ගලවන්ඩ උදවු කරන්නං." කෙට්ටේරි මුහුණා මට අවවාද දෙමින් අත දිගු කළේ ය.

"උදවු ඕන නෑ මහත්තයෝ."යි කී මම ඉහළින් වූ තට්ටුවේ කෙළවර අල්ලාගෙන ඉහළට ඉස්සුණෙමි. බූට් සපත්තු දෙක පහසුවෙන් කකුලෙන් ලිස්සා වැටුණි.

"බලනවාකෝ ඒ දිහා!" කළුකුම් බිත්තරයා විස්මයෙන් හඬ තැළී ය. "මොකෝ නුඹ ඔය තරං තද සපත්තු දාන්නේ පුතා? ඔයිට ඩිංගක් ලොකු දෙකක් ඇනවුම් කරන්ඩ බැරි වුණා ද?"

සියල්ලෝ සිනාසුණහ. පරණ එදිරිවාදීන් දෙදෙනා අතරින් මිරිකී බංකුවේ හිඳගන්නට මම සමත් වුණෙමි. වැස්ස නැවතුණි. සියල්ලෝ සැනසුම් සුසුම් හෙළූහ. මම කෙමෙන් උණුසුම් වෙන්නට වීමි.

"මේ බලනවා, මේ උලව් සූට්කේස් එක මගේ කකුල උඩින් දැන්වත් අරගන්නවා, නැත්තං සහතිකමයි මං ඕක ජනේලෙන් විසි කරනවා ම යි!"

කළුකුම් බිත්තරයා නිහඬව සූට්කේසය ගෙන මගේ රාක්ක තට්ටුව මත එය තැබී ය.

යළිත් නිහැඬියාවකි.

හිටි අඩියේ ම කිසිවෙක් මහ හඬින් කිවිසුමක් හැරියේ ය.

"ආයුබෝවේවා!" කටහඬ කීපයක් ම එකට ප්‍රතිචාර දැක්වී ය. ඉක්බිති තවත් කවුදෝ කිවිසියේ ය. පැය බාගයකට පසු, සෑම දෙනෙක් ම සෑම දෙනකුට ම වාසනාව ද, දීර්ඝායුෂ ද, නිරෝගී සුව ද පතමින් උන්හ: එය හරියට ම දිගු කලක් වෙන් වී සිටි ඥාතීන් එකට මුණගැසුණා වැනි ය.

"මේක මෙහෙම නං හරියන්නේ නෑ!" කෙට්ටේරි මුහුණා හිටිහැටියේ ම නිවේදනය කළේ ය. "අපිට නියුමෝනියාව හැදිලා අපේ කෝච්චි පෙට්ටියේ රතු කුරුස ලාංඡනේ අඳින්ට කලින් මොනවා හරි කරන්ඩ හිතන්ඩ ඕනෑ අපි."

"එයා කොහෙත්ම මෝඩයෙක් හෙම නං නෙවෙයි හැබැට ම." කළුකුම් බිත්තරයා කීවේ වොඩ්කා බෝතලයක් එළියට ගනිමිනි.

"ඔය තුන්වෙනි රාක්කෙ ඇති මගේ ලොකු වයින් ලේගරයක් ම." ඒ වන තෙක් ම කිසිවකු විසින් නොදුටු පැහැපත් හිස කෙසින් යුත් අයෙක් කීවේ ය.

"වයින් කොහෙත් ම හීතලට හොඳ නෑ... වොඩ්කා තමා ජාතිය." කෙටේරි මුහුණා කීවේ දැන් මහත් බලාපොරොත්තුවෙන් එකට අතුල්ලමිනි.

"හෝ... ඔහේ කැමති විදිහකට." පැහැපත් මිනිසා විනීත ලෙසින් එකඟ විය.

"ඔහේගේ ලේගරේ මූඩිය ගලවන එක වඩා හොඳා. වයින් ටික එළියට තල්ලුවේවි, එතකොට අපි පෙඟිලා යාවි!" පිරිසිදු ඇඳුමින් සැරසී, ප්‍රවේශපතක් සහිතව සිටි මගියා පැහැපත් මිනිසාට කීවේ ය.

පැහැපත් මිනිසා ඔහු කී ලෙස ම නිහඬව කටයුතු කොට යළි හිඳ ගත්තේ ය.

මගීහු තම තමන්ගේ බඩු පොදි ලිහන්නට වූහ. කිසිවෙක් තවත් වොඩ්කා බෝතලයකින් දායක වූහ. කෙටේරි මුහුණා තවත් දෙකක් එළියට ගනිමින් ස්වෙච්ඡාවෙන් ම සව්දිය පිරීම ඇරඹී ය.

"සහෝදරවරුනි! මෙතන ඉන්න ඔහේලගෙන් කිසි කෙනෙක් ඇත්තට ම මගේ යාළුවෝ නෙවෙයි, ඒත් ඔහේලා දන්නවානේ කෝච්චියක දී කොහොම ද වෙන්නේ කියලා. කෝච්චි ගමනක දී මිනිස්සු ලේසියෙන් ම යාළුවො හදාගන්නවා. අපි කවුද? මොන යකාගේ ගුහාවේ ඉඳන් ද අපි මේ මතුවුණේ?"

"මම මේ වෙළෙඳ කටයුත්තකට ගිහින් එමින් ගමන්." ප්‍රවේශපතක් හිමි මගියා නිවේදනය කළේ ය.

"විශිෂ්ටයි!" සව්දිය පුරන්නා කීවේ ය. "එතකොට මෙයා කවුද? මොන යකාගෙ ගුහාවෙන් ද එයා ආවේ?" කෙටේරි මුහුණා කළුකුම් බිත්තරයා දෙස ඇඟිල්ල දිගු කළේ ය.

"මොකක් ද ඔහේ 'යකාගෙ ගුහාවෙන්' කියන එකෙන් කියන්නේ?" කළුකුම් බිත්තරයා එකටෙක කීවේ ය. "ඔහේ ඔය ඔළුගෙඩිය අස්සේ විනීත බාසාවක් තියාගන්නවා හොඳා, නැත්තං මං..."

"දැන් ඉතිං මට මේ සව්දිය පුරන එක ඉවර කරන්ඩ දෙමුකෝ! ඔය වචනවල එල්ලෙන්ඩ ඕනෑ යැ? ඉතිං මං මොකක් ද මේ කිය



කියා උන්නේ? ආ... ඔව්. ඔහේ මාව දන්නවා ද? නෑ! මං ඔහේව දන්නවා ද? ඒත් නෑ. අපි ඉන්නේ වෙන කොහේහරි තැනක නං මං ඔහේව බකමූණු හූවක් තරමට ගණන් ගන්නෙ නෑ. ඒත් මේ කෝච්චිය අපිව එකට එක්කහු කරලා යාළුවෝ කරලා. ඉතිං අපි බොමු කෝච්චිය වෙනුවෙන්!"යි අවසන් කළ ඔහු වොඩ්කා වීදුරුව ගිල දැමී ය.

"අපේ කෝච්චිය වෙනුවෙන්!"

"කෝච්චියට ජයවේවා!"

"හ්ම්ම්... ඒක නං හැබැට ම අමුතුයි වගේ... කෝච්චිය වෙනුවෙන්!"යි කී ප්‍රවේශපතක් හිමි මගියා වීදුරුව මට ලබාදුනි.

"සහෝදරවරුනි, මේ මගේ පළවෙනි කෝච්චි ගමන..." මම කීමට ගත්තෙමි.

"වාසනාවන්තයා!" කළුකුම් බිත්තරයා කීවේ ය.

"මං පිටත් වෙද්දී ඉලිකෝයි ඉලේරියනුයි මට අනතුරු ඇඟෙව්වා කෝච්චියේ බොහෝම කයිරාටිකයෝ ඉන්ඩ පුළුවන් කියලා. ඒ හින්දා ඇහැ ගහගෙනම ඉන්ඩ කියලා. මට පේනවා එයාලා වැරදි විත්තිය. උදාහරණෙකට මේ මනුස්සයා... මොකක් ද මහත්තයා ඔයාගේ නම?" මම කෙටේරි මුහුණාගෙන් ඇසීමි.

"අම්බාකෝ!"

"හොඳයි, අම්බාකෝ එහෙනං... මං එයාව මුලින් ම දැක්ක වෙලාවේ හිතුවේ 'මොන වසංගතයක් ද අම්මපා?' කියලායි. එතකොට ඔයාගෙ නම මොකක් ද?" මම කළුකුම් බිත්තරයාගෙන් ඇසීමි.

"මගේ නම අන්ටිපෝ, ඒත් දෙවෙව්වා ඇති! බීලා ඉඳ ගන්නවාකෝ!"

"හොඳා, මම මුලින් ම හිතුවේ අන්ටිපෝ කියන්නේ මහ හිල් මුට්ටියක් කියලා."

"එතකොට තාමත් එහෙම ද හිතන්නේ?'

"දැන් මට තේරෙනවා කෝච්චිය අපිව මිතුරෝ කරලා කියලා. එහෙනං කෝච්චිය වෙනුවෙන්!"යි අවසන් කළ මම වොඩ්කා වීදුරුව ගිල දැමුවෙමි.

සව්දිය පුරන්නා යළිත් වීදුරුව පිරවී ය. ඔහුට ඕනෑ වූයේ තවත් වටයක් යවන්නට ය. එහෙත් දුම්රිය ගැස්සී ඔහුගේ හිස උඩින් වූ රාක්කයෙහි වැදුණි. නොපමාව හිඳගත් ඔහු මෙසේ කියන්නට විය:

"දෙවියන් වහන්සේ වානරයින්ට කතා කරන්ඩ උගන්නද්දි, එයාලා හුවමාරු කරගත්ත පළවෙනි වචනෙ තමා 'සුබ දවසක්!' කියන එක. ඊට පස්සේ කැලෑ කපා දැමුණා, ගෙවල් හැදුණා, එතකොට මේ කෝච්චි පාර හැදුණා. අපි කෝච්චියට ගොඩවෙලා ඒකෙන් යන ගමන් එකිනෙකාට 'සුබ දවසක්!' කියාගන්නවා…"

"මං කිසි කෙනකුට 'සුබ දවසක්!' කීවේ නැහැනේ."

"ඔහේ විනීත මිනිහෙක් නං එහෙම කියන්ඩ තිබ්බා…"

"එහෙනං අපි 'සුබ දවසක්!' උණුසුම් සුබපැතුම වෙනුවෙන් බොමු…" අම්බෙකෝ අවසන් කළේ ය.

"ඒක නං හොඳ සච්දිය පිරිල්ලක්!… හිතා බලමුකෝ, මොකක් ද සුබපැතුමක තියෙන්නේ? මහ දෙයක් නෑ! ඒත් සමහරු කෙනකුට සුබ පතන එකවත් කරන්නෙ නෑ. මට සහෝදරයෙක් ඉන්නවා, අපි විශ්වවිද්‍යාලෙට ඇතුළු වුණේ එකට…

"ඔහේ කොහේ කෙනෙක් ද, රත්තරනේ?"

"නිගොයිට්වල."

"ඒක හොඳ ගමක් නෙවැ. කොහොම ද මේ සැරේ අස්වැන්න හෙම?"

"නරක නෑ, සරුයි… ඉතිං ඔන්න මට සහෝදරයෙක් උන්නා…"

"…ඔහේට සුබපතන්නේ නැති? අපි ඒ ගැන ඔක්කොම දන්නවා! ඒත් ඔහේ දන්නව ද අපට තියෙන්නේ එක වීදුරුවක් විතරයි කියන එක! ඉතිං ක්‍රිස්තුගේ නාමෙට ඕක බොනවා!"

…යළිත් මගේ වාරය පැමිනුණි. වීදුරුව ඔසොවා, ඒ තුළ ඇති උණුසුම ගෙනෙන දියරය දෙස බලද්දී මට අත්තම්මා, ඉලිකෝ, ඉලේරියන් ගැන සහ මේරි ගැන පවා සියල්ල මේ අමුත්තන්ට කිය යුතු යැයි හැඟුණි. මට ගී ගයන්නටත්, බෙරිහන් දෙන්නටත් ඕනෑ විය. එහෙත් මම ඉරුණු කලිසමින් හා ගෙවී ගිය සපත්තුවලින් යුතු සැම ගම් කොල්ලකු සේ ම ලැජ්ජා වුණෙමි.

"මිත්‍රයිනි ඔබේ නිරෝගී සුවය වෙනුවෙන්!"යි කඳුළින් බරව කී මම එක්වන ම හිඳගතිමි.

"බලනවාකෝ, අපේ වීරයා අඬනවා වගෙයි පේන්නේ!" කෙට්ෙරි මුහුණා කළුකුම් බිත්තරයාට කීවේ ය. "මේ වොඩ්කාවල කොච්චර ඇල්කොහොල් තියේ ද?"

"සියේට අසූවක් ම!"





"මං ඕන ඔට්ටුවක් අල්ලනවා, විස්සකට නං වැඩි නෑ." මම දැස් පිස දමමින් කීවෙමි. "මේක මේ වොඩ්කාවල පළහිලව්වක් නෙවේ, ඇහැට රොඩ්ඩක් ගියා."

"හොඳා, ඒකෙන් කාරියක් නෑ… මං එහෙනං මේක ඉස්සරහට අරන් යනවා, සහෝදරවරුනි!" සච්දිය පුරන්නා උස් හඬින් කියාගෙන ගියේ ය. "අපි කිය කියා උන්නේ දෙවියන් වහන්සේ වානරයින් මැව්වා කියලයි, අපි ඒ වානරයින්ගෙන් පැවත එනවා කියලයි. ඒ ඔක්කෝ ම විකාර ගොන්නක්… වැඩියක් ම මිනිස්සු පැවත එන්නේ එයාලගේ දෙමාපියන්ගෙන්. එහෙම නෙවෙයි නං අපි මේ වොඩ්කා බොන්නේ නෑ. ඒ වගේම මේ වොඩ්කා නොතියෙන්ඩ අපිට බැරිවෙනවා අපේ දෙමව්පියෝ වෙනුවෙන් බොන්ඩ. මං කිසිදාක දැකලා නැහැ තමන්ගේ මව්පියන් සිහි නොකරන බොන මිනිහකුව."

"මං නං වෙරි වුණාම මට මෙලෝ දෙයක් මතක නෑ." තරුණ පැහැපත් මිනිසා පාපොච්චාරණය කළේ ය.

"අන්තිමේ ඒකවත් මතක් වෙච්ච එක ලොකු දෙයක්!"යි කළුකුම් බිත්තරයා කී ය.

මව්පියන් වෙනුවෙන් සච්දිය පිරිමෙන් අනතුරුව අපි පැහැපත් මිනිසා පරිස්සමින් ඔසොවා, නිදාගැනීම පිණිස ඉහළ තට්ටුවේ, ඔහුගේ ලේගරය පසෙකින් තැබුවෙමු.

"එයාගෙ මූණ බිත්තිය පැත්තට හරවනවා, මං ආස නෑ ඔය ඉක්කා ගැහිල්ලට!" කෙට්ෙරි මුහුණා අනතුරු හැඟවී ය. එහෙත් පමා වූවා වැඩි ය. පැහැපත් මිනිසා ගිනිකන්දක් මෙන් පුපුරා ගියේ ය. ඇසිපියක් ගසන්නටත් පෙර අපේ සච්දිය පුරන්නාගේ සාටකය තද රතු පැහැ ගැන්විණි. කළුකුම් බිත්තරයාත්, ප්‍රවේශපතක් හිමි මගියාත් හීතියෙන් එකිනෙකා දෙස නෙතු හයා බැලූහ. විශ්මයජනක ලෙසින් එයින් වෙනස්ව සිටියේ මා පමණකි. ඔවුන් අතරෙහි සිටගනිමින්, පව්කාරයින් අතරෙහි ක්‍රිස්තුස් මෙන්, මම වියරු ලෙස සිනාසෙමින් හුනිමි.

"තීවයා!"යි හඬතැලූ කෙට්ෙරි මුහුණා අපවිත්‍ර වූ සාටකය උරහිසින් ඇද ජනේලයෙන් පිටතට වීසි කළේ ය.

"උඟරා, ඒකව බිමට බානවා!" කළුකුම් බිත්තරයා ගෙරවී ය.

"හපොයි බොලේ, කොච්චර භයානක ද! දැන් මං මක් කරන්ඩ ද! මේක මගේත් නෙවෙයි!" ප්‍රවේශපතක් හිමියා ලේන්සුවකින් සිය කමිසයේ වමනය පිස දමමින් කෙඳිරි ගෑවේ ය.

"එයාගෙ කට තුවායකින් බඳිනවා," අසල්වැසි මැදිරියේ කවුදෝ අවවාද කළේ ය.

"මොකද කාරණේ, සහෝදරවරුනි? ලේගරේ හෙම පිපිරුවා නෙවෙයි නේද?" එක්වර ම පැහැපත් මිනිසාගේ මෘදු කටහඬ පැමිණියේ ය. හුණු මෙන් සුදුමැලි වූ ඔහුගේ වික්ෂිප්ත මුහුණ උඩ රාක්ක තට්ටුවේ අඳුර අතරින් එබී බැලී ය.

"තක්කඩියා, අපිව විහිළුවට ගත්ත ද? තමුසෙගෙ කැමැත්තෙන් 'ලේගරේ පිපිරුවා!' එතකොට තමුසෙගෙ ලේගරේ තිබුණේ ඉස්ටු ද? හිටු මං පෙන්නන්ඩ!" කෙට්ටේරි මුහුණ මාරක වියරුවකින් බෙරිහන් දුනි. භීතියෙන් අකර්මණ්‍යව හුන් පැහැපත් මිනිසාගේ මුහුණට දමා අනින්නට පෙර ඔහු පාලනය කරගන්නට අපි යාන්තමින් සමත් වුණෙමු.

පැය බාගයකට පසු අපි යළිත් බීම ඇරඹීමු. මඳ වේලාවක් ගෙවෙද්දී කෙලින් සිටගෙන සිටීමට සමත් වූයේ කෙට්ටේරි මුහුණ සහ මා පමණකි.

"මට ඕනෑ ඔහේට මාව වඩා හොඳින් අඳුන්නලා දෙන්ඩ, අම්බෙකෝ මාමේ." මම කීවෙමි.

"නුඹේ නම මොකක් ද?"

"සුරිකෝ වකලොම්ඩ්සෙ."

"හා, නුඹට තියෙන්නෙ හොඳ නමක්. ඒ වගේම හොඳට බොන්ඩ පුළුවන් ඔළුවක්. නුඹ කාගෙ පුතා ද?"

"මම අපේ අත්තම්මාගෙයි, ඉලිකෝගෙයි, ඉලේරියන්ගෙයි පුතා."

අම්බෙකෝ සන්ත්‍රාසයෙන් ඇස් ලොකු කොට මා දෙස බැලුවේ ය.

"එතකොට ඒ වගේ තව වෙන කවුරුවත් හෙම නැද්ද?" අන්තිමේ ඔහු ඇසී ය.

"නෑ, වෙන කවුරුත් නෑ. මේ තුන්දෙනා විතරමයි. මට සින්දු කියන්ඩ ඕනෑ."

"නුඹ ඒකට ද ටිබිලිසි යන්නේ?"

"නෑ මං ටිබිලිසි යන්නේ විශ්වවිද්‍යාලෙකට ඇතුළු වෙන්ඩ. මට 'පරිණත සහතිකයක්' තියෙනවා. ඔයාට තියේ ද? නෑ? එහෙනං ඔහේ 'පරිණත සහතිකය' කියන්නේ මොකක් ද කියලා දන්නෙ නෑ. එහෙනං ඉගෙනීමට ජයවේවා!"යි කී මම වොඩ්කා වීදුරුව ගිල දැමුවෙමි.



"මං කියන්න යන දේ ගැන අහගෙන ඉන්නවා... නුඹ හොඳ විනීත කොල්ලෙක් වග පේන්ඩ තියෙනවා... නුඹ අහගෙන ද ඉන්නේ? මෝඩයෙක් වගේ හිනාවෙන එක නවත්තාපන්! අහගනින්! මේ මමත්, ඒ කියන්නේ අම්බෙකෝ ගොර්ඩෙලාඩ්සේත් යන්නේ ඉගෙන ගන්ඩ. 'ඔය වයසෙ දි ඉගෙනගන්න එකේ පලේ මොකක් ද?' කියලා නුඹ අහාවි. ඒත් නුඹ වැරදියි. ඉගෙන ගන්ඩ කවදාවත් පමාවක් නෑ... ඔය නිකොලස් සාර්ව රජකමෙන් පන්නන වෙලාවෙ... ඔය මෙසේ අල්ලා ගන්නවා... මේ විදිහට මුණින් පෙරළෙන්ඩ එපා!... මං කිවුවේ, නිකොලස් සාර්ව රජකමෙන් පන්නන වෙලාවෙ මාත් නුඹ වගේම නිවටයෙක්. මහ විශාල ආසනේක සාර් වාඩි වෙලා ඉන්න හැටියි, ගොවියොයි කම්කරුවොයි ඒකව කකුල් දෙකෙන් ඇදගෙන යන හැටියි මං හිතෙන් මවා ගත්තා... එහෙම තමා මං හිතුවේ. නුඹ දන්නව ද ඇයි ඒ කියලා? මං මොට්ට මෝලෙක් හන්දා. ඒත් මගේ පුතාලා ඔක්කොම උගත්තු. නුඹට තේරෙනව ද? අධ්‍යාපනයට ජයවේවා!"

"ඉලේරියන් මාමට ජයවේවා!"

"මගේ නම අම්බෙකෝ!"

"නෑ, ඉලිකෝ!"

"අම්බෙකෝ!"

"මං කියන්නේ ඉලිකෝ! ඒත් කොහෙන් ද ඔහේට දෙවැනි ඇහැක් වැවුණේ?"

"අහපන් පුතා, මගේ නම අම්බෙකෝ!"

"මට ඔහේව සිපගන්ඩ ඉඩදෙන්ඩ ඉලේරියන්!"

"අනේ බොට හෙණ ගහන්ඩ, එහෙනං මං ඉලේරියන් වෙච්චාවේ. ඒත් දෙවියන්ගේ කැමැත්තෙන් සිහියක් පතක් ආවහම මට අම්බෙකෝ කියලා කතා කරපන්!"

"ඔහේට මාව සිපගන්ඩ ඕන නැද්ද?"

"අපූරු කොල්ලෙක්ව සිපගන්නේ නැත්තෙ මොකෝ?"

අම්බෙකෝ තම කමිස අතින් දෙතොල් පිස දමා මගේ කොපුල සිප ගත්තේ ය. මම මගේ හිස ඔහුගේ උරහිස උඩින් තබා දෑස් පියා ගතිමි.

"අපේ අසරණ මුරාඩාට වෙඩි තියාදාපු හැටි මතක ද ඉලේරියන්?"

"ඇත්තටම මට මතකයි පුතා!"

අප දැන් වැඩිහිටියන් බවත්, පාසලට දිය හැකි සෑම දේ ම අපට ලබා දී ඇති බවත්, මෙතැන් සිට අපට අප කැමති දෙයක් කළ හැකි බවත්, අවැසි නම් ඔළුගෙඩි බිත්තියේ හප්පා ගැනීම වුව ද කළ හැකි බවත් විදුහල්පතිතුමා සිය කතාවේ දී කියා සිටියේ ය. ඉන් පසු ඔහු හෝඩියේ පිළිවෙළින් අපේ නම්, එක් එක්කෙනා සඳහා වෙන වෙන ම කෙටි විස්තරයක් සහිතව හඬ නගා කියවා, නිල වශයෙන් 'පරිණත සහතිකය' යනුවෙන් හැඳින්වෙන දේ අප වෙත පිරිනැමී ය. පාසල හැරයන්නාට අතට අත දුන් ඔහු මේ ඓතිහාසික මොහොත සදානුස්මරණීය කිරීමට සැදී පැහැදී සිටගෙන සිටි ඡායාරූප ශිල්පී පව්ලූෂා දෙස බැල්මක් හෙළුවේ ය. පාසල හැරයන්නා බියපත් නිසලතාවකින් ගල් ගැසේ, පව්ලූෂා දහය දක්වා ගණන් කර ඡායාරූපය ගත් බව පෙන්වීමට අත වනයි. එවිට වාදක මණ්ඩලය කන් බිහිරි කරවන තූර්යඝෝෂයක් නංවයි.

එහෙත් මගේ වාරය පැමිණි විට කුමක්දෝ හේතුවක් නිසා තූර්ය වාදකයෝ වාදනය කළේ අවමඟුලක් සඳහා වැයෙන 'ටාවෝ වෙමෝ' වාදනයයි.

විදුහල්පතිවරයා රවා බැලී ය. සංගීත කණ්ඩායම වහා සිය වාදනය තූර්යඝෝෂයකට මාරු කළේ ය.

උත්සවයෙන් පසු අපේ ගමේ ගීතිකා කණ්ඩායම සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට නියමිත විය. එහෙත් ඔවුන්ගේ ගී අඩු තරමේ දහස් වතාවක්වත් අසා තිබූ අපි සියල්ලෝ ම ගෙවල් බලා ගියෙමු.

මගේ සහතිකය දුටු මොහොතේ අත්තම්මා මගේ හුස්ම හිරවෙන තරම් තදින් මා වැළඳ ගත්තා ය. "දැන් ඉතිං මරණෙට බෑ මාව පරාද කරන්ඩ,"යි කී ඇය කඳුළින් සහතිකය තෙත් කළා ය. ඉක්බිති හිටිඇඩියේ ම බැරෑරුම් පෙනුමක් ගෙන මා වෙත අප්‍රසන්න බැල්මක් හෙළූ ඇය සහතිකය මේසය මත තබා, ගෙයින් පිටතට ගියා ය. කිසිවක් තේරුම්ගත නොහුණු මම ඈ දෙස නෙතු හයාගෙන හුනිමි.

මිනිත්තු පහළොවකට පමණ පසු අත්තම්මා ආපසු ආවේ ඉලිකෝත් ඉලේරියනුත් කැටුව ය.

"අසල්වැසියෙනි, ඉඳගනිල්ලා!" අත්තම්මා කීවා ය.

දෙදෙනා හිඳ ගත්හ.

"හොඳා දැන් ඉතිං මොනව ද නුඹ කරලා තියෙන්නේ?" ඉලේරියන් මගෙන් ඇසී ය.





"මොකුත් නෑ, මම මේ පාසල් හැරයාමේ සහතිකය ගත්ත විතරයි." මම සහතිකය ඔහුට පාමින් කීවෙමි.

"මං නුඹලාව එක්ක ආවේ මේක ඇත්ත සහතිකයක් ද නැත්තං ගිය අවුරුද්දෙ ගෙනැත් පෙන්නුව චරිත සහතිකේ වගේ අනුන්ගේ එකක් ද කියලා බලවාගන්ඩයි."

සහතිකය ගත් ඉලේරියන් මුද්‍රාව ද, අත්සන ද පිරික්සා බැලී ය. පහනේ ආලෝකයට ද අල්ලා බැලූ ඔහු එය ඉලිකෝට දුනි. ඉලිකෝ ඊටත් වඩා සුපරීක්ෂාකාරීව එය විමසා බලා ඉන් පසු මෙසේ නිවේදනය කළේ ය:

"මේක හරියට හරි. සැක කරන්ඩ මොකවත් ම නෑ."

"නුඹට සහතකි ද?" අත්තම්මා ඇසුවා ය.

"ආයෙ දෙකක් නෑ ඒකේ. පළවෙනි හේතුව එයාට කවදාවත් මේ විදිහට ලියන එක අල්ලාගන්ඩ බැරිවීම, දෙවෙනි හේතුව සහතිකේ පිටිපස්සේ රුසියානු බාසාවෙනුත් ඉස්සරහ පැත්තේ ටික ම ලියලා තිබීම, තුන්වෙනි හේතුව ඒ විදිහට රුසියානු බාසාවෙන් එහෙම දෙයක් ලියන්ඩ පුළුවන් තරං කිසිම ශිෂ්‍යයෙක් අපේ සබ්ලොනාට නැති වීම, හතරවෙනි හේතුව, උඩ ඉඳල පහළට ම යනකං කිසිම විෂයකට සාමාන්‍ය සම්මාන ඇරෙන්ඩ විශිෂ්ට සම්මාන නැති වීම. ඉතිං හොඳටෝ ම පැහැදිලියි මේක එයාගෙ ම කියලා."

"දෙවියන්ට ස්තුති වේවා! ඉලිකෝ නුඹ මට සැනසීම ගෙනාවා!" අත්තම්මා සැනසුම් සුසුමක් හෙළුවා ය.

ඉලේරියන් යළිත් සහතිකය අතට ගත්තේ ය.

"ප-රි-ණ-ත ස-හ-ති-ක-ය!" ඔහු අකුරින් අකුර හඬ නගා කියැවී ය. ඉක්බිති නැගිට ගත් ඔහු මා වෙත පැමිණ දබරඇඟිල්ලෙන් මගේ හිසට තට්ටු කොට, එම හඬට සවන් දී කනස්සල්ලට පත් හඬින් ඉලිකෝට මෙසේ කී ය:

"දැන් ඉතිං සහෝදරයා මේකට ද පරිණතයි කියන්නේ, එහෙනං මාත් චීන මැන්ඩරින් බාසාවේ පරිණතයෙක්."

"කාරියක් නෑ... තක්කාලි වුණත් හොඳට ඉදෙන්ඩ කලින් කඩනවානේ. වෙළෙඳපොළට ගෙනියන අව්අස්සේ ඒවා පරිණත වෙනවා."

"හොඳා එහෙනං, අපි දැන් තීරණේ කරන්ඩ ඕනෑ එයා ඊළඟට කරන්නෙ මොනව ද කියලා, මොන රස්සාව ද එයා තෝරගන්නේ

"එයාගෙ කට තුවායකින් බඳිනවා," අසල්වැසි මැදිරියේ කවුදෝ අවවාද කළේ ය.

"මොකද කාරණේ, සහෝදරවරුනි? ලේගරේ හෙම පිපිරුවා නෙවෙයි නේද?" එක්වර ම පැහැපත් මිනිසාගේ මෘදු කටහඬ පැමිණියේ ය. හුණු මෙන් සුදුමැලි වූ ඔහුගේ වික්ෂිප්ත මුහුණ උඩ රාක්ක තට්ටුවේ අඳුර අතරින් එබී බැලී ය.

"තක්කඩියා, අපිව විහිළුවට ගත්ත ද? තමුසෙගෙ කැමැත්තෙන් 'ලේගරේ පිපිරුවා!' එතකොට තමුසෙගෙ ලේගරේ තිබුණේ ඉස්ටූ ද? හිටු මං පෙන්නන්ඩ!" කෙටේරි මුහුණා මාරක වියරුවකින් බෙරිහන් දුනි. භීතියෙන් අකර්මණ්‍යව හුන් පැහැපත් මිනිසාගේ මුහුණට දමා අනින්නට පෙර ඔහු පාලනය කරගන්නට අපි යාන්තමින් සමත් වුණෙමු.

පැය බාගයකට පසු අපි යළිත් බීම ඇරඹීමු. මඳ වේලාවක් ගෙවෙද්දී කෙළින් සිටගෙන සිටීමට සමත් වූයේ කෙටේරි මුහුණා සහ මා පමණකි.

"මට ඕනෑ ඔහේට මාව වඩා හොඳින් අඳුන්නලා දෙන්ඩ, අම්බෙකෝ මාමේ." මම කීවෙමි.

"නුඹේ නම මොකක් ද?"

"සුරිකෝ වෂලොම්ඩ්සෙ."

"හා, නුඹට තියෙන්නෙ හොඳ නමක්. ඒ වගේම හොඳට බොන්ඩ පුළුවන් ඔළුවක්. නුඹ කාගෙ පුතා ද?"

"මම අපේ අත්තම්මාගෙයි, ඉලිකෝගෙයි, ඉලේරියන්ගෙයි පුතා."

අම්බෙකෝ සන්ත්‍රාසයෙන් ඇස් ලොකු කොට මා දෙස බැලුවේ ය.

"එතකොට ඒ වගේ තව වෙන කවුරුවත් හෙම නැද්ද?" අන්තිමේ ඔහු ඇසී ය.

"නෑ, වෙන කවුරුත් නෑ. මේ තුන්දෙනා විතරමයි. මට සින්දු කියන්ඩ ඕනෑ."

"නුඹ ඒකට ද ටිබිලිසි යන්නේ?"

"නෑ මං ටිබිලිසි යන්නේ විශ්වවිද්‍යාලෙකට ඇතුළු වෙන්ඩ. මට 'පරිණත සහතිකයක්' තියෙනවා. ඔයාට තියේ ද? නෑ? එහෙනං ඔහේ 'පරිණත සහතිකය' කියන්නේ මොකක් ද කියලා දන්නෙ නෑ. එහෙනං ඉගෙනීමට ජයවේවා!"යි කී මම වොඩ්කා වීදුරුව ගිල දැමුවෙමි.





"මං කියන්න යන දේ ගැන අහගෙන ඉන්නවා... නුඹ හොඳ විනීත කොල්ලෙක් වග පේන්ඩ තියෙනවා... නුඹ අහගෙන ද ඉන්නේ? මෝඩයෙක් වගේ හිනාවෙන එක නවත්තාපන්! අහගතින්! මේ මමත්, ඒ කියන්නේ අම්බෙකෝ ගොර්ඩෙලාඩ්සේත් යන්නේ ඉගෙන ගන්ඩ. 'ඔය වයසෙ දි ඉගෙනගන්න එකේ පලේ මොකක් ද?' කියලා නුඹ අහාවි. ඒත් නුඹ වැරදියි. ඉගෙන ගන්ඩ කවදාවත් පමාවක් නෑ... ඔය නිකොලස් සාර්ව රජකමෙන් පන්නන වෙලාවෙ... ඔය මේසේ අල්ලා ගන්නවා... මේ විදිහට මුණින් පෙරළෙන්ඩ එපා!... මං කිවුවේ, නිකොලස් සාර්ව රජකමෙන් පන්නන වෙලාවෙ මාත් නුඹ වගේම නිවටයෙක්. මහ විශාල ආසනේක සාර් වාඩි වෙලා ඉන්න හැටියි, ගොවියොයි කම්කරුවොයි ඒකව කකුල් දෙකෙන් ඇදගෙන යන හැටියි මං හිතෙන් මවා ගත්තා... එහෙම තමා මං හිතුවේ. නුඹ දන්නව ද ඇයි ඒ කියලා? මං මොට්ට මෝලෙක් හන්දා. ඒත් මගේ පුතාලා ඔක්කොම උගත්තු. නුඹට තේරෙනව ද? අධ්‍යාපනයට ජයවේවා!"

"ඉලේරියන් මාමට ජයවේවා!"

"මගේ නම අම්බෙකෝ!"

"නෑ, ඉලිකෝ!"

"අම්බෙකෝ!"

"මං කියන්නේ ඉලිකෝ! ඒත් කොහෙන් ද ඔහේට දෙවැනි ඇහැක් වැවුණේ?"

"අහපන් පුතා, මගේ නම අම්බෙකෝ!"

"මට ඔහේව සිපගන්ඩ ඉඩදෙන්ඩ ඉලේරියන්!"

"අනේ බොට හෙණ ගහන්ඩ, එහෙනං මං ඉලේරියන් වෙච්චාවේ. ඒත් දෙවියන්ගේ කැමැත්තෙන් සිහියක් පතක් ආවහම මට අම්බෙකෝ කියලා කතා කරපන්!"

"ඔහේට මාව සිපගන්ඩ ඕන නැද්ද?"

"අපූරු කොල්ලෙක්ව සිපගන්නේ නැත්තෙ මොකෝ?"

අම්බෙකෝ තම කමිස අතින් දෙතොල් පිස දමා මගේ කොපුල සිප ගත්තේ ය. මම මගේ හිස ඔහුගේ උරහිස උඩින් තබා දෑස් පියා ගතිමි.

"අපේ අසරණ මුරාඩාට වෙඩි තියාදාපු හැටි මතක ද ඉලේරියන්?"

"ඇත්තටම මට මතකයි පුතා!"

"එතකොට ඊට පස්සෙ ඔහේ කියාපු එක මතක ද?"
"මතක් කරලා දියන්කෝ, මට අමතක වෙලා."
"'අඬන්ට එපා සුරිකෝ!' කියලා ඔහේ මාව අස්වසන්න හැදුවා."
"දැන් මට මතකයි."
"එත් ඔහේත් ඇඬුවා!"
"එහෙම ද? හැබෑ තමා, මාත් ඇඬුවා."
"එතකොට මතක ද දුංකොළ? ඉලිකෝ දීපුවා?"
"ඇත්තවශයෙන් ම ඒවා පන්කාදු පහේ දුංකොළ."
"නෑ, මං කිව්වේ අර එයා අපට ගම්මිරිස් දාලා දීපුවා."
"ආ... ඔව් ගම්මිරිස් දාපු දුංකොළත් මට මතකයි."
"ඔහේ දන්නව ද මුළු ලෝකයෙන් ම මං වැඩියෙන් ම ආදරය කරන මිනිස්සු දෙන්නා ඉලිකෝයි ඔහේයි කියලා."
"මං දන්නවා පුතා... දැන් ඉතිං නිදාගනින්කෝ!"
"දැන් අත්තම්මා නිදි ඇත්ද?... නෑ, එයා නිදියන්නෙ නෑ... එයා මා ගැන හිතනවා ඇති..."
"ඇත්තට ම ඈ එහෙම තමා. ඈ නුඹට ආදරෙයි..."
දුම්රිය වේගයෙන් ඇදුණි, මැදිරි දෙපසට වැනුණි, ඒ හා සමඟ ම පොළොවත් හැම දෙයක්මත් දෙපසට පැද්දුණි... දුම්රිය පීලිවලින් පැන්නොත් කුමක් වෙනු ඇත් ද? ඒත් මට බිය වන්නට දෙයක් නැත. මම ඉලේරියන්ගේ පපුව පිට නිදමින් සිටින්නෙමි... ඔහුගේ රළු අත මගේ තෙත් නළල් තලය මෘදු ලෙස පිරිමදී... රේල් පීලි මූට්ටුවල දී රෝද කට කටස් හඬ නගයි... දුම්රිය හූ හඬ නගමින් ඉදිරියට දුවයි.
"ළමයෝ, සුරිකෝ, උඹ කොහාට වුණා ද, ළමයෝ!"
"මං එනවා අත්තම්මේ!" සිහින් මීදුමක් අතරින් දිව එමින් මම කෑගැසුවෙමි.
"නිදාගනින් පුතා!" කවුදෝ තළවනසුළුව කීවේ ය.

## කරදර නවාතැන

දැන් මම ආර්ථික විද්‍යා අංශයෙහි ශිෂ්‍යයෙක්මි. තවමත් මට අයත් සබ්බ සකලමනාව ම සමන්විත වූයේ කලිසමක් සහ දේශපාලන ආර්ථික විද්‍යාවෙන් අසමත් වූ සහතිකයක් පමණකි. මා පළමු වසරේ





සිටිද්දී මට හිමි දීමනා මුදල ගියේ, මට දොස් තබන්නට හැකි මොන ම අවස්ථාවක් හෝ අත නොහරින නවාතැන් හිමිකාරිය අතට ය.
"නුඹ එහේ මෙහේ රස්තියාදුවේ නොගියා නං ගෞරව පන්තියේ ශිෂ්‍යයෙක් වෙන්ඩ තිබුණා. එහෙනං දීමනාවත් වැඩිවෙනවා!"
දැන් මට අසමත් සහතිකයක් හිමි බැවින් නිවාස හිමිකාරියට මා වෙනුවෙන් දෙන දීමනාව ද නවතනු ලැබ තිබිණි. එහෙයින් ඈ තවත් උනන්දුවෙන් මගේ ඉගෙනීම් ගැන විමසන්නට වූවා ය.
"නුඹ කවද ද විභාගෙ ගන්නේ?" ඈ සෑම උදෑසනක ම මගෙන් අසන්නී ය.
"මාර්තා නැන්දේ, මට ඉන්ඩ අරින්ඩකෝ, ඔයාගෙ හිරිහැර මගේ අත්තම්මටත් අන්තයි!" මම කෝපයෙන් කොඳුරමි.
"නුඹයි, නුඹේ අත්තම්මයි දෙන්නට ම හෙණ ගහව්වාවේ!" නිවාස හිමිකාරිය කෑගසයි. "අනේ හැබෑට මොන ඉලව්වකට මං නුඹව මෙතනට වැද්ද ගත්ත ද? නුඹ කුලිය ගෙවනව ද නැද්ද? ගෙවල් කළමනාකාරයා ගැන නුඹට අමතක වුණා ද? එයා මට ඊයේ අනතුරු ඇඟෙව්වා ආයෙත්: 'ඔහේ ලියාපදිංචි නැති නවාතැන්කාරයෙක් තියාගෙන ඉන්නවා. එහෙම ඉන්ඩ ඇරලා තියෙනවාට මට ස්තුති කරන්ඩවත් ඔහේට අමතක වෙලා' කියලා මිනිහා කීවා."
"ඇයි ඔයාට බැරි එයාට ස්තුති කරන්න? ඔයා හොඳ වචනවලට ලෝබ ද?"
"මාව විහිළුවට ගන්ඩ එපා, මොට්ටයා! ඉඳගෙන පාඩම් කරපන්! දවස් දෙකකින් නුඹේ දීමනාව නොදුන්නොත්, මං නුඹව පයින් ගහලා එළවනවා ගෙදරින්!"
"මගේ පශ්චාත් උපාධි පාඨමාලාව දවස් දෙහෙකින් ඔයා ඉවර කරලා දෙනවාවත් ද? මේකටත් ගෙයක් කියලා කියනව ද? මී උගුලක් මීට හොඳා!"
"ඒකත් උඹ වගේ උන්ට හොඳට ම හොඳා! නුඹට ඕනෑ ඇත්තේ සමහර විට නාන කාමරයකුයි උණුවතුරයි එක්ක තට්ටු ගෙයක් වෙන්ඩැති!"
"අපොයි නෑ, හොඳ උණු තේ වීදුරුවක් හොඳටෝම ඇති!"
"මං උඹට කොහෙත් ම තේ දෙන්නෙ නෑ! මට ඉක්මනට ම දකින්ඩ පුළුවනි උඹ මිනීපෙට්ටියක ඉන්නවා!"
"සීනි ටිකක් දාන්ඩ අමතක කරන්ඩ එපා!"

නිවෙස් හිමිකාරිය කුණාටුවක් සේ පිටවූවා ය. මම මගේ පෙළපොත් දෙස කනගාටුවෙන් බැලුවෙමි. මාර්තා නැන්දා ජීවත් වූයේ වසාර් වීදිය කෙළවර ම වූ කාමර දෙකක කුඩා පැලක ය. ඇය අවලක්ෂණ මෙන් ම නිතර කෝප ගැන්වෙන ගැහැනියකි. එහෙත් ඇයට තිබුණේ කාරුණික හදවතකි. මම ඇගේ එකම නවාතැන්කරුවා වීමි. මම මගේ කාමරය කච්චියක්, පුටුවක්, සොෆි නම් බැළලිය සහ මාළු වලිගයක් ඇති ගැහැනියක් සමඟ බෙදා හදා ගත්තෙමි. ගැහැනිය පලසක එම්බ්‍රොයිඩර් කොට සිටි අතර පලස ඇණවලින් බිත්තියේ එල්ලිණි. සොෆීට තිබුණේ කොළ පැහැ ඇස් ය. උදෑසන මා විශ්වවිද්‍යාලයට පිටත්ව ගිය විට මගේ එකම පිගාන හොඳින් ලෙවකා පිරිසිදු කරන ඇය, මිදුලේ වැවී ඇති පැරණි මල්බෙරි ගස මත පනිමින් සිටින ගේ කුරුල්ලන් දෙස බලමින් දවසේ ඉතිරි කාලය ම ජනෙල් පඩිය උඩට වී හිඳගෙන සිටින්නී ය. පෙනෙන හැටියට, මාර්තා නැන්දාත්, මල්බෙරි ගසත් එකම වයසේ ය. එහෙත් එම ගසේ ඵල හටගනු කිසිවෙක් කිසිදා දැක නැත. සොෆි කපටි සහ තමන්ට ම පමණක් ආදරය කරන ප්‍රාණියෙකි. සැන්දෑවේ ඈ ඉවසිලිමත්ව බලා සිටින්නේ මා ඇඳට පැමිණ එය උණුසුම් කරන තුරු ය. ඇය ජනෙල් පඩියෙන් බසින්නේ එවිට පමණෙකි. හීත් සිරුවේ ඇය බ්ලැන්කෙට්ටුව තුළට රිංගා ගනී. මම සොෆීට ඉතාමත් කැමැති වෙමි, නැතිනම් මම ඇයට හුරු වී සිටිමි, එහෙත් ඒ අර කැමැත්ත නිසාම වන්නට පුළුවන. ඈ කොහේ සිට ආවා දැයි මමවත්, මාර්තා නැන්දාවත් නොදනිමු. එය සිදු වූයේ එක් සැන්දෑවක ය. කිසිදු හඬක් නොනඟා මගේ කාමරයට ඇතුළු වූ ඇය නඟුට ඔසොවාගෙන කච්චි කකුලේ ඇතිල්ලෙමින් මා දෙස විපරම්කාරී බැල්මක් හෙළුවා ය. හරියට ම "නුඹ මට කැමති ද?"යි අසන්නාක් මෙනි. ඇයට තිබුණේ අල්ලපු ගෙදර ගැහැනු ළමයාගේ ඇස් ම ය. ඒ නිසා මම ඇයට කැමැති වීමි. "සොෆී මෙහෙට එන්න!" මම ඇයට හඬගැසීමි. ඇය මට පසුපස හරවා කඩිමුඩියෙන් තොරව දොර දෙසට ගියා ය. "කොහේද යන්නේ, සොෆී මෙහේ නවතින්න!" මම ආයාචනා කළෙමි. ඉතිං ඇය නැවතුණා ය. එදා සිට අපි එකට ජීවත් වෙන්නෙමු.

මා කරදරයෙන් සිටින බව සොෆීට දැනෙයි. ඉතිං ඈ මා ප්‍රීතිමත් කරන්නට ඈ ඇයට හැකි උපරිමය කළා ය. මම යළිත් පෙළපොත පාඩම් කරන්නට හරිගැසුණෙමි. ඉන් පසු බලාපොරොත්තු සුන්





බවින් එය කොට්ටය යටට තල්ලු කළෙමි. ඊයේ රාත්‍රියේ මාර්තා නැන්දා මට කීවේ මගේ හැම කරදරයක ම මුල මා දෙවියන් විශ්වාස නොකරන පව්කාරීත්වය බව ය. ඇයට ලැබෙන මගේ දීමනාවත් මගේ සාමයත් හොරා ගැනීමෙන් දෙවියන් වහන්සේ පාපකාරී දෙයක් සිදුකළ බව මම පිළිතුරු දුනිමි. මේ දේවාපහාසයට දෙවියන් වහන්සේ කිසිදා මට සමාව නොදෙනු ඇතැයි ඇය කියා සිටියා ය. දෙවියන් වහන්සේව තඹයකටවත් මායිම් නොකරන බව මම කීවෙමි. ගොළුවකු වීමේ සාපය නොවැදීමට අවශ්‍ය නම් වහාම දණින් වැටී සමාව ඉල්ලා දෙවියන් වහන්සේට කන්නලවු කරන මෙන් මාර්තා නැන්දා අණ කළා ය. ඔහු මා දැනටමත් ගොළු වෙන සේ දෙවරක් සාපකොට ඇතැයි මම කීවෙමි: මම මගේ විභාගය සමත් වීමට දෙවරක් උත්සාහ කොට ඇත්තෙමි. ඒ දෙවර ම මට එක ම වචනයක් හෝ කියාගත නොහැකි විය. හීතියෙන් කුරුසය ලකුණු කළ මාර්තා නැන්දා කෙළ ගසා දොර දඩාස් හඬින් වසාගෙන යන්නට ගියා ය…

…මම යළිත් මේ උදෑසන උත්සාහ ගනිමි. කෙසේ වුවත්, මාර්තා නැන්දාගේ අවවාදය පිළිපදින්නට මම තීරණය කළෙමි: මම කච්චිය ඉදිරියේ දණින් වැටී දෑත් සිවිලිම දෙසට ඔසොවා දෙවියන් වහන්සේට කන්නලව් කළෙමි:

"ප්‍රේමණීය ස්වාමීනි, මේ ජරාවාස වූ වහලය මගේ ඉහ මත කඩා නොවැටෙන්නට වගබලා ගනු මැනවි… ඉන් පසු, ප්‍රේමණීය ස්වාමීනි, දහයට මට දේශපාලන ආර්ථික විද්‍යාව සඳහා විභාගයට හිඳගැනීමට තිබේ. එය මොන විදිහේ හුවමාරු භාණ්ඩයක් දැයි ඔබ දනී ද? මා සිතාගෙන සිටි ලෙස, එළදෙනක්, ඌරෙක් නැතිනම් එළුවෙක් හුවමාරු භාණ්ඩ නොවේ. අනෙක් අතට, එළදෙනක්, ඌරෙක් සහ නැතිනම් එළුවෙක් හුවමාරු භාණ්ඩයක් වන්නට පුළුවනි. ඔබට වැටහෙන්නේ නැද්ද? මටත් එහෙමයි. ආන් ඒ නිසායි මා ඔබගෙන් ඉල්ලා සිටින්නේ මා විභාගයෙන් සමත් කරදෙන ලෙස. නිසැකව ම ඔබට ඕනෑ නැහැ ඉලේරියන්ට, ඉලිකෝට සහ අත්තම්මාට මා අවමානයක් කරවන්නට! ඔබ තරුණ වියේ දී ඉහළම ගණයේ ශිෂ්‍යයකුව සිටියා යැයි කියන්නට නම් විතරක් එපා. මං ඒක පිළිගන්නේ නෑ. ඉලේරියන් දිගටෝ ම මට කිවුවෙත් ඒකමයි. ඇයි

1 ජෝර්ජියානු බසෙහි 'හුවමාරු භාණ්ඩය' සහ 'ගවයින්' යන අර්ථ දෙක ම දෙන්නේ එක ම පදයකිනි. එහෙයින් මෙහි එය එන්නේ සමච්චල්කාරී අර්ථයකිනි.



HADIL

ඔබලා වගේ අය හැම වෙලේ ම කරුණාවෙන් දේශනා කියන්නේත් ඔබ සිය තරම් ආත්මාර්ථකාමී නම්, ටිකේ මගේ අදේවරණී, කතාව අහගෙන ඉන්නේ දාලා මට විභාගය ගමන් යන්නට උදවු කරන්න. එය හැකියාව දේව ශ්‍රීයගේ වෙඩි මට දේශනාලන අභිධර්ම විද්‍යාවෙන් පෙළඹවීමක් කරල දී ගන්නට මට ඉඩදෙන එක ඔබගාමන්ගේට පෙනෙනේ ම කරුණක් නොවන බව මට සහතිකයි! දෙවියනි, ඔබට මා ඇහෙනවා ද?"

"මොනවක් ද, මගේ නම?" පෙණ පහරක් වගේ කටහඬක් මිදි අඩියේ ම අසා සිටියේ ය.

මම මිනියෙන් ගල් ගැහුණෙමි.

"මං අහන්නේ තුම්ගෙනේ?" කටහඬ යළිත් ඇසී ය.

"ඒ... ඒ... ලූසිෆර්..."

"චමලෝම්ඩිවෙන්?"

"ඔව්, චමලෝම්ඩිවෙන්"

"මේ අහනවා, ඇයි තුම මේ ගෙයි කිවුලියෙක් හැටියට ලියාපදිංචිවෙලා නැත්තේ?"

"ඒ මොනවක් ද?"

"මොනවක් ද කියලා දැන ගන්නැහැකි, එනවා යන්ඩ මා එක්ක පොලීසියට!"

එහෙනම් මා සමග මේ කතා කරන්නේ දෙවියන් වහන්සේ නොවේ.

"එතකොට ඔහේ කවුද?" වටපිට බලමින්, අවස්ථාව ගත් මම ඇහුවෙමි.

මා ඉදිරියෙහි සිටගෙන සිටියේ රැල්වැටුල් වූ කොස්ප්ඩයක් පැලඳ, ගෙව්තිය ලිහිලේවන පතුම්බියක් කිහිල්ලේ ගහගත් උස, කෙට්ටු මිනිසෙකි. ඒ අපේ නිවාස කළමනාකරු වෝමෙන්ට්‍රි ය.

"වෝමෙන්ට්‍රි මාමේ!" මම මුහුණ ඇද කරමින් කීවෙමි.

"නාකි නින් වෙන්වැනි උඹගෙ මාමා!" වෝමෙන්ට්‍රි ද මුහුණ ඇද කරමින් එකට එක කීවේ ය.

"වෝමෙන්ට්‍රි සහෝදරයා!" මම ම නිවැරදි කළෙමි.

"මට 'සහෝදරයා' කියන්ඩ එන්ඩ එපා!" වෝමෙන්ට්‍රි කඩා පැන්නේ ය.

"එහෙනං තමුසෙ ගහගන්නවා!" මම පුපුරා හැලුණෙමි. "මට කමක් නෑ තමුසෙ කවුරු වුණත්, මට ඉන්ඩ ඇරලා යනවා! මට පැය එකහමාරකින් විභාගයක් තියෙනවා!"





"කතා කරන හැටි අහගෙනයිත් දැන් ඇඳුම් අඳගෙන මා එක්ක එළියට යන්ඩ පොලීසියට!"

"මල්ලෙ තුළ තියාගෙන මට පාඩම් කියන්ඩ, යන්ඩ එපා" මම ද අසමතුර වෙනත් ප්‍රිම්.

වෝමෙන්ට්‍රි විශ්මයෙන් කෙඳිරුවේ ය. "මොකක්... ඊ... කොහෙකට මය නැති කමක් ද තියෙයි"

"මං ඔහේට කාරණාව කියන්නකොට ඇද මට ඇති දෙන්න. මට අද විභාගයක් තියෙනවා. මං ගෙට පොලීසියට එන්නම්. එතකොට ඉතින් මාව කැඳවාගෙන යන්ඩ එන්ඩ පිංතුන් නෑ"

"නෑ, තුම ඇඳුම එන්ඩ ඕනා, මොකද, ගෙට එයාලා තුමව අරන් යන්නේ බලෙන්!"

ඔහු කියන්නේ හැබෑවක් බව මට පෙනුණි. මා කරදරයක වැටී ඇති බව දුටු පෙනී විජ්ජු වැටුණා සේ ඇවි තඩ නැලී ය.

"අරකාගෙ කට වහනවා, නැත්නං මං ඒකා ඊගේලෙන් එළියට විසි කරනවා!" වෝමෙන්ට්‍රි කීවේ ය.

ඒ කී දේ තේරුණු පෙනී තිගැස්වූ විය. මම ඇඳුම් ඇඳලා ගතිමි. මිනිත්තු පහකට පසු අපි වයාරිස් වීදිය දිගේ ගමන් කරමින් තුබ්මු.

"ඔහේට හදවතක්වත් අනුකම්පාවක්වත් නෑ" මම කීවෙමි. "මිනිත්තුව විශ්වවිද්‍යාලේ විභාගයක් තියෙන අස්සේ ඒකට පොලීසියට ඇදගෙන යනවා."

"කාට ද හදවතක් නැත්තේ? මට හදවතක් නැද්ද?" වෝමෙන්ට්‍රි පැරුණු ලෙසින් ඇසී ය. "එහෙනං කාට ද තියෙන්නේ? එතකොට තමුන්ට හදවතක් තියේ ද? තමුන් මෙහේ පදිංචිවෙලා ඉන්නවා, ලියාපදිංචියක් ගැන හිතන්නෙ නැතුව, මං ඒකට වගකියන්ඩ ඕනා බව තමන්ට සලකන්නෙ නැතුව. එයාලා කියාවි මං කුට වැඩ කරනවා කියලා... දැන් කියාපන් බලන්ඩ තමුන් මට කවදාවත් එක ම එක කොපෙක් එකක්වත් දීලා තියේ ද කියලා?"

"නෑ!"

"ආන් බලාපන්! ඒත් කියන්නේ වෝමෙන්ට්‍රි හොරෙක්, වෝමෙන්ට්‍රි බලෙන් අල්ලස් ගන්නවා, වෝමෙන්ට්‍රි ලෝකෝත්තරයා... දැන් කවුද ලෝකෝත්තරයා, කවුද හොරා?"

"කවුද?"

"තුඹ කාමරේට කීයක් ගෙවනව ද?" වෝමෙන්ට්‍රි හිටි හැටියේ ම ඇසී ය.

"දෙසිය පනහක්!" මම කීවෙමි.

"කොහෙන් ද නුඹට මේ සල්ලි?"

"අත්තම්මා මට එවනවා."

"එතකොට එයාට කොයින් ද?"

"එයා ඉලේරියන්ගෙන් ණයට ගන්නවා."

"ඉලේරියන්ට කොහෙන් ද?"

"අස්වැන්න සරු නං එයා වයින් විකුණනවා, නරක නං ඉලිකෝගෙන් ණයට ගන්නවා."

"ඉලිකෝට කොහෙන් ද සල්ලි?"

"ඕහ්, ඕක නවත්තමු! වඩා හොඳා ඔහේට සල්ලි දෙන්නෙ කවුද කියන එක කීවොත්."

"කිසි කෙනෙක් නෑ. ආන් ඒකයි මං තමුන්ව මේ පොලීසියට අරන් යන්නේ?"

"කෙළින් කියනවාකෝ, මොනව ද ඔහේට මගෙන් ඕනෑ කරන්නේ?"

"මට නුඹෙන් මොකවත් එපා. මං නුඹව පොලීසියට අරන් යනවා, ගිහින් නීතියට අනුව කූඩුවට දාන්ඩ බාරදීලා මෙහෙම කියනවා: මේ පුරවැසි අහවලා... මොකක් ද ඔහේගේ වෘත්තිය?"

"මට තාම කිසිම වෘත්තියක් නෑ."

"විශිෂ්ටයි! මේ පුරවැසි වෂලොම්ඩ්සේ, එයාට කිසිම වෘත්තියක් නෑ. එයා තමන්ගේ නවාතැනේ නිවැසියෙක් විදිහට ලියාපදිංචි වෙලා නෑ. ඒ වගේම විභාගයෙන් අසමත් වෙලා... ඇයි නුඹ මොකෙන් ද අසමත් වුණේ?"

"දේශපාලන ආර්ථික විද්‍යාවෙන්."

"හපොයි හැබැට තමුන් නං... දේශපාලනිකව මොට්ටයෙක් වගේ ම වාසියට දෙයියන් විශ්වාස කරන්නෙක්... නුඹ මං එද්දී හිටියේ යාඥා කර කර නේද?"

"ඔව්..."

"විශිෂ්ටයි! මං උඹව කූඩුවට දානවාමයි... නුඹ කවදාහරි හිරේ වැටිලා තියේ ද?"

"නෑ..."

"එහෙනං තමුන් ගැනම අනුකම්පා කරගනින්! වට වංගු නැතිව කීවොත්, ආයි හෝදන්ඩ දෙයක් නෑ, මට නුඹව පටස් ගාලා





ලියාපදිංචි කළ හැකි!"යි ඩෝමෙන්ට්‍රි කීවේ තේ කඩයක් ළඟ නැවතෙමිනි. "මං කී දේ තේරුණා ද?"

"නෑ..."

"මොට්ටයා! ගොන් වාගේ! පුංචිම දේවත් තේරුං ගන්ඩ බැරි කොට තමුන්ට කතා කරන එකේ පලේ මොකක් ද! මොකෝ මා දිහා ඇස් උළුප්පාගෙන ඉන්නේ? අපි රිගලෙටෝගේ කඬේට ගිහින් උදේ කෑම කමු..."

ඇත්තම කීවොත්, මා සිටියේ අධික කුසගින්නෙනි. කෘතවේදී සිනාවක් ඩෝමෙන්ට්‍රි වෙත පෑ මම ඔහු පසුපසින් තේ කඩයේ බිංගෙය දක්වා වූ පඩි පෙළ බැස්සෙමි.

අපි කොණක වූ මේසයකට හිඳ ගතිමු. මේස රෙද්ද ඉතා කිළිටි එකක් විය. එහි යාන්තම් ගෑවීමෙන් වුවත් අත කිළිටිකොට ගත හැකි තරම ය. ඩෝමෙන්ට්‍රි එහි වාටිය නවා ඇත්කොට, මැස්සන් මරන්නට ඇති උපකරණයකින් පිඟානක් එහාට තල්ලු කොට, ඔහු වාඩි වී හුන් පුටුවේම පිටුපසින් තම ලිපි ලේඛන මල්ල තබා, තළල පිසදමා මහත් උනන්දුවක් පාමින් කතා කළේ ය.

"හොඳා, මොනව ද නුඹ කන්ට කැමති?"

"හැමදේම!" මම නොපමාව පිළිතුරු දුනිමි.

"බීම?"

"බිල ගෙවනවා නං මං බූමිතෙල් වුණත් බොනවා." මම හඬනගා කීවෙමි.

ඩෝමෙන්ට්‍රි මඳහසක් පා මේසයට තඩිබෑවේ ය.

"රිගලෙටෝ!"

තේ කඩයේ හිමිකරු කවුන්ටරයෙන් මෑත්ව අප දෙසට කොර ගසමින් ආවේ ය.

"සුබ උදෑසනක්!"

"සුබ උදෑසනක් රිගලෙටෝ! හඳුනා ගනිමුකෝ, මේ සුරිකෝ, මිනිහා නිදහස් හාදයෙක්, මගේ හොඳ යාළුවෙක්. අද එයා තමා සත්කාරකයා."

නැගී සිටි මම විනීත ලෙස හිස නමා, ටිබිලිසිහි අතට අත දෙන නිවැරදි ක්‍රමයෙන් රිගලෙටෝගේ අත අල්ලා ගතිමි.

"හොඳ හයි හත්තිය ඇති හාදයෙක්!" රිගලෙටෝ කීවේ, මා දෙස කිසියම් අනුකම්පාවකින් මෙන් බලමිනි. "මොනව ද කන්නෙ බොන්නෙ එහෙම?"

"බියර් දෙකයි, චීස් කෑලි දෙකයි, බෝංචි පිඟන් දෙකයි, ඒකට රාබු දාන්ඩ අමතක කරන්ඩ හෙම එපා. එතකොට පාන් රාත්තල් දෙකයි, වොඩ්කා බෝතලයයි. ඇඹුල්තියල් මාළු එහෙම තියේ ද?"

රිගලෙටෝ මෝඩ ලෙස සිනා පෑ ය. ඉක්මනින් ම මේසය මත කෑම විය.

වීදුරු පිරවූ ඩෝමෙන්ට්‍රි සිය වීදුරුව මගේ එක සමඟ ගටා නිහඬව බීවේ ය. අපි දෙවැනි වීදුරුව අපේ වැඩෙන සුහදතාව වෙනුවෙන් බීවෙමු. ඉක්බිති ඩෝමෙන්ට්‍රි සවුදිය පුරන කතාවක් ඇරඹී ය.

"ඩෝමෙන්ට්‍රි කවපුරිඩ්සෙ වන මම ඇගෙන් පුංචි මිනිහෙක්. ඒත් නැපෝලියන් කියන්නේ ඊටත් වඩා පුංචි මිනිහෙක්, එතකොට මගේ තාත්තත් ඊට වඩා පුංචියි. ඒත් එයාට කඳු වුණත් හොලවන්ඩ පුළුවනි. මං නිවාස කළමනාකරුවෙක්. එතකොට මට තියෙන්නෙ කරුණාවන්ත හදවතක්. මිනිහෙක් ජීවත් වෙන්ඩ ඕනෑ ගේක ද නැත්තං පාරෙ ද කියලා තීරණය කරන එක තියෙන්නෙ මගෙ අතේ. නුඹ කවදාවත් පාරේ ජීවත්වෙලා තියේ ද?"

"ඒ මොකටැයි? මං ඉන්ඩ හිටින්ඩ තැනක් නැති එකෙක්යැ?" මම කෝප සහගතව කීවෙමි.

"මට පුළුවනි නුඹව පාරට එළෝලා දාන්ඩ. මොකද නුඹ පදිංචියට ලියාපදිංචිවෙලා නැති හින්දා."

"එහෙනං මාව ලියාපදිංචි කරන්ඩ!"

"මෙහෙම?"

"මෙහෙම කියන්නේ මොකක් ද?" මම නොතේරුම්ව ඇසුවෙමි.

"හොඳා හොඳා, බොමුකෝ!"යි ඩෝමෙන්ට්‍රි කීවේ යළිත් වීදුරු පුරවමිනි. "නුඹ දන්නවා ද ගෙයක් කියන්නේ මොකක් ද කියලා?"

"මොනව ද ඕකේ දැනගන්ඩ තියෙන්නේ? ගෙයක් කියන්නේ ගෙයක්!"

"නුඹ දන්නෙ ඔච්චර ද?"

"හොඳා මෙහෙම කියමු, කාමර, වහලට උළු නැත්තං පිදුරු හෙවිල්ලලා නැත්තං…"

මහ හඬින් සිනාසෙන්නට වූ ඩෝමෙන්ට්‍රි තම වීදුරුව අතට ගත්තේ ය. "නුඹ මෝඩයෙක්. ඔක්කෝටම කලින් ගෙයක් කියන්නේ නිවෙසක් සහ පවුලක්. නුඹට පවුලක් තියේ ද?"

"නෑ."





"උඹ මෝඩයෙක් මගේ කොල්ලෝ! මං නුඹට කියා දෙන්නං, නුඹේ වයසෙ දි මං දෙසැරයක් බැඳලා. දැන් මං ආයෙත් ජීවත් වෙන්නේ මගේ පළවෙනි බිරිඳ එක්ක… මොනවා ගැන ද මං කිය කියා උන්නේ? ඔව්, ගෙය සහ පවුල තියෙන්නේ එකට බැඳිලා. නුඹට ගෙයක් හෙම නැත්තං ඉතිං බඳින්ට බෑ. නුඹ බඳින්නේ නැතිනං නුඹේ ගෙදෙට්ට ස්වාමිදුවක් නැතිවෙනවා. නුඹ දන්නව ද ගෙයක් ගෙයක් වෙන්නෙ කොහොම ද කියලා?"

"ඔව්!"

"එහෙනං කියාපන් බලන්ඩ!"

"ඒක හැදිලා තියෙන්නේ ගඩොල්වලින්, ලෑලිවලින්, හුණුවලින්, ගල්වලින්, උළුවලින්…"

"කට වහගන්, නීචයා! ගඩොල් හොයාගන්ඩ කලින් මිනිස්සු ජීවත් වුණේ ගස් උඩ…"

"ගුහාවල…" මම ඔහු නිවැරදි කළෙමි.

"සමහරු ගුහාවල, සමහරු ගස් උඩ... ඊට පස්සේ මිනිහට ගස් උඩ ඉඳලා ඇතිවෙලා බිමට බැස්සා. නුඹ දන්නව ද එයාට එතෙන් දී මොකද වුණේ කියලා?"

"එයා ටිකක් එහාට මෙහාට ඇවිදලා බලලා ආයෙත් ගහට බඩගෑවා."

"නෑ, එයා ඇවිදලා බැලුවා, ඒක ඇත්ත. එයාට හීතල දැනෙන්ඩ ගත්තා! එතකොට එයා මොකද කළේ?"

"එයා කබාය දාගෙන උණුසුම් වුණා."

"මොට්ටයා! එයා කොහෙන් කබා හොයන්ඩ ද? එයා කළේ ගිනිගලක් අරන් ගලකට ගහලා පුළිඟුවක් අරන් ඒකෙන් ගින්නක් ගහලා උණුසුම හදාගත්තා. ඒත් නුඹ දන්නවානේ, ස්වභාව ධර්මය හරිම වංචාකාරීයි. හිටිහැටියේ ම නැගෙනහිරෙන් හීතල හුළඟක් හමන්ඩ වුණා. ඉතිං මිනිහා කළේ හුළඟින් ගින්න ආරක්ෂා කරගන්ඩ නැගෙනහිර පැත්තෙන් බිත්තියක් හදාපු එක. එතකොට හුළඟ වෙනස් වෙලා බටහිර පැත්තෙන් හමන්ඩ වුණා. මිනිහා දෙවැනි බිත්තියත් හැදුවා, බටහිර පැත්තෙන්. එතකොට හුළඟ ඒ බිත්ති දෙක මැද්දෙන් උතුරෙනුයි දකුණෙනුයි හමන්ඩ ගත්තා! අසරණ මනුස්සයා මොනවා කරන්ඩ ද? එයා උතුරටයි, දකුණටයි දෙකට මුවාවෙන්ඩ තව බිත්ති දෙකක් හැදුවා. ඒ සරත් කාලේ. ඔන්න හීතල වැස්සක් ඇදගෙන වැටෙන්ඩ ගත්තා. තමන්ගෙ ගිනිමැළේ වැහි

"බියර් දෙකයි, චීස් කෑලි දෙකයි, බෝංචි පිඟන් දෙකයි, ඒකට රාබු දාන්ඩ අමතක කරන්ඩ හෙම එපා. එතකොට පාන් රාත්තල් දෙකයි, වොඩ්කා බෝතලයයි. ඇඹුල්තියල් මාළු එහෙම තියේ ද?"

රිගලෙටෝ මෝඩ ලෙස සිනා පෑ ය. ඉක්මනින් ම මේසය මත කෑම විය.

වීදුරු පිරවූ ඩෝමෙන්ට්‍රි සිය වීදුරුව මගේ එක සමඟ ගටා නිහඬව බීවේ ය. අපි දෙවැනි වීදුරුව අපේ වැඩෙන සුහදතාව වෙනුවෙන් බීවෙමු. ඉක්බිති ඩෝමෙන්ට්‍රි සවුදිය පුරන කතාවක් ඇරඹී ය.

"ඩෝමෙන්ට්‍රි කවපුරිඩ්සෙ වන මම ඇඟෙන් පුංචි මිනිහෙක්. ඒත් නැපෝලියන් කියන්නේ ඊටත් වඩා පුංචි මිනිහෙක්, එතකොට මගේ තාත්තත් ඊට වඩා පුංචියි. ඒත් එයාට කඳු වුණත් හොලවන්ඩ පුළුවනි. මං නිවාස කළමනාකරුවෙක්. එතකොට මට තියෙන්නෙ කරුණාවන්ත හදවතක්. මිනිහෙක් ජීවත් වෙන්ඩ ඕනෑ ගේක ද නැත්තං පාරෙ ද කියලා තීරණය කරන එක තියෙන්නෙ මගෙ අතේ. නුඹ කවදාවත් පාරේ ජීවත්වෙලා තියේ ද?"

"ඒ මොකටැයි? මං ඉන්ඩ හිටින්ඩ තැනක් නැති එකෙක්යැ?" මම කෝප සහගතව කීවෙමි.

"මට පුළුවනි නුඹව පාරට එළෝලා දාන්ඩ. මොකද නුඹ පදිංචියට ලියාපදිංචිවෙලා නැති හින්දා."

"එහෙනං මාව ලියාපදිංචි කරන්ඩ!"

"මෙහෙම?"

"මෙහෙම කියන්නේ මොකක් ද?" මම නොතේරුම්ව ඇසුවෙමි.

"හොඳා හොඳා, බොමුකෝ!"යි ඩෝමෙන්ට්‍රි කීවේ යළිත් වීදුරු පුරවමිනි. "නුඹ දන්නවා ද ගෙයක් කියන්නේ මොකක් ද කියලා?"

"මොනව ද ඕකේ දැනගන්ඩ තියෙන්නේ? ගෙයක් කියන්නේ ගෙයක්!"

"නුඹ දන්නෙ ඔච්චර ද?"

"හොඳා මෙහෙම කියමු, කාමර, වහලට උළු නැත්තං පිදුරු හෙවිල්ලලා නැත්තං..."

මහ හඬින් සිනාසෙන්නට වූ ඩෝමෙන්ට්‍රි තම වීදුරුව අතට ගත්තේ ය. "නුඹ මෝඩයෙක්. ඔක්කෝටම කලින් ගෙයක් කියන්නේ නිවෙසක් සහ පවුලක්. නුඹට පවුලක් තියේ ද?"

"නෑ."





"උඹ මෝඩයෙක් මගේ කොල්ලෝ! මං නුඹට කියා දෙන්නං, නුඹේ වයසෙ දි මං දෙසැරයක් බැඳලා. දැන් මං ආයෙත් ජීවත් වෙන්නේ මගේ පළවෙනි බිරිඳ එක්ක... මොනවා ගැන ද මං කිය කියා උන්නේ? ඔව්, ගෙය සහ පවුල තියෙන්නේ එකට බැඳිලා. නුඹට ගෙයක් හෙම නැත්තං ඉතිං බඳින්ට බෑ. නුඹ බඳින්නේ නැතිනං නුඹේ ගෙදෙට්ට ස්වාමිදුවක් නැතිවෙනවා. නුඹ දන්නව ද ගෙයක් ගෙයක් වෙන්නෙ කොහොම ද කියලා?"

"ඔව්!"

"එහෙනං කියාපන් බලන්ඩ!"

"ඒක හැදිලා තියෙන්නේ ගඩොල්වලින්, ලෑලිවලින්, හුණුවලින්, ගල්වලින්, උළුවලින්..."

"කට වහගන්, නීචයා! ගඩොල් හොයාගන්ඩ කලින් මිනිස්සු ජීවත් වුණේ ගස් උඩ..."

"ගුහාවල..." මම ඔහු නිවැරදි කළෙමි.

"සමහරු ගුහාවල, සමහරු ගස් උඩ... ඊට පස්සේ මිනිහට ගස් උඩ ඉඳලා ඇතිවෙලා බිමට බැස්සා. නුඹ දන්නව ද එයාට එතෙන් දී මොකද වුණේ කියලා?"

"එයා ටිකක් එහාට මෙහාට ඇවිදලා බලලා ආයෙත් ගහට බඩගෑවා."

"නෑ, එයා ඇවිදලා බැලුවා, ඒක ඇත්ත. එයාට හීතල දැනෙන්ඩ ගත්තා! එතකොට එයා මොකද කළේ?"

"එයා කබාය දාගෙන උණුසුම් වුණා."

"මොට්ටයා! එයා කොහෙන් කබා හොයන්ඩ ද? එයා කළේ ගිනිගලක් අරන් ගලකට ගහලා පුළිඟුවක් අරන් ඒකෙන් ගින්නක් ගහලා උණුසුම හදාගත්තා. ඒත් නුඹ දන්නවානෙ, ස්වභාව ධර්මය හරිම වංචාකාරියි. හිටිහැටියේ ම නැගෙනහිරෙන් හීතල හුළඟක් හමන්ඩ වුණා. ඉතිං මිනිහා කළේ හුළඟින් ගින්න ආරක්ෂා කරගන්ඩ නැගෙනහිර පැත්තෙන් බිත්තියක් හදාපු එක. එතකොට හුළඟ වෙනස් වෙලා බටහිර පැත්තෙන් හමන්ඩ වුණා. මිනිහා දෙවැනි බිත්තියත් හැදුවා, බටහිර පැත්තෙන්. එතකොට හුළඟ ඒ බිත්ති දෙක මැද්දෙන් උතුරෙනුයි දකුණෙනුයි හමන්ඩ ගත්තා! අසරණ මනුස්සයා මොනවා කරන්ඩ ද? එයා උතුරටයි, දකුණටයි දෙකට මුවාවෙන්ඩ තව බිත්ති දෙකක් හැදුවා. ඒ සරත් කාලේ. ඔන්න හීතල වැස්සක් ඇදගෙන වැටෙන්ඩ ගත්තා. තමන්ගෙ ගිනිමැළේ වැහි

වතුරට අහුවෙන හැටි මිනිහට පෙනුණා. ඉළුක්වලින් වහලක් ගහන්ඩ ඕනෑ කියලා එයාගෙ ඔළුවට ආවේ ඔය වෙලාවේ!"

"ඊට පස්සේ මොකද වුණේ?"

"ඊට පස්සේ තවත් කරදර තිබුණා. ගිනිමැලේ දුමට යාගන්ඩ තැනක් නෑ. මිනිහගේ ඇස් දැවිල්ල ගන්ඩ වුණා. ඒ ගැන මොකක් හරි කළ යුතු වුණා. එයාට පුළුවන් ද බිත්ති ටික අහක් කරන්ඩ? ඒත් එයා මිනිහෙක්, අපි එතැන දි තිරිසනුන්ගෙන් වෙනස් වෙනවා. අපි අපේ මොළේ පාවිච්චියට ගන්නවා. අපට පුළුවනි දෙකයි දෙකයි එක්කරන්ඩ."

"නුඹ තිරිසනෙක්, සෙරපියෝනා, නුඹ ආන් එහෙමයි!" බෝතලය ඩැහැ ගනිමින් මම කීවෙමි.

"මෝලා, ඔය බෝතලේ තියාපන්... මං කොහේ ද නැවැත්තුවේ?"

"මිනිහා දුමෙන් හුස්ම හිරවෙලා උන්නා."

"ආන් හරි. එයා හුස්ම හිරවෙලා මැරෙන්ඩ ම ගියා. ඒත් එතකොට ම මිනිහට ආවා අදහසක්ඃ එයා වහලේ හිලක් හැදුවා. දුම එතැනින් පිටවෙලා ගියා. මිනිහට හොඳින් හුස්ම ගන්ඩ හැකි වුණා. හොඳා, ඔන්න මිනිහා ගිනිමැලේ ළඟ ඉඳගෙන උණුසුමට සැප පහසුවට ඉන්නවා. එළියේ වැස්ස පායලා ද කියලා මිනිහට දැනගන්ඩ ඕනෑ වුණා. ඒත් කොහොම ද ඒක කරන්නේ?"

"එළියට අත දාලා බලනවා, ආන් එහෙමයි!"

"මොකෙන් එළියට ද?"

"ජනේලෙන්, වෙන මොකෙන් ද?"

"අනේ පොල් මෝලෝ, ඒකාට මොන ජනේලයක් වත් තිබුණේ නෑ! ඉතිං මිනිහා කල්පනා කළා බිත්තියේ ජනේලයක් හදන්ඩ... එතකොට ම මිනිහාට තේරුණා පිටවෙන්ඩත් විදිහක් ඕනෑ කියලා... නුඹට හිතාගන්නැහැකි ද ඇයි කියලා... රිගොලෙටෝ! තව බෝතල් බාගයක්!" ඉක්කා ගැසූ ඩෝමෙන්ට්‍රි දිගටම කියාගෙන ගියේ යඃ "ඔන්න ඉතිං එයා බිත්තියේ විවරයක් හැදුවා. දැන් එයාට මොකක් ද තියෙන්නේ?"

"හිලක්." මම පිළිතුරු දුනිමි.

"බුරු වහන්සේ! එයාට දැන් තියෙන්නේ ගෙයක්, ආන් ඒකක්. ගෙයක්!"





"මං දන්නෑ. මගේ සීයා ගෙයක් හදන්ඩ ගියේ ඔයිට වෙනස් ම විදිහකට..."

"මගේ සීයත් කිසිම ගෙයක් හදන්ඩ ගියේ නෑ, එයා ඇතුළු වුණේ වෙන කවුරුවත් හදාපු ගේකට. ඒත් ඒක මේ කාරණෙන් පිටයි... ඊට පස්සේ මිනිහා කැලෑවෙන් බල්ලෙක් අරන් ඇවිත් ගෙයි මුරට තියලා ගෙයින් පිට ගියා. එයිනුත් පස්සේ මිනිහා තමන්ට ම කියලා බිරියක් අරන් ඇවිත් ගෙයි කටයුතු බලා හදා ගන්ඩ උන්දැට පවරලා ආයෙත් ගෙයින් පිටවුණා. එයා ආපහු ආවෙ මොනවා හරි දඩයමකුත් අරගෙන... කට්ටිය ම එකතු පහදුවෙලා ඒක කාලා මිනිහාව අගය කළා... ඊට පස්සේ මිනිහට දරුවොයි, මුණුබුරොයි, මී මුණුබුරොයි ලැබුණා... ඔන්න ගමක් ජේන්ඩ වුණා, ඊටත් පස්සේ නගරයක්, අන්තිමේ අගනුවර... ජෝර්ජියාවේ අගනුවර ටිබිලිසි... දැන් නුඹට තේරෙනව ද අපේ ටිබිලිසි ගොඩනැගෙන්ඩ කොච්චර කාලයක් ගත්ත ද කියලා? නෑ! එහෙනං නුඹ කොහොම ද පදිංචිය ලියාපදිංචි නොකර ඉන්ඩ බය නැති වුණේ? හොඳා, කාරි නෑ... මං නුඹට කැමතියි... මොකක් කියල ද නුඹේ නම කීවේ?"

"සූරිකෝ."

"සූරිකෝ... මං මාර්තාට නුඹ ගැන විශේෂයෙන් කතා කරන්නංකෝ, එතකොට නුඹෙන් මං රූබල් දෙසීයකට වඩා ගන්නෙ නෑ... හැබැයි කාටවත් කියන්නෙ හෙම නෑ!... මොකක් කියල ද නම කීවේ?"

"සූරිකෝ!"

"ඔව්, හොඳා කට පරිස්සං කරගන්නවා හොඳා, තේරුණා ද?" ලැජ්ජාශීලීව ඉඟිමැරූ ඩෝමෙන්ට්‍රි, එලෙසින් ම දිගට ම එක් ඇසක් පියාගෙන සිටියේ ය. ඉක්බිති අනෙක් ඇසින් ඉඟි මැරූ ඔහුට එය ද ඇර ගත නොහැකි විය. ඔහු තද නින්දට වැටී හුනි.

වීදුරුව වොඩ්කාවලින් පිරවූ මම රිගොලෙටෝ ඇමතිමි.

"මහත්තයා."

එසැණෙන් ඔහු පැමිණියේ ය.

"මෙන්න, බොමු!" වීදුරුව පාමින් මම කීවෙමි.

"වැඩකරද්දී මම බොන්නෙ නැහැනේ!"යි කී රිගොලෙටෝ පරිස්සමින් වීදුරුව මේසය මත තැබී ය.

මම ඔහු වැළඳගෙන මෙසේ ඇසීමි:

"ඔහේ දන්නව ද දේශපාලන ආර්ථික විද්‍යාව කියන්නේ මොකක් ද කියලා?"

"මම දේශපාලනය දන්නවා. එතකොට ආර්ථික විද්‍යාවත් දන්නවා."

"එහෙනං මට කියන්ඩ මොකක් ද හුවමාරු භාණ්ඩය කියලා?"

"මොන ජාතියේ හුවමාරු භාණ්ඩ ද, තීරණාත්මක ඒවා ද?"

"ඔව්!"

"මෙහෙමයි, කඩේ විකුණන්ඩ තියලා තියෙන හැම දේ ම එක විදිහක හුවමාරු භාණ්ඩ. එතකොට ගබඩාවෙත් හුවමාරු භාණ්ඩ තියෙනවා. තීරණාත්මක කියන්නේ..."

"හරියට හරි! ඔහේට මේ මළ මිනිය පේනව ද?" මම ඩෝමෙන්ට්‍රි දක්වමින් ඇසුවෙමි.

"නින්දට වැටිලා නේද!" සිනාවක් පාමින් රිගොලෙටෝ ඇසී ය.

"ඒ සෙරපියෝනා."

"නෑ, සෙරපියෝනා නෙවෙයි, ඒ ඩෝමෙන්ට්‍රි."

"මං කියන්නේ මේ සෙරපියෝනා,"යි කී මම එක හුස්මට වීදුරුව හිල දැමුවෙමි. හිටි අඩියේ ම මා වටා වූ සෑම දෙය ම කරකැවෙන්නට විය. මේසය, රිගොලෙටෝ සහ මම බිත්තිය දිගේ නැංගෙමු. "අපි වැටෙනවා". යාන්තමින් ඇස් උළුප්පා ගැනීමට මට යාන්තමින් කල්වේලා තිබිණි. ඇස් ඇර බලද්දී සියල්ල ම හරිගොස් තිබිණි.

"ඔහේ මාව දන්නව ද? මම සූරිකෝ වෂලො...මිඩ්සේ... එතකොට ඔහේ දේශපාලන ආර්ථික විද්‍යාව දන්නව ද?" මම රිගලෙටෝගෙන් ඇසීමි.

"නැතුවයැ! මං බිල අරන් එන්ඩ ද?"

"සහතිකේටම."

ඉවත ගිය රිගලෙටෝ දැවැන්ත ඇබකසයක් ගෙන ආපසු පෙනී සිට එහි පබළු ගණින්නට විය.

"ෂෂ්ලික් මාළු දෙකයි – රූබල් හතළිහයි, පාන් රාත්තල් දෙකයි – රූබල් හයයි, වොඩ්කා, බෝංචි, චීස්... ඔක්කොම එකතුව රූබල් තුන්සීයයි..."

"තුන්සීයක් බොහොම වැඩියි... පනහක් හොඳටෝ ම ඇති..."

"ඔහේ හොඳ සිහියෙන් ද?"

"මං කියන්නේ මට රූබල් පනහක් දෙනවා, ඒ ටැක්සියකට ගෙවන්ඩ. මට මෙහෙම පයගහන් ඉන්ඩ බෑ වගේ..."





"විහිළු කරන්ඩ එනව ද? ජෝකරයෝ එක්ක මං ගනුදෙනු බේරන හැටි දන්නව ද නුඹ?" අඩි දෙකක් දිග පිහියක් රිගොලෙටෝගේ අතේ දිලිසිනි.

"මොකක්, නුඹ මාව මරන්ඩ ද යන්නේ?" මම ඇසුවෙමි.

"බිල ගෙවනවා!" රිගොලෙටෝ පිම්බේ ය.

"මාව හෝදිසි කරලා බලනවා! එක සතයක් හොයා ගත්තොත් මං නුඹට බෝතල් දෙකක් අරන් දෙනවා!"

රිගලෙටෝ මගේ කමිස කරින් අල්ලා ගත්තේ ය.

"ඩෝමෙන්ට්‍රි මාමේ! ඩෝමෙන්ට්‍රි සහෝදරයා! ඩෝමෙන්ට්‍රි! නැගිටිනවා, තමුසෙට නං හෙණ වදින්ඩ ඕනෑ. මේකා මාව මරනවා!" මම බෙරිහන් දුන්නෙමි.

ඩෝමෙන්ට්‍රි දෑස් විවරකොට, මා දෙස නොදකිනසුලු ඇසින් බලා සිට අතක් වනා පිඟානකට හිස ඔබා ගත්තේ ය.

"මට යන්ඩ අරිනවා. මං එයාව තියලා යන්නං ඇපේට. ඒ මදි ද?" මම අයැදීමි.

"නෑ, ඒක හරියන්නෙ නෑ. සල්ලි දීලා හිටපන්, ඊට පස්සේ උඹට ඔන ජෝගියක් නටා ගත්තැහැකි!"

"හොඳා එහෙනං, බෙල්ල අතාරිනවා."

රිගොලෙටෝ මගේ කමිස කර අත හැරියේ ය. ඩෝමෙන්ට්‍රිගේ මල්ල ගත් මම එය සොලවා බැලුවෙමි. එය හිස් ය. ඉන් පසු මම ඩෝමෙන්ට්‍රිගේ කබා සාක්කු පිරික්සා බැලුවෙමි. රූබල් තිහේ නෝට්ටු හතරක් එහි විය.

"එකසිය විස්සයි. තමුසේ තව එකසිය අසූවක් දෙන්ඩ ඕනෑ."

මම ඩෝමෙන්ට්‍රිගේ කලිසම් සාක්කු ද ඇද බැලුවෙමි. එයින් තවත් රූබල් එකසිය පණහක් උපයා ගතහැකි විය.

"තව තිහක් ඕනෑ!" රිගොලෙටෝ කී ය.

"තමුසේ පපුවක් නැති මිනිහෙක්!" මම විරෝධය පෑමි. "තමුසෙට ළමයි එහෙම නැද්ද?"

"නෑ!" ඔහු කඩා පැන්නේ ය.

"එහෙනං තමුසෙගෙ ළමයි නැතිකමට බද්ද හැටියට මේ රූබල් තිහ ගෙව්වා කියලා හිතාගන්නවා,"යි කියා සිටි මම දොර දෙසට ගමන් ගතිමි.

"මේ කුණු මස් කෑල්ලත් අරන් පලයං, මං ඒකාව ඇඹුල්තියල් කරන්ඩ කලිං," රිගලෙටෝ කෑගැසී ය.

ඩෝමෙන්ට්‍රි එහි සිටීම ආරක්ෂාකාරී නොවන බව මම තේරුම් ගතිමි. ඔහු මගේ පිට මත අසීරුවෙන් ඔසොවාගත් මම ඒ බරින් වැනෙමින් රිගලෙටෝගේ වසම හැර ආවෙමි.

එදා රැයෙහි සොපීත්, මමත් අපේ ඇද ඩෝමෙන්ට්‍රි සමග බෙදා ගතිමු. පදිංචිය ලියාපදිංචි නොකොට, මුළු ලොව ම සමග සාමයෙන් අපි සනීපෙට නිදාගතිමු.

## ප්‍රීතිය

මම මේ වන විට අවුරුදු තුනක් තිස්සේ ටිබිලිසිහි දිවි ගෙවමින් සිටිමි. ගමේ දී මා ඇමතෙන්නේ 'නගරංකාරයා' ලෙසිනි. නගරයේ දී මා 'ගම්බයියා' ලෙස හැඳින්විණි. මාර්තා නැන්දා තවමත් සලකන්නේ මා හදන්නට බැරි තරම් නරක, වැඩ අතපසු කරන්නකු ලෙසිනි. නිවාස කළමනාකරු ඩෝමෙන්ට්‍රිට මා විශ්වාසී මිනිසෙකි. මගේ මහාචාර්යවරුන්ට නම් ඉබාගාතේ යන්නෙකි. මොන විදිහේ අධ්‍යාපනයක් ඔළුවට පුරවා ගත්තත්, අත්තම්මා, ඉලිකෝ සහ ඉලේරියන්ට පමණක් මා තක්කඩියෙකි, වාචාලයෙකි, මිථ්‍යා දෘෂ්ටිකයෙකි. සොපී මගේ අතීතය, වර්තමානය හෝ අනාගතය ගැන කිසිවක් නොසලකන්නී ය. ඈ මගේ ඇඳේ නිදයි, මගේ ආහාරයෙන් ඉතිරි වන දෑ කයි. ඉතිං බළලකුට ප්‍රීතිය ඇතිවෙන්නට ඕනෑ කරන්නේ වෙන මොනවා ද? අසමත්වීම දිගින් දිගට ම මා පසුපස්සේ පන්නති. මගේ දීමනාවන් ඒවායේ නියම හිමිකරු පැමිණ ලබාගන්නා තුරු විශ්වවිද්‍යාලයේ කොමේදෝ බරසාර පෙට්ටගම්වල දිගින් දිගට ම එකතු වෙමින් තිබේ.

පිටත සීතල ය. හිම වැටෙමින් තිබේ, සුළඟ උඩුබුරලයි.

මම මාර්තා නැන්දාගේ කාමරයේ හිඳගෙන සිටිමි. මෙතැන උණුසුම් ය. වටකුරු බඩගෙඩියක් ඇති සමොවාරයක් මේසය මත හුම් හඬ නගයි. අපි කඩිමුඩියෙන් තොරව තේ බොමින් සාමකාමී කතාබහක යෙදී සිටිමු.

"අනේ අපොයි උඹේ අත්තම්මා!" මාර්තා නැන්දා සුසුම් ලෑවා ය. "පාදඩයෝ උඹේ දීමනාව වත් ලැබෙනවා නං, ඈට ටිකක්වත් ලේසියක් වේවි..."





"මාර්තා නැන්දේ, අද මගේ උපන් දිනේ, ක්‍රිස්තුගේ නාමෙට ඒක නරක් කරන්ඩ එපා!"

"අනේ උඹේ උලව් උපන් දිනේට හෙණ ගහච්චාවේ, ලැජ්ජා නැති තීවයා!"

"බොහොම ස්තුතියි! ඔයාටත් එසේම වේවා, මාර්තා නැන්දේ" මම මගේ තේ වීදුරුව නිවෙස් හිමිකාරියගේ වීදුරුව සමග ගැටුවෙමි.

"රස්තියාදුකාරයා!"යි සිනාවක් සඟවා ගනිමින් කී මාර්තා නැන්දා මගේ වීදුරුවට තවත් සීනි ගුළියක් හොරෙන් එකතු කළා ය.

එය ටිබිලිසියේ ඉතා සීතල සිසිරයක් විය. සැන්දෑවන් මාර්තා නැන්දාගේ කාමරයේ ගෙවීමට මම කැමැත්තෙමි. අපට දරාගත හැකි උපරිමයට තේ බී නිමා වූ පසු මාර්තා නැන්දා නේකාකාර දුක්බර කතා කියන්නට ගත්තී ය. ඇය කියන්නේ ප්‍රථම පුරුෂයෙන් වුවත් ඒවා ඇගේම ජීවිතයේ කොටස් බව මම දැන සිටියෙමි. මම දුක්බර කතා අසන්නට ප්‍රිය කළෙමි. එසේ ම මගේ අනෝරක් නැති දෙඩවිලි අසන්නට මාර්තා නැන්දා ද ප්‍රිය කළා ය. ඇය සිනාව දරාගත නොහැකිව ගැහෙන්නට ගනී. කඳුළු පිසදාගන්නා ඇය මගේ කතාවට විරාමය තබන්නේ, "අනේ උඹ නරකාදියට ම පලච්චාවේ!"යි කියමිනි.

අද මගේ උපන් දින අවස්ථාවේ, කථකරුවාගේ භූමිකාව මම රඟපෑවෙමි. මාර්තා නැන්දා තේ වීදුරුව තොලගාමින් ඕනෑකමින් සවන් දුන්නා ය.

"ඔයා මගේ ඉලිකෝ ගැන දන්නවා නේද?" මම ඇරඹුවෙමි.

"නැතුවායැ! නුඹ ඔය එකැස් යක්ෂයා ගැන කීයක් නං කතා කියලා තියේ ද!"

"එහෙනං අහගන්න... උස රස චෙරි ගහක් ඉලිකෝගේ වත්තේ තියෙනවා, හරියටම වැට අද්දර. වෙනස් වෙනස් විදිහේ වර්ග හතරක රස චෙරි උපද්දනවාට මේ ගහ හරි ප්‍රසිද්ධයි. මුළු සරත් කාලෙ පුරාම ඒකෙ ගෙඩි. ඉලිකෝට මේ පුදුම ගහ ගැන හරි ආඩම්බරයි. එයා එයාගෙ තනි ඇහෙන් බොහොම ආදරෙන් ඒ දිහා බලනවා. දවල් දවසේ මේ ගහට නගින්ඩ තරං බයක් හැකක් නැති කවුරුවත් ගමේ නෑ. රෑට ඉලිකෝ බැල්කනියේ බුදියාගන්නේ ලුණු කොටපු ආදිකල්පික බෙර්ඩාන් තුවක්කුවක් තුරුල් කරගෙන...

...ඉතිං දවසක් හැන්දෑවේ මමයි ඉලේරියනුයි මෝලට ගියා. අපේ වාරෙ එනකං එතන පැය ගාණක් රස්තියාදු වෙන්ඩ වුණා. ඒත්

කාලෙ ගෙවුණා දන්නෙම නෑ අපේ කයිවාරුව හින්දා. අපි ආපහු ආවේ මහ ර ජාමෙ. ඉලිකෝගේ ගේ පහුකරමින් ඉන්දැද්දි ඉලේරියන් නැවතුණා…

"අපි පොඩියක් මහන්සි ඇර ගනිමු,'යි කීව ඉලේරියන් වෙරි ගහ පාමුල ඉඳගත්තා. මගේ විරුද්ධයක් තිබුණේ නෑ. අපි ඉඳගෙන දුම්බිව්වා. මගේ සිගරැට්ටුව අන්තිම කොටේ වුණා ම මම නැගිට්ටා.

"මොකක් ද කලබලේ?" ඉලේරියන් ඇහුවා.

"ඔහේ කල්පනා කරන්නේ පාන්දර වෙනකං මෙතන ලගින්ඩ ද? මට හෙණ ගහන තරමට නිදිමතයි."

"වෙරි ගෙඩි දෙක තුනක් කන්ඩ හෙම කැමති නෑ?"

"හැබෑටම මොකෝ නැතුව! ඒත් මොන ලෝකෙන් හොයාගන්ඩ ද?"

"මොන ලෝකෙන් ද කියලා අහන්නේ මොක ද? තොග පිටින් ඔය තියෙන්නේ නුඹේ ඔළු ගෙඩිය උඩින්ම!"

"අපොයි එපා, බොහොම ස්තුතියි! ඔහේට තුවක්කුව අමතක වෙලා වගේ!"

"මෝඩයා! දවස් කීපෙකට කලිං තුවක්කුව එයාගෙ අතේ ම පිපිරුවා!"

"ඒකට කාරි නෑ. මම නං මේ ගහට බඩගාන්නේ නෑ!"

"එතකොට උඹ කියන්නෙ මං ගහට බඩගාන්ඩ ඕනෑ කියල ද, උඹ මෙතන ඉඳන් වෙරි කකා මට උදවු කරන අව් අස්සේ?"

"නැතුව!"

"තක්කඩියා! උඹට ලැජ්ජා නැද්ද අසරණ නාකි මනුස්සයෙක්ව ගස් බඩගාවන්ඩ?"

"එහෙනං, නුඹ මට 'අසරණ නාකි මිනිහා' වෙන්ඩ එපා!"

"හරි හරි, අනේ බොට හෙණ ගහන්ඩ. අපි දෙන්නා ම එහෙනං ගහට බඩගාමු."

අන්තිමේ දී, මං වත්තට ඇතුළුවෙලා, වටපිට සෝදිසි කරලා, ගහට නැගලා ඉලේරියන්ට ගහට නගින්ඩ සංඥා කරන්ඩ ඕනෑ කියලා අපි එකඟතාවෙකට ආවා.

…මුළු වටපිටාව ම සද්ද බද්දක් නෑ. මම වෙරි ගහ ගාවට බඩගෑවා, කන්දුන්නා, පරිස්සමට ඉස්සුණා, ඊට පස්සේ ගහේ කඳ වටේ අත යැව්වා… යකඩෝ ඇලිච්චි! හරියට මැස්සො අල්ලන ගම් ගාපු කඩදාසියක මැස්සෙක් ඇලවුණා වගේ! මිනිහකුගේ උසට





එනකං ගස් කඳ පුරා ම මොනවදෝ යක්ෂ ජරාවක් ඝන තට්ටුවක් වෙන්ඩ තවරලා. ගඳේ හැටියට බැලුවම ඒක ඝන තෙලුයි, පෝරයි, කුකුළු බෙටියි, ඒ ජාතියෙම ගන්දස්සාර දහ ජරාවල් තොගේකුයි එකට කලතාපු වගකුයි දැනුණේ… ගහෙන් ආපහු අත ඇදගන්ඩ මගේ මුළු වෙර ම දාන්ඩ සිද්ධ වෙච්චි. මගේ ඇඳුම් ගඳේ බෑ. කේන්තියටයි ගඳටයි හුස්ම ගන්ඩ බැරුව මම එහෙම ම හිටගෙන හිටියා. මාව මේ මෝඩකමට එව්වට ඉලේරියන්ගෙන් පළිගන්නේ කොහොම ද කියලා මං කල්පනා කළා. හොඳාකො, මට නැතිවෙන්ඩ කියලා දෙයක් තිබ්බෙ නෑ, ඉතිං මං ගහට බඩගාලා දිග සිවුරුහමක් කළා. ඒ එක්කම ඉලේරියන්ගේ හෙවණැල්ල වැනි වැනී වැටෙන් පැනලා ගහ ළඟට බඩගෑවා. එයා නහයෙන් ඉව කර කර මෙහෙම අහනවා මට ඇහුණා.

"ඒයි මොකක් ද මේ ගඳ?"

"ගණන් ගන්ඩ එපා, උඩට නගිනවා." මං රහස් හඬින් කිවුවා.

ඉලේරියන් අත් දෙක විහිදලා ගහ බදාගත්තා… එහෙමමයි. මිනිත්තුවක් යනකං ගහ යට මෙලෝ සද්දක් නෑ… ඉන් පස්සේ මට මහ මිලේච්ච පිඹිල්ලක් ඇහුණා.

"ඒයි සුරිකෝ මොකක් ද බොල මේකෙ තේරුම?"

"ඒකේ තේරුම දෙයියෝ හොරෙකුට දඬුවං කරනවා කියන එකයි! ඔහේ ඔය සෝස් එකට කැමති නැද්ද?" කියලා මං සංතෝසෙන් ඇහුවා.

"සුරිකෝ වෂලොම්ඩ්සේ, උඹ ඉතුරු ජීවිතේ පුරාම ගහ උඩට වෙලා ඉන්ඩ නං යන්නේ, එහෙම නං ඉතිං කාරියක් නෑ. හැබැයි උඹ බිමට බැස්සොත් හෙම උඹේ බෙල්ල කැපෙන්නේ හරියට නත්තල් ඌරකුගේ බෙල්ල කැපෙනවා වගේමයි!"

"ඒ මොකට ද? ඒක ඔහේගෙ ම වැරැද්ද නෙවැ!"

"මගේ වැරැද්ද ද බොල බැල්ලිගෙ පුතෝ? බොට වෙරි ටිකකින් සංග්‍රහ කරන්ඩ මට ඕනවුණ එක ද තක්කඩියෝ? නාකි මෝඩ මට හරියට ම සැලකුවා, ලැබුණේ හත්ජරාව ගොඩක්!"

"ඔය පළිගැහිල්ල නවත්තා ගන්ඩ දැන්! මං බහින්ඩයි යන්නෙ, කෝ ඉඩදෙන්ඩ…"

"සුරිකෝ, උඹේ ඔය පච්කාර ඔළුවට අනුකම්පා කරලා මා ළඟට නං එන්ඩ එහෙම එපා…"

"ඔහේ කියන්නෙ මට පියාඹන්ඩ කියල ද?"

"මේ කාලකණ්ණියා මාව පිස්සු වට්ටනවා! නීචයා, උඹ කොහොම ද මට මේ වගේ කතා කරන්ඩ බය නැති වුණේ! මං මෙහෙම ගෙදර යන්නෙ කොහොම ද කියලා හිතන්ඩ උඹ ටිකක්වත් නැවතුණා ද?"

"එතකොට මං?"

"උඹ ආයි තවත් නං කොහේවත් යන්නෙ නෑ! මං උඹේ ගෙදරට ඇදගෙන යන්නේ උඹේ මළකඳ, උඹට ඇහෙනව ද මං කියන දේ? උඹේ මළකඳ!"

එහෙම කිවුව ඉලේරියන් මගේ කකුලෙන් අල්ලා ගන්ඩ අත් දික්කළා. ඒත් ඒ එක්කම එයා වමනෙ කරන්ඩ ගත්තා. අර ජරාව එයාගෙ බඩ දඟලවන්ඩ අරන්. මං තත්පරෙන් බිමට බැස්සා.

"ඉලේරියන් රත්තරනේ මොකද, බඩ දඟලනව ද?"

"උඹ මට අත තියන්ඩ එපා!" එයා මාව තල්ලු කරමින් දුර්වල විදිහට කෑගැහැව්වා.

වට කරගෙන තිබුණු ගඳ හින්දායි, ඒ හින්දා ම දෙන්නට දෙන්නා ගැන තිබුණු තරහව හින්දායි අපට පරිස්සම ගැන අමතක වුණා. එකපාරට ම ඉලිකෝගේ බැල්කනියෙන් මොකක්දෝ බර දෙයක් වැටෙන සද්දක් ආවා. ඒ එක්ක ම පපුව පැලෙන තරං යටිගිරියෙන් කෑගහන බෑගිරි සද්දක් ආපි.

"ඒයි... මිනිස්සුනේ ඕකාව අල්ලා ගනිං! ඒයි වරෙල්ලා, හැම පැත්තෙන් ම වට කරපල්ලා, ඒයි...!"

ඉලේරියනුයි මායි වැට පැත්තට දිවුවා, වැටේ වැදිලා අපි දෙන්නා ම බිම පෙරලෙච්චි. දඩිබිඩියේ අපි ගෝණි දෙක ඇදලා ගත්තා. වෙඩිල්ලක් පිපිරුවා.

"ඒකා හිතනවා ඇති වෙඩිල්ලකින් මිනිහෙක් මැරෙන්නෙ නෑ කියලා, එකැස් යකා," ගෝණිය අමාරුවෙන් කරටගන්න අස්සේ ඉලේරියන් මුණු මුණු ගෑවා.

"කරදර වෙන්ඩ එපා, එයා තුවක්කුව ආයෙ කොටාගන්නකං අපිට පැනගත්තැහැකි."

"ඉලව්ව! ඔය තුවක්කුවට බැරල් දෙකක් තියෙනවා!"

"තුඹ කොහොම ද දන්නේ?"

"ඒක ණයට දුන්නේ මං නෙවෑ!"

"තමුසෙ ඔක්කොටොම වඩා මෝඩයෙක්!"

"ඔය මල්ල අරගන් මොට්ට මෝලෝ! පණ බේරාගෙන දුවමු!"



මං මල්ල අරගෙන ඉලේරියෙන් පස්සේ වැටුණා විතරයි තවත් වෙඩිල්ලක් පත්තු වුණා. ඉලේරියන් මල්ල බිම අතෑරලා අමුතු හැඩේකට වක ගැහිලා, එක අතකින් මාව අල්ලාගෙන අනිත් අතින් පස්ස පැත්ත අතගාලා ඉලිකෝගේ ජනෙල් පියන් වෙවුලවන තරමට යටිගිරියෙන් බෑගිරි දෙන්ඩ ගත්තා. මං දඩිබිඩියේ එයාගෙ කට අතින් වැහැව්වා. ඉලේරියන් දෂ්ට කළා වගේ ඇඹරුණා, බඹරයක් වගේ කැරකුණා, බිම ඉඳගත්තා, උඩ පැන්නා, වෙන වචනවලින් කිවුවොත් මොන ම වෘත්තීය සර්කස්කාරයකුට වුණත් ඉරිසියාවේ පැලෙන තරමට හොඳට කරණං ගැහැව්වා. ගෝණිවලට වෙන දෙයක් වෙච්චාවේ කියලා එයාව කරගහගෙන ගෙදර අරන් යනවා ඇර වෙන කරන්ඩ කිසි දෙයක් තිබුණෙ නෑ."

...මාර්තා නැන්දා අන්තිමට ඇඬෙන තුරු ම සිනාසුණා ය. ප්‍රමෝදයෙන් දුබල වූ ඇය පුටුවේ සිට කවිච්චියට පෙරළී ගොස් කතාව නවතන්නැයි අත වැනුවා ය. එහෙත් කතාවක් පටන් ගත් විට එය නවත්වා ගැනීම මට ලේසි නැත.

"'සූරිකෝ, අනේ රත්තරනේ, මාව දාල නං යන්ඩ එපා, මගේ මේ කෙස් පැහුණු ඔළු ගෙඩියට නින්දා වෙන්ඩ නං අරින්ඩ එපා!' කියලා වේදනාවෙන් දත්මිටි කකා ඉලේරියන් යැද්දා. 'හිටුකෝ, ඉලිකෝ විගොගිඩ්සේ, හිටුකෝ මං බෝව අල්ල ගන්නකං! කැලිවලට ඉරනවා!... මාව බේරාගනිං, සූරිකෝ, මං මැරෙන්ඩ යනවා!'"

"ඒ සාමාන්‍ය ලුණු ද?" මං ඇහුවා.

"මට හිනාවෙනව ද? දීනයා! මාව විහිළුවට ගන්නව ද ඈ? හිටුකෝ! මං තොපි දෙන්නා ගැනම බලාගන්නංකෝ තක්කඩියෝ! අයියෝ... දෙයියනේ, මේ වේදනාවෙ ඉවරයක් නැද්ද? මාව පිච්චෙනවා!"

"උහුලාගෙන ඉන්නවා, ඕක ඉක්මනට දියවෙලා යාවි..."

"කවදා ද? අර එකැස් යකා මාව ලුණුවලින් පුරෝලා...!"

මං ඉලේරියන්ව පරිස්සමට මූණින් අතට බාවලා, තුවාලෙ ගැන බලන්ඩ එයාගෙ කලිසම පාත්කළා.

"මගේ තත්ත්වෙ නරක ද? මං උදේ වෙනකංවත් අල්ලා ඉදියි ද?" ඉලේරියන් කෙඳිරිගෑවා.

"කලබල වෙන්ට තරං දෙයක් නෑ, ඉලේරියන්," කියලා මං එයාව සැනසුවා.

"අනේ සුරිකෝ පුතේ, හැක් නං තුවාලෙට පිඹහන්කෝ, එතකොට මට සනීපයක් දැනෙයි," ඉලේරියන් යැද්දා.

මං පැයක් තිස්සේ වාඩිවෙලා ඉලිකෝට සාප කර කර තුවාලෙට පිම්බා. ඊට පස්සේ අපි කොහොමෙන් හරි ඉලේරියන්ගෙ ගෙදරට යාගත්තා. එයාව කට්ටියේ දිගා කරලා, දැන් තිල් ගැහිලා තියෙන තුවාලෙ උඩින් තෙත තුවායක් එළපු මං අත්තම්මාව එක්ක එන්න ගෙදර දිව්වා. කෙඳිරි ගගා, අනුකම්පා සහගත විදිහට විලාප තියන මගේ තුවාල වුණු යාළුවාගෙ පැත්තකින් ඉඳගෙනයි රෑ එළිවෙනකම් ම අපි හිටියේ.

"හිතා බලමුකෝ වැඬේ හැටි ඔල්ගා හාමිනේ, කෙනකුට ඔහොමත් විහිළු කරනවද!" කොට්ටය විකාගෙන ඉලේරියන් වැලපුණා. "අයියයියෝ... හිටුකෝ එකැස් යකා, මං තෝව අල්ලා ගන්නකං! මං උඹට දෙනවාමයි, ඔව් දෙනවාමයි."

"ඒ නුඹය කියලා එයා දැනං උන්නෙ නැද්ද?" අත්තම්මා ඇහුවා.

"ඌ දැනගත්තෙ නෑ! දැනගත්තා නං හෙම, ඔහේගෙ ඉලේරියන් මේ වෙද්දී පපුවෙ උණ්ඩයක් එක්ක බිම දොයි..."

"උඹලටත් හොඳ පාඩම! අනුන්ගෙ පලතුරු වතුවලින් හොරා ගන්නවට යස පාඩම... එතකොට උඹ මොකක් කරනවා කියල ද හිතුවේ කාලකණ්ණියෝ?" කියලා අත්තම්මා මා දිහාට හැරුණා. "ඔය ඇඳුම් ගලෝලා වීසි කරලා, ගිහින් නිදා ගන්... මං ඔය ගන්දස්සාර ගොමස්කඩ ටික හෝදලා දාන්නං. බාග වෙලාවට ඒවා උදේ වෙද්දී වේළෙයි. නැත්තං ඉතිං දවස ම ඇඳේ තැග්ගැහිලා ඉන්ඩ වෙයි, සාපලත් රස්තියාදුවා!"

අපිට යාන්තං නිදාගන්ඩ යන්ඩ පුළුවන් වුණේ පාන්දර ජාමේ. එළිවෙලා හොඳට ඉර පෑව්වට පස්සේ මං දැක්කා ඉලිකෝ පාර දිගේ එනවා. මං ජනේලෙන් ඒ දිහා බලා උන්නේ ගත්ත හුස්ම එහෙම ම තියාගෙන. එයා ගෝණි දෙකක් කර තියාගෙන එනවා. ලොකු ගෝණිය ඉලේරියන්ගේ ගේට්ටුව ළඟ අතෑරියා. පොඩි එක වැට උඩින් අපේ වත්තට වීසි කළා. ඊට පස්සේ එයා අත කට ළඟට කරලා හයියෙන් කෑගැහුවා:

"ඉලේරියන්! ඉලේරියන්...! ඇහෙන්නෙ නැද්ද රත්තරනේ?"

ඉලේරියන්ගෙන් මීනීවළක් වගේ සද්දබද්දක් නෑ.

"සුරිකෝ! සුරිකෝ!" ඉලිකෝ නවත්තන්නේ නැතිව කෑගැහුවා.





"මොකෝ උඹ බෙල්ල කැඩිලා යන තරමට බෙරිහන් දෙන්නේ, එකැස් යක්ෂයෝ?" අත්තම්මාත් ඒ සද්දෙට ම කෑගැහුවා. "මේ යස්ස හෝරාවෙ ළමයෙක් ඇහැරවන්නේ මොන උලව්වකට ද? මොනව ද උඹට ඕනෑ?"

මේ ලෝකයේ මොනම එකාටත් වඩා ඉලිකෝ අත්තම්මට බයයි. ඉතිං එයා එක සැරේට ම කටහඬ බාල කළා.

"නෑ ඔල්ගා රත්තරනේ, මොකුත් නෑ. මට මේ ඕන වුණේ ඉලේරියන් ගෙදර ද කියල දැනගන්ඩ."

"ඉතිං මගේ සුරිකෝ ද එයාගෙ බාරකාරයා? ගිහින් උඹම බලාගනින්!"

ඉලිකෝ දිග හුස්මක් ගන්නවා වගේ ටික වෙලාවක් සද්ද නැතුව උන්නා. ඊට පස්සේ එක පාරට ම පුපුරා හැලුණා.

"ඒයි නාහෙ ලොකු යක්ෂයා, උඹ ගෙයි ද? වරෙන් එළියට, ඇවිත් පෙනියන් බලන්ඩ. බයයි නේද? හොරා! මංකොල්ලකාරයා! අනුන්ගෙ වෙරි හොරාකනවා නේද? ලැජ්ජාවක් නැද්ද උඹට? දැන් පස්ස උඩ තියන් දපන්ඩ වෙච්ච එක හොඳ ඇති නේද? ඈ... ඒකට කැමති නෑ? බාග වෙලාවට තව ලුණු ටිකක් තට්ටමට වැටුණොත් හොඳ ඇති මයෙ හිතේ! එහෙම ද? වරෙන් එළියට, ඇවිත් පෙනී හිටහන් බලන්ඩ! ඇයි ඇවිදගන්ඩ බැරි ද? නීචයට නියම සබ්බුව! අවංක මිනිස්සුන්ගෙන් කඩාවඩා ගන්නවට හොඳ පාඩම!'

"මොකද ඉලිකෝ වෙලා තියෙන්නේ, මොකෝ මේ උඹ දෙස් දෙවොල් තියන්නේ?"

"මොකෝ? දැනගන්ඩ ඕනෑ නං මේං මෙකයි, ඒකාට ඊයෙ රෑ මගේ වෙරි රස බලන්ඩ ඕනෑවෙලා! ඉතිං ඒකට අතුරුපස හම්බවෙලා. ඒකටයි, ඒකගෙ කුට්ටාලියටයි දෙන්නටම!"

"මොන කුට්ටාලියා ද?"

"මං කොහොම ද දන්නෙ? ඉලේරියන්ගෙන් අහන එක හොඳා."

ඉලිකෝ මගාරින විදිහට කිව්වා.

"ඒත් බාග වෙලාවට ඒ ඉලේරියන් නොවෙන්ඩත් පුළුවන් නෙව?"

"ඒකා නෙවෙයි නං මොකෝ මට මෙහෙම බැන අඬගහන්ඩ ඉඩ ඇරලා, උත්තර නොදී මොකද හැංගිලා ඉන්නේ? එතකොට අර කම්සෙයි කලිසමයි හිටිහැටියෙ හේදුවෙ මොකද? අර ඒවා වේළෙන්ඩ වනලා තියෙන්නේ! බලහල්ලකෝ පෝසතා දිහා, එයාට මාරු කර කර අඳින්ඩ ඕන තරං කලිසං! නැගිටලා එළියට වරෙන්

නාහෙ ලොකු හොරා! මේ පිටි ගෝණිය අරගන්, මගේ හිත වෙනස් වෙන්ඩ කලින්, මංකොල්ලකාරයා!"

ජයගත්ත විදිහෙ ගමනකින් ඉලිකෝ පාර දිගේ අඩි බර කරලා යන්ඩ ගියා. අඩි කීපයක් ගිහින් නැවතුණු එයා හැරිලා මහ සද්දෙට මෙහෙම ඇහුවාඃ

"එතකොට කෝ අර තක්කඩි සුරිකෝ කොහේ ද? ඒකාට මාව ඇහෙන්නෙ නැද්ද?"

"නුඹට ඒකගෙන් ඕන කරන්නෙ මොනව ද?" අත්තම්මා හයිය කෝටුවක් අතේ තියාගෙන ඇහුවා.

"එච්චර දෙයක නෙවෙයි, ඔල්ගා රත්තරනේ... මට මේ මිනිහගෙන් අහගන්ඩ ඕන වුණේ ඊයෙ රෑ එයාගෙ නාස් ලොකු යාළුවාව කුදලගෙන ආවෙ කොච්චර සන්තෝසෙන් ද කියලා විතරයි."

මේ වෙලාවෙ මට තවත් බලා ඉන්ඩ බැරි වුණා. මම මහ හයියෙන් හිනාවෙවී මිදුලට පැන්නා. අත්තම්මා විරිත්තුවා. ඉලිකෝ කොක්හඬ දාලා හිනාවුණා. අසරණ ඉලේරියන් විතරක් හිනාවුණේ නෑඃ එයා දිගටෝම බඩ බිම උලාගෙන දිගාවෙලා, නාහෙ කොට්ටෙට ඔබාගෙන වේදනාවෙන් දත්මිටි කෑවා..."

...මම මගේ කතාව නිම කළෙමි. මාර්තා නැන්දා නැඟිට මගේ නළල සිඹ මට තවත් තේ වීදුරුවක් වත් කළා ය. ඉන් පසු පිඟන් අල්මාරිය විවෘත කළ ඇය වොල්නට් ජෑම් බඳුනක් ගෙන පීරිසියකට ටිකක් බෙදා මට දුන්නා ය.

"සුරිකෝ නුඹ නං අම්මපා මගේ මරණේ වෙච්! නුඹටයි, නුඹේ අත්තම්මටයි, නුඹගේ ඉලිකෝටයි, නුඹගේ ඉලේරියන්ටයි ආශිර්වාද වේවා!"

"මං ජෑම් ටික උදේට කන්නං මාර්තා නැන්දේ." පීරිසිය ගනිමින් මම කීවෙමි.

"දැන් කාපන්, උදේ කෑමට මං තව ටිකක් දෙන්නං." කාරුණික හඬකින් කී මාර්තා නැන්දා ජෑම් බඳුන මා වෙත තල්ලු කළා ය.

එදා රැයේ හාස්කමක් සිදු වියඃ මා කාමරයට එද්දීත් සොපී ඇඳට ගොස් තිබුණි. ඈ බාග විට බොහෝ, බොහෝ, බොහෝ වේලාවක් මා එන තුරු බලා සිටින්නට ඇත. එහෙත් පාන්දර දෙක වන තුරු මම මාර්තා නැන්දාගේ කාමරයෙන් පිට නොවුණෙමි.



සොපී එක් ඇසක් ඇර බලා, පැමිණියේ මා බව දැක, එය යළි පියා ගත්තා ය. ඇඳුම් අහවර කළ මම ඇය පසෙකින් දිගා වුණෙමි. මිනිත්තු කීපයක් නිහඬව ගෙවී ගියේ ය. අන්තිමේ දී මම ඇසුවෙමිඃ

"නුඹ නිදි ද?"

සොපී පිළිතුරක් නොදුන්නා ය, එක් ඇසක් ඇර මා දෙස බැල්මක් හෙළා, යළි එය පියා ගත්තා පමණකි.

"මං උන්නෙ මාර්තා නැන්දා එක්ක කියලා දැන දැන ම ඔහොම බුම්මාගෙන ඉන්න එක මෝඩකමක් සොපී," මම කීවෙමි.

යමක් කීමට ඇතත් එය කෙසේ කියන්නේ දැයි නොදන්නා බව කියන්නාක් මෙන් සොපී බැල්මක් හෙළුවා යඃ ඔක්කෝටමත් වඩා ඇය සොපී ය, මුරාඩා නොවේ. මගේ සිතුවිලි කියවන්නට හැකිවූත්, මේ ඉර හඳ යට ඇති ඕනෑ ම දෙයක් ගැන ඈසෙන වාද විවාද කළ හැකි වූ මුරාඩා නොවේ.

"සොපී, අද මගේ උපන්දිනේ. නුඹ දන්නව ද මං කොච්චර වයස ද කියලා?" මම නොනැවතී කතා කළෙමි.

සොපී ඒ ගැන දැන සිටියේ හෝ ඒ ගැන මායිම් කරන බවක් පෙනුණේ හෝ නැත. එහෙත් මා සිටින්නේ හොඳ මනෝභාවයකින් බව මගේ දෑස්වලින් දකින්නට සමත් වූ ඇය ඇගේ විදියෙන් මගේ සතුට බෙදා ගත්තා යඃ මුහුණ මා දෙසට හැරවූ ඇය මගේ කම්මුලෙහි එය ඇතිල්ලුවා ය. මම ඇය වැළඳ ගතිමි. ඉතිං අපි නින්දට වැටුණෙමු. මුළු රැය පුරාම මම අත්තම්මාත්, ඉලිකෝත්, ඉලේරියනුත් ගැන සිහින දුටුවෙමි. බාගවිට සොපී මීයන් ගැන සිහින දකින්නට ඇත.

කවුදෝ ගේට්ටුව අසල සිට කතා කරන විට හිමිදිරි පාන්දර උදාවෙමින් තිබිණි.

"ඒයි, මහත්තයා!"

මම එම ගෙහි මහත්තයා නොවුණෙමි, ඉතිං මම පිළිතුරු නොදුන්නෙමි.

"ඒයි මහත්තයෝ!" මිනිසා යළිත් කතා කළේ ය.

මාර්තා නැන්දා ඇඳෙන් බසින හඬ මට ඇසුණි. ඉන් පසු දොර කිරි කිරි ගා ඇරෙන හඬ ද, එළියට යන ඇගේ සෙරෙප්පු හඬ ද ඇසුණි.

"කවුද ඔය?"

"සුරිකෝ වෂලොම්ඩ්සෙ ඉන්නෙ මෙහේ ද?"

"කවුරු?"

"අර තක්කඩි සුරිකෝ වෂලොම්ඩිසේ!"

"අර තක්කඩි සුරිකෝ වෂලොම්ඩිසේ!" යකඩෝ! ශුද්ධ වූ ස්වාමීනි! මාර්තා නැන්දේ! සොපී! දන්නව ද හාස්කමක් කියන්නෙ මොකක් ද කියලා? දන්නවා ද හදවත සංතෝසෙට උඩ පනින්නෙ කොහොම ද කියලා? නෑ? එහෙනං දන්නවා ද මගේ නම ඔය විදිහට කියන්නේ කවුද කියලා? බාගදා ඒ නිකං ම විදුලි පුවතක්වත් ද? නෑ, ඒ විදුලි පුවතක් නං වෙන්ඩ බෑ! ඒත් කවුද ඒ? සුරිකෝ ඔහොම හිටින්! සෙරෙප්පු නැතුව මිදුලට දුවන්ඩ එපා, ඉස්සෙල්ලා දොරෙන් එබිලා බලහන්! නෑ, නෑ, ගේට්ටුව ළඟට දුවපන්! කෑගහපන්, අඬපන්, හිනාවෙයන්, සංතෝසෙට සිංදු කියාපන්, සුරිකෝ! වත්තෙන් එළියේ, යෝධ ගෝණියක් කරේ තියාගෙන, සීතලට නිල් ගැහිච්ච මහ විශාල නහය උඩ පිටි වගේ හිම කුඩු එක්ක හිටගෙන ඉන්නේ නුඹේ ඉලේරියන්!

සුරිකෝ ඉපදුණු දිනය ගැන ඉලේරියන්ට මේ ඊයේ වාගේ මතක ය. එදා ඔහු තමන්ගේ බෙර්-ඩාන් තුවක්කුවෙන් අන්තිම වෙඩිල්ල තැබුවේ ය. ඉන් පසු ඉක්මනින් ම එය ඔහුගෙන් ගනු ලැබිණි. ඒ කෙසේ වෙතත්, ඉලේරියන්ට සුරිකෝගේ උපන් දිනය අමතක වන්නට ඉඩක් නැත:

ඒ තමාගේ පුංචි සුරිකෝට තරම් ආදරයෙන් ඉලේරියන් මේ මුළු ලෝකයෙන් කිසිවකුට නොසැලකූ හෙයිනි.

ඉතිං ඔහු ලොමින් කළ මෙස්, වයින් මල්ලක්, වොඩ්කා බෝතලයක් සහ වේළූ පලතුරු ටිකක් රැගෙන තමන්ගේ සුරතලා බලන්නට පැමිණ තිබේ. එපමණක් නොවේ, ඔහු මුදල් ටිකක් ද ගෙනැවිත් තිබේ. ඒ ඔහු පටපණු කෝෂ වෙනුවෙන් ලද පාරිතෝෂිත මුදල වන රූබල් හත්සියයයි. ඔහු අත්තම්මාගෙන් ලිපියක් ද සුරිකෝට ගෙනැත් තිබේ. තමන්ගේ සුරිකෝට අත්තම්මා ලියන්නේ මොනවා දැයි බලමු!

"මගේ ආදරණීය පුතේ! නුඹ දැන් මුළු ටිබිලිසියේ ම ප්‍රසිද්ධ උගත් මිනිහෙක්. විශ්වවිද්‍යාලයෙන් නුඹේ පරණ ඉස්කෝලෙට ලියුමක් ආවා. උඹට ගහන්ඩ දෙයක් මුළු අගනගරෙ ම හොයාගන්ඩ නැහැයි කියලයි ඒකෙ කියන්නේ. එයාලා අහනවා "කවුද එයාට ඉගැන්නුවේ?" කියලා. මගේ රත්තරනේ, මං දන්නවා උඹ උන්ව පිස්සු වට්ටවනවා කියලා! අපේ ගමේ ගෞරවයට කුණු ගාන්නෙ නැතිවෙන්ඩ විතරක් වගබලාගනිං. උඹෙන් මං

වෙන්නේ ආන් එච්චරයි පුතේ. හෙටට උඹට අවුරුදු විස්සක් වෙනවා. ඒක එහෙම නේද? අවුරුද්දක් ඇතුළත මං උඹට මනාලියෙක් හොයන්නං කොල්ලෝ. මට ඕනෑ මැරෙන්ඩ කලියෙන් උඹේ පුතාව තොටිල්ලක දාලා නළවන්ඩයි. ඉන් පස්සේ උඹට පුළුවනි මා වළදාන්ඩ. ඒත් හැබැයි මගේ මළගමේ දී උඹ අඬන්ඩ හෙම ලෑස්තිවෙන්ඩ එපා! මගේ ආදරණීය පුතේ, උඹ මාව වළදාන්ඩ ඕනෑ හිනාවෙවී, සින්දු කිය කියා! මරණෙට බෑ මාව බයකරන්ඩ. මං ඇති තරං කාලයක් ජීවත්වෙලා තියෙනවා... දෙයියන්ට ස්තූතිවෙන්ඩ ගමේ හැම දෙයක් ම හොඳින්. ඉලිකෝගේ වැස්සි පැටියෙක් වැදුවා. නොණ්ඩි ආර්කිප් භූතයෝ ගෙනිච්චා. අපි එයාව පහුගිය ඉරිදා වැළලුවා. මැට්‍රියෝනාට අන්තිමේ ඇගේ කට්ට කළු කෙලීව බන්දලා දෙන්ඩ පුළුවන් වුණා. ඉලිකෝයි මමයි තෑගි ටිකක් එක්ක නුඹව බලන්න ඉලේරියන්ව එවනවා. එයාව හොඳින් බලාකියා ගනින්. අසරණයා ඇහේ අමාරුවක් ගැන කියනවා. මහාචාර්ය කෙනකුට පෙන්නවන්ඩ බලාපන්. එයාලට අපේ ඉලේරියන්ව සනීප කරන්ඩ පුළුවන් වේවි. එච්චර තමා මගේ පුතේ. මේරියි අපේ අසල්වැසියොයි නුඹට සුබපැතුම් එවනවා. ඉතිං එහෙනං නුඹේ අත්තම්මා වන ඔල්ගා මුළු හදවතින් ම නුඹව සිඹ ගන්නවා."

මුළු දවස පුරාම සුරිකෝ මේ ලිපිය කියැවී ය, යළි යළිත් කියැවී ය. ඔහු එය දෙවැනි දිනයේත්, තුන්වැනි දිනයේත් කියැවී ය. එකවිට හැඬෙන බවත්, සිනාසෙන බවත්, කෑගැසෙන බවත්, ගී ගැයෙන බවත් ඔහුට දැනිණි. ටිබිලිසියටත්, අධ්‍යාපනයටත්, ඩිප්ලෝමාවටත් හෙණ ගහච්චාවේ! සුරිකෝ තමන්ගේ සබ්බ සකලමනාව එකතුපහදු කොටගෙන ගම බලා යනු ඇත... තමා එන තුරු බලා සිටින ආතම්මාත්... එසේම මේරිත් සිටින ගමට... ඔහු ආපසු යනු ඇත! ඔහු තම කාරුණික හදැති වියපත් අත්තම්මා වැළඳගනු ඇත. ඉන් පසු ඔහු මේරි වෙත ගොස් "ඔයාට සීතල ද?"යි අසනු ඇති.

"ඔව්!" මේරි පිළිතුරු දෙනු ඇත.

සුරිකෝ තමන්ගේ බැටළු සම් කබාය ගලවා සීතලෙන් ගල් වූ ඇගේ උරයට එය දමා ඇගේ ඉණ වටා අත යවනු ඇත. ඉන් පසු ඔවුහු මෙතෙක් නොපෑගුණු සුදු හිම අතරින් උදෑසන වන තුරු

# තවත් එකැස් යක්ෂයෙක්

ඉලේරියන් මාසයක් තිස්සේ මා සමඟ ජීවත් වෙමින් සිටී. ඔහු මගේ කාමරයටවත්, මගේ පුස්තකාලයටවත් කැමති නැත.

"බල්සාක් – පදම් නොකළ හම්, රොමෙන් රොලාන්ඩ් – කෝලාස් බ්‍රෑග්නන්, ප්‍රොස්පර් මෙරිමී – මේටියෝ ෆෝල්කන්, හියුගෝ – නොත්‍ර දාම ය, ජවාක්හිෂ්විලි – ක්වාචි ක්වාචාන්ට්‍රාඩ්, ඩිකන්ස් – ඩේවිඩ් කොපර්ෆීල්ඩ්, ගැලැක්ෂන් – ගින්දර, කාව්‍ය එකතුව, ඕමාර් ඛයියාම් – රුබයියාට්, ගම්සකුර්දියා – සඳ පැහැරගැනීම, ඉල්යා... අකාකි... වෂා... කස්බෙගි... චොන්කාඩ්සේ...[1]" මගේ පොත් රාක්කයේ ඇති පොත් වෙත ඇඟිල්ල යොමු කරමින් ඔහු මුමුණයි. ඉන් පසු කණ්ණාඩි කුට්ටම යටින් පුදුමයෙන් මෙන් බලමින් මෙසේ අසයි:

"ඇයි නුඹ ගාව ඉග්නාටේ නිනොෂ්විලිගේ[2] මොකුත් නැත්තේ?"

"මේවා ඉග්නාටේගේ ඒවාට නරක නෑ." මම ඔහුගේ සැක දුරු කළෙමි.

"නරක නෑ? කවුද ඔයින් ඉග්නාටේ එක්ක එකට තියන්ඩ පුළුවන් කෙනා?"

"ඔය හැමෝම!"

"නමක් කියාපන් බලන්ඩ! මෙතන නම්වලින් බාගයක් ම මං දන්නෙ නෑ."

"පොත් කියවන්ඩ ගන්ඩ. එතකොට එයාලාව දැන කියාගන්ඩ පුළුවනි." මම කීවෙමි.

උපහාසයෙන් මා දෙස බැලූ ඉලේරියන් පොත් පිටු උඩින් පල්ලෙන් පෙරළී ය.

...අපි මුළු දවස ම ගෙවූයේ නගරය පුරා ඔහේ ඇවිද යමින් සහ මඟ දිගේ ඇති සෑම කඩයකට ම මෙන් ඇතුළු වෙමිනි. ලොම් වාටියෙන් යුතු රතු හම් කබායක් දෙස ඉලේරියන් ගිජු ලෙසින් ඇස් උළුප්පාගෙන බලා සිටියේ ය. ඉන් පසු ඔහු ගොඩනැගිලි බඩු

1 ඉල්යා චව්චව්ඩ්සේ, අකාකි ට්සෙරෙටෙලි, වාෂා ප්ෂාවෙලා, ඇලෙක්සැන්ඩර් කසාබෙගි, ඩැනියෙල් චොන්කාඩ්සේ යන ජෝර්ජියානු සම්භාව්‍ය ලේඛකයින් ගැනය මේ කියන්නේ.

2 ඉග්නාටේ නිනොෂ්විලි යනු ජෝර්ජියාවේ ඉලේරියන්ගේ ගම් පෙදෙසෙන් පැමිණි ලේඛකයෙකි.





කඩයක් සම්පූර්ණ අධ්‍යයනයකට ලක් කළේ ය. ඔහු පීරි, මිටි, කියත් සහ කවුන්ටරයට සවිකර ඇති දොර අගුළු පිරික්සුවේ ය. ඉන් පසු මිදිවතුවලට බෙහෙත් විදින යන්ත්‍ර තිබේ දැයි ඇසූ ඔහු පිළිතුරු ලැබෙන තුරු බලා නොසිට එළියට ආවේ ය.

අපි වැඩිම වේලාවක් ගෙවූයේ අඩයම් තුවක්කු සහ මාළු බාන ආම්පන්න විකුණන කඩවල ය.

"ඔහේලා ගාව වෙඩි බෙහෙත් තියේ ද?" ඉලේරියන් වෙළෙඳසල් සහකරුවාගෙන් රහසින් ඇසුවේ කවුන්ටරයට වාරු වෙමිනි.

"නෑ!" වෙළෙඳ සහායකයා අඩබ්බර ලෙස පිළිතුරු දුනි.

"ඇබින්දක්වත්?"

"නෑ!"

"එසාලා?"

"කාලා කියන්නේ මොන මළ ඉලව්වක් ද?" වෙළෙඳ සහායකයා නොරිස්සුම්ව ඇසී ය.

"පතරොං කැප්, කාලකණ්ණියෝ!" ඉලේරියන් ද එපමණට ම හඬ වැඩි කළේ ය.

"කතා කරන්ඩ ඉගෙන ගන්නවා හොඳා!" වෙළෙඳ සහායකයා බෙරිහන් දුනි.

"මොකෝ තමුසේ තුවාල වෙච්ච[1] වලහෙක් වගේ කෑ මොර ගහන්නේ?" ඉලිකෝ අසා සිටියේ ය.

"මොනව ද තමුසේ කීවේ?" කේන්තියෙන් සුදුමැලි වී ගිය වෙළෙඳ සහායකයා පිම්බේ ය. "මේ ඔල්මාදකාරයා අරන් යනවා. මගෙන් ඒකා මැරුං කන්ඩ කලින්!"

එනපොට හොඳ නැත. ඉතිං මම ඉලේරියන් ඇදගෙන වෙළෙඳසලෙන් කඩිනමින් පිටවීමි.

"කාලකණ්ණියා, උඹ මාව මරන්ඩ යන්නේ මොකෙන් ද?" ඉලේරියන් දොර දෙස ආපසු හැරී කෑගැසී ය. "උඹ ගාව වෙඩි බෙහෙත් සොච්චමක්වත් නෑ!"

...සමහර විට අපි ට්‍රෑම් රියවල හෝ ට්‍රොලි බස්වල ගමන් කරමු. සෑම විටම ප්‍රවේශ පත් ගත්තේ ඉලේරියන් ය. ඒ මා ශිෂ්‍යයකු වූ නිසාත්, කොයි වේලේත් මා සිටියේ මුදල් හිඟ පාඩුවෙන් නිසාත් ය.

1 තුවාල වූ – යනුවෙන් ජෝර්ජියානු බසේ දී කියැවෙන වචනය අර්ථ දෙකක් සපයයි. ඉන් එකක් 'තුවාල වූ' යන සෘජු අදහස දෙන අතර 'කප්පාදු කළ' යන ව්‍යංග අර්ථය දෙවැන්න ය. එහෙයින් මෙය දෙපිට කැපෙන වචනයක් සේ සැලකිය හැකි ය.

මුල දී ඉලේරියන් උන්නේ මහත් සතුටකිනි. ඒ කොන්දොස්තර කත මුදල් ගැනීමෙන් පසු, ප්‍රවේශ පත් වෙනුවට ඔහුගේ අත්ල කිතිකවා ඇසින් ඉඟිමැරූ නිසා ය. ඔහු සිතුවේ ගැහැනිය ඔහු සමඟ ආලයෙන් බැඳී ඇති බවයි. එහෙත් ඊළඟට එම සංග්‍රහය ම ගොරෝසු පිරිමි කොන්දොස්තරවරයකුගෙන් ද ලැබුණු විට, උමතු වූ ඉලේරියන් සැමට ම ඇසෙන්නට බෙරිහන් දුන්නේ ය:

"තමුසෙ මට ඇස් ගහන්ඩ එන්ඩ එපා, දත් ටික බඩට යන්ඩ දෙන්ඩ කලින් මට ටිකැට් දෙනවා!"

සැන්දෑවරුවල අපි නිතරම මෙන් චිත්‍රපට බලන්නට ගියෙමු. එසේම මම ඉලේරියන් සර්කස් බලන්නටත්, සත්තු වත්තටත් ගෙන ගියෙමි. මා සිතුවේ ඔහු කට ඇරගෙන පුදුමයෙන් ඒවා බලනු ඇතැයි කියා ය. එහෙත් කාරණා තුනක් හැරුණු විට ටිබිලිසියේ වෙන කිසිවක් ඉලේරියන් පුදුමයට පත් කළේ නැත: පළමුවැන්න, මොනවා හෝ ඉගෙනීමේ දෙයක් මා විසින් කරනු ලබන්නේ කොයි මොහොතේ ද යන්න ය. දෙවැන්න, සර්කස් කණ්ඩායමේ විකටයාට කොළ පාට කොණ්ඩයක් තිබුණේ ඇයි යන්න ය. තෙවැන්න, ඉසබෙලා වයින් සහ ලීක්ස් නොමැතිව මචාඩි වයින්වලින් මිනිසුන් උණුසුම් වෙන්නේ කොහොම ද යන්න ය.

සංස්කෘතික රසවින්දන නැති සැන්දෑවරුවල දී අපි මාර්තා නැන්දාගේ වටකුරු ලොකු බඩගෙඩි සමොවාරය ළඟ ගෙවුවෙමු. ඉලේරියන් නොයෙක් ජාතියේ යාන් හැලි කීවේ ය. මාර්තා නැන්දාත් මමත් තේ බොමින් සිනාසුණෙමු. ඉලේරියන් මාර්තා නැන්දා ප්‍රිය කළේ ය. මාර්තා නැන්දාත් ඉලේරියන් ප්‍රිය කළා ය. ඈ කීවේ ඔහුට ඇත්තේ සැබෑ රාජාලි නාසයක් බව ය.

මම මගේ ඇඳ ඉලේරියන් සමඟ බෙදා ගතිමි. නින්දට යන්නට පෙර ඔහු එක්කෝ පොත් කියැවී ය, නැතහොත් කියවූ දෙයක් ගැන විවේචනය කළේ ය, එසේත් නොමැති නම් නගරයේ විධි ගැන මගෙන් ඇසුවේ ය, ඒ කිසිවක් නොවේ නම් මට බණ දේශනා කළේ ය. සමහර විටක මේ සියල්ල එකට කලවමේ කරන්නටත් ඔහු සමත් විය. සොෆී අප දෙදෙනා අතර වැතිර, අපේ සංවාදයන්ට සවන් දෙමින් ප්‍රමෝදයෙන් පුරු පුරු ගෑවා ය.

ඉලේරියන් සොෆී දුටු මොහොතේ ම ඇති කරගත්තේ අකමැත්තකි, ඒ හැඟීම දෙන්නාට ම එක සම විය. ඉලේරියන් මගේ ඇඳේ සිටිනු මුලින් ම දුටු මොහොතේ ඈ කොන්ද දුන්නක් සේ



නවා, වලිගය කෙළින් කොට පිම්බා ය. ඉලේරියන් වාඩුව ගත්තේ ඇගේ කරමුලින් අල්ලා ජනේලයෙන් එපිට හිම ගොඩට විසි කිරීමෙනි. සොෆී අපේ පවුලේ ම බවත්, සමාන අයිතිවාසිකම් භුක්ති විඳින බවත් මම ඉලේරියන්ට පැහැදිලි කළෙමි. එසේම ඉලේරියන් අපේම මිත්‍රයෙක් බව සොෆීට ද ඒත්තුගන්වන්නට මම උත්සාහ කළෙමි. තාවකාලික සටන් විරාමයක් ඇති විය, එහෙත් දෙන්නා කිසිදාක සැබෑ මිත්‍රත්වයකට නොපැමිණියහ.

"ඇයි නුඹ ඒකිව පයින් ගහලා එළවන්නෙ නැත්තේ?" ඉලේරියන් අසයි. "බළලෙක් කියන්නෙ මොන වදකරදරයක් ද!"

"ඒකි ඔහේට කරදර කරනවායැ?"

"මොකෝ නැත්තේ, එකම දේ මං මුළු රෑ පුරාම ඔය ඉලව් තිරිසනා චොප්පවෙයි කියන බයට හෙලවෙන්නෙ නෑ!"

"එහෙනං හෙලවෙන්ඩ එපා."

"නුඹ මං හුස්ම ගන්න එකත් නවත්තනවා ද?"

"ඒකි වෙන කොහේ ද බුදියන්ඩ ද?"

"ඒකිට කට්ච්චිය යටත් මේ වගේම බුදියතැහැකි!"

"කට්ච්චිය යට හීතලයි."

"හොඳා එහෙනං, මං ගිහින් ඒක යට බුදියන්නං, ඒකි ඇඳේ දපාපුවාවේ!"

"ඔහේගෙ කැමැත්තක්."

මෙයට ඉලේරියන් කිසිදු උත්තරයක් දුන්නේ නැත. එහෙත් ඒ වෙනුවට ඔහු බැළලිය වලිගයෙන් අල්ලා බිමට දමා ගැසී ය. දුක්බර ලෙසින් ඥාව් හඬ තලමින් කට්ච්චිය යටට රිංගාගත් සොෆී ඉලේරියන් නින්දෙන් ගෙරවීම අරඹන තුරු එතැනට වී කල් බැලුවා ය. ඉන් පසු ඇය තමන්ට හිමි තැන වූ බ්ලැන්කෙට්ටුව යටට යළිත් ආවා ය. ඒත් ඉලේරියන් නින්දට වැටෙන්නට දිගු වේලාවක් ගත්තේ ය.

...ඉලේරියන් අසනීපයෙනි. ඔහුගේ වම් ඇස භයංකර ලෙසින් වේදනා දෙයි. ඔහු මේ අග නගරයට ගෙන ආවේ, මට ඇති ආදරය නිසා මෙන් ම මේ අසනීපය ද නිසා ය. ඉලේරියන් කොහෙත්ම බයගුල්ලෙක් නොවේ. එහෙත් වෛද්‍යවරයකු හමුවන්නට යන්නට බිය වූ ඔහු රෝහලට යෑම ගැන සලකා බැලීම පවා ප්‍රතික්ෂේප කළේ ය. එසේ නමුදු ඔහුගේ ඇස දිගින් දිගටම නරකට ගියේ ය. රාත්‍රියට ඉලේරියන් කොතෙක් වේදනාවෙන් පීඩා වින්දේ ද යත් මැරෙන්නට

පවා සූදානම් වූණි. මම මට කළ හැකි හැම දේ ම කළෙමි. එහෙත්
සුවපහසුව සඳහා මා කළ කිසිවකින් පලක් වූයේ නැත.

තවදුරටත් බලා සිටීම අපරාධයක් බව අන්තිමේ මම තීරණය
කළෙමි.

තියෙන හොඳම ඇඳුමින් සැරසුණු අපි, වොඩ්කා බෝතලයක්
සහ කා-චාපුරි චීස් කැබැල්ලක් පත්තර කඩදාසියක ඔතාගෙන,
මාර්තා නැන්දාගේ නිර්දේශය අනුව පුද්ගලික වෛද්‍යවරයකු
හමුවන්නට සොලොලාකි දිස්ත්‍රික්කයට පිටත් වූණෙමු. ඔහුට ද
ඇත්තේ එක් ඇසක් නමුදු ටිබිලිසියේ සිටින හොඳම, වඩාත් ම
ජනප්‍රිය ම අක්ෂි වෛද්‍යවරයා ඔහු බව මාර්තා නැන්දා අපට කියා
තිබුණි. ඇගේ ඇසේ වූ නගනය ඔහු සුව කර තිබුණේ මාසයකටත්
අඩු කාලයක දී ය. ඔහුගේ දොරකඩ රෝගීන්ගේ පෝලිමක්
දකින්නට නොහැකි වූ නිසා අපි මහත් පුදුමයට පත්වීමු.

"අද එයා ලෙඩ්ඩු බලන්නෙ නැතුවා වද්ද?" ඉලේරියන් කෙඳිරි
ගෑවේ ය. "මං මැරේවි!"

"වදවෙන්ඩ එපා ඉලේරියන්, මං එයා ඉස්සරහා දණින් වැටිලා
ඉල්ලා හිටින්නං, එයා නුඹව බලාවි." මම ඔහු අස්වැසුවෙමි.

මම දොරට මහ හඬින් තඩිබෑවෙමි. කොරිඩෝරයෙන් කිසියම්
පොඩිවෙන හඬක් නැඟිණි, ඉන් පසු ඇසුණේ කෙඳිරිල්ලකි, ඉනුත්
පසුව ඇතුළේ දොරක් දඩාස් ගා වැසෙන හඬකි. මොන
මොනවාදෝ බිම වැටෙන හඬක් ඇසිණි. අන්තිමේ දොර ඇරුණි.
මා දුටුවේ අවුල් වී කඩා වැටුණු කෙස්සෙහි පිහාටු රැඳුණු කුඩා
බියපත් ගැහැනියකි.

"අනේ සමාවෙන්ඩ කරුණාකරලා, මං හිතන්නේ සම්මානනීය
මහාචාර්යතුමා අද මේ වෙලාවෙ ලෙඩ්ඩු බලන්නෙ නැහැ කියලා,
ඒත් මගේ මාමා මේකටමයි ඇත ගමේ ඉඳලා ආවේ, එයාට
හොඳටෝම අමාරුයි..." මම කියාගෙන ගියෙමි.

"ආහ්, ඒකටද... මං හිතුවේ මේ මීටර් කියවන අය කියලා..."
ගැහැනිය මට බාධා කළා ය.

කඩිසරව පුටුවකට නැගගත් ගැහැනිය සාක්කුවෙන් වයර්
කැබැල්ලක් ගෙන විදුලි මීටරය තුළට ඔබා බිමට පැන්නා ය.

"හරි, දැන් මොනව ද ඕනෑ කියමුකෝ?"

"අපි ඉල්ලා හිටිනවා සම්මානනීය වෛද්‍යතුමාට අපිව බලන්න
කියලා. එයා අපිව බලනකං අපි යන්නෙ නෑ!"යි මා කීවේ
ප්‍රතිප්‍රහාරයකට මුහුණ දෙන්නට සූදානම් වෙමිනි.





"නොබලන්ඩ මොකෝ හේතුව? ඇත්ත වශයෙන් ම එයා ඔයාලව
බලාවි. මිනිත්තුවයි! එන්න ඇතුළට!"යි කී ගැහැනිය ඕනෑවටත් වඩා
කලබල කරන්නට ගත්තා ය.

"කවුද ඔයාලව එව්වේ? කරුණාකරලා කාමරය ඇතුළට එන්න...
මාමොන්ටි! මාමොන්ටි! ලෙඩ්ඩු වගයක් ඇවිත්! ලෙඩ්ඩු!"

ගැහැනිය අපව කාමරයකට තල්ලු කර පිටතින් අගුළු දමා
"මාමොන්ටි! මාමොන්ටි!"යි අමතමින් දිවුවා ය.

මොහොතකට පසු උස්, රැවුළ නොකැපූ, ඉරි ඉරි පිජාමාවක් ඇඳි
මිනිසෙක් කාමරයට කඩා වැදුණේ ය. ඔහුගේ එක් ඇසක් කොළ
පැහැ වූ අතර අනෙක රත් පැහැ විය.

"ඉඳ ගන්නවා!" ඔහු තදින් කීවේ ය.

අපි වටපිට බැලුවෙමු. කාමරයේ ඇඳක්, ලියන මේසයක් සහ පුටු
දෙකක් තිබුණි.

"ලෙඩා මෙතැනින් වාඩි වෙනවා." මිනිසා කීවේ එක් පුටුවක්
පෙන්වමිනි. "එතකොට එයාගෙ යාළුවා අතන?" ඇඳ පෙන්වමින් කී
ඔහු ලියන මේසය ළඟ තිබූ අනෙක් පුටුවේ හිඳ ගත්තේ ය.

අපි ඔහු කී ලෙසින් හිඳ ගතිමු.

"කොහේ ද අමාරුව?" වෛද්‍යවරයා ඇසුවේ ය.

"මගේ ඇහැ?" ඉලේරියන් පිළිතුරු දුන්නේ ය.

"මොකද වෙලා තියෙන්නේ? රිදෙනව ද?"

"මේ මොනවා අහනවා ද! ඔහේට ම පේන්නෙ නැද්ද? මං අන්ධ
වෙන්ඩයි යන්නේ!"

"ඔහේ ගමේ දී ඒකට මොනව ද කළේ?"

"තේවලිනුයි, කිරිවලිනුයි හේදුවා..."

"සීනි හෙම දාලා බැලුවෙ නැද්ද?"

"ඔහේ මාව විහිළුවට ගත්ත ද?" ඉලේරියන් ඇසුවේ ය.

"කොහෙත් ම නෑ! ඔහේ ඒවයින් කරන දේ දන්නවාට වඩා ඔහේ
තේයි කිරියි බොන්ඩ ඕනෑ. වයින් බොනව ද?"

"කවුද නොබොන්නේ?"

"බොහොම නරකයි!"

"මං බොන්නේ හොඳ වයින්!" ඉලේරියන් ඔහුට සහතික කළේ ය.

"දුම් බොනව ද?"

"ඇත්තවශයෙන්ම."

"එහෙනං මට සිගරැට්ටුවක් දෙනවා." වෛද්‍යවරයා කීවේ ය.

"එයාට සිගරැට්ටුවක් දෙමු." ඉලේරියන් මට කීවේ ය.

මම සිගරැට් පැකැට්ටුවක් පෑවෙමි. වෛද්‍යවරයා දෙකක් ගත්තේ ය. එකක් කටට එබූ ඔහු අනෙක කන අයිනේ රඳවා ගති.

"මං ඊ කෑමට පස්සේ දුම් බොනවා." ඔහු පැහැදිලි කළේ ය.

"එහෙනං තව ගන්ඩ!"

"බොහොම හොඳා, ඔහේලගෙ සංතෝසෙට එහෙනං මං ඊ කෑමෙන් පස්සේ සිගරැට් දෙකක් බොන්නංකෝ!"යි කී වෛද්‍යවරයා තවත් සිගරැට්ටුවක් ගෙන අනෙක් කන පිටුපස රැඳවී ය. ඔහුට කන් දෙකක් පමණක් තිබුණේ හොඳට ය. නැතිනම් දවසේ ඉතිරි හරිය ම මටත් ඉලේරියන්ටත් සිදුවෙන්නේ සිගරැට්ටුවක් නැතිව සිටින්නටයි.

ඔහු කලබලයක් නැතිව දුම් බී, ඉන් පසු ඉලේරියන්ට ළං වී ඔහුගේ ලෙඩ ඇසට ඇන බැලී ය. ඉලේරියන් උඩ පැන්නේ ය.

"රිදෙනව ද?"

"මොකක් කියල ද හිතුවේ?"

"ඔහේගෙ ස්නායුවල තත්ත්වේ නරකයි."

"ඇත්තවශයෙන් ම එහෙම තමා! මේකෙ වේදනාවට පිස්සු වැහෙනවා. මට මැරෙන්ඩ ම හිතෙනවා."

"ඔව්, ඇහැකට ඒක කරන්ඩ පුළුවනි... මට මතකයි මගේ ඇහැ නැතිවෙන්ඩ කලින් තිබුණු වේදනාව හිතාගන්ඩත් බෑ! මං පණ නහගන්ඩ හැදුවා!"

"ඔහේගෙ ඇහැට මොකද වෙලා තිබුණේ?"යි සහනුකම්පාවෙන් ඇසූ ඉලේරියන් වොඩ්කා බෝතලය සහ වීස් එළියට ගන්නා මෙන් මට සංඥා කළේ ය. ඉතිං මම එසේ කළෙමි.

"මේ මොනව ද?" වෛද්‍යවරයා බෙරිහන් දුනි.

"මෙතැන හරි හීතලයි, පොඩ්ඩක් ගන්න එක හොඳ වේවි." ඉලේරියන් පැහැදිලි කළේ ය.

"හොඳා හෙනං, එකම එක වීදුරුවක් විතරයි."යි එකඟ වූ වෛද්‍යවරයා බෝතලය සොලවා බැලී ය.

"හොඳ බඩු! සීයෙට හැටක් ඇල්කොහොල්!"යි කී ඉලේරියන් ලියන මේසය මත වූ කුඩා මැටි බඳුන ගෙන එහි වූ පැන්සල් හලා දමා, එය වොඩ්කාවලින් පුරවා වෛද්‍යවරයාට පෑවේ ය.

"එහෙනං ඕං ඔහේගේ නිරෝගී සැපතට."යි කියමින් වෛද්‍යවරයා එක හුස්මෙන් වොඩ්කා ටික ගිලදමා කෑදර ලෙසින් වීස් කැබැල්ලක් කා දැමී ය.





අපි ද බීවෙමු.

දෙවැනි වඩියෙන් පසු වෛද්‍යවරයා තමාගේ කතාව කියන්නට විය:

"මගේ ඇහැ ගැන නේද... මොකක් ද ඔහේගෙ නම?"

"ඉලේරියන්!"

"එතකොට ඔහේගේ?"

"සූරිකෝ!"

"හොඳා... දොස්තරලා මගේ වටේ රොක් වුණා... එයාලා මට හැම ජාතියෙ ම බෙහෙත් දුන්නාඃ මේක ජර්මානු එකක්, මේක ඇමරිකන්, එතකොට මේක ගැමි බෙහෙතක්... ඕන් ඔහොමයි කීවේ. ඒවා එහෙකින්වත් වැඩක් වුණේ නෑ!... මොකක් ද ඔහේගෙ නම කීවේ?"

"සූරිකෝ!"

"ඉලේරියන්ගේ නිරෝගි සුවයට!" වෛද්‍යවරයා කීවේ ය.

"දොස්තර මහත්තයගේ නිරෝගි සුවයට!" ඉලේරියන් කීවේ ය.

අපි තුන්වැනි වඩිය ද ගත්තෙමු. මගේ කපොලට තට්ටු කළ වෛද්‍යවරයා මගේ නම ඇසුවේ ය. වෛද්‍යවරයාගේ කපොලට තට්ටු කළ මම මගේ නම සූරිකෝ බව කීවෙමි.

"හොඳා, සූරිකෝ රත්තරනේ, දොස්තරලා මගේ වටේ පොදි ගැහිලා හැම ජාතියෙම බෙහෙත් මට ගිල්ලෙව්වා. ඊත් මට කියනවා බලන්ඩ, දොස්තර කෙනෙක් සනීප කරපු එකම ලෙඩ මිනිහකුව කවදාවත් දැකලා තියේ ද කියලා?"

"නෑ, කවදාවත් නෑ!" මම කීවෙමි.

"ආන් එහෙමයි ඒක... මං උන්ගේ බේත් ජාති ඔක්කෝම ගිල්ලා, ඊට පස්සේ ඇහැ අහක් කරලා වීදුරු ඇහැක් දැම්මා හිලට. ඒත් උන් වැඩේ හොඳට කළා. කියන්ඩ පුළුවන් ද කොයික ද වීදුරු ඇහැ කියලා? හොඳට බලනවා!"

ඉලේරියන් දොස්තරගේ ඇස්වලට එබී බැලුවේ ය.

"එතකොට කෝක ද වීදුරු ඇහැ?"

"රතු එක!"

"හප්පඳ බොල! ඒක හැබෑ ඇහැක් වගේමනේ! ඒක කොළ පාට කරගත්තා නං, කිසිකෙනකුට කවදාවත් හොයාගන්ඩ බෑ."

"ඇත්ත, ඔහේගෙ කොයි ඇහැ ද රිදෙනවා කීවේ?"

"දොස්තර මහත්තයෝ ඔහේගෙ ඇස් දෙක ම වීදුරු නෙවෙයි හෙම නේද?" ඉලේරියන් සැකමුසුව ඇසුවේ ය.

"සහතිකයි, එකම එකයි! ඔහේට වෙනස කියන්ඩ බෑ නේද?" වෛද්‍යවරයා ප්‍රීතියෙන් කීවේ ය.

"අපි නිරෝගි හැමෝගෙ ම නිරෝගි සැපතට බොමු." වොඩ්කා බඳුන ඔසොවමින් ඉලේරියන් කීවේ ය. "එසේම දෙවියන් වහන්සේ අපව මහාමාරියෙන්, දොස්තරලාගෙන් සහ අනෙක් ශෝකයන්ගෙන් ආරක්ෂා කරත්වා!"

"මම හැබෑ දොස්තර කෙනෙක්!" අපේ සත්කාරකයා වොඩ්කා බඳුන පිළිගනිමින් කීවේ ය. "මට ඩිප්ලෝමාවක්වත් දොරේ ගහපු තහඩුවක්වත් නෑ තමා, ඒත් මං හැබෑ දොස්තර කෙනෙක්. අමාත්‍යාංශෙ සමහරු මට කැමති නෑ, උන් නිර්නාමික වාර්තා ලියලා මට දඩ ගහනවා, ඒත් මං ගණන් ගන්නෙ නෑ! මගේ දැනුම හැම වෙලේම තියෙන්නේ මා ගාව! හුඟක් උන් මට කැමති නෑ! ලෙඩ මිනිස්සු දොස්තරලට කොහෙත්ම කැමති නෑ! ඒක සාමාන්‍ය දැනීම. ඒත් දොස්තරලා හැම වෙලේම ලෙඩ මිනිස්සුන්ට ආදරෙයි!... කෙනකුට දොස්තරලා ගැන විශ්වාස තිබ්බැහැකි ද? කොහෙත් ම බෑ! ඉඩක් ලැබෙන්නෙ කොතැන ද, දොස්තරලා එතෙන් දී මුළු ලෝකෙම මිනී වළට දක්කනවා! මොකක් ද ඔහේගෙ නම?"

"එයාගෙ නම සුරිකෝ. දැන් බීම නවත්තනවා, නැත්තං ඔහේගෙ මොළේ අවුන්සයක්වත් ඔහේට ඉතුරුවෙන එකක් නෑ. වීදුරු ඇහැක් වගේ මොළේ ඔළුකට්ට අස්සට ඔබන්ඩ බෑ, දන්නවද!" ඉලේරියන් තදින් කීවේ ය.

"විකාර! නවීන වෛද්‍ය විද්‍යාවට විස්වකර්ම දේ කරන්ඩ හැකි, රත්තරනේ... මොකක් ද නුඹේ නම කිවුවේ?" ඔහු ඉලේරියන්ගෙන් ඇසුවේ ය.

"මගේ නමෙන් කමක් නෑ. ඔහේට හැකි නං කියනවා මගේ ඇහැට මක් වෙලා ද කියලා. බැරි නං මං තමුසෙව මේ ඇඳේම බාවනවා, ඒ තමා අවසානේ!"

"නවීන විද්‍යාවට විස්වකර්ම දේ කරන්ඩ ඇහැකි... බොහොම ඉක්මනට ම අලුත් මොළයක් ඔළුකට්ට ඇතුළට දාන්ඩ පුළුවන් වේවි, ඔහේව සම්පූර්ණයෙන් අලුත් කරාවි. ඔන්න පණපිටින් මිනිහෙක් දොස්තර කෙනකු ගාවට ගේනවා, එයාව ඇඳිපුටුවේ ඉන්දවනවා...





දොස්තර බොත්තමක් ඔබනවා, ඕන් හරි, අරන් යනවා දැන් මිනියා! මොකද ඔහේ ඒ ගැන හිතන්නේ?"

"තමුසේ නැතත් මං ඒ ගැන හොඳට දන්නවා." ඉලේරියන් නහයෙන් පිම්බේ ය.

"ඔහේ දන්නවා නං, මොකට ද බයවෙන්නේ? එයාලා ඔහේ වෙනුවෙන් ඇහැ උළුප්පලා දාවි! ඉතිං මොකෝ? එයාලා අලුත් එකක්, වැඩිය හොඳ එකක් හයි කරාවි. මොකක් ද වීදුරු ඇහැක වැරද්ද, කියනවා බලන්ඩ මට? ඒක ඕනි නං එළියට අරං වතුර කෝප්පෙක දාලා තියලා මෙලෝ දෙයක් තකන්නෙ නැතුව බුදියා ගත්තැහැකි. නැත්තං මෙහෙම කියමු, ඔන්න මූණ හෝදන්ඩ යනවා, එතකොට ඇහැට සබන් යනවා. සබන් හින්ද හැබෑ ඇහැක් නං දැවිල්ල ගන්නවා, වීදුරු ඇහැට ඒකේ වගේ වගක් නෑ! ඊටත් වඩා හොඳේ මේකයි: ඔන්න උණුහුම් වෙන්න ගිනිමැළයක් ළඟටවෙලා ඉන්නවා, එකපාරට ම, ඌයි! ගිනි පුපුරක් ඇහැට වීසි වෙනවා. හැබෑ ඇහැ නං ඒකෙන් ම කණ වෙනවා. ඒත් වීදුරු ඇහැකට ඒක දැනෙන්නෙවත් නෑ!... මං ඔහේට තව දෙයක් කියන්නං..."

"අපොයි, ඔහේ කියාපුවා හොඳටෝම ඇති!" ඉලේරියන් සුසුමක් හෙළමින් කීවේ ය. "තමුසෙට දොස්තරයෙක් කියන්නේ මොන මෝල ද? තමුසේ මහ ප්‍රාඥයෙක්. මං මේ දැනටම කල්පනා කර කර ඉන්නේ මගේ ඇස් දෙකම උළුප්පලා දාලා, ඒ වෙනුවට වීදුරු ඇස් දාගන්ඩ ද? ඒකට ද?"

"ඇයි නැතුව? වෙදකම කියන්නේ ශ්‍රේෂ්ඨ විද්‍යාවක්, සහෝදරයා! හැබෑ ඇස්වලට හෙණ ගහච්චාවේ! කෘත්‍රිම ඇස් දිගුකල් දිනේවා!"

"කෘත්‍රිම ඇස් දිගුකල් දිනේවා!" වෛද්‍යවරයාගේ පාඨය අල්ලා ගත් මම දිගටම කියාගෙන ගියෙමි. "මේ තමා මේ මුළු ලෝකෙන් ම මං වැඩියෙන් ම ආදරේ මනුස්සයා, එයා ඉලේරියන්, එයාගෙ ඇහැ රිදෙනවා."

"මොන ඇහැ ද?" වෛද්‍යවරයා මා දෙස ඇස් හයාගෙන ඇසුවේ ප්‍රහේලිකාවට පත් ලෙසිනි.

"අපි කතා කර කර හිටි ඇහැ." මම කීවෙමි.

"හොඳා, අපි එහෙනං ඒක අහක් කරමු! තත්පරෙන්! බාබලේ! මට පිහියකුයි උණුවතුර ටිකකුයි ගේන්ඩ!" ඉක්කා ගැසූ වෛද්‍යවරයා මේසය මත හිස තබා ගති.

"මං මොනව ද ගේන්ඩ ඕනෑ?" දොර හරිමින් ඔහුගේ බිරිඳ ඇසුවා ය.

"බෙසමක් ගෙනැත් එයා ඉස්සරහින් තියන්ඩ." ඉලේරියන් කීවේ ය.

"අපොයි දෙයියනේ! එයාට මක්වෙලා ද?" බාබලේ හඬ තැළුවා ය.

"එච්චරට දෙයක් නෑ... තාම නං." මම කීවෙමි.

"මාමොන්ටි, නැගිටින්න, මාමොන්ටි!" ගැහැනිය වැලපුණා ය.

"මං මේ කල්පනා කරන්නේ මිනිහව භෞතීස්ම කලේ මොන ගොන් අලිය ද කියලා," ඉලේරියන් කීවේ ය. "මාමොන්ටි! මොන ජාතියෙ නමක් ද අම්මපා ඒ? එයාට දෙන්ඩ තිබුණු නම තමා සෙරපියෝනා! මොකෝ හිතන්නේ සුරිකෝ, සෙරපියෝනා කියන්නේ මිනිහට හොඳ නමක් නේද?"

මම පිළිතුරු නොදී සිනාපෑවෙමි. මොකක්දෝ හේතුවක් නිසා දීප්තිමත් ආලෝක පුලිඟු සහ තිත්ත කළුවර මාරුවෙන් මාරුවට ඇති විය. බිත්ති දිගින් දිගට ම වැනෙන්නට විය.

"තමුසේ එයාට මොකද කළේ?" බාබලේ ඉලේරියන්ට කඩා පැන්නා ය.

"මට පාඩුවේ ඉන්ඩ අරිනවා!" ඉලේරියන් බැනවැදුණේ ය. "අපි කරපු ඉලව්වක් නෑ! බොන්ඩ බැරි නං නොබී ඉන්ඩ එපායැ. ඒකා අඩුගාණේ මාව හරිහැටි පරීක්ෂා කළේත් නෑ, තක්කඩියා!"

"වද වෙන්ඩ එපා ඉලේරියන්, මම ම ඔහේ ව පරීක්ෂා කරන්නංකෝ." ඔහු සනසමින් කී මම ලියන මේසය උඩ තිබූ දිග කෝටුව ගෙන බිත්තියේ එල්ලා තිබූ අකුරු සටහනට එය එල්ල කළෙමි. "මෙන්න මේ අකුර මොකක් ද ඉලේරියන් රත්තරනේ?"

"කෝක ද හුරතලෝ?" ඉලේරියන් ඇසුවේ ය.

"මං මේ පෙන්නන එක!"

"කියවාපන් මෝඩයෝ!"

"ඒක ඊ."

"ඊ" ඉලේරියන් ද කීවේ ය.

"හොඳට ම හොඳා! ඉලේරියන් මාමේ ඔහේගෙ පෙනුම හොඳට ම හොඳා! එතකොට මේ අකුර මොකක් ද?"

"කෝක ද?"

"ඒකෙ පෙනුම සර්පයෙක් වගේ!"





"එහෙනං ඒ 'එස්' වෙන්ඩ ඕනෑ!" ඉලේරියන් අනුමාන කළේ ය.

"ජයවේවා, මට නුඹව ඉඹගන්ඩ ඉඩ දෙනවා." මම කීවෙමි. ඉතිං අපි එකිනෙකා වැළඳ ගතිමු.

"තමුසෙලා දෙන්නා මෙතනින් යනව ද නැද්ද!" බාබලේ හිටිහැටියේ ම කෑගැසුවා ය.

"බෙරිහන් දෙන්ඩ එපා, අපි යනවා... කොහොම වුණත් ඔහේගෙ මැමත් අපිට නං මළ මීනියකට වඩා පරෝජනයක් නෑ!"

"යනවා!" බාබලේ පිම්බා ය.

"මම ගුරියානුවෙක්, ඔබත් එහෙමමයි..." ගීතයක් ගයන්නට ගත් ඉලේරියන් ඔහු අත මගේ උරහිස වටා යැවී ය. අපි මාමොන්ටි පසාරවාගේ ගෙදරින් ඉමහත් ප්‍රීතියෙන් පිට වුණෙමු... එදා රෑයේ ඉලේරියන්ගේ ඇස කොතරම් දරුණු ලෙස වේදනා දුන්නේ දැයි යත් අපට ගිලන් රථයක් ගෙන්වන්නට සිදු විය. රිය පැමිණෙන තුරු බලා සිටින විට මා අස්වසන්නට ඉලේරියන් තමාට කළ හැකි සෑම දේ ම කළේ ය.

"මොකෝ මෝඩයෝ නිකං කඩා වැටිලා? වදවෙන්ඩ එපා, මට මොකවත් නපුරු දෙයක් වෙන්නෙ නෑ." ඔහු මා සනසනසුලුව කීවේ ය. "ඒත් නුඹේ සොපිට නත්තල් තමා! දැන් ඉතිං ඒකිට නුඹේ ඇඳෙන් බාගයක් ම ගන්ඩ පුළුවනි. කොල්ලෝ, ටිකක් පණ ගහලා ඉඳහන්! හා හා, මං කියන විදිහට කරහන්කෝ, ඉතිං!"

ඉලේරියන් දෙස හදවත පතුලෙන් ම උපන් අනුකම්පාවෙන් යුතුව බලමින් මිදුලේ සිටගෙන සිටි මගේ දෑසින් කඳුළු රූරා වැටුණි. ඔහුගේ කටහඬ ප්‍රීතිමත් ය, එසේම ඔහුගේ මුහුණෙහි බලාත්කාරී සිනාවක් ද විය, එහෙත් ඔහුගේ තොල් වෙවුලන සැටිත්, රළිගැසුණු කොපුල දිගේ කඳුළු ගලා යන සැටිත් මට දැකිය හැකි විය.

...දවස් පහළොවකට පසු ඉලේරියන් රෝහලෙන් පිටකරනු ලැබුයේ එක් ඇසක් අඩුවෙනි. ඔහු මගේ කාමරයට නිහඬව පැමිණ කිසිදු වදනක් නොදොඩා හිඳ ගත්තේ ය. මම ඔහුගෙන් කිසිවක් නොඇසීමි. ඔහු කිසිවක් කීවේ ද නැත. මෙසේ සතියක් ම ගෙවිණි. සැමදෙනා සමගම ඉහළ විනීත බවින් යුතුව අනලස්ව දේශනවලට සහභාගී වූ මම පන්ති නිම වූ සැණින් ඉලේරියන් බලන්නට ගෙදර ආවෙමි.

වරක් විශ්වවිද්‍යාලයේ සිට පැමිණි මට ඉලේරියන් කාමරයේ නැති බව පෙනුණි. ජනේලයෙන් පිටත බැලූ මම එක්වර ම ගොළුව

ගියෙමි. එය උණුසුම් ලෙස හිරු පැයූ දිනයකි. ඉලේරියන් මල්බෙරි ගස යට පුටුවක හිඳගෙන සිටියේ ය. සොෆී – හිතලා බලන්න! – සිටියේ එයාගේ ඔඩොක්කුවේ! ඉලේරියන් අහස දෙස කල්පනාකාරීව බලමින්, දුම්බොමින්, හීලෑ වූ බළලාගේ පිට කාරුණික ලෙස අතගාමින් හීන් හඬින් ඇයට කතා කළේ ය. මම සවන් දුනිමි.

"මෝඩ සතෝ, නුඹට තේරෙනව ද ඇස් පේන්නේ නැතුව යනවා කියන එකේ තේරුම? ඒකෙ තේරුම ඉරවත්, හඳවත්, ගස්වත්, මිනිස්සුවත් දකින්ඩ බෑ කියන එකයි... ඒකෙ තේරුම කට්ට කළු අන්ධකාරේ ජීවත්වෙනවා කියන එකයි... මේ සැත්කම කරන්ඩ එපා කියලා මං කිවුවා නං හෙම, මට ඇස් දෙක ම නැතිවෙන්ඩ තිබ්බා. තේරුණා ද? නෑ, උඹට මෙලෝ දෙයක් තේරුණේ නෑ, මෝඩ බළලා! අපේ මුරාඩා නං ඕං තේරුං ගනී... උඹ මහ මෝඩ තිරිසනෙක්! ඕං, දැන් බුම්මාගන්ඩ එපා! උඹට මා ගැන ගාණක් නෑ... මං කොහොම ද දැන් ආපහු මගේ ගමට යන්නේ? මුළු ජීවිත කාලෙ පුරා ම මං ඉලිකෝට කතා කළේ එකැස්-යක්ෂයෙක් කියලා... දැන් මං ඒකගෙන් කොහේ කියලා හැංගෙන්ඩ ද? හොඳා, මං තව මාස දෙකක් මෙහේ ම ජීවත් වෙනවා... ඒත් අන්තිමේ මට ගෙදර යන්ඩ වෙනවා!... බාගෙදා එයා දකින එකක් නැතුවා වත් ද? එහෙම වෙන්ඩ ඉඩක් නෑ! හැබෑ ඇහැකයි වීදුරු ඇහැකයි වෙනස අහු නොවෙන්ඩ තරං නං එයා කොහෙත්ම මෝඩයෙක් නෙවෙයි! මගේ වගේම අපූරු වීදුරු ඇහැක් එයාටත් තෑග්ගක් හැටියට ගෙනියන්ඩ ද? ඒක දීලා මං මෙහෙම කියනවා: 'ඉතිං යාළුවා ඕං අපේ කකුල් ඇදගැනිල්ල ඉවරයි... මගෙන් තෑග්ගක් හැටියට මේක අරන් ඔය ඇස් කෙවෙණිය අස්සට ඔබා ගන්නවා... දැන් අපි සමානයි..." නුඹ හිතනවා ද එයා මගේ අවාසනාවට හොඳ වැඩේ කියාලා හිනාවෙයි කියල ද? නුඹ හිතනව ද එයා එහෙම කරයි කියලා? ආයි එහෙම ඒක කියනවා නෙවෙයි, බළලෝ! උඹ එහෙම හිතන්නෙවත් කොහොම ද! උඹ දන්නෙ නෑ මගේ ඉලිකෝ ගැන! නාකි මනුස්සයා දුකෙන් පැලේවි. උඹ හිතන්නෙ නෑ කියල ද? එයා මුළු ලෝකෙන් ම වැඩිය ම ආදරේ කරන්නේ උඹේ අලස ස්වාමියා සුරිකෝටයි මටයි කොට කොහොම ද එහෙම වෙන්නේ!... ගිහින් දැන් කකුල් දිගැරගනිං, උඹට මේ දේවල් කොහොමටත් තේරුං ගන්ඩ බෑ..."





ඇය පරිස්සමින් බිම තැබූ ඉලේරියන් යාන්තමින් තල්ලු කළේ ය. සොෆී ජනේලය වෙත සක්මන් කළා ය. ඉලේරියන් ඇය දෙස බලන්නට හැරුණි, ඔහු සිටියේ හඬමිනි.

මා ද සිටියේ හඬමිනි. හඬමින් සහ ඉලේරියන්ට මගේ කඳුළු දැකිය නොහැකි නිසා ප්‍රීතියෙනි.

## ආ... ඉලේරියන්

සැත්කමින් පසු ඉලේරියන් නොසන්සුන් බවට පත් විය. ඔහුට ටිබිලිසිහි සිට ඇතිවෙලා ය. මාර්තුව පැමිණෙමින් තිබිණි. ගම තමා අදින බවක් ඔහුට දැනිණි. ඔහු එන තුරු ඔහුගේ එක් අඟක් ඇති එළදෙන ද, නොමැඩලිය හැකි සේ ආරෝවට පැටලෙන කුකුළා ද සිටියේ එහි ය. ඔහු එන තුරු ඔහුට ම උරුම පසත්, ඔහුට ම උරුම හිරුත්, වසන්තයත්, ජීවිතය අවදි කරවන වකවානුවත්, ශ්‍රමය සහ බලාපොරොත්තුවත් තිබුණේ එහි ය.

ඉලේරියන්ට තනිවම ගමට යන්නට දෙන්නට මට නොහැකි විය. ඒ ඔහු සැත්කමින් පසු තවමත් ඉතා දුබලව සිටි හෙයිනි. හැරත්, ඔහු මරණයටත් වඩා ඉලිකෝ මුණගැසීමට බිය වූවේ ය. ඉතිං ඉලේරියන්ගේ දුක්බර කතාන්දරයත් රැගෙන අපේ පීඨාධිපති වෙත ගිය මම ඔහුගේ අනුකම්පාව දිනාගනිමින් වැඩිපුර දින දෙකක නිවාඩුවක් ලබා ගතිමි.

...ඉලේරියනුත් මමත් අපේ ගමට ළඟා වෙත් දී හිරු යාන්තමින් කඳුකරය මතින් නැඟුණා පමණ ය... රෑ පුරා කළ මුර සේවාවෙන් විඩාපත් වූ බල්ලෝ දුබල ලෙස බුරමින් උන්හ. සූරි ගැසීගත් කුඩා කුරුලු රෑන් පින්නෙන් නැවුණු තුරු අතරෙහි තොරතෝංචියෙන් තොරව චිරි බිරි හඬ නැගූ හ. සීන් මීදුමක් ගම මතින් ඇතිරිණි.

"බලහන්කෝ සූරිකෝ, නුඹේ අත්තම්මා දැනටම ඇහැරිලා." යි ඉලේරියන් කීවේ අපේ දුම් කවුළුවෙන් පිටතට ඇදෙන සිහින් දුම් කැරැල්ලක් දෙසට ඇඟිල්ල දිගු කරමිනි.

ගිරිය යටින් කෑනොගසා සිටින්නට මට නොහැකි විය. "අත්තම්මෙ! ආ... තම්...මේ!"

මගේ කුඩුගැසුණු අත්තම්මා වියැකුණු ලේන්සුව හිස වටා බඳිමින් කඩිමුඩියේ එළියට ආවා ය.

"අත්...තම්...මේ...!"

ඇස් මුවාකොට දුර ඈත දෙසට එබී බලා, මොහොතකට පසු දෑත් සලා මොනවාදෝ හඬතැළු අත්තම්මා මා දෙසට දුවන්නට ගත්තා ය.

"පුරිතෝ! පුතේ!"

අපි වැළඳගතිමු. ඉන් පසු මම ඇය ඔසොවාගෙන ගෙදර දෙසට ගමන් කළෙමි.

"පුතේ, මගේ රත්තරනේ! අන්තිමේ ආවා එහෙනං! දෙයියනේ බලහන්කෝ තුඹේ හැටි, ඇටෙයි හමයි විතරයි! මං තුඹට කිවුවා ඉගෙනිල්ලට මිනිහෙක් මරන්ඩ හැකි කියලා. අහෝ දෙවියනේ!"

"ඉතිං ඔයාට කොහොම ද අත්තම්මේ?"

"ඉස්සෙල්ලා උඹ ගැන කියලා හිටින්කෝ! උඹේ ඉගෙන ගන්න වැඩ ඉවර ද?"

"අපොයි නෑ අත්තම්මේ, තාම නෑ! මං ඉගෙනගන්ඩ පටන් ගත්තා විතරයි!"

"අපොයි තුඹේ අසරණ අත්තම්මා! මොන එහෙකට ඔච්චර ඉගෙන ගන්නව ද? උඹේ ගුරුවරයට හෙණ ගහච්චාවයි, ඒකා මොනව හිතා ඉන්නව ද? උඹ එයාට විස්තර කරලා කියන්ඩ ඕනෑ උඹට වයසක, ලෙඩවෙච්ච වගේම තට්ට තනියමේ ඉන්න අත්තම්මෙක් ඉන්න වග. එයා උඹ එනකං ආසාවෙන් බලා ඉන්න වගත් කියන්ඩ ඕනෑ. එතකොට ඔය හොල්මන උඹේ පාඨමාලාව ඉක්මන් කරාවි."

"මං එයාට කියා බලන්නංකෝ අත්තම්මේ, සත්තකින් ම කියන්නම්." මම ඇය සනසමින් කීවෙමි.

මේ අතර ඉලේරියන් මා පසුපසින් සිටගෙන උන්නේ, හිස සොලවමින් සහ මා අත්තම්මා බිම තබන තුරු ඉවසීමෙන් බලා සිටිමිනි.

"වොල්ගා හාමිනේ!" අන්තිමේ ඔහු කතා කළේ ය.

"ඉලේරියන්, රත්තරනේ, අනේ සමාවෙයන්! මට සංතෝසෙට සිහිය නැතුව ගියා. ඉතිං සැප දුක් කොහොම ද? ඇඟට කොහොම ද?"



"මොන ඇඟ ද වොල්ගා හාමිනේ! මට තවත් ඉතිං එහෙම එකක් නෑ."

"නාකි යක්ෂයා, මොන විකාරයක් ද මේ කියන්නේ?"

"ඒත් ඒක ඇත්ත වොල්ගා හාමිනේ!"

"එතකොට මේ මොකක් ද? ඇඟක් නෙවෙයි ද?"

"මේක ද? කියන විදිහට නං ඇඟක් තමා... හරියට ම කිවුවොත් ඉලිකෝගේ ගෙදර බිත්තියේ එල්ලලා තියෙන වෙළඳ උකුස්සාගේ ජාතිය ම තමා..."

"තුඹ කියන්නේ ඕක විදුරු ඇඟක් කියල ද?"

"ඔව්!"

"හපොයි දෙවියනේ! ඒත් ඕක එච්චරට හිතට ගන්ඩ එපා ඉලේරියන්... අපි තුඹ එක්ක ඉන්නවානේ රත්තරනේ... ඒත් තුඹලා දෙන්නා මේ මිදුල මැද්දේ මොකද මේ හිටගෙන ඉන්නේ? ඇතුළට වරෙල්ලා! ගමන ඇවිල්ලා තුඹලට බඩගිනිත් ඇති!"

උදේ කෑම ගැනීමෙන් පසු මම ඉලේරියන් සමග ඔහුගේ ගෙදර ගියෙමි. ඉන් පසු අපි දෙදෙන ඉලිකෝ පැමිණෙන තුරු ජනේලය ළඟට වී බලාගෙන සිටියෙමු. ඉලිකෝ මද වේලාවක් පාරේ පහ වෙමින් හුනි. ඉක්බිති ගේට්ටුවෙන් කිරි කිරි හඬ දෙමින් ඔහු මිදුලට ආවේ ය. අපි ඔහු දෙස අයාගත් හුස්මෙන් යුතුව බලා සිටියෙමු.

"ඉලේරියන්!" ඔහු හඬතැලී ය.

"හිනින් එකෑස් යක්ෂයාව මුණගැහෙනවා!" හුස්ම අදිමින් මට කී ඉලේරියන් වතුර ජෝග්ගුවක් ගත්තේ ය. මම එළියට ආවෙමි.

"ඉලිකෝ මාමේ! ඇතුළට එන්ඩ!"

"ආ... මහාචාර්යතුමා!"යි පිළිතුරු දුන් ඉලිකෝ දොරකඩට පැමිණ හෘදයංගම ලෙසින් මා වැළඳගෙන, පියවරක් පසුපසට ගෙන දිගු වේලාවක් ඇස කරකවමින් මා දෙස බලා හුනි. අන්තිමේ දුක්බර විලාසයකින් හිස සෙලවූ ඔහු යළිත් මා වැළඳගන්නට විය.

"මගේ ආදරණීය තක්කඩියා! හොඳා, දැන් ඒවා පැත්තකින් තියමුකෝ! කොහොම ද වැඩ කටයුතු? කොහොම ද ඉගෙනීමේ වැඩ? මං ඕන ඔට්ටුවක් අල්ලනවා, තුඹ තුඹේ හැම මහාචාර්ය කෙනෙක්ව ම පිස්සු වට්ටලා ඇති. ඒයි, මේ මොකක් ද? උඩු රැවුලක් ද?" ඔහු මගේ උඩු රැවුලෙන් ඇද්දේ ය. "හැබෑට ම ඇත්ත එකක් ද?"

"හැබෑ ම හැබෑ එකක්!"

"වෙන්ඩ බෑ!"

"සහතිකයි, හැබෑ එකක්!"

"නුඹ වගේ හැබිචෝල්කාරයෙක් උඩු රැවුළකුත් ඇඳගෙන ඈ? මේ ලෝකේ නං කිසිම සාධාරණයක් නෑ, නැත්තං නුඹට යටි රැවුළක්වත් උඩු රැවුළක්වත්වත් හිටින්ඩ විදිහක් නෑ! කෝ දැන් එතකොට ඉලේරියන්? ඒයි, නාස් ලොකු යක්ෂයා! ඇවිල්ලා පෙනී හිටපන්!"

"ඉන්ඩ කැමති නං ඇතුළට වරෙන්, නැත්තං යන අතක පලයන්!" ඉලේරියන් ඇතුළේ සිට පිළිතුරු දුනි.

ඉලිකෝ ඇතුළට ගියේ ය.

"ඉලේරියන්!"

"ඉතිං ඉලිකෝ!"

ඔවුහු දිගු වේලාවක් එකිනෙකා වැළඳගෙන උන්හ. ඉක්බිති අපට මේසයට හිඳගන්නට ඇරයුම් කළ ඉලේරියන් වයින් සමඟ හපන්නට දේ ගෙන ආවේ ය. සංවාදය පමා විය. ඉලිකෝ නිහඬව දුම් බීවේ ය. මම ඉලේරියන් දෙස හොර බැලුම් හෙළුවෙමි. රවමින් හිඳගෙන හුන් ඉලේරියන් ඉලිකෝගේ සෑම චලනයක් දෙසම නෙත් හයාගෙන හුනි.

"ඉතිං!" අන්තිමේ ඉලිකෝ නිහැඬියාව බින්දේ ය. "ඇයි නුඹලා මට අලුත් ආරංචි නොකියන්නේ? නගරේ මිල ගණන් එහෙම? මට රෝච් කරෝල ටිකක් හෙම ගෙනාව ද?"

"මට හාන්කවිසියක් මතක නැති වුණා." මම පසුතැවිල්ලෙන් පිළිතුරු දුනිමි.

"අනේ කොල්ලෝ, මොනව ද හැබෑට නුඹේ මොළේ තියෙන්නේ?... ඉලේරියන් මේකා කොහොම ද එහෙටවෙලා කාලේ ගෙවන්නේ? ඉගෙනගන්න වැඩ මොකවත් යංතන්වත් කරනව ද?"

"මං දන්නෙ නෑ... මොන විදිහෙන්වත් මං නං දැක්කෙ නෑ ඒකා එක සැරයක්වත් පොතක් අතට ගන්නවා."

"ඒකා මතකෙන් ඉගෙන ගන්නවා වෙන්ඩැති. නීචයා, නුඹ දැන් මොන අවුරුද්දෙ ද?"

මට යක්ෂයා ආරූඪ විය. "නුඹ ආවේ මගෙන් ප්‍රශ්න කරන්ඩ ද?"

"නුඹේ ඉගෙනගැනිලි ගැන ඇරෙන්ඩ මං වෙන මොනවා නුඹ එක්ක කතා කරන්ඩ ද බනිසෝ? නුඹ කෝච්චි ඉස්ටේසමේ බඩු උස්සන එකෙක් නං එහෙම කියාපන්, එතකොට අපිට හැකියි බඩු උස්සන වැඩ ගැන කතා බහ කරන්ඩ."





"ඔව්, බඩු උස්සන එකෙක්."

ඉලිකෝ මා දෙස තම තනි ඇස් කොණින් බලා මට තවත් වයින් ටිකක් වත්කොට රිදුණු ස්වරයෙන් කතා කළේ ය.

"හොඳා, අපි බොමු එහෙනං නුඹලා ආපහු ගෙදර ආ එකට... නුඹලා නං මහ කුඩුකේඩු රොත්තක් වග කියන්ඩ ම ඕනෑ! යාළුවෝ ආපහු ඇවිත් කියලා ආරංචි වෙච්ච හැටියේ මං දුවගෙන ආවා. එයාලා මට හැම ආරංචියක් ම කියාවි, අපට හොඳ කදයක් දාන්ඩ පුළුවනි, කියලායි මං කල්පනා කළේ. ඒ වෙනුවට උඹලා මොකද කරන්නේ, ඔතනට වෙලා ඉඳගෙන වෘකයෝ බානක් වගේ මට කඩා පනිනවා. නොදකින් උඹලා! මේ ලොකු නාස් යක්ෂයාට යාළුවො කවුද හතුරො කවුද කියලා හොයාගන්ඩ බෑ කියන එක මං හැමදා ම දැනගෙන උන්නා. ඒත් හොට්ටා, උඹෙන් නං ඒ වගේ සැලකිල්ලක් කොහෙත් ම බලාපොරොත්තු වුණේ නෑ!"

මට මහත් ලැජ්ජාවක් උපණි. අසුනෙන් නැගී සිටි මම ඉලිකෝ වෙත ගොස් ඔහු සිපගතිමි.

"අමනාප වෙන්ඩ එපා, ඉලිකෝ රත්තරනේ. අපිට හරි මහන්සියි මෙච්චරක් දුර ඇවිත්, ඒකයි."

"කට වහගනිං! නුඹලා දකින එක මට කොච්චර සංතෝසයක් ද... නැත්තං හිතුව ද මං මේ ඇඹුල් වයින් හින්දා මෙහේ ආවා කියලා?"

"මං දන්නවා ඇයි නුඹ ආවෙ කියලා." ඉලේරියන් මැතිරී ය.

"කියන්ඩ ගත්ත දේ කියලා අහවර කරාපන්, වෙවුලන නාකි කුඩුකේඩුවා!"

"නුඹ ආවේ මට හිනාවෙන්ඩ, ආන් ඒකට! හොඳා, දැන් ඉතිං මං පරාදයි! හපාපන් මාව, ඉරා දාපන් මාව, වද දියන් ඕන තරං! ඕන් මං ඉන්නවා, මට පැනලා දුවන්ඩ බෑ!"

"මොකක්, නාකියෝ තමුසෙගේ මොළේ විකල් වෙලා ද? මොනව ද මේ කියන්නේ? නගරෙ දි තමුසෙට වස කැවුණ ද? සුරිකෝ, ඒකට මක්වෙලා ද? ගමෙන් යද්දී එයා රත්තරං මිනිහෙක්, දැන් ආපහු ඇවිත් ඉන්නේ පිස්සු යකෙක් නෙව!"

ඉලේරියනුත් මමත් මහත් ගැටලුවට පත් බැලුම් හුවමාරු කොට ගතිමු. ඉලිකෝට කිසිවක් දැකගන්නට නොහැකි වී ඇත් ද? සත්‍යය ගැන ඔහුට කිසි සැකයක් නැත්තේ ද? එයින් පෙනුණේ

ඉලේරියන්ගේ වීදුරු ඇස පරීක්ෂණයෙන් සමත්ව ඇති බවයි. "එක්කෝම හරි" අපි තීරණය කළෙමු. අපේ දිරිය එක් වරම තැඹිණි.

ඉලේරියන් තම වීදුරුව එසැවී ය.

"අපේ ආපනු ඒම සහ අපේ ආදරණීය ඉලිකෝ මුණගැසීම වෙනුවෙන්"

"ආන් එහෙම තේ වෙන්ඩ ඕනැ!" ඉලිකෝ සැහැසිමෙන් හඬ නැළී ය. "තුම්ලා තව පොඩ්ඩෙන් මේ එකැස් තාකියාව පිස්සු වට්ටනවා! මං කාට ද මේ ලෝකෙන් වැඩියක් ම ආදරේ? තුම්ලා දෙන්නාගේ ම නිරෝගී සුවයට එහෙනං ඕං!"යි කී ඔහු අප දෙදෙනා වෙත වෙත ම සිප ගත්තේ ය.

තුන්වැනි වීදුරුවෙන් පසු ඉලිකෝ ගීතයක් ඇරඹී ය.

වයින් පිරුණු බඳුනේ පෙණ අතරේ
ගිල්වමි මම මගේ දුක් කරදර සැම
සඳ නැගී විට ඇවිදින්නට යන්නෙමි
මගෙ අගනා සොඳුරිය සමඟින්

"ඉලිකෝ, රත්තරනේ, නුඹ දන්නව ද මං කොච්චර නුඹට ආදරේ ද කියලා?"යි කී ඉලේරියන් තම අත ඉලිකෝගේ උරහිස වටා යැවී ය.

"ඔව් ඉලේරියන්, මං දන්නවා නුඹ මට නුඹේ ඇහේ බබා ගාණට මට ආදරේ වග." ඉලිකෝ පිළිතුරු දුන්නේ සිනාපාමිනි.

'ඇහැ' යන වචනය ඇසෙද්දී ඉලේරියන් දරදඬු වුණි. එහෙත් ඉලිකෝ කිසිදු කැළඹීමකින් තොරව දිගට ම ගී ගැයී යඃ

විදුරු පුරවා ගිල දමමු!
ජීවිතයේ දුක් පිස දමමු!

"ඉලිකෝගේ සරීර සුවයි වෙනුවෙන්!"
"අපේ තක්කඩියා වෙනුවෙන්!"
"අපේ ලොකු නාස් ඉලේරියන් වෙනුවෙන්!"

සෙල්ලමට එක්වන්න මා හට ඉඩ දෙන්න
දිනාගත යුතුයි මම අගනා ම ත්‍යාගය
අසල්වැසියන් හට මුහුණ දෙමි නොබියව
පෙම්පිඩෙහි දිදුලන දැසින් උණුසුමව



ඉලිකෝ දිගටම ගී ගැයී ය. ඉලේරියන් යළිත් කොඩින් කත් දුන්නේ ය. එහෙත් අභිංසකත්වයේ මූර්තිය වූ ඉලිකෝ වෙනත් ගීයකට මාරු වී තිබිණි.

ගමෙන් එපිට තැලුමට යමි
සැම දෙන තෙත් ඉකිමරතිය
කළු ඇස වෙත සුබ පතමින්...

ඉලේරියන් සපමින් හුන් කටගැස්ම බිඳක් විට උගුරේ හිරේ ය. ඔහු කහින්නට විය. කැස්ස නිම වූ විට ඔහු තමාට වදදෙන්නා දෙස තදින් ඇස් හයා බැලුවේ ය. එහෙත් ඒ කෙරේ කිසි සැලකිල්ලක් නොපෑ ඉලිකෝ දිගට ම ප්‍රාණවත් ලෙසින් ගී ගැයුවේ යඃ

අඳුරේ මට මග පෙන්වයි
කාන්තිමත් දෑසේ ආලෝකය

අන්තිමේ තමා ඉලිකෝ මෝඩ කරන්නට සමත් වූයේ යැයි තහවුරු වූයෙන් ඉලේරියන් සන්සුන් වූවේ ය. ඔහු කොතෙක් දිරිමත් වී දැයි යත් ඉලිකෝට 'එකැස් යක්ෂයා' හැර වෙනත් නමකින් තවදුරටත් නොඇමතී ය. ඉලිකෝ එය ගණන්ගත් බවක් නොපෙනිණි.

ඉලිකෝත් මමත් ගෙවල් බලා පිටවෙන විට මහ රෑ වී තිබිණි. අපි එකිනෙකාගේ උරිස් වටා දැත් යවාගෙන ගී ගයමින් මිදුලට බැස්සෙමු. ඉලේරියන් අප හා සමග ගේට්ටුව දක්වා ආවේ ය. වැටෙන් පැන්න හැටියේ ම ආපසු හැරුණු ඉලිකෝ මහ හඬින් කතා කළේ ය.

"ඉලේරියන්!"

"මොනව ද ඕනැ නුඹට එකැස් යක්ෂයෝ?" ඉලේරියන් ඇසුවේ ය.

"රෑට නුඹේ ඇහැ කෝප්පෙක දාලා තියන්ඩ අමතක කරන්ඩ එපා!"

"මොකක්...?" ඉලේරියන්ගේ මුව හැයිනි.

"මොකුත් නෑ! දැන් නුඹට පුළුවනි ඇහැක් තරං මට ඉගිමරන්ඩ!"

"ඉලිකෝ විගොගිඩ්සේ!" ඉලේරියන් මොරදුන්නේ ය.

"මගේ නම නිතර නිතර කියාපන්, එතකොට ඒක අමතක නොවේවි! ඒත් සම්පූර්ණයෙන් ගත්තොත් නුඹ වාසනාවන්තයි. නුඹ දඩයමට ආසයිනේ, දැන් නුඹට ඇහැක් වහන්නේ නැතුවම, ගමේ ඔහේ ඇවිදගෙන යන ගමන් පේන්ඩ ඉන්න ඕන බල්ලකුට වෙඩි තියන්ඩ පුළුවනි!"

"ඉලිකෝ විගොගිඩ්සේ!" පෙරට දිව එමින් ඉලේරියන් හඬ තැළී ය. "මාව පොලඹවන්ඩ හදන්ඩ එපා!"

"එච්චර හිතට ගන්ඩ එපා, ඉලේරියන්! නුඹ ඔය වීදුරු කැටිත්ත පරිස්සං කරගන්ඩ බලන්ඩ ඕනෑ!" ඉලිකෝ අනතුරු හැඟවී ය.

එක්වරම ඉලේරියන්ගේ හුළං බැස්සේ ය. ඔහු තත්පරයක් ඉලිකෝ දෙස උදාසීනව බලාහුනි. ඉක්බිති හැරී දොරකඩ පඩිපෙළ වෙත දෙපා අද්දමින් ගමන් කළේ ය. එතැන හිඳගත් ඔහුගේ හිස කඩා වැටුණි.

මඳ වේලාවක් පාරේ සිටගෙන හුන් ඉලිකෝ ගේට්ටුව හැර ආපසු විත් ඉලේරියන් පසෙකින් හිඳ ගත්තේ ය. දුම්කොළ පසුම්බිය ගත් ඔහු සිගරැට්ටුවක් ඔතාගෙන පසුම්බිය ඉලේරියන් වෙත පෑවේ ය. එහෙත් ඉලේරියන් ඒ දෙස බැල්මක් පවා හෙළුවේ නැත.

"ආ මේක ගනිමු!" ඉලිකෝ මෘදු ලෙස කීවේ ය.

පසුම්බිය ගත් ඉලේරියන් දුමක් දල්වා ගති.

"නුඹේ අවාසනාව ගැන දැනගන්ඩ ලැබුණම මගේ හදවත තුවාල වෙලා ගියා." ඉලිකෝ කියන්නට විය. "දෙයියෝ ඒ ගැන සාක්කි දේවි... නුඹයි මමයි එක ම එකෙක් ඉලේරියන්... නුඹේ කරදරය මගේත් කරදරයමයි... මට නුඹව කේන්ති ගස්සන්ඩ ඕන වුණේ නෑ... ඔක්කෝටමත් වඩා නුඹ මට එකැස් යක්ෂයෙක් කියලා කියද්දි කේන්ති ගත්තෙ නෑ නොවැ... නුඹට ඇහැක් නැතිවුණා. ඉතිං ඒකට මොකද? කුටුසොව්ටත්[1] තිබුණේ එක ඇහැයි. ඒත් තමන් ඇවිදගෙන යන බිම හරියට දකින්ඩ එයාට පුළුවන් වුණා. නුඹටත් ඇහැක් නැතිවුණා, ඉතිං ඒකට මොකද? ඇස් දෙක ම නැති වුණත් උඹයි මායි දෙන්නා ම යටත් වෙන්නෙ නෑ. අපි අතින් අත අල්ලාගෙන ලෝකෙ පුරා ඇවිදගෙන යනවා. අපට තනියම ඒක කරන්ඩ බැරිනං සුරිකෝ අපට මඟ පෙන්නාවි. දැන් ඉතිං හිනාවෙයන් නාකියා!" ඉලිකෝ ඉලේරියන්ගේ උරහිසට ගැසී ය.

1 මිහයිල් කුටුසොව් (1745-1813) යනු 1812දී නැපෝලියන්ට එරෙහිව යුද්ධයේ දී රුසියානු හමුදා මෙහෙයවූ ජනරාල්වරයා ය.





නැඟී සිටි ඉලේරියන් ගෙතුළට ගොස් ආපසු ආවේ පත්තර කඩදාසියක එතූ යමක් සමඟිනි.

"ඉලිකෝ!" ඔහු කීවේ පහත් හඬිනි.

"මොනව ද ඉලේරියන්?" ඉලිකෝ ඇසුවේ ඊටත් වඩා පහත් හඬිනි.

"මෙතන රෝච් කරෝල ටිකක් ඇති. ඒවා වොඩ්කා හරි ඉසබෙලා වයින් එක්ක හරි ගන්ඩ හොඳයි..."

"මං රෝච් කරෝලවලට පණ ඇරලා." ඉලිකෝ කීවේ ය.

"මං දැනං උන්නා, ඒකයි නුඹට ටිකක් ගෙනාවේ." ඉලේරියන් කී ය.

"නුඹ ගේනවා කියලා මං දැනගෙන හිටියා..." පාර්සලය ගත් ඉලිකෝ නැඟිට කඩිමුඩියෙන් තොරව ගේට්ටුව දෙසට යන්නට විය.

"ඔහොම හිටින්, මාත් එනවා නුඹ එක්ක ගේ ළඟට."

"හැබෑටම!"

ඔවුහු ගේට්ටුවෙන් පිටව පාරදිගේ ගමන් ගත්හ. අඳුරේ ඔවුන්ගේ රූ දියැවී යන තුරු ම මම ඔවුන් දෑසින් හඹා ගියෙමි.

## සීරා

ශිෂ්‍ය අවදිය යනු පුද්ගලයකුගේ ජීවිතයේ ප්‍රීතිමත් ම කාලයයි. සුදු ලූනු ඉලූ රයි පාන් පොත්තක රසය අගයන්නටත්, ප්‍රවේශපතක් නොමැතිව ට්‍රෑම් රියවල ගමන්ගන්නා අයකුගේ මනෝභාවය අවබෝධ කරගන්නටත්, දෙබැම මත 'සතුටුදායක' ලකුණක් උපයා ගැනීමේ මිහිරියාව අත්විඳින්නටත්, ශිෂ්‍ය දීමනාව අලුත්වීමේ ප්‍රීතිය දැන හඳුනා ගන්නටත්, විභාගයක් ඉදිරියේ දණිස් බෙලහීනව දුබලව යන සැටි හඟින්නටත්, පෙළපොත් මතින් ගෙවන නිදි නැති රාත්‍රියකට පසු උදාවෙන හිමිදිරියක ප්‍රීතිය ලබන්නටත්, මිත්‍රත්වයේ සැබෑ වටිනාකම සොයාගන්නටත්, අන්තිමේ... ඊයේ පාවහන් රහිතව දුව පැන්න හඩු කොලුවා ගරුකටයුතු පුරවැසියකුව... රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකුව නැඟීමේ ආඩම්බරය විඳින්නටත් අයෙක් ශිෂ්‍ය ජීවිතයෙහි අවුරුදු කීපයක් ගෙවිය යුතු ම ය... කෙසේ වුව ද මා ඇතුළත්වීමේ විභාගයෙන් සමත් වී විශ්වවිද්‍යාලයට ලියාපදිංචි

වූයේ කෙසේ දැයි යන්න ඉලිකෝටත්, ඉලේරියන්ටත්, මගේ දේශකයින්ටත් පමණක් නොව මටමත් සදහට ම රහසක් ව පවතිනු ඇත. මා ලද ආශ්චර්යමත් ත්‍යාගයත් ගැන නිරන්තරව ම නොසැලෙන විශ්වාසයෙන් යුතු වූයේ මගේ අත්තම්මා පමණකි.

විශ්වවිද්‍යාලයේ ඉගෙනීම චමත්කාරජනකය! ශිෂ්‍යයෙක් මාස ගණනාවක් පුරා පොතක් ඇල්ලුවේ නැත ද බලකරන කිසිවෙක් නැත! අන්තිමේ ඔහුට තරවටු කරන්නට හෝ නරක ලකුණු දෙන්නට කිසිවෙක් නැත. ශිෂ්‍යයකුට දේශන පහක්, දහයක්, පහළොවක් අතපසු වුව ද දෙමව්පියන් පීඨාධිපති කාර්යාලයට කැඳවාගෙන එන්නැයි කිසිවෙක් ඔහුට කියන්නේ නැත... පාඩම්වල දී – එනම් මෙහි දී ඔවුන් කියන පරිදි දේශනවල දී – ඔහු, ඔහු වැනිම අනෙකුන් සීයක නැතිනම් දෙසීයක එකකු පමණකි. ඔවුන්ගෙන් අයෙක් ලියති, අයෙක් කුරුටුගාති, අයෙක් මුණු මුණු හඬින් කතා කරති, අයෙක් හරස්පද ප්‍රහේලිකා විසඳති. එසේම ලිවීම, කුරුටුගෑම හෝ කතාබහ නොකරන අය ද සිටිති. ඔවුහු හිඳි පුටුවේ ම දවල් හීන දකිති. ඔවුහු එය ගෙදර දී හෝ උද්‍යානයේ දී නොකරන්නේ ඇයි දැයි කිවහැකි කිසිවෙක් නැත. ඉතාම සුළු පිරිසක් නින්දට වැටෙති. වෙනත් වචනවලින් කිවහොත්, දේශන යනු විශිෂ්ට චාරිත්‍රයකි, ඒවා මා වැනි මිනිසුන්ට හරියට ම ගැළපෙයි. එහෙත් ලොව ඇති සියලු හොඳ දෙයෙහි මෙන්ම ඒවායේ ද බරපතළ අඩුපාඩුවක් තිබේ. ඒ ඉක්මනින් හෝ පමා වී වාරය අවසානයකට ඒම ය. පාඩම් මාලා අවසාන කෙරේ. දේශකවරු ද්වේෂයෙන් සිනාපාති. ශිෂ්‍යයෝ මාරක අන්තරායයකට මුහුණ දුන් වගක් හඟිති. නිවර්තන උණ සමය ඇරඹෙයි – විභාග.

අපි අපෙන් එකකුගේ මහල් නිවෙසක කණ්ඩායම් ලෙසින් පාඩම් කරන්නෙමු. පැන්සල් කොන් හපමින් අපි පෙළපොත්වල පරිච්ඡේද පිටින් කටපාඩම් කරමු, සටහන් කොපි කරමු, වාෂ්පශීලී වන දැනුමෙන් අපේ ඔළුගෙඩි පුරවමු, අඩු නින්ද නිසා රතු වූ ඇසිනුත් වේගවත් ඉගෙනීම නිසා වූ විඩාවෙනුත් යුතුව විභාගයට එන්නෙමු, ප්‍රශ්න පත්‍රය ගන්නෙමු, ප්‍රශ්න කියවන්නෙමු, කටබලියා ගනිමු, වෙවුලමු, තේරුම් ගත නොහැකි මොනවා හෝ මුමුණමු, ඉන් පසු චකිතයෙන් යුතුව ගෙල දිගු කරමු – එය "අසතුටුදායක ද?" – මහත් ආශාවෙන් දිගු වේලාවක් බලා හුන් ඉවත්ව යන ලෙස දක්වන





සංඥාව දකිමින් ප්‍රමෝදයෙන් පිරි සිනාවක් සමඟින් කාමරයෙන් පිටතට දිග හැරෙමු...

මමත් මගේ මිතුරනුත් මගේ කාමරයෙහි ආර්ථික භූගෝල විෂයය විභාගය සඳහා පාඩම් කරමින් සිටිමු. විභාග පරීක්ෂකවරයා ලෙස අද පෙනී සිටින්නේ සීරා ය. නෙස්ටර්, ඔටාර්, ක්විටිසෝ සහ මෝටා විභාග මණ්ඩලය විය.

"ශිෂ්‍ය වෂලොම්ඩසේ! ටින් ලෝහය කැණගනු ලබන්නේ කොහෙන් ද? එසේම මේ ඛනිජ විශාලම තොගය ඇත්තේ කුමන රටේ ද?" සීරා බරපතළ ලෙසින් ඇසුවා ය.

"ටින් ද තඹ ද?"

"ටින්!"

"විශාලම ටින් තොගය තියෙන්නේ අපේ ගමේ ටින්වැඩ කරන අලී ගාවයි මගේ හිතේ, ඒත් ඒවා කොහෙන් කැණගෙන එනව ද කියලා නං මට මෙලෝ නිච්චියක් නෑ."

"ඒකා ආයෙත් ගොනාට අඳිනවා! තමුසෙට ඉගෙනගන්ඩ ඕන නැත්තං යනවා යන්ඩ මෙතැනින්, අපට මේක කරගන්ඩ දීලා." නෙස්ටර් කෝපයෙන් කීවේ ය.

"යනවා යන්ඩ මෙතැනින් කියලා මොකක් ද කීවේ? මං මේ කාමරේට මාසෙකට දෙසිය පනහක් ගෙවනවා!"

"අනේ උඹට හෙණ ගහන්ඩ, ලැජ්ජා නැති හමා!" මාර්තා නැන්දා ඇගේ කාමරයේ සිට ප්‍රතිචාර දැක්වූවා ය. "මං ගිය අවුරුද්දේ ඉඳන් උඹෙන් එක පිත්තල කාසි කාලක්වත් අරන් තියේ ද?"

"වෂලොම්ඩසේ! දෙවැනි ප්‍රශ්නෙට උත්තර දෙන්න. ඔයා ටින් ගැන මෙලෝ දෙයක් දන්නෙ නෑ." සීරා සිනාපාමින් කීවා ය.

"ආදරණීය දේශකතුමියනි, මම ඔබෙන් උදක් ඉල්ලා සිටිනවා..."

"සූරිකෝ සෙල්ලක්කාරකං නවත්තනවා!" ඔටාර් මට බුරා පැන්නේ ය.

"හරි... දෙවැනි ප්‍රශ්නය තමා ඇමරිකා එක්සත් ජනපදය යන්නු සෑදීම... ඇමරිකාව සෑදී තිබෙන්නේ ජනපදවලින්. කොහොම වුණත් මේ ජනපද කවුරු හරි විරෝධය පාද්දී ඔටාර් ඇතුළුවෙන එක වගේ කියලා හිතාගන්න එපා..."

"සූරිකෝ, අනේ හැබෑට! කරුණාකරලා මේක බැරෑරුම්ව ගන්න!" සීරා කීවේ කෝප ගැන්වෙමිනි.



NUHA

"ඇමරිකා එක්සත් ජනපදය ඉතා හොඳින් යන්ත්‍ර සෑදීම සංවර්ධනය කොට තිබෙනවා. ෆෝර්ඩ් පමණක් සාදලා තිබෙනවා… මට මතක නැහැ අවුරුද්දකට යන්ත්‍ර කීයක් ද කියලා… ඔවුන් කියන්නෙ ඇමරිකාවේ සෑම මිනිසකුට ම – ඒ කියන්නේ පිරිමියකුට, ගැහැනියකට හෝ ළමයකුට කාර් පහක් බැගින් කියලා… ඔන්න පාරේ කාර් එකක් පේනවා, එතකොට එතැනට යද්දීම දොර අරිනවා…"

"දොර ඉබේම ඇරෙනවා!" ෂෝටා මා නිවැරදි කළේ ය.

"හරියට හරි. ඊට පස්සේ බොත්තමක් ඔබපු හැටියේ සිගරැට්ටුවක් එළියට එනවා, තව බොත්තමක් එබුව හැටියේ ගිනිපෙට්ටියක් එනවා, තුන්වැනි බොත්තම එබුව හැටියෙ…"

"රෝස් කරපු ඌරු පැටියෙක් එනවා." ෂෝටා මගේ සිතුවිලි සංවර්ධනය කළේ ය. "හතරවෙනි බොත්තම ඔබපු හැටියේ එළියට එන්නේ උණු උණු බඩ ඉරිඟු කේක් එකක්. පහළට තියෙන ටියුබ් එක උරපු හැටියේ කටට එන්නේ වයින් නැත්තං සෝස්. යතුර කරකැවුව හැටියේ සෝඩා වතුරයි චොකලට්ටුයි එනවා. ගෑස් ටැංකියට පය ගහපු හැටියේ ඔන්න ඒකෙන් එනවා හොඳ නටන්ඩ පුළුවන් සංගීතයක්…"

"කවුද ඔය ජාතියෙ කාර් එකක් විකුණන්නේ?" නෙස්ටර් පුදුමයෙන් ඇසී ය.

"සල්ලි ඕනෑ නං තමුසේ ඒක විකුණයි!" ෂෝටා කීවේ ය.

"ඔය වල්පල් කියවලා එපා වෙන්නෙ නැද්ද?" සීරා කුපිතව ඇසුවා ය.

මොහොතක් යන තුරු අපි දමනය වී නිහඬතාවට ඇද වැටුණෙමු. ඉක්බිති මම දිගට ම කියාගෙන ගියෙමි.

"කියන හැටියට ෆෝර්ඩ්ට අයිති රත්තරං උණු කරලා පටියක් හැදුවොත් ඒක මුළු ලෝකෙ වටේ බඳින්න පුළුවනිලු."

"මට ඒකෙ ගාංචුව විතරක් හොඳටෝ ම ඇති… කොච්චර අපූරු දතක් ඒකෙන් හදාගන්නැහැකිද!" නෙස්ටර් සිහිනයක් දකින්නා සේ කීවේ සිය කළු පැහැ දත සිනාවකින් දක්වමිනි.

"කාට ද දත් ඕනෑ?" ෂෝටා නිර්දය ලෙස විරිත්තමින් ඇසුවේ ය. "මට ඔය රත්තරං තිබ්බා නං…"

"මොනව ද එහෙනං කරන්නේ?" නෙස්ටර් ඇසී ය.





"ඔක්කොටම කලින් මං සටහන් පොතුයි පෙළ පොතුයි පුච්චනවා. ඊට පස්සේ මං අපේ පීඨාධිපති ළඟට ගිහින් මගේ ශිෂ්‍ය හැඳුනුම්පතයි, විභාග පොතයි එයා ඉස්සරහා මේසෙ උඩින් තියලා, කදිමට එයාට හිස නමලා බැහැලා එනවා… නෑ, මං රත්තරං පවුමකුත් තියලා එනවා, මුද්දර ගාස්තු හැටියට. මා ගැන දුක් කතගාටුවක් දැනුණොත් එතකොට එයා මට ලිවුවාවේ. එහෙනං සමාවෙන්න, ආයුබෝවන්, ටටා… කැප් එක දාගත්තා, ඕං මං ගියා. ඒ තමා එයා මාව දකින අන්තිම වතාව!"

"වෙන මොනව ද?"

"වෙන මොනව ද කියන එකෙන් මොකක් ද අදහස් කරන්නේ?"

"බාගෙදා නුඹ මට රූබල් දාහක් ණයට දේවි නේද? මං මාර්තා නැන්දාට මහ ගාණක් ණයයි." මම කීවෙමි.

"මං මොකට ද එහෙම දෙන්නේ? ඒක මට අයිතිකාරියක් යැ!"

"මාර්තා නැන්දේ! ඇහුණ ද ඒක?"

"මට ඇහුණා පුතා!" මාර්තා නැන්දා පිළිතුරු දුන්නා ය. "උඹලා ඔක්කොම එක වල්ලෙ පොල් – රස්තියාදුකාරයෝ, තක්කඩියෝ!"

"තුන්වැනි ප්‍රශ්නයට උත්තර දෙන්න!" සීරා මට මතක් කළා ය.

"මං ඒකට සූදානං නෑ." මම වික්ෂිප්තව කීවෙමි.

"මොනව හරි ප්‍රශ්න තියේ ද?" සීරා මණ්ඩල සාමාජිකයින්ගෙන් ඇසුවා ය.

"මට තියෙනවා!" ඔටාර් කීවේ ය.

"ඉදිරිපත් කරන්න!"

"මම මේ ගරුතර මණ්ඩලයෙන් සමාව ඉල්ලා සිටිනවා, මං කැමතියි දැනගන්ඩ මේ පට්ටපල් මෝඩයා ඇත්තට ම අනිද්දට විභාගෙට වාඩිවෙන්ඩ හිතා ඉන්නව ද කියලා?"

"පිළිතුරු දීම මම ප්‍රතික්ෂේප කරනවා!" මම විරෝධය පෑමි. "පාඨමාලාවේ එහෙම ප්‍රශ්නයක් නැහැ!"

ඉන් පසු වෙනත් අයකුගේ විභාග වාරය එළැඹුණි.

අපි මහ රැයෙහි වෙන් වූයෙමු.

ඔටාර්, නෙස්ටර් සහ ෂෝටා දිවි ගෙවූයේ විශ්වවිද්‍යාල මණ්ඩපයේ ය. සීරා පදිංචි වී සිටියේ මචබෙලි වීදියේ ය. ඇය නිල් ඇස් ඇති, පාණ්ඩු පැහැ, උස සුන්දර කෙල්ලකි. අපෙන් වැඩි දෙනෙක් ඇයට ආලය කළහ. එහෙත් ඇය කිසිවෙක් හා ආලයෙන් නොබැඳුණා ය. එසේම තමාව ගෙදර ඇරලවන්නට මට හැර වෙන

කුිසිවකුට ඇය ඉඩ නොදුන්නා ය. අපි පැය ගණන් උද්‍යානයේ හිඳගෙන සිටියේ එක්කෝ නිමක් නැතිව කතා කරමිනි, නොඑසේ නම් කිසිවක් ම නොදොඩමිනි.

සීරාත් මමත් රුස්ටිවෙලි වීදිය දිගේ සෙමෙන් ඇවිද යමින් උතිමු. වෙළෙඳසල් අසල තිදිකිරන රෑ මුරකරුවෝ අප දෙස සැකමුසුව බලා, ඉක්බිති එසැණින් මුළුමනින් ම මෙන් යළි නින්දට වැටෙති. රාත්‍රියේ දී ටිබිලිසිය කොතරම් ලස්සන දැයි ඔවුන්ට කිසිදු හැඟීමක් නැත. සියල්ල නිහඬ ය. දුර ඈත සිට එන ට්‍රෑම් රියක හඬ නැතහොත් රථවාහන පාලන නිලධාරියකුගේ විසිල් හඬ පමණක් ඉඳහිට ඇසිණි.

"සූරිකෝ?"

"ඇයි සීරා?"

"ඔයා රෑට ඇවිදින්න ආස ද?"

"ඔව්!"

"ඔයාට බය නැද්ද?"

"නෑ, ඔයා?"

"බයයි!"

"ඔයා මොනවට ද බය?"

"අපිව හොරු අල්ලාගත්තොත්?"

"මගෙන් නං උන්ට පැහැරගන්ඩ කිසි දෙයක් නෑ, සත්තකට ම මේ ඉරිච්ච වැරහැලි නං උන් ගන්න එකක් නෑ."

"උන් මගේ ඇඳුම් ගලවා දායි."

"එතකොට මං ඇස් පියා ගන්නවා."

"එච්චර ද? හරිම ආරක්ෂකයෙක් තමා මට ඉන්නේ!"

"හරි හරි, එහෙනං මං ඔයාගෙ නිරුවත දිහා බලන්නංකෝ, එතකොට හරි ද?"

"අනේ මේ මාව විහිළුවට ගන්ඩ එපා. මං දන්නවා ගමේ කොල්ලො වෙච්ච ඔයාලට ඇඟපතින් හරි හයි හත්තිය තියෙනවා, ඒත් හරි බයගුල්ලෝ."

"මං බය එක ම දේ තමා පිහිය."

"මාත් එහෙමයි, තුවක්කුවටත් ඒ වගේමයි."

"ඔයා මීයන්ට බය නැද්ද?"

"අපොයි බයයි!... සූරිකෝ! අර... අර මිනිස්සු දෙන්නා එන්නේ අපි දිහාට නේද?"





"ඔව්."

"උන් බීලා. අපි පාරේ අනිත් පැත්තට පනිමු!"

"ඒක බියගුළුකමක්!"

"අනේ සූරිකෝ අපි යං!" සීරා ආයාචනාත්මකව ම වෙත ඇලුණා ය.

"මෝඩ වෙන්ඩ එපා! ඒක බියගුළුකමක්!"

මිනිසුන් දෙදෙනා කඳුවෙටි පල්ලිය ඉදිරිපිට නැවති බීමත් වූ සැමකෙක් ම කරන සම්ප්‍රදාය ලෙසින් එකිනෙකා වැළඳගත්හ. ඉක්බිති අයෙක් ආපසු හැරුණේ ය, අනෙකා දිගට ම අප දෙසට ආවේ ය.

අපි නැවතුණෙමු. සීරා සිටියේ ගැහෙමිනි. මගේ දෙපා දුබල වන බවක් දැනිණි.

මිනිසා අප වෙත පැමිණ පළමුව සීරා දෙසත්, ඉක්බිති මා දෙසත් නුරුස්නා බැල්මක් හෙළා, අත සාක්කුවට ඔබමින් හිටිහැටියේ ම ගිගිරුවේ ය.

"ඒයි? දුමක් තියේ ද?"

"ඔව්, තියෙනවා, ඉන්ඩ ටිකක්!" කෙඳිරිලි හඬක් පෑ මම සිගරැට් පැකට්ටුවක් ඔහුට පෑවෙමි.

"ගිනිකූරු!"

"ඉන්ඩ ටිකක්!" වෙවුලන අතින් ගිනිකූරක් ගැසූ මම එය අමුත්තාගේ නාසය ළඟට ම ගෙන ගියෙමි.

"මං ඊයේ සිගරැට් බොන එක නැවැත්තුවා." මිනිසා කියා සිටියේ ය. "එවේලේ ඉඳන් මං සිගරැට්ටුවක් ඇල්ලුවේවත් නෑ... දැන් මං සිගරැට් බොන්ඩ නෙවෙයි යන්නේ, විශ්වාසය හදාගන්ඩ. මිනිහෙක් වචනයක් කිවුවොත් ඒ විදිහට ඉන්ඩ ඕනෑ!" ඔහු සිගරැටුට්ට දල්වා ආස්වාදයෙන් යුතුව උගුරක් ඇද්දේ ය.

"නුඹ දුම් බොනව ද?" ඔහු මගෙන් ඇසී ය.

"නෑ, කොහෙත්ම නෑ!"

"හොඳ කොලුවා! මං අවුරුදු විස්සක් තිස්සේ දුම් බිව්වා. දැන් නවත්තලා. කිසි එහෙකුට බෑ ආයිත් මගේ කටේ සිගරැට් එකක් ඔබන්ඩ!"යි කී ඔහු මගේ සිගරැට් පැකැට්ටුව සාක්කුවේ දමාගෙන දෙඩැවී ය.

අපි දුබල ලෙසින් යළි අපේ ගමන ඇරඹීමු.

සීරා හිටිහැටියේ ම කෙළිලොල් වූවා ය. ඇය ගසක සෙවණැල්ලට පැන්නා ය, ඉන් පසු තවත් එකකටත්, එතැනින් තවත් එකකටත් පනිමින් සංචාරක හෝටලය වෙත ළඟා වූවා ය. එතැන දී ඇය දුවන්නට වූවා ය.

"පුළුවන් නං මාව අල්ලන්න!"

මම ඇය පසුපස දිව ගොස් ඇය අභිබවා ඇගේ උරහිසින් තදින් අල්ලා ගතිමි.

"ඌහ්... මට මහන්සියි."

සීරා ඇගේ හිස මගේ උරහිසට පහත් කළා ය. මම අතක් ඇගේ ගෙල වටා යවා නිදහස් අතින් ඇගේ නිකට ඔසොවා ඇගේ විසල් නිල් ඇස් දෙස එබී බැලුවෙමි.

"මේ රෑ සඳහටම තියෙනවා නං." සීරා හුස්ම ඇද්දා ය.

"ඇයි සීරා?"

"මේකයි... දවල්ට වඩා රෑ හොඳ හින්දා."

සීරා මගේ අත ඉවත් කොට, හිස යළිත් ඔසොවා තරුවලින් ගැවසුණු අහස දෙස නෙතු හයා බැලුවා ය. ඉක්බිති ඈ මගේ අත ගත්තා ය.

"ඔයා කා එක්ක හරි ආදරෙන් වෙන්ඩ ඕනැ, සීරා, කියන්න ඒ කවුද!"

"මම අහසට ආදරෙයි, මම තරුවලට ආදරෙයි, මම අර මුරකාරයාට ආදරෙයි, මම මේ ගස්වලට ආදරෙයි!" ඇය ගසක් වෙත දිව ගියා ය. "ඔයා මාව විශ්වාස කරන්නෙ නැද්ද? මං ඒක ඉඹගන්න ද?"

ගසේ කඳ වැළඳගත් සීරා එය සිප ගත්තා ය.

ගස මුදුනේ නිදාහුන් ගේ කුරුල්ලෝ අවදිව බියපත්ව චිරි චිරි හඬ නගන්නට වූහ. උන්ගේ හඬට සවන් දුන් සීරා මා දෙසට හැරුණා ය.

"මම ගේ කුරුල්ලන්ටත් ආදරෙයි!"

"ඔයා නං හරි විහිළුකාර කෙල්ලක්."

"වෙන්ඩැති. එතකොට ඔයා මොන ජාතියේ කොල්ලෙක් ද?"

"මං හිතන්නේ මාත් විහිළුකාර කොල්ලෙක්."

"නෑ, ඔයා නිකම්ම මෝඩයෙක්!"

"ස්තූතියි!"

"නෑ, මෝඩයා නෙවෙයි වචනේ. ඔයා බීරියි, අන්ධයි. හොඳයි නැද්ද? අපි බලමු."





සීරා මා ළඟට ම පැමිණ මගේ මූළු මුහුණට ම එබී මෙසේ ඇසුවා ය:

"ඔයාට මාව පේනව ද?"

"හොඳටෝම."

සීරා මගේ අත ගෙන ඇගේ හදවතට තදකොට මෙසේ ඇසුවා ය:

"ඔයාට ඇහෙනව ද?"

මට ඇගේ හදවත වේගයෙන් ගැහෙන හඬ ඇසිණි. ඇගේ උණුසුම් හුස්ම මගේ මුහුණට වැදිණි. එක්වරම මම සීරා වැළඳගනිමින් ඇගේ දෙතොල් සිප ගතිමි.

යළිත් අපි තුරු පෙළ අතරින් ඇවිද යමින් සිටියෙමු.

"සූරිකෝ?"

"ඔව් සීරා?"

"මම ඔයාට ආදරෙයි!"

"ඒක ඇත්ත නෙවෙයි!"

"ඇත්තමයි, සූරිකෝ!"

"ඒක ඇත්ත නෙවෙයි සීරා, අපි ඒ ගැන කතා නොකර ඉමු..."

සීරා නිහැඬියාවට වැටී ගසකට හේත්තු වූවා ය. මම ද තාප්පයකට හේත්තු වී නිහඬව සිටගෙන හුනිමි. එසේ අපි බොහෝ වේලාවක් තිස්සේ එකිනෙකා දෙස බලා සිටගෙන හුනිමු. අන්තිමේ සීරා මා වෙත පැමිණ, මගේ කමිසයේ බොත්තම් පියවා, මගේ ඇසිබැම අතගා පාර දිගේ ගෙදර දෙසට ගමන් කළා ය. මම ඇය පසුපසින් ගැටුවෙමි.

එක්වනම සීරා ආපසු හැරී බැලුවා ය. ඇගේ දෑස්හි කඳුළු දිලිසෙමින් තිබිණි. ඈ මා වෙත පැමිණ, මා සිඹ දුවමින් යන්නට ගියා ය.

...දිගු වේලාවක් ගතවන තුරු මම ගල්ගැසුණා සේ සිටගෙන සොඳුරු තුරු මත ළපලු පත් කොඳුරන හඬට කන්දුනිමි.

මම ගෙදර දෙසට එන්නට වුණෙමි. පමා වූ ට්‍රෑම් රියක් ළමා රඟහල අසල දී මා අල්ලා ගති. මම ඊට පැන ගතිමි. නිදිකිරමින් හුන් කොන්දොස්තරවරයා ගැස්සී දෑස් හැර මට ඉදිරියට යන්නැයි කීවේ ය. මම ඉදිරියට ගියෙමි. ඉක්බිති පස්සට පැමිණ ප්‍රවේශපතක් ගන්නා ලෙස කොන්දොස්තරවරයා කෑගෑවේ ය. පිටුපසට පැමිණි මම මා වෙත මුදල් නැති බව කියා සිටියෙමි. ඔහු විශ්වාස නොකළේ ය. මම සාක්කු නොපිට පෙරළා ඒවා හිස් බව පෙන්වීමි. එවිට

කොන්දොස්තරවරයා මෙසේ කීවේ ය: "එහෙනං නැගපු විදිහට ම ආපහු පනිනවා."

බිමට පැන්න මගේ මුහුණ ඉදිරියේ සිටගෙන සිටියේ රථවාහන පාලන නිලධාරියෙකි.

"සුබ උදෑසනක්!" මෝඩ සිනාවක් පාමින් කීවෙමි.

"කරුණාකරලා ගන්නවා බලපත්!"

"මගේ බලපත් ඔහේට මොකක් කරන්ඩ ද?"

"පුරවැසියා, මම නුඹට කීවේ බලපත් පෙන්නන්ඩ කියලා! අපි බලමු තමුන් මොන ජාතියෙ කුරුල්ලෙක් ද කියලා!"

"කුරුල්ලො මොකට ද?"

"එකට එක කීම නවත්තනවා!"

"තමුසේ මට කෑගහන්නෙ මොකද?"

"දඩයක් ගෙවනවා!"

"මා ළඟ සල්ලි නෑ..."

"එහෙනං එනවා මා එක්ක පොලීසියට. තමුන් එහේ දි නොවැරදී ම ගෙවයි."

"ඔහේ හිතන්නේ පොලීසියට යන අතරමග දී මට වාසනාව කඩා වැටෙයි කියල ද? මං ඔහේට කියන්නේ මා ළඟ සල්ලි නෑ."

"එකට එක කියන එක නවත්තනවා."

පොලීසියේ බංකුවක් මත මිනිසුන් හතරදෙනෙක් වූහ. මා දුටු මතින් ම රාජකාරියේ යෙදී හුන් ලෙෆ්ටිනන්ට්වරයා ඇස් කරකවා බලා "ආයිත් අහුවුණා ද?"යි ඇසී ය.

"ඔහේට වැරදිලා සර්, මං මීට කලින් කවදාවත් පොලිසිය ඇතුලේ ඉඳලා නෑ!"

"එකට එක කියන එක නවත්තනවා!"

"ජේනව ද බොස් මේකා මොන ජාතියෙ තක්කඩියෙක් ද කියලා! මේකා මෙතෙන්ට එනකම් ම හරියට අසරුවෙක් වගේ පළි ගගහා ආවේ!"

"ඒක බොරුවක් සර්! මං කිසිම රළු වචනයක් එයාට කීවේ නෑ!"

"නිශ්ශබ්ද වෙනවා! මේ රොත්ත ගැන බලලා ඉවර කරලා මං තමුන් ගැන බලාගන්නං,"යි කී ලෙෆ්ටිනන්ට්වරයා බංකුව මත හුන් හතරදෙනාගෙන් අයකු වූ රැවුළ නොබෑ, රතු නාසයැති මිනිසා වෙත හැරුණි.

"තමුන් මට පොරොන්දු කීයක් දීලා තියේ ද?"





"ඇයි, ඔහේ ඉල්ලපු තරමට මං දුන්නානේ. වාද කරන්ඩ මං මොන මිනිහෙක් ද?"

රතු නාසයැති මිනිසා නැගිට්ටේ ය. මම ඔහුගේ තැන හිඳගතිමි. 'මගේ' පොලිස් භටයා පිටව ගියේ ය.

"බොහොම හොඳා එහෙනං, කියනවා බලන්ඩ මේ සැරේ මොන හුටපටේට ද?"

"කවුද? මම? මං මොන හුටපටේටවත් නෑ. ඔහේ ඒකාට ඇහුන්කන් දෙන්ඩ එපා. ඒකාටත් ගුරුවරයෙක් කියලා කියනවාද! මොන ජාතියෙ ගුරුවරයෙක් ද ඒකා? ළමයි තියා බල්ලෙක්වත් ඒකා ගාව තියන්ඩ විශ්වාස නෑ. ගුරුවරයෙක්! හුහ්!"

"කරුණාකරලා මේ කුණු කටාගෙන් මාව ආරක්ෂා කරන්න." සිහින් උස් අයෙක් අසුනින් නැගිටිමින් කීවේ ය. "මගේ වෘත්තීය නිපුණත්වය ගැන ඔහේට පුළුවනි දිස්ත්‍රික් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අහලා බලන්න."

"තමුන් කට පරිස්සං කරගන්නවා හොඳයි!" ලෙෆ්ටිනන්ට්වරයා බීමත් මිනිසාට කෑගැසී ය.

"එතකොට ඒකාට මගේ වෘත්තීය නිපුණතාව ගැන ප්‍රශ්න කරන්ඩ සම්පූර්ණ අයිතිය කොයින් ද?"

"ඒත් එයා කොහෙත් ම ඔහේගේ වෘත්තිය ගැන කීවේ නැහැනේ!" මම මැදිහත් වීමි.

"කීවේම නැහැ? එතකොට කවුද මට බේබද්දා කීවේ?"

"ඇත්තවශයෙන් ම ඒක නං හොඳ නැහැ." මම ගුරුවරයා වෙත හැරී කීවෙමි.

"තරුණ හාදයා, ඒකා මොන තරං කැත ගනුදෙනුකාරයෙක් ද කියන එක ගැන ඔහේට අවබෝධයක් නෑ."

"කැත ගනුදෙනුකාරයා උඹයි." බේබද්දා කීවේ ය.

"මං මොකවත් ම කියන්නේ නෑ ඒකා තමන්ගේ බිරිඳට තඩිබාන හැටි ගැන, ඔක්කෝටමත් වැඩිය ඒක පවුලේ දෙයක්. ඒත් ඒකා බොන්නේ හරියට මාළුවෙක් වගේ, බෙරිහන් දෙන්නේ බෙල්ල ගැලවිලා යන්ඩ, අසල්වාසීන්ට මොහොතක් සාමයෙන් ඉන්ඩ අරින්නෙ නෑ..."

"ඒක ඇත්ත ද?" මම බේබද්දාගෙන් රළු ලෙස ඇසුවෙමි.

"ඇත්ත වුණත් මොකද? මං ඉන්න තත්ත්වෙ දි තමුසෙත් ඔහොම තමා! අවුරුදු විස්සක් තිස්සේ, – තමුන්ට හිතාගන්ඩ පුළුවනි ද –

අවුරුදු විස්සක් – මේ වෙළිච්ච කෝටුව මට කතා කරන්නේ බේබද්දා කියලා! හරියට මං ඒක නොදන්නවා වගේ! ඒකා ඒක මට මොකද මතක් කරවන්නේ? ඒකා කියන්නේ මං පාදඩයෙක් කියලා. ඒකා නැතුවට මං ඒක දන්නෙ නැතුව ද? ඒ මදිවාට ඒකා දැන් හිතලා තියෙනවා අලුත් වචනයක් – මන්දකයා... නෑ... මන්බුදි... මන්...!"

"මන්ද බුද්ධිකයා." ගුරුවරයා සිහිපත් කළේ ය.

"ආන් හරි. මන්ද බුද්ධිකයා. ඒකා මට ගෝරිල්ලා කියලා කතා කරනවා මදිවෙලා වගේ!"

"ඔහේ හැබෑටම මෙයාට ගෝරිල්ලා කියනව ද?" මම ගුරුවරයාගෙන් ඇසීමි.

"ඒත් ඔහේ මේකව අඳුනන්නෙ නෑ තරුණ හාදයා! ඒකා සාන්තුවරයෙක් වුණත් පිස්සු වට්ටනවා! අපේ ස්නායු කිපිලා! අපේ අසල්වැසියෝ හැමෝට ම ඉවසලා ඉවසලා ඇතිවෙලා!"

"මොන අසල්වැසියො ද? ඇයි ඒ කවුරුවත් පැමිණිලි කරන්නෙ නැත්තේ?"

"එයාලා තමුසෙට බයයි!"

"එයාලා මට ගරු කරනවා, ආන් ඒකයි, ඒ වගේ ම මට ආදරෙයි."

"මේන්, මම පැමිණිල්ලක් ගෙනාවා. ඔක්කොම ගෙවල්වල අය අත්සන් කරලා තියෙන්නේ."

"උන් ඔක්කොම ගෝරිල්ලෝමයි! තමුසෙත් එහෙමයි!" රතු නාසයැති මිනිසා ලෙෆ්ටිනන්ට්වරයාට පිටුපා මට ආයාචනා කළේ ය. "අපි ඒක ගැන සිහි නුවණින් කතා කරමු. ඇයි මිනිහෙක් බොන්නේ? එයා කාලකණ්ණිවෙලා හින්දා. එයාගෙ ස්නායු තියෙන්නේ බොහොම නරක අඩියක. මිනිහෙක්ගෙ ස්නායු නරක අඩියක තියෙද්දී කැනොගහ ඉන්ඩ බෑ. එයාට ඇහුන්කන් දෙනවා නං, මිනිහකුට බොන්ඩ ඉඩදෙන්ඩ බෑ, ඒ වගේම තමන්ගෙම ගෙදර ටිකක් කෑගහන්ඩ දෙන්ඩත් බෑ... කොහොම ද ඒකට කැමති වෙන්නේ?"

"ඇත්තවශයෙන් ම මිනිහකුට බීමක් ගන්ඩ පුළුවනි, ඒත්..."

"දෙවියන්ට ස්තුති වේවා, අන්තිමේ ටිකක්වත් මොළේ තියෙන කෙනෙක් ඉන්නවා." රතු නාසයැති මිනිසා ප්‍රීතියෙන් හඬතැළී ය.

"ඔහේ ඒකට කියන්නේ බීමක් කියල ද? ඒකා වයින් ගිලදාන්නේ බාල්දිවලින්! ඒකා මී පාසානං කැවත් අපට ඇති දෙයක් නෑ, ඒත් මේ



අසල්වැසියො අපි මොකට ද විඳවන්නේ? නිකං පොඩ්ඩක් බලනවා, අර රතු නාහේ කතා කරන හැටි විතරක්."

"ඇහුණ ද ඒක? දැන් මිනිහා සාක්කිකාරයෝ ඉස්සරහ ම මට නින්දා කරනවා!" බේබද්දා පැමිණිලි කළේ ය.

"ඒත් ඔහේගේ නාහෙ රතුයි කියන එක කොහෙත්ම ප්‍රතික්ෂේප කරන්ඩ බෑනේ!" මම කීවෙමි.

"ඉතිං මොකෝ? මගේ නාහෙ පාට මගෙ වැඩක්. මට ඕන්නං ඒකට කොළ පාට ගානවා, කාගෙවත් අවසරයක් මට ඕන නෑ."

"තරුණයා, මට ඔහේගේ නම කියන්ඩ පුළුවන් ද?" ගුරුවරයා මගෙන් ඇසී ය.

පිළිතුරක් දෙන්නට මට හැකිවන්නට පෙර ලෙෆ්ටිනන්ට්වරයා මේසයට මිටින් හෙණයක් සේ පහර දුන්නේ ය. ජනෙල් විදුරු එයින් සට සට ගෑවේ ය. මළ නිහැඬියාවක් කාමරයට පාත්විණි.

"හොට්ටා, මෙතන ප්‍රශ්න කරන්ඩ උඹ කවුද? නැගිටලා ඔය කැප් එක ගලවාපිය!" ලෙෆ්ටිනන්ට් බෙරිහන් දුනි.

"ඇයි කේන්ති අරන් සර්? මං මේ ඔයාට උදවු කරන්ඩ හැදුවේ!"

"මට උඹේ උදවු ඕන නෑ! දැන්ම මෙතැනින් පිටවෙලා යනවා. හැබැයි ආයෙ තමුන්ගෙ අසල්වැසියන්ගෙන් ආයෙ මට පැමිණිල්ලක් හෙම ආවොත් බලාගෙනයි!" ඔහු කීවේ රතු නාසයැති මිනිසාට ය.

"මේ දැන් යනවා ඉන්ස්පෙක්ටර්. මට එක ඉල්ලීමක් තියෙනවා කරන්ඩ... මං සාමකාමී මනුස්සයෙක්, මගෙ ජීවිතේට කවදාවත් මැස්සකුටවත් රිදවලා නෑ... ඒකාට කියන්ඩ මට ගෝරිල්ලා කියලා කතා කරන්ඩ එපා කියලා!"

"යන්ඩ නේද කීවේ!"

"මේ යනවා!"

බේබද්දා දොර දෙසට ගමන් ගති. මා පසු කරන අතරෙහි ඔහු මගේ කනට කෙඳිරුවේ ය.

"මං නුඹ එනකං එළියේ ඉන්නං. අපි හොඳ සාජ්ජයක් දාමු."

"මං තමුන්ව කූඩුවට දාන්ඩ කලින් යනවා හොඳයි!" ලෙෆ්ටිනන්ට් කෑමොර දුනි.

බේබද්දා අතුරුදන් විය. ගුරුවරයා තම පැමිණිල්ල ලෙෆ්ටිනන්ට්වරයාගේ මේසය මත තබා මා වෙත ආචාරශීලීව හිස නමා පිටව ගියේ ය.

සිනැටිමේ ම දොර මත තබින් ඇවි මාර්තා නැන්දා කාමරයට කඩාවැදුණා ය. පුදුමයෙන් තැතිගැනුණු ලෝරිනාන්ට්වරයා ඇ දෙසට කතා කළේ ය.

"මොකද මාර්තා නැන්දේ? මෙහේ මොකද කරන්නේ මේ?"

"මගේ ළමයා නැතිවෙලා! මගේ ළමයා ගෙදර ආවේ නෑ!"

මම පුදුමෙන් ඇසුවෙමි.

"මොන ළමයා ද මාර්තා නැන්දේ?"

"මගේ ජෝවානිකා. පුරිනෝ විසෙලොම්බිගේ... එයා ගෙදරින් පිටවුණා. එත් ආපහු ආවේ නෑ! මං මේ වටේම තියෙන පොලිසිවලටයි ඉස්පිරිතාලවලටයි කතා කළා. එයා පුළුවන් වගේ අතුරුදන්වෙලා! අනේ පුතේ මට උදව් කරාපන්, කොහේට හරි කතා කරලා බලාපන්, අනේ පුතේ!"

මාර්තා නැන්දාගේ විලාපයම් අසමින් මම පුල්ලේ හිඳගෙන සිටිමි. මගේ හදවත ප්‍රීතියෙන් උතුරා යයි. කිසියම් කෙනෙක් මා වෙනුවෙන් දුක්වෙන්නට සිටී, කිසියම් කෙනෙක් මා ගැන කරදර වෙන්නට සිටී! ජෝන්තිකාර මහලු ගැහැනියක වූ මාර්තා නැන්දා හරියට ම මා ඇගේ පුතා හෝ ළඟම නෑයකු වූවා සේ මා සොයමින් නගරය පුරා දුව ඇවිදලා!

ඇ එතරම් කලබලව සිටිනු දකිමින් මට තවදුරටත් පුල්ලේ හැංගී සිටිය නොහැකි විය. එළියට ආ මම ඇය වැළඳ ගතිමි.

"මං මෙතන ඉන්නවා, මාර්තා නැන්දේ!"

"තගොයි දෙවියනේ! කොහෙත් ද තුඹ කවා පාත්වුණේ? තුඹට ලජ්ජාවක් නැද්ද තක්කඩියෝ? මගේ මං බිහි පත්වෙලා නගරේ පුරා හොයා ඇවිද්දා, එයා මෙතන වැඩිලා කඩිපාරු ගහනවා. තුඹ මෙතෙන්ට ආවෙ කොහොම ද හිවියෝ? දැන්ම කියාපන් මට!"

"මම හිතාම ඇවිදගෙන ආවේ, එහෙම වැදී මාර්තා නැන්දේ..."

"ඇයි පුතේ මගේ එයාව අත් අරංගන්ට ගන්නේ?" මාර්තා නැන්දා ලෝරිනාන්ට්වරයාගෙන් ඇසුවා ය.

"මම දන්නෙ නෑ මාර්තා නැන්දේ, මගේ පොඩ්ඩෙක් කබ එයාව හොයාවේ..."

"තුඹ දන්නෙ නැ? මොකට ද තුඹ දන්නෙ එහෙනං? තුඹ මෙතන වැඩිලා ඉන්නෙ මොකොකට ද? උන් ළමයෙක්ව අරන් එනවා, තුඹ ගන්නෙ නැ ඇදිනෙක් ඇයි කියලවත් එයා



මංකොල්ලකාරයෙක් හරි මිනීමරුවෙක් හරි වගේ ද පේන්නේ? තැන්තං පාදඩයෙක් වගේ?"

"මාර්තා නැන්දේ..."

"මට මාර්තා නැන්දේ කියන්න එපා! මේ දැන්ම ගෙදර යමන්. නිවයා! ලෝරිනාන්ට්ට ඇයි වැරදි කරන්නේ නෑ කියලා පොරොන්දු වෙලා මෙතනින් යමන්! අතුරුදන් ළමයයි ගෙදෙද්දී!"

මාර්තා නැන්දා මා ඇදගෙන පොලිසියෙන් පිටවූවා ය. සතාන් මුවින් අත දෙස බලා සුන්. රාත්තරියේ තිබුනු ලෝරිනාන්ට්වරයාට අත වනාගන්නට මට යන්නමින් කාලය තිබිණි. ගෙදර එන අතරතුර මාර්තා නැන්දා වචනයක් හෝ නොදෙඩුවා ය. අපේ නිවසේ දොර වෙත ළඟා වූ විට මම ඇගේ කොපුල සිපගන්නට තැත්කෙළෙමි.

"නිවයා, මට ඉන්න ඇරපන්." යි කී ඇය කොපුල පිසදැමුවා ය. ඉන් පසු තම කාමරයට ගිය ඇය දොරගුළේ යතුර කැරකුවා ය.

නින්දට යන්නට කිසිදු හේතුවක් නොවී ය.

විබිලිසියේ පුරාතන තරිකලා බලකොටුව මතින් හිමිදිරිය උදාවෙමින් තිබිණි.

## ප්‍රීතිමත් සවාරිය

අපේ වන්නිය සමිති සංවිධායකයා නියමිත අය මුදල් එකතු කිරීමෙන් එපිටට තම ක්‍රියාකාරකම් ඉදිකිරී දිගු කළේ ය. ඡන්දය යන්නමින් පෙනෙන්නට පටන් ගත් විට ඔහු සමහර විට විනෝද චාරිකාවක් සංවිධානය කරයි. එනි සාමාන්‍ය රට දැකස නම් චිත්‍රපටයක් හෝ නාට්‍යයක් බලන්නට යාමයි. එහෙත් අපි මෙවර යන්නට යන්නේ සැබෑ ම විනෝද සවාරියකි. එනම් මියාමිවෙරින්-මියෝ ගුහාව- ආලුම්ය බලන්නට ය.

මාර්තා නැන්දා අර්තාපල් වෙල්ලවැළුම් සතරක් දිගා ආහාරය පිළියෙ මට දුන්නා ය. ඇ මට පාන් කිසිවක් නොදුන්නේ සිසිදු බිලාවර පුරෝහිතයෙක් අර්තාපල් සහ මැකරෝනි සමග පාන් නොකන බව පැහැදිලි කරමිනි. ආහාරවල හිතකර රට සිලිට ලෙසින් නිර්ලෝභී ලෙස සෑම වර්ගයක ම දැනමුතුකම් සහ අවවාද නිර්මාණය කළේ ය.

විශ්වවිද්‍යාල භූමියෙහි මගේ සගයෝ බසය එන තුරු බලා උන්හ. අපට වැඩිවේලා – එනම් පැයකට වඩා – බලා සිටින්නට සිදු වූයේ නැත. බසය පැමිණි විගසින් ඊට නැඟගත් අපි අසුන් ගතිමු. රියැදුරු එන්ජිම පණගන්වන්නට යත්න දැරී ය. එය ගොර ගොර හඬක් ද කිවිසුමක් හැර නිහඬ විය.

"ඇවිත් පොඩියක් මට උදවු කරනව ද?" රියැදුරු ඉල්ලා සිටියේ ය.

මම බසයෙන් බැස ඉදිරිපසට ගොස් වක් දණ්ඩ කරකැවීමි. ඇන්ජිම නිහැඬියාවේ ම ගැලිණි.

"ඔක්කොම බහින්ඩ!" රියැදුරු අණ දුනි. සීරා හැර සියල්ලෝ බැස්සහ.

"අපි තල්ලුවක් දෙමු! ඔක්කොම එකට, හා ඕං!"

"එකයි, දෙකයි, තුනයි!"

"හැමෝම එකට හා!"

"ඔන්න ගියා!"

"ජයවේවා!"

බසය ගැස්සිණි, ඇන්ජිම දෙවරක් කිවිසුම් හැර පණ ගැන්විණි.

"ආපහු නගිනවලා!"

අපි යළිත් අසුන් ගතිමු. බසය ගැස්සී ගමන ඇරඹී ය.

ප්‍රීතිමත් සවාරිය ඇරඹිණි.

සීරා පසෙකින් හිඳගෙන හුන් මම වරින් වර ඇ දෙස හැංගි හොරා බැලුම් හෙළීමි. මා එහි සිටින බව නොදන්නා බවක් ඇය බොරුවට ඇඟවූවා ය. නෙස්ටර් සිටියේ ඔටාර් ගෙනා වයින් බඳුනක් සුරතල් කරමිනි. ඔටාර් අපේ මඟපෙන්නා හා සමඟ සාමීචියේ ය. ෂෝටා ගීතයක් මුමුණයි. මම මීයකු මෙන් නිසලව, මා උරමින් සිටි සිගරැට්ටුවෙන් සීරාට අපහසුවක් නොවන ලෙසින් දුම වෘත්තිය සමිති සංවිධායකයා දෙසට පිඹහරිමින් හුනිමි.

"තමුසෙට ඔය දුම වෙන අතකට පිඹින්ඩ බැරි ද වෂලොම්ඩසේ?"

"මොන අතට ද?"

"මගේ මූණට නොවදින ඕන අතකට... තමුසේ අහම්බෙන්වත් අයමුදල් ගෙවුව ද?"

"ඔව්."

"කවද්ද?"

"ඊයේ, ඔහේට මතක නැති වුණා ද?"



"මට එහෙමට මතකයක් නෑ."

"ඔහේට මතක තියෙන්නෙ මොනව ද! එක්කෝ ඔය සෙංගෙඩි කපා ගන්නවා, නැත්තං වෙන මොනවා හරි කරනවා ඔය මතක වැඩිදියුණු කරගන්ඩ. එහෙම කරලා ඔහේගෙ ඔය මෝඩ අයමුදල් ගැන සිය වතාවක් අහ අහ මිනිස්සුන්ට කරදර කරන එක නවත්තනවා."

සංවිධායකවරයා නැඟිට බසයේ පසුපසට යන්නට ගියේ ය.

බසය දැන් ගමන් ගනිමින් තිබුණේ ජෝර්ජියානු හමුදා මහ මඟෙහි ය.

"දකුණු පැත්ත දිහා බලන්න. මේ තමා මට්ක්වාරි ගඟ." මඟපෙන්වන්නා තම දේශනය ඇරඹී ය.

"එහෙම ද? ඔහේට ඒ මට්ක්වාරි කියලා සහතික ද?" ෂෝටා විශ්මයෙන් හඬ තැලී ය.

නෙස්ටර් කොක්හඬලා සිනා සී ඔටාර් දෙසට හැරුණි.

"ඔටාර් මොකුත් හපන්ඩ හෙම වෙලාව නෙවෙයි ද? මට නං බඩගිනියි."

සැමදෙන ම සිනාසුණහ.

"නුඹ දවසකට වේල් කීයක් කනව ද?" කවුදෝ විමැසී ය.

"මට ලැබෙන තරමට තමා. ඇයි මට මොකුත් දෙන්නෙ නැත්තෙ?"

"දකුණ බලන්න." මාර්ගෝපදේශකයා තම ගමන් විස්තරය නොකඩවා ගෙන ගියේ ය. "මේ තමා ජලවිදුලි බලාගාරය. අපට විදුලිය ලැබෙන්නෙ මෙතැනින්... දකුණට වෙන්ඩ ඇතින් කඳුකරේ තියෙන්නේ ජ්වේරි[1] ආශ්‍රමය. ඒක ගොඩනැඟුවේ දූරාතීතයේ. ඒත් ඒක තාමත් නටබුන් වෙලා නැහැ..."

"ඔක කවද විතර නටබුන් වෙයි කියල ද ඔයා හිතන්නේ?" සීරා ඇසුවා ය.

උගුලක් ඇටවුණු බව දැනුණු මාර්ගෝපදේශකයා බුද්ධිමත්ව ඊට පිළිතුරු දීමෙන් වැළකුණි.

මඳ විරාමයකින් පසු ඔහු යළි කතා කරන්නට විය.

"මේ ආශ්‍රමයත් එක්ක සම්බන්ධ පුදුම සහගත වගේම ලස්සන පුරාවෘත්තයක් තියෙනවා... ඒකේ ස්වාමි කෙනෙක් වාසය කළා...

1 ජ්වේරි ආශ්‍රමය ඇත්තේ මට්ස්කෙටා නගරය ආසන්නයේ ය. 6 වැනි සියවසේ ඉදි වූ එය පුරාතන ජෝර්ජියානු ගෘහනිර්මාණ ශිල්පයේ ප්‍රධානත ම සිහිවටනයකි.

මට එයාගෙ නම අමතකයි. එයා සාමාන්‍ය ජීවිතයේ පුහු ආටෝප‌වලින් ඈත්වෙලා හිටපු තාපසයෙක්... එයා ඉඳහිටලා මට්ස්කෙටා නගරෙට බෑස්සේ මහ ප්‍රපාතයක් වගේ තිබ්බ පාරේ ඇදලා තිබුණු දම්වැලක එල්ලීගෙන. ඉතිං දවසක් මේ ස්වාමි දම්වැල අල්ලාගෙන පහළට බහිනවා. ඔන්න එතකොට එයාට පෙනුණා ලස්සන ළමිස්සියක් නිරුවතින් මට්ක්වාරි සහ ආරග්වි ගංගාවල නාන හැටි..."

"එකම ළමිස්සි එක වෙලාවෙ ගංගා දෙකක නානවා?" රියැදූරා සැකමුසුව ඇසී ය.

"දකුණු පැත්ත බලනවා – ගංගාවල් දෙක එකට එක්කහු වෙලා ගලන තැන තමයි මේ!"

"අහා, ඉතිං කතාව කියනවකෝ!"

"ස්වාමි හොරාට අර නිරුවත් ගෑනු ළමයා දිහා බැලුවා..."

"ස්වාමි හොරාට අර නිරුවත් ගෑනු ළමයා දිහා බැලුවා..."

"එයා බැලුවා එහෙනං, නාකි එළු තඩියා, එහෙම ද?" රියැදූරා මහත් ප්‍රමෝදයෙන් කී ය.

"ඔව් එහෙම කළා. ඒ වගේ ම මතක තියාගන්න, ඒ කාලේ ස්වාමිලාට අවසර දීලා තිබුණේ නෑ නිරුවත් ගෑනු ළමයි දිහා බලන්ඩ..."

"ඉතිං මිනිහා නීති කැඩුවා..." රියැදූරා ඇසී ය.

"නිරුවත් ගෑනු ළමයෙක් දිහා බැලුවම මොකද වෙන්නෙ කියලා හැමෝම දන්නවා. අසරණ ස්වාමිට කැරකිල්ල හැදුණා. එයාට දම්වැල අතෑරිලා ගඟ පහළට ඇදගෙන වැටුණා. ඉතිං මිනිහා ගිලිලා මළා." මාර්ගෝපදේශකයා ශෝකාකුලව සිය කතාව අවසන් කළේ ය. එම පුදුම සහගත සහ ලස්සන පුරාවෘත්තයේ අවසානය එය විය.

"එච්චර ද?" රියැදූරු ඇසී ය.

මාර්ගෝපදේශක හිස සැලී ය.

"හැම විනාසයක් ම එන්නේ ගෑනුන්ගෙනුයි, සූදුවෙනුයි, වයින්වලිනුයි..." රියදූරු කීවේ ය. "ටික දවසකට කලින් මම රුස්ටාවෙලි පාර දිගේ බස් එක අරන් යමින් ඉන්දැද්දී මං දැක්කා දේවදූතියක්! ඇට පියාපත් තිබුණේ නෑ තමා, ඒත් දේවදූතියක්මයි, දෙවියන් වහන්සේ මා වෙනුවෙන් සාක්කි දෙයි. ඇත්ත, එයා උන්නේ කොහෙත් ම නිරුවතින් නෙවෙයි... 'තරුණ නෝනා මේ පැත්ත බලන්ඩකෝ!' මම එයාට කතා කළා. එයා හැරිලා බැලුවා... මටත් අර සුවාමිට වගේ කැරකිල්ල ආවා. ඊළඟ මොහොතේ දඩාස්





ගාලා සද්දයක් ආවා. බස් එක වොල්ගා කාරෙකෙක හැප්පිලා. ඔහොම වෙලාවක හැම වෙලේ ම සිද්ධ වෙන්නා වගේ කොහෙන් දැයි කියලා හිතාගන්ඩ බැරි තැනකින් පොලිස් නිලධාරියෙක් මතු වුණා. මාර්ගාරක්ෂක පොලීසිය තමා අපේ දෙයියා. එක ම වෙනස දෙවියන් වහන්සේ පාත් වෙන්නේ අහසේ ස්වර්ගයෙන්, පොලිසිය මතුවෙන්නේ පොළොව පලාගෙන යටින්, එච්චරයි... ඉතිං කතාවෙ ඉතුරු හරිය ඔහේලට එච්චර රසවත් නෑ." රියැදූරු තම ශෝකී සහ උපදේශාත්මක පුරාවෘත්තය නිම කළේ ය.

"දකුණ බලන්න!" මාර්ගෝපදේශක යළිත් සජීවී විය. "ඔබ ඉදිරියේ තියෙන්නේ ස්වෙටිට්ස්කොවෙලි ආසන දෙව්මැදුරයි[1]. එය සෑදූ ගෘහනිර්මාණ ශිල්පියාගේ දකුණු අත සාර්ගේ අණක් අනුව කපා දැම්මා."

"ඒ ඇයි?" නෙස්ටර් ඇසී ය.

"කුමන්ත්‍රණයක්... කවුදෝ මිනිහට විරුද්ධව ගතු කියලා..."

"ගොඩනැඟිලි ද්‍රව්‍ය මොනවා හරි හොරකං කරන්ඩ ඇති." රියැදූරු කීවේ ය.

"මේ දෙව්මැදුරට ස්වෙටිට්ස්කොවෙලි කියන්නෙ ඇයි?" සීරා ඇසුවා ය.

"ඒකට එහෙම කියන්නේ... ඔයා හැබෑවට ම ඒකේ තේරුම දන්නෙ නැද්ද?"

"මං දන්නෙ නෑ."

"මෙතන ඉස්සර කුලුනක් තිබුණ හින්දා..."

"එතකොට සත්තු ආවෙ කොහෙන් ද?" නෙස්ටර් විමැසී ය.

"කැලෑ සත්තු මේ වටපිට කැලේ ජීවත් වුණා." ෂෝටා පැහැදිලි කළේ ය.

"වම් පැත්ත බලන්න!" මාර්ගෝපදේශක නිවේදනය කළේ ය. "මේ තමා අපේ ජාතික වීරයා ආර්සෙනා මරබ්දෙලිගේ[2] සොහොන."

---

1 ස්වෙටිට්ස්කොවෙලි යනු මට්ස්කෙටාහි ඇති ආසන දෙව්මැදුරකි. 11 වැනි සියවස මුල්භාගය තෙක් ඈතට විහිදෙන අතීතයක් ඇති එය සිහිවටනමය ගොඩනැගිල්ලකි. එහි ගෘහනිර්මාණ ශිල්පියා වූයේ ආර්සකිඩ්සේ නමැත්තා ය. 'ස්වෙටිට්ස්කොවෙලි' යන්නෙහි තේරුම 'ජීවිතය දෙන වැඹ' යන්න ය. 'ට්ස්කොවෙලි' යන්නෙන් 'තිරිසන් සතෙක්' යන්න ද අදහස් වේ.

2 ආර්සෙනා මරබ්දෙලි – මරබ්දා හි ආර්සන්. ඔහුගේ සැබෑ නම වූයේ ආර්සන් ඔඩිසෙ-ලැෂ්විලි යන්න ය. ඔහු වහල්භාවයට එරෙහිව සටන් වැදුණු ජනප්‍රිය වීරයෙකි. උපත 1800 වන අතර 1842 දී මරා දමනු ලැබිණි.

"ආර්සෙනා? මං එයාව දන්නවා."යි හඬතැලූ රියැදුරු ඔහු ගැන වූ කවියක් කියන්නට විය.

ලූර්ජා නම් අසු පිට නැගිලා – ආර්සෙනා අපගේ
කදිම අසරුවෙක් නොවේ ද මේ – සැදල මත්තෙහි හිඳිනා…
මාල වළලු තෝඩු ද සමඟින් අගනා දෑ
ඔහු දුන්නා ඈ වෙත බොහොමින්…
පොහොසත් උන්ගෙන් උදුරා ගත් හැම
බෙදනෙමි දුප්පත් උන් අතරෙහි…[1]

දහවල් මැදියම වන විට අපි ඩිසෙග්වි ගමට ළඟා වුණෙමු. පාරුවකින් ගඟ තරණය කළ අපි ෂිම්ග්විම් කන්දෙහි බෑවුම දිගේ උඩට නගින්නට වීමු. මම සීරා ළඟින් ම ගමන් ගතිමි. එහෙත් ඈ කොහෙත්ම මා දෙස බැල්මක් නොහෙලුවා ය. එදා ස්මරණීය රාත්‍රියෙන් පසු ඈ මා මගහරිමින් සිටින්නී ය. මා ඉතා තදින් ඇය ප්‍රියා කළා සේ ම ඇය හා මිතුරු වීමට මට ඕනෑ විය. කොහොමටත් මා සමඟ සදහට ම රණ්ඩු දබර වී සිටින්නට සීරාට සැබැවින් ම ඕනෑ නැති බව මට සහතික විය. එහෙත් ඈ සිටියේ මා හා කතා කිරීමේ ලැජ්ජාවකිනි.

"සුරිකෝ!" ඒ නෙස්ටර්ගේ හඬ ය. "ඔය ගෑනු ළමයට තනියෙන් ඉන්ඩ ඇරහං! පේන්නෙ නැද්ද එයාගෙ කැමැත්තක් නෑ කියලා? ඇවිත් අපට පොඩි තල්ලුවක් දෙනවා."

ඔවුන් වෙත එක්වුණු මම වයින් පිරි මල්ල මාරුවෙන් මාරුවට ගෙන යන්නට උදවු වුණෙමි. අප සැමදෙන ම පෙණවලින් වැසී ගොස් සිටියෙමු.

සීරා අප ඉදිරියෙන් ඇවිද ගියා ය. ඈ නිතර නිතර ම නැවී මලක් කඩා ගත්තා ය. මම මල්වලට මහත් සේ ඇලුම් කරන්නෙමි. එක් මලක් දෙස බැලීමෙන් මලින් ගැවසීගත් මුළු තණබිමක් ම දකින්නට මට හැකි ය. නොඑසේ නම්, එකම එක මලකට වඩා වෙනත් කිසිවක් නොදැක දවස තිස්සේ මුළු යායක් පුරා ම මට ඇවිද යා හැකි ය. උඩුබැලිව වැතිර පැය ගණනක් පුරා අහස දෙස බලා සිටින්නට මට හැකි ය. ඒ මුළු අහසම සැරසී ඇත්තේ මල්වලිනි. මම මල්වලට

1 ගැමි කවියක් වූ 'ආර්සෙනා ගැන කතාන්දරයෙහි' පේළි පටලවා මාරු කරමිනි රියැදුරු මේ කවිය කියන්නේ.



ආදරය කරමි, ඒවා කඩනු මට බලා සිටින්නට නොහැකි ය. කැඩූ මල් මම පිළිකුල් කරමි. මට ඒවා සිහිගන්වන්නේ අවමංගල මල් වඩම් ය…

ආශ්‍රම උද්‍යානයේ දී අපට තරුණ ප්‍රීතිමත් පූජකවරයකු මුණගැසිණි. මහත් ලොලකින් වයින් මල්ල දෙස බැලූ ඔහු අප කවුදැයි ඇසී ය. අප විශ්වවිද්‍යාල සිසුන් බව ඇසීමෙන් ඔහු දොම්නසට පත් බවක් පෙනිණි.

"කොම්සොමෝල්[1]* සාමාජිකයො ද?"

"අපි හැමෝම!" සංවිධායකයා කීවේ ය.

"එහෙනං මට ඔහේලට පල්ලියට ඇතුළු වෙන්ඩ දෙන්ඩ බෑ. අදේවවාදීන්ට දෙවියන්ගේ නිවහනට ඇතුළු වෙන්ඩ අවසර නෑ."

"මම කොම්සොමෝල් සාමාජික මුදල් මාස දෙකෙකින් ගෙවලා නැහැ. මට ඇතුළු වෙන්ඩ දෙනව ද?" මම ස්වාමිගෙන් ඇසීමි.

"සත්තකින් ම පුළුවනි!" ඔහු සිනාසෙමින් කී ය.

"අපි මෙහේ ආවේ යාච්ඤා කරන්ඩ නෙවෙයි, ඓතිහාසික සිහිවටනයක් බලන්ඩ!" වෘත්තීය සමිති සංවිධායකයා කීවේ කෝපයෙන් දැවෙමිනි.

"එතකොට ඔහේ කවුද?"

"මම තමා වෘත්තිය සමිති කමිටුවේ සභාපති."

"බොහොම හොඳා එහෙනං, ඔයාලා හැමෝටම ඇතුළට යන්ඩ පුළුවනි. හැබැයි කරුණාකරලා තොප්පි ගලවලා කකුල් පිහදාලා යන්ඩ. බිත්තිවල මොකුත් ලියන්ඩ එපා!"

දොරටුව වෙත ගිය ස්වාමි අගුල හැර දොර හැරියේ ය. ඉක්බිති කුරුසය ලකුණු කළ ඔහු ඇතුළට පියමැනී ය. අපි ඔහු පසුපස ගමන් ගතිමු.

පල්ලිය හඳුන්කූරුවල සහ ඉටිපන්දම්වල පුසුඹෙහි තදින් වෙළී තිබිණි. දිවා ආලෝකයේ පාණ්ඩු පැහැ ආලෝක තීරු ජනේලවලින් පෙරී විත් බිම පුරා කතිරමය රටාවක් සැදුවේ අද්භූත ඇඳිරිය යාන්තමින් පලවා හරිමිනි. පසුගිය සියවස්හි වැකරැළි ගැසුණු මුහුණු ද, විසල් බුද්ධිමත් දෑස් ද, හරහට බැඳගත් සිහින් අත් ද ඇඳිරි බිත්තිවල සිට අප වෙත එබී බැලූහ.

"මේ චිත්‍රයේ තේරුම මොකක් ද?" එසේ ඇසුවේ නෙස්ටර් ය.

1 කොම්සොමොල් යනු තරුණ කොමියුනිස්ට සංගමය යි.

"ඒ ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැඟිටීම." ස්වාමි පිළිතුරු දුනි.

"එයාට අද නං මළවුන්ගෙන් නැඟිටින්න එච්චර අවස්ථාවක් නෑ!" ෂෝටා කීවේ ය.

"මං දැනං හිටියා කොම්සොමොල් සාමාජිකයින්ට පල්ලිය ඇතුළට එන්ඩ දෙන්ඩ හොඳ නෑ කියලා." ස්වාමි දුක්බරව කීවේ ය.

"යාළුවා ඔය කන්කෙඳිරිල්ල නවත්තනවා!"

"මං ඔහේගෙ යාළුවෙක් නෙවෙයි! මට පියතුමා කියලයි කතා කරන්ඩ ඕනෑ!"

"එතකොට මගේ හැබෑ පියතුමාට මං මොකක් ද කියන්නේ?"

"නුඹ කැමති ඕන එකක්..."

"ඔහේ වැරදිලාවත් සාන්තුවරයෙක් හෙම නෙවෙයි නේද?"

"ඒ ඔක්කොම ඇත්තේ දෙවියන් වහන්සේ අතේ..."

"එතකොට මේ චිත්‍රය මොකක් ගැන ද?" එසේ ඇසුවේ සීරා ය.

"එයින් පෙන්වන්නේ ජුදාස් ජේසුස් වහන්සේව පාවාදීම."

"ආන් බලමු ඒකේ හැටි: තමුන්ගේ ම සහෝදරයා ගැනවත් විශ්වාස කරන්ඩ බෑ. රිදී තිහක් ගැන කතා කරන්ඩ දෙයක් නෑ, ඒකා ඔහේව විකුණාවි කුකුල් කෑම ටිකකට." රියැඩුරා කීවේ සුසුමක් හෙළමිනි.

"දෙවියන් වහන්සෙ කියල කෙනෙක් නෑ!" වෘත්තීය සමිති සංවිධායකයා හිටිහැටියේ ම නිවේදනය කළේ ය.

"නැද්ද? මං අහලා තියෙන්නේ එයා උඩ අහසේ ඉන්නවා කියලා." සීරා සරදම්කාරී බැරෑරුම් බවකින් යුතුව කීවා ය.

"අහසේ තියෙන්නෙ අහස්යානා විතරයි." රියැඩුරු ද දායක විය.

"ඔහේලට සහතික ද දෙවියන් නැහැ කියලා?" මාර්ගෝපදේශකයා ඇසුවේ සරදම්කාරී සිනාවක් පාමිනි. "දවස් කීපෙකට උඩ දී මම පාර දිගේ ඇවිදගෙන යද්දී එක පාරට මං ඉස්සරහින් පදික වේදිකාවට ගඩොලක් වැටුණා. මාව බේරුණේ නූලෙන්. හිතාගත්තැහැකි ද ඒක? මං තව අඩියක්, අඩි බාගයක් තිබ්බා නං... ඔහේලා තාම හිතන්නේ දෙවියන් නැහැ කියල ද?"

"දෙවියන් හිටියා නං අර ගඩොල තමුසෙගෙ මෝඩ ඔළුවේ වදින්ඩ තිබ්බා!"යි කී මම අඩිය උස්සා පල්ලියෙන් පිටවීමි.

දෙවියන් පිළිබඳ වාදය කෙසේ අවසන් වී දැයි මම නොදනිමි, එහෙත් සැමදෙනා ම පල්ලියෙන් පිටතට ආවේ දරුණු බඩගින්නකින් යුතුව කෑම සඳහා මහත් සෝෂාවක් කරමිනි.



අපි පල්ලිය කිට්ටුව තණකොළ්ලෙහි රෙද්දක් එළා එක් එක්කෙනා ගෙනා දේ එහි තබා කටයුතු ඇරඹුවෙමු. සව්දිය පුරන්නා මාරුවෙන් මාරුවට තෝරා ඔහුගේ සිතේ ඇති දෑ කියා සව්දිය පුරන්නට අපි තීරණය කළෙමු.

පළමු සව්දිය පිරුම යෝජනා වූයේ රියැඩුරු වෙතිනි.

"මං අවාසනාවන්ත මිනිහෙක්. මිනිස්සු කන්ඩ බොන්ඩ වාඩිවෙන හැම වෙලේ ම බොහොම ප්‍රීති වෙනවා. ඒත් මං පිපාසෙන් බලාපොරොත්තු සුන් කරගන්නවා, මොකද අපි රියදුරෝ නොබී ඉන්ඩ ඕනෑ හින්දා... හිතමුකෝ මෙතන තියෙන මේ වයින් මම බිව්වා කියලා. ඊට පස්සේ බස් එක හෙළකට කැපුවොත්?... ඇත්තවශයෙන් ම මං කියාවි තිරිංගවල දෝසයක් හරි ඕං ඔය වගේ මොකක් හරි... ඒක පරීක්ෂා කරන්ඩ ලේසි නෑ. ඒත් මාර්ගාරක්ෂක පොලීසිය රවට්ටන්ඩ බෑ. එයා ළඟට ඇවිත් මෙහෙම කියනවා, 'අපි බලමුකෝ ඔහේගෙ හුස්ම කොහොම සැර ද කියලා යාළුවා! අහා, බීලා නේද? මං ඒක ලියාගන්නං: රියැඩුරා සිටියේ ඇල්කොහොල් මතිනි'. ඉතිං කවුද මගේ රැකවරණේට ඉන්නේ. ඔහේලගේ සාර්කිස් රියැඩුරා ටිබිලිසියේ උසම ගොඩනැගිල්ලේ ලගීවි..."

"කොයිකෙ ද? තට්ටු එකොළහේ ගොඩනැගිල්ලෙ ද?" ඔටාර් ඇසී ය.

"හිරගෙදර!"

"ඇයි හිරගෙදරට වඩා උස ගොඩනැගිල්ලක් ටිබිලිසියෙ නැද්ද?" මම ඇසුවෙමි.

"නෑ, හිරගෙදර තමා උසම එක. ඒකෙ ජනෙල්වලින් චුකොට්කා නගරෙත් පේනවා."

"මට ඔහේව තේරෙනවා."

"ඔහේට මෙලෝ දෙයක් තේරෙන්නෙ නෑ. හොඳා, ඔහේගේ ශරීර සුවයට එහෙනං ඕං ඈ!"

එකක් පසුපස එකක් බැගින් සව්දිය පිරීම් සිදුවිය. අපි මිත්‍රත්වය, ආදරය, සංස්කෘතික සිහිවටන, විද්‍යාත්මක සොයාගැනීම්, අපේ මුතුන්මිත්තන් සහ අපේ මව්පියන් වෙනුවෙන් බිව්වෙමු. සව්දිය පිරුම් කීයක් දැයි ගණන් මිනුම් නොවී.

ස්වාමි මුල දී බීම ප්‍රතික්ෂේප කළත්, හතරවැනි වටයට පසු ස්වෙච්ඡාවෙන් ම මධු-සේවකයාගේ කාරිය බාර ගත්තේ ය. ඔහු අපට වයින් වත්කරන සෑම වතාවක ම බඩගිනිකාර වස්සකු මෙන්

එළිව බටය ඉදිරිපිටි ය. අපේ භෝජන සංග්‍රහය අවසන් වෙන්නට ආසන්නයේ ඔහු සකාවකට අවසර ඉල්ලී ය. ඉන්නා ගනමින් සහ බැලෙමින් ඔහු එහෙ ස්වයංකෝෂය ඉදිරිපත් කළේ ය.

"ඉරානයේ මා අම්මාගේ මේ ආශ්‍රමයේ දී... ඔහේලා දන්නවා ද ඇයි ගොයෙන් විස්සේ සාතිටෙ 'අසාර්' කියන්නෙ කියලා?... මා අම්මාගේ ජෝර්ජියානු ස්වාමින් දුකෙදුනා ගාමෙණ් විසි චතාවක් අටගෙන කෙලී කැලුවා! ඇයි එයා ඒක කළේ? ස්වාමිලා දෙවියන් කියන්නෙ බොඩියක් නෙවෙයි... සාගේ අත්තම්මාත් ජෝර්ජියන් කාන්තාවක් තමි... ස්වාමි කෙනෙක් වළක වාඩිවෙලා තැම බීම ප්‍රතික්ෂේප කරලා හිටියා... ඇයි එහෙම?"

"මෙහෙ බලනවා ගාවලා!" ෂෝටා පුපුරා හැලුණි. "ඔහේ ස්වාමි කෙනෙක් ද, නැත්තං දේශනායෙක් ද? මොකද තමුසේ මය 'ඇයි'වලින් අපට වද දෙන්නේ? ඇයි කියලා අපි දන්නෙ කොහොම ද ඉලව්වේ. තමුසෙ ම කියනවා බලන්ඩ!"

"මං කියන්නං ඔහේට... මං කියන්නං ඔහේලා හැමෝට ම... ඒක හැබෑට ම හරි සරලයි... අපි කා වෙනුවෙන් ද බොන්නේ? අපි බොමු දෙවියන් වහන්සේ වෙනුවෙන්! අපි උන්නාන්සේගේ ශරීර සුවය, ප්‍රීතිය, අවුරුදු සීයක ජීවිතය සහ ඔහුගේ සියලු ප්‍රාර්ථනාවන් සඵල වීම කියන දේවල් ඉටුවේවා කියලා බොමු! මේ ගෙදර වෙනුවෙන් බොමු! දෙවියන් වහන්සේ මෙහි ස්වාමියාටයි, ස්වාමිදූවටයි ප්‍රීතිමත් ජීවිතයක්... පුතුන් දොළහක් සහ දියණියන් දොළහක් ප්‍රදානය කරන්වා... ජේසුස් ක්‍රිස්තුස්ටත් අපෝස්තුලුවරු දොළහක් උන්නා... මම ස්වාමි කෙනෙක්... ඇයි? හික්...!"

'ඇයි?' යන්නට පිළිතුරක් නොදීම ස්වාමි නින්දට වැටුණි. එහෙත් මම එය දැන සිටියෙමි. වානර-මිනිසාගෙන් කෙළින් ම පැවතෙන්නා සමග විවාහ වන්නට කැමති වන ගැහැනියක් මේ මුළු මහත් ලෝකයේ ම සිටින්නට ඉඩක් නැත. ඉතිං ඔහුට ඉතිරි වී තිබූ එකම දෙය ස්වාමි කෙනකු වීම ය.

ඉන් පසු එළැඹියේ මගේ සචිදිය පිපීමේ වාරයයි. මම වීදුරු පුරවා කතාව ඇරඹීමි.

"හිරු දිගුකල් දිනේවා!"

"මොන හිරු ද? දැනටමත් රෑ වෙලා!" ෂෝටා කෙඳිරී ය.

"ඒත් මට ඉර පේනවා!" මම උදක්ම කීමි.

"හොඳ කොල්ලා!" ඔටාර් අනුමත කරනසුලුව කී ය.





"ඔව ඉර් දකින්න පුළුවනි! තුම්ලාත් ඒක දකින්න ඕනෑ. ඊශ්‍රර භූගෝන් තුම්ලා සම්පූර්ණ අන්ධයෝ!"

"ඇත්තවශයෙන් ම අපට ඒක පේනවා," නෙස්ටර් කීවේ සද දෙස බලමිනි.

"නෑ, මේ සඳ, ඒත් තුම්ලා හිරු දකින්ට ඕනෑ!" මම විරෝධය පෑමි.

"උඹ බීලා වෙරිවෙලා!" නෙස්ටර් කීවේ ය.

"මම මියෝ මිග්විමෙලි![1]"

"තුඹ පූරිකෝ වමෙලොම්ඩයේ!" පූරිකෝ කීවේ ය.

"එහෙනම් තුඹ සෙරබියෝනා!"

සෙරබියෝනා යනු කවුරු දැයි නෙස්ටර් දැන සිටියේ නැතිමෙන් ඔහු කේන්ති ගත්තේ නැත.

"මම ගෙදර යනවා!"යි කී මම නැගිට්ටෙමි.

"ඉතිං පලයං, ආන් අරක තමා කෙටිම පාර," ඔටාර් කීවේ ය.

"සීරා, ඔයා මා එක්ක එනව ද?" මම ඇසුවෙමි.

"ඒ මොකට ද එයා තුඹ එක්ක එන්නේ?" ඔටාර් ඇසුවේ ය.

"ඒක තමුසෙගෙ වැඩක් නෙවෙයි!" මම කඩා පැන්නෙමි.

"ඔයා හැබෑට ම මේ මෝඩයා එක්ක යනව ද?" ඔටාර් සීරාගෙන් ඇසුවේ ය.

"මම මෙතන ඉන්නවා," සීරා කීවා ය.

"මා එක්ක?" ඔටාර් ඇසුවේ ය.

"හැමෝ ම එක්ක."

"ඔටාර් කියන්නෙ හැමෝම ද?" මම උපහාසයෙන් ඇසීමි.

"ඇයි ඔටාර්? නෙස්ටරුත් ඉන්නේ..."

"නෙස්ටර් නිදි."

"ඉතිං ඈ මාත් එක්ක ඉන්නවා," ඔටාර් කීවේ ය.

"තුඹත් මිනිත්තුවෙන් නිදා ගනීවි," මම කීවෙමි.

"නෑ මං නිදාගන්නෙ නෑ," ඔටාර් ඇණුම් හැරියේ ය.

"තුඹ නිදාගන්නවාමයි!"

"මං නිදාගනීවි ද සීරා?"

"මොකෝ නැතුව, ඔයාට නිදිමත ද?"

ඔටාර් තණගොල්ලෙහි දිග ඇදී එක්වරම නින්දට වැටුණේ ය.

1 මිග්විමෙලි යනු ළමයින් සඳහා කවි ලියූ ප්‍රමුඛ ජෝර්ජියානු කිවි මියෝ තුටුකාශ්විලිගේ පුරතල් නාමයයි.

"සූරිකෝ් ඔයාත් නිදාගන්න... මගේ උකුලේ ඔයාගෙ ඔළුව තියාගන්න..."

"සීරා, මං වයින් වීදුරුවක් බොන්න ආසයි."

"ආ මෙන්න."යි කී ඇය මට වීදුරුවක් දුන්නා ය.

"ඔයා ලස්සන කෙල්ලක්, සීරා!"

"මම දන්නවා..."

"එතකොට මම වානරයෙක්!"

"මම දන්නවා..."

"ඇයි එහෙනං ඔයා මට ආදරේ කරන්නේ?"

"මම දන්නෙ නෑ..."

"නොදන්නාකමට ජයවේවා! අසතුටුදායක ලකුණුවලට ජයවේවා! ඉලිකෝ්ට, ඉලේරියන්ට, මගේ අත්තම්මාට ජයවේවා!"

"මට නුඹේ ඔය ඉලේරියන් එපා වෙලා!" ඔටාර් අවදිවෙමින් මැතිරී ය.

"සීරා මා එක්ක එන්න." මම කීවෙමි.

"කොහාට ද?"

"කොහේටවත් නෙවෙයි... එන්න."

"මට බයයි!"

"බයවෙන්න එපා!"

සීරා පැකිළෙමින් මා පසුපස ආවා ය.

"සූරිකෝ්!"

"ඇයි සීරා?"

"ඇයි ඔයා කතා බහක් නැත්තේ? මට හොඳට ම ලැජ්ජයි... ඔයා මට ආදරෙයි නේද? ඇයි ඔයා ඒක පිළිගන්නෙ නැත්තේ එහෙනං?"

"සීරා, ඔයා දාහකින් හොයාගන්ඩ බැරි කෙල්ලක්!"

"ඔයා ඕක කලින් ම කියලා තියෙනවා!"

"ඔයාට බෑ සීරා මට ආදරේ කරන්ඩ... මං දැන් බීලා, බීපු වෙලාවට මං කතා කරන්නේ ඇත්ත... ඔයයි... මමයි... ඔයා ලස්සන කෙල්ලක්... ඔයා මට ආදරේ කරන එක මට ඕන නැහැ... මං ඔයාගෙ ආදරේට තරං වටින්නෙ නෑ..."

"කට වහගන්න සූරිකෝ්!"

"මම තක්කඩියෙක්!... මං කවදාවත් හිතුවෙ නෑ ඔයා මට ආදරේ කරාවි කියලා. ඔයා දන්නෙ නෑ මං කොච්චර නරක ද කියලා... ඔයා ඒ තරමට හොඳයි... මට ඉන්නවා..."



"මොකවත් කියන්න එපා සූරිකෝ්!"

"නෑ, මං ඔයාට කියන්ඩ ම ඕනෑ... මට ඉන්නවා... කෙල්ලක්... එහේ, ගමේ... මං ඇට ලෝකේ තියෙන හැමදේට ම වැඩිය ආදරෙයි... ඈ මට මගේ ජීවිතේටත් වැඩිය වටිනවා... ඔයා එයාට වඩා හොඳයි, දහස් වාරයක් හොඳයි. ඒත් මං ආදරේ කරන්නේ ඇට. ඈ මගේ ඉර, මගේ තාරකාව... එයාගෙ නම මේරි... ඔයා ඒ ගැන දැනගන්න ඕනෑ..."

මගේ කටහඬ බිඳිණි. තිත්ත ගුළියක් මගේ උගුරෙහි හිරවිණි. වදනක් හෝ තෙපලාගත නොහැකිව හිස පහත් කොටගත් මම නිහැඬියාවට වැටුණෙමි.

සීරා ගල්ගැසී සිටගෙන උන්නා ය. පුළුල්ව ඇරුණු ඇගේ තිල් දෑස්හි කඳුළු හෝ දෝෂාරෝපණය නොවිණි. තිබුණේ මහත් විස්මය පමණකි. එක්වරම සිය භ්‍රාන්තිය ගසාහල ඇය මා වෙත පැමිණ මුළු වෙර යොදා මගේ මුහුණට අතුල් පහරක් දුන්නා ය. මම නොසෙල්වුණෙමි. ඉක්බිති දෑතින් මුහුණ ආවරණය කොටගත් ඇය මගේ පපුවට වාරු වී ඉකිබිඳින්නට ගත්තා ය.

සීරා වටා දෑත් යැවූ මම ඇයව යළි එළිමහනට කැඳවාගෙන ගියෙමි. ඉන් පසු මම ඇය තවමත් නින්දේ සිටි ඔටාර් පසෙකින් හිඳුවා, ඇගේ දෑත් සිඹ වදනකුදු නොදොඩා පිටවුණෙමි.

පැරණි සීනු කුලුන වෙත ආ මම පඩිපෙළ නැග ඉහළ වේදිකාව වෙත පැමිණ නැවුම් රෑ සුළං උරා බී මගේ පෙණහලු ඉඩදෙන තරම් මහ හඬින් බෙරිහන් දුනිමි.

"ඔහෝ... හෝ... හෝ!"

"ඔහ්හෝ... හෝ!" දෝංකාරය ආපසු ආවේ ය.

මම සීනුව අතගා බැලීමි. එහි වූ ඝන පාසි තට්ටුව මත දූවිලි පිරී ගොසිනි. මම එහි අමු යකඩ මුහුණතට මිටින් ඇන්නෙමි. දිගු වේලාවක් පවත්නා බොල් හඬක් මතුවිණි. එක්වරම හිස කරකැවෙන බවක් මට හැඟිණි. ලෝකය මා වටා කරකැවෙන්නට විය. ඇදවැටීමෙන් වළකින්නට මම කඹයෙහි එල්ලුණෙමි.

"ටාං...ං...ං!" සීනුව කෙඳිරිගෑවේ ය.

මම කඹය යළි යළිත් ඇද්දෙමි.

"ටාං!... ටාං!... ටාං...ං...ං!" සීනුව ගැයී ය.

හඬවල් මුල දී වෙනස් වෙනස් රිද්මය බිඳු ලෙසින් පෙරළී ගියේ ය, ඉක්බිති ඒවා එකට මුසු වී නොනවතින රැළි ලෙසින් පාව ගියේ

ආශ්‍රම භූමියත්, රාත්‍රියත්, සඳඑළියෙන් බබළන මුළුමහත් ලෝකයත් එයින් පුරවාලමිනි.

සිනුවේ ගීතයට සවන් දෙමින්, යාන්තමින් මගේ සිහිකල්පනාවේ රැඳී සිටින හිරු දෙස බලමින් මම වේදිකාව මත සිටගෙන සිටියෙමි.

## දර

ඉලේරියනුත් මමත් රට කරඹ ගස සෙවණේ හිඳගෙන සාමකාමී කතා බහක යෙදී හුනිමු. විද්‍යාව, දේශපාලනය සහ සාහිත්‍යය ගැන සාකච්ඡා කරන්නට ඉලේරියන් මහත් සේ රුචි කළේ ය. ජීවිතයේ සෑම සංසිද්ධියක් ගැනම තමන්ගේ ම වූ මතයක් තිබූ ඔහුගේ හිස නැවුම් න්‍යායන්ගෙන් පිරී ඉතිරී තිබිණි. ඔහු පිළිගත් එක ම ප්‍රාමාණිකයා මා පමණි. එහෙත් මගේ අදහස් පවා ඔහු පිළිගත්තේ සැකමුසු ස්වරූපයකිනි.

"නුඹ කොහෙන් ද ඒක කියෙවුවේ?" ඔහු සෝපහාසීව අසයි. මම මූලාශ්‍රය කියමි.

"හොඳා... කොහොමටත් ඔය පොත් ලියන්නේ මිනිස්සු. උන් ගැන ඕනවට වඩා විශ්වාස තියන්ඩ එපා..."

පැය දෙකක දේශනයකින් පසු, ලෝකය වටකුරු බව අන්තිමේ ඉලේරියන් ඒත්තු ගත්තේ ය. හරියට ම ලෝක ගෝලය හරහා විදගෙන ගියහොත් ඇමරිකාව හමුවන බව ද ඔහු පිළිගත්තේ ය. ඔහුට තේරුම්ගත නොහැකි වූ එකම දෙය වූයේ, ඇමරිකාවට කෙටි මගක් සෑදීම සඳහා මිනිසුන් ලෝක ගෝලය විදගෙන යන්නේ නැත්තේ මක්නිසා ද යන්න ය.

අසලක වූ ගස් කොටයක් මත හිඳගෙන සිය ගෙතුම් කරමින් ම මේ මොහොතේ අත්තම්මා අපේ සංවාදයට එක් වූවා ය.

"හරි පුතේ එතකොට උඹ කියන්නේ සත්තු පහළ වුණේ මිනිස්සුන්ට කලින් කියලයි. එතකොට එළදෙන්නුන්ගෙනුයි එලිච්චියන්ගෙනුයි කවුද ඒ කාලේ කිරි දෙවුවේ?"

"කිසි කෙනෙක් නෑ! කිරිවලින් කොටහක් පැටව් බිව්වා, ඉතිරි ටික නිකම් අහක ගියා..."

"ඕන් අහපන්කෝ ඉලේරියන්! කිරි නිකම් ම අහක ගියා!"





"ඒකේ දෙයක් නෑ ඔල්ගා හාමිනේ. අහමු එයාගෙන් කොහොම ද වඳුරාගෙන් මිනිහා හැදුණේ කියලා!"

"කියාපන් පුතේ!"

"ඒකෙ මොනව ද කියන්ඩ තියෙන්නේ! ඉලිකෝයි ඉලේරියනුයි දිහා බැලුව නං අත්තම්මට ම බලාගතහැකි!"

"ඒයි හොටුවා කට පරිස්සං කරගන්! කණ්ණාඩියක් ළඟට නැත්තං ගිහින් ළිඳට එබිලා උඹම බලාගනින්!" ඉලේරියන් මහත් සේ කෝපව පිම්බේ ය. "ඉතිං කියාපන් උඹේ ආතම්මාට උඹේ ඥානවන්ත මහාචාර්යවරු උඹේ මොට්ට මොළේට ඔබලා තියෙන දේවල්."

"කොහොමින් හරි ඔහේට මෙලෝ දෙයක් තේරෙන්නෙ නෑ."

"උඹට ලැජ්ජ ද?" බොරු සිනාවක් පාමින් ඉලේරියන් කීවේ ය.

"ඉලේරියන් උඹම කියාපන්කෝ!" අත්තම්මා අයැදියා ය.

"මොනවා කියන්ඩ ද! විකාර ගොඩක්. ඒකා කියන දේට ඇහුන්කන් දෙනවා නං මෙහෙමයි, වඳුරාට බඩගිනි වැඩිවෙලා පොළොව හාරන්ඩ ගත්තා..."

"එහෙම ද? ඊට පස්සේ?"

"ඒකාට වකුටුවෙලා හාරන්ඩ බැරි වුණා, ඉතිං ඌ පස්සා ගාත්වලින් හිටගත්තා."

"ඒක ඇත්ත ද පුතේ?"

"එයා කියන්නෙ බොරු!"

"එතකොට නුඹ ඕක කවදාවත් කීවේ නැද්ද?"

"මං ඒක කීවෙ මෙහෙම ද?"

"මං හිතන්නේ මෙහෙම තමා. නුඹ කියපුවායින් බාගයක්වත් මට තේරුණේ නෑ."

මම ඉවසිලිමත් ලෙසින් අත වැනීමි. ඉලේරියන් දිගටම කියාගෙන ගියේ ය.

"හොඳා ඔන්න ඉතින් ඒකා ඉස්කෝප්පයක් ගත්තා..."

"එයාට කොහෙන් ද ඉස්කෝප්පයක්?"

"මට අහන්ඩ අමතක වුණා. ඒයි මොට්ටයා, කොහෙන් ද වඳුරා ඉස්කෝප්පයක් ගත්තේ?"

"ඇයි ඔහේ දන්නෙ නැද්ද? ඌ කඩේට ගිහින් ඔට්සොයාගෙන් ඉල්ලා හිටියා රූබල් දහ අටක් වටින ඉස්කෝප්පයක් පෙන්නන්න කියලා. ඉතිං ඔහේ මොක ද හිතන්නේ?"

"ඒ කාලේ ඔට්සොයාත් වඳුරෙක් ද?" ඉලේරියන් ඇසී ය.

"ඔට්සොයා ගැන ගත්තොත්, එයා අද වෙනකම් ම වඳුරෙක් තමා!" අත්තම්මා මැදිහත් වූවා ය. "දවස් කීපෙකට කලින් ඒකා මට ඇණ කිලෝවක් වික්කා. ඒකෙ ග්‍රෑම් දෙසීයකට වැඩිය අඩුයි. ඒ මදිවාට මාරු සල්ලි දුන්නෙත් අඩුවෙන්!"

"සුබ පැතුම් අසල්වැසියෙනි!"

අපි ඒ කවුදැයි බැලීමු. ගේට්ටුව ළඟ සිනාසෙමින් සිටියේ ඉලිකෝ ය. ඉලේරියන් ඔහු දෙස මහත් ඕනෑකමින් බලා කතා කළේ ය.

"මට මේක අවංකව ම කියනවා, ඉලිකෝ විගොගිඩ්සේ: නුඹ ආවේ මිතුරෙක් විදිහට ද නැත්තං සතුරෙක් විදිහට ද?"

"ඔහේ කරදර වෙන්ඩ ඕන නෑ, මගේ කොහෙත් ම බලාපොරොත්තුවක් නෑ මගේ අත් ඔහේගෙන් කිළුටු කරගන්ඩ. මං ආවේ අපේ අසල්වැසියන්ගෙන් පොඩි උපදේසයක් ගන්ඩ."

"එහෙනං ඇතුළට එනවා."

ඉලිකෝ ඇතුළට පැමිණ අපට සුබ දිනයක් පතා කොටයක් මත හිඳගති. දුම්කොළ පසුම්බියක් ගත් ඔහු දුම්කොළ ටිකක් හලාගෙන පසුම්බිය යළි සාක්කුවෙහිලා ගත්තේ ය. ඉක්බිති ඔහු අනෙක් සාක්කුව අතපත ගා වෙනත් පසුම්බියක් ගෙන එය අපට පෑවේ ය.

"දුමක් බොමු?"

පසුම්බිය ගත් ඉලේරියන් එය විවරකොට, දුම්කොළ ඉවකොට බලා ආපසු ඉලිකෝට ම දුන්නේ ය. "උඹ දවසකට තුන් සැරයක් බෙහෙත් ගන්ඩ ඕනෑ ඉලිකෝ. බාගදා ඒකෙන් උඹට සනීප වෙයි."

"ආයෙත් ගම්මිරිස් දාල ද?" මම ඇසීමි.

"නෑ, තනිකර පිදුරු!" ඉලේරියන් පිළිතුරු දුනි. "ඉතිං, මොකට ද නුඹ ආවේ?"

ඔහු දෙස බැලීමක් හෝ කළ යුතු බවක් ඉලිකෝ නොතැකී ය. ඔහු අත්තම්මා දෙස හැරී කතා කළේ යඃ

"එයාට කතා කරන එකේ පලේ මොකක් ද ඔල්ගා හාමිනේ. ඔහේට ජේනවනේ ඒකගේ කටින් වැක්කෙරෙන්නේ වස. ඔහේගෙනුත් පැණි සිරප් වැක්කෙරෙනවා නෙවෙයි තමා, ඒත් ඔහේ බුද්ධිමත් ගෑනියක්. කියමු බලන්ඩ මං මක් කරන්ඩ ඕනෑ ද කියලා. මං මේ ගම ඇරලා සදහට ම යන්ඩ ද නැත්තං මිනිහෙක්ව මරලා හිරේ යන්ඩ ද?"





"සර්ව බලධාරී දෙවියනේ, මොනව ද මේ නුඹ කියන්නේ? නුඹට මක්වෙලා ද?"

"ඔහේට මිනිත්තුවෙන් දැනගන්ඩ ලැබේවි... ඔහේ හිතන්නේ ගුබාසොව්ලි ගඟ දිගේ කොට පා කරගෙන එන එක මට ලේසි වැඩක් කියල ද? සුරිකෝ මේකට මට උදවු කළා, එයා දන්නවා..."

"ඉතිං?"

"කවුදෝ මගේ දර ටික හොරකං කරනවා! හිතා බලන්ඩ! කවුරු හරි කුණු හොරෙක් මගේ දර ටිකට විදිනවා! මට ඌව අතට ම අල්ලගන්ඩ බෑනේ! දවස් ගාණක් තිස්සේ මට නින්දක් නෑ!"

"ශුද්ධ වූ සාන්තුවරයිනේ! ඔහේ මේ දර සොච්චමකට මිනිහෙක් මරන්ඩ හෙම යනවා නෙවෙයි නේද?"

"ඔය බැල්ලිගෙ පුතාව අල්ලගත්තොත් නං මං උගේ බෙල්ල මිරිකනවාමයි!"

"මට නුඹට දෙන්ඩ පුළුවන් උපදේසෙ මොකක් ද ඉලිකෝ? මිනිහෙක්ව අල්ලාගන්නකං ඒකා හොරෙක් කියලා කියන්ඩ බෑ."

"ඒත් මගෙන් හොරකං කරලා!"

"ඒ නුඹේ ලැබීම!"

"බොහොම හොඳා එහෙනං!"

ඉලිකෝ ගේට්ටුව දෙසට අඩි තැබී ය.

"ඇයි නුඹ දර ටික නිදාගන්න කාමරේ ගොඩගහන්නේ නැත්තේ?" ඉලේරියන් හඬනගා කී ය. "නැත්තං වඩා හොඳා දර ගොඩ උඩ ඇඳ හදා ගන්නවා!"

"කාරුණික උපදේසෙට ස්තුතියි ඉලේරියන්! නුඹේ උදවු නැත්තං මට මොකවත් ම කරගන්නැහැකි ද! හැබැට මං වගේ අසරණ කාලකණ්ණියෙක්!" ඉලිකෝ ආපසු හඬ තැළී ය.

එදා සැන්දෑවේ ඉලිකෝ යළිත් පෙනී සිටියේ දිගු පොරකටු සහ තද රතු කරමලක් ඇති මාහැඟි කුකුළකු ද සමඟිනි.

"මේ මොකෙක් ද ඉලිකෝ?" අත්තම්මා විස්මයෙන් හඬනැඟුවා ය.

"පේන් නැද්ද කුකුළෙක් කියලා?"

"ඒත් ඌට මක්වෙලා ද?"

"ඌට මොකුත් වෙලා නෑ. පැටියා කාලේ ඉඳලා අද වෙනකං ඌට ඉහෙන් බහින ලෙඩක් නෑ. ඒකා විශිෂ්ට සටන්කාමියෙක් වගේ ම පොදුවේ කිවුවොත් අංක එකේ පොර කුකුළෙක්. ඌට බැරි එක ම

දේ බුරන එක, ඒත් උඟ බල්ලෙක් ගාණට ම නපුරුයි, මොකකුටවත් මගේ වත්තට එන්ඩ දෙන්නෙ නෑ. මට ඕනෑ ඒකව තෑග්ගක් හැටියට ඔහේගෙ සූරිකෝට දෙන්ඩ."

"මගේ අසරණ කිකිළියො ටික බොහොම සංතෝස වෙයි!" අත්තම්මා කවටකාරී අපේක්ෂා භංගත්වයකින් කෑගෑවා ය.

එහෙත් ඉලිකෝ තවදුරටත් සවන් දුන්නේ නැත. ඔහු මා පසෙකට ගෙන මගේ කනට කෙඳිරී යඃ

"සූරිකෝ, රත්තරනේ, මට උදවු වෙයන්!"

"මොකක් ද කරන්ඩ යන්නේ ඉලිකෝ?"

"නුඹ නගරෙන් ගෙනාව පතරොං කැප් ටිකක් හෙම තියේ ද?"

"ඔව් තියෙනවා."

"කොච්චරක් ද?"

"තිහක් හරි ඒ වගේ ගාණක්!"

"මට ඒ ටික දියන්, මං උඹෙ කැපවෙච්ච වහලා වෙන්නං!"

"නුඹ බැංකුව පුපුරවන්ඩ සැලසුම් කරනවාවත් ද?"

"මගෙන් ප්‍රශ්න අහන්ඩ එපා! මට ඔය පතරොං කැප් ටික දීලා ඕන ගාණක් ගනින්!"

"මොකට ද කියනවා, එතකොට පතරොං කැප් ටික ලැබේවි."

"නුඹ මාව පාවාදෙන්නෙ නෑ නේද?"

"මං කොහොම ද එහෙම කරන්නේ ඉලිකෝ!"

"නුඹ මාව නැතිබංග කරන්නෙ නෑ නේද?"

"කවදාවත් නෑ!"

"එහෙනං දිවුරපන්!"

"ඉලිකෝ, නුඹ ලැජ්ජා වෙන්ඩ ඕනෑ!"

"හොඳා එහෙනං, මා එක්ක වරෙන්..."

පාන්දර වන තුරු ම මමත් ඉලිකෝත් දරගොඩ අසල හිඳගෙන වයින් බොමින්, දර කොටවල හිල් විද්දෙමු. එම හිල්වලට ඩයිනමයිට් ටිකක් සහ පතරොං කැප් එකක් බැගින් ඇතුළු කළ අපි ඒවා රතු මැටියෙන් වසා දැමුවෙමු.

ඉලිකෝ සිටියේ ඉහළ ම ප්‍රාණවත් බවිනි.

"ඔන්න දැන් අහුවුණා තමයි! ඇත්තවශයෙන් ම මම දන්නවා මගේ දර හොරා ගත්තෙ කවුද කියලා, ඒත් අතටම අල්ලාගන්නකං චෝදනා කරන්ඩ බෑ. දැන් ඉතිං මං අල්ලා ගන්නං. මං උපන් බුද්ධිමතෙක්, සූරිකෝ!"





"මෙකෙන් කවුරුවත් මැරෙන එකක් නෑ කියලා සහතික ද?"

"කරදර වෙන්ඩ එපා, කවුරුවත් මැරෙන්නෙ නෑ, හැබැයි ඒකෙගෙ පස්ස පැත්ත නං රෝස් වෙයි!"

"කාටවත් කරදරයක් වෙන්නේ නැත්තං ඒ ඇති..."

"සූරිකෝ වෂලොම්ඩසේ! මෙ පතරොං කැප් ගැන කවුරු හරි හුළං පොදක් හරි දැන ගත්තොත්, මං මගේම බෙල්ල කපා ගන්නවා, මගේ මරණෙ තියෙන්නෙ නුඹේ අතේ! ඒක හොඳට මතක තියාගනින්!"

කට පරිස්සම් කරගන්නා බවට මම විධිමත් දිවුරුමක් දුනිමි...

...සතියකට පසු මමත් ඉලේරියනුත් හිඳගෙන වොඩ්කා නිස්සාරණය වෙන අයුරු බලා සිටියෙමු. දැවැන්ත තඹ කල්දේරම ශ්‍රීතිමත් ගොර ගොර හඬක් නැඟී ය. උණුසුම් වොඩ්කා ප්‍රාණවත් ව එහි කෙමියෙන් පිටවෙමින් තිබිණි.

ඉලේරියන් සැර වොඩ්කාවලට ප්‍රිය කරයි. වරින් වර ඊට ඇඟිල්ල ඔබන ඔහු ඇඟිල්ල ගිනිදැල්ල වෙත අල්ලා බලයි. නිල් පැහැව දැල්ල නැඟී නම් එහි අදහස් වොඩ්කා හොඳ සහ සැර බව ය. දැල්ලක් නොනැඟී නම් එහි අදහස 'අමුද්‍රව්‍ය' නව උවමනා බව ය.

කාලය ඉක්මනින් ගෙවිණි. අපි කල්දේරමේ කෙමිය යටින් වීදුරු තබා ඉන් පසු ඒවා සීතල වතුරෙන් සිහිල් කොට, ආස්වාදයෙන් යුතුව, ලෝදිය වැනි දියරයෙහි ගුණ පරීක්ෂා කළෙමු. මෙසේ කල්දේරම ළඟ හිඳ, ඇස් පියාගෙන, සෙමෙන් වොඩ්කා පානය කරන විට ගස්වැල් සෙලැවෙන්නට ගන්නා අතර ඔබ මොර දී ගී ගයන්නට පටන් ගනී, නොයෙක් විකාර කතා කියන්නට ගනී, කිසිදු හේතුවක් නොමැතිව හිනාවෙන්නට ගනී.

මම කල්දේරම් කෙමිය අසල හිඳගෙන සිටි අතර ඉලේරියන් සිටියේ ගිනිමැළය අසල ය. අපි වොඩ්කා රසවින්දනය කළෙමු. ගස්වැල් දැනට ම වැනෙන්නට ගෙන ය. අපි කිසිදු හේතුවක් නැතිව සිනාසුණෙමු, ගී ගැයුවෙමු, යළිත් සිනාසුණෙමු.

"මේ ගෙදර සාමය සහ සමෘද්ධිය වෙනුවෙන්!"

"සාමය සහ අමුත්තා වෙනුවෙන්! ඉලිකෝ මගේ වොඩ්කා ටිකක් රහ බලමු!"

කොහේදෝ සිට ඒ මොහොතේ එතැනට ආ ඉලිකෝට ඉලේරියන් වීදුරුවක් පිරිනැමී ය. දැනුම් තේරුම් ඇති විලාසයෙන් වොඩ්කා තොල ගෑ ඉලිකෝ දෙතොල් ලෙවකා, තෘප්තියෙන් යුතුව

ඇස් කරකවා ඉක්බිති සෙමෙන් වීදුරුව තබා සැහීමට පත් ලෙසින් "ඔන්න වොඩ්කා! වලහෙක් වුණත් බිම දාන්ඩ වදිනවා!"යි නිවේදනය කළේ ය.

ඉලේරියන් තෘප්තිමත්ව සිනා පෑ ය. ඉලිකෝ මා පසෙකට කැඳවමින් කඩිමුඩියේ මගේ කනට කෙඳිරී ය.

"අරන් ගිහින්!"

"කාව ද?"

"දර ටික මෝඩයෝ! අද පිපිරුම අහන්ඩ පුළුවනි!"

"ඔය හැබෑම ද?"

"දෙයියම්පල්ලා! හොඳා මං දැන් යනවා. හොඳ හෝදිසියෙන් හිටිං!"

මහත් බලාපොරොත්තුවෙන් යුතුව සිනාසෙමින් ඉලිකෝ දැත් එකිනෙක ඇතිල්ලී ය. ඉලේරියන් රැවුවේ ය.

"මොනව ද එකැස් යක්ෂයාට ඕනෑ වුණේ? ඒකාට ඒක හයියෙන් කියන්ඩ බැරි වුණා ද?"

"ඔහේට ඒක ඉක්මනට ම දැනගන්ඩ ලැබෙයි."

"එහෙම ද...!"

"අපිට මුළු රෑ ම හිනාවෙන් පුරවන්ඩ පුළුවන් වෙයි."

"කියාපන් මොකක් ගැන ද කියලා!"

"මට කියන්ඩ පුළුවනි, ඒත් වඩා හොඳා ටිකක් ඉවසලා ඉන්න එක... ඒ විදිහ වැඩිය හිත්ගන්නාසුලුයි!"

"එහෙනං නුඹ එකැස් යක්ෂයා එක්ක හවුලේ කුමන්ත්‍රණ ඈ! මං තොපි දෙන්නාට ම කෙළ ගහනවා, තූ නොදකින්!"

ඉලේරියන් තව දර ගෙන එන්නට ගියේ ය. මම යළිත් වීදුරුව වොඩ්කාවලින් පුරවා ගතිමි.

"හරියට බඩගිනි වස්සෙක් වගේ උරනවා! මේ බේබද්දාව මොකට මං වැද්දාගත්තා ද? ඔතනින් අහක් වෙයන්!" ඉලේරියන් කෑගැසී ය.

අප තැන් මාරුකොට ගතිමු. දර කොට ප්‍රීතිමත්ව දැල්විණි. ගිනි පුපුරු ඉහළ නැගිනි. රුදුරු ගිනිදැල් අලුත් කොටයකට ඇවිළිණි. එක්වර ම පිපිරුමකි, ගිනි දළු හෝ ගා ඉහළ නැගිණි, මැටි පිඩක් වේගයෙන් ඈතට වීසිවිණි...

"ඉලේරියන් බිම දිගාවෙනවා!" මම කෑගැසීමි.

"මොකද වුණේ?"

"බිම දිගාවෙනවා ඔයි!"





ඉලේරියන් බිම වැටී දිගාවුණි. මහත් පිපිරුමක් ඇති විය. ඒ සමගම තවත් එකකි, තවත් එකකි, තවත් එකකි... කල්දේරම පෙරළී ගියේ ය, එහි වූ දෑ ගින්නට වැක්කෙරිණි. මට කෑගසන්නට ඕනෑ විය, එහෙත් මගේ කට අළුවලින් පිරී ගොසිනි. පිපිරුම් එකපිට එක සිදු විය. ඇවිළෙන ගිනි අඟුරුත් ගිනි පුපුරුත් අහසට පියෑඹී ය.

නොනැවතී කෙරෙන පිපිරුම් මිනිත්තු ගණනාවක් පුරා ඇදී ගියේ ය. සියල්ල නිහඬව ගිය පසු මම හිස ඔසොවා වටපිට බැලුවෙමි. මුහුණ බිමට ඔබාගෙන වැතිර සිටි ඉලේරියන් මදකුදු සෙලැවුණේ නැත. දිවගිය මම ඔහු අනෙක් පැත්ත පෙරළුවෙමි. දෑස් හැර, අළු තැවරී ගත් මුහුණ පුරා අතගා බැලූ ඔහු දුබල හඬින් කෙඳිරුවේ ය.

"ඒ මොකක් ද සුරිකෝ?"

"නොදකින් තමුසෙට හෙණ ගහව්වාවයි! මොන හත්තිලව්වට ද තමුසේ ඉලිකෝගේ දර හොරකං කළේ? අඩුගාණේ තමුසෙට තිබුණා ඒක මටවත් කියන්ඩ!"

"උඹ මොනව ද මේ කියන්නේ?"

"කියන්නෙ දර කොට ගැන! ඉලිකෝගේ මිදුලේ ගොඩගහලා තිබ්බ දර ටික ගැන! ඇයි තමුසේ මේක මට නොකිවුවේ, ලොකු නාස් යක්ෂයෝ? ඒවට පතරොං කැප් පිරෙව්වෙ මගේ අත් දෙකෙන්මයි!"

"සුරිකෝ වෂලොම්ඩ්සේ! එහෙනං උඹ මාව ඉලිකෝ චිගොගිඩ්සේට වික්කා ඈ! පණපිටින් ඉන්දැද්දී මෙතනින් පලයං යන්ඩ දැන් ම, නැත්තං මෙතන මගේ අතින් මිනී මැරුමක් වෙනවා!"

"ඒයි මාස්ටර්!" කවුදෝ හඬ ගෑ ය.

"කවුද ඔය?" ඉලේරියන් ගෙරවී ය.

"මේ මම ඉලිකෝ. මං මේ ආවේ පොඩි උපදේසයක් අහන්ඩ උඹෙන්. කවුදෝ මගේ මිදුලේ තිබ්බ දර ටික හොරාගෙන ගිහින්. බාගෙදා උඹට පුළුවන් වෙයි නේද ඒකාව අල්ලගන්ඩ මට උදවු කරන්ඩ...!"

"මං උඹව මරනවා!"යි බෙරිහන් දුන් ඉලේරියන් ගේට්ටුව දෙසට පිම්මේ දිවුවේ ය.

ඉලිකෝ පසුදා උදෑසන යළි පැමිණියේ ය. නරියකු මෙන් ඉලේරියන්ගේ වත්තට රිංගූ ඔහු ඊයේ ව්‍යසනය සිදු වූ බිම්කඩ සිසාරා පිරික්සා බලා, ශෝකයෙන් හිස සලා, ඉක්බිති ගසක් යට

හිඳගෙන, සුරූපීමය සිනාවක් පාමින් පිපිරුමට අවස්ථාවක් නොලැබ ඉතිරි ව තිබූ දර කොටවල වූ වෙඩි බෙහෙත් අසීරුවෙන් ඉවත් කරන්නට විය.

## ධන නිධානය

ටිබිලිසියේ ඉගෙනුම ලබන ගමේ ගැටයකු ජූනි මාසය යනු අවුරුද්දේ හොඳම මාසය ලෙසින් පිළිගන්නේ යැයි අයෙක් සිතනු ඇත. විභාග අවසන් ය, ගිම්හානයේ මාස තුනට අදාළ දීමනා මුදල ලබාගෙන අවසන් ය, ඉතිං ඔහුට සැහැල්ලු සිතින් ගෙදර යා හැකි ය. ඉදිරියට ඇත්තේ ගිම්හානය ය, අසල්වැසියන්ගේ පලතුරු වතුවලට නිශාචර ආක්‍රමණයන් ය, මාළුබෑම් ය, දඩයම් ය, ගවේෂණ චාරිකා ය... ගමේ පාසලේ සිසුවකු සිටි සමයේ මහත් ප්‍රමෝදයෙන් යුතුව ගිම්හානය පැමිණෙන තුරු මම ද බලා සිටියෙමි. එහෙත් විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු වී නාගරිකයකු වූ දා සිට ජූනි මාසය කෙරේ මා තුළ වූ ආකර්ශනය සදහට ම නැතිව ගියේ ය. ඔබම විනිශ්චය කරන්න, සතුටු වෙන්නට තිබෙන්නේ මොනවා ද? වසන්තයේ දී අසමත් වූ විෂයයන් සරත් ඍතුවේ විභාගයේ දී ලිවිය යුතු ය යන නපුරු ඉරණම මුළු ගිම්හානය පුරාම මගේ හිස උඩින් එල්ලී සිටියි. මගේ විභාග පොතෙහි ඇති යාන්තම් සමත් යැයි කියැවෙන ලකුණු විශිෂ්ට ලකුණු බවට මාරු කළ යුතු ය. ඒ මේ පූර්වෝපාය රහිතව මට කොහෙත් ම අත්තම්මාට මුහුණ දිය නොහැකිකම නිසා ය. එසේ ම ඉලිකෝ සහ ඉලේරියන් මගේ දීමනාව ගැන ඇනුම්පද කියන්නේ ය. ("උන් ආයෙත් නුඹේ දීමනාව අත්හිටෙව්ව ද සූරිකෝ?") හැරත් ආතම්මා ඉදිරියේ මගේ දැනුමට ඇති පිපාසයත්, ටිබිලිසියේ සිටිය දී ඔහු වෙනුවෙන් මා ගත් වෙහෙස සහ ඔහු විඳි දුෂ්කරතා ගැනත්, පෙළ පොත්වලින් මා හිතුවක්කාරයකු වන සැටිත් ගැන දිගින් දිගට ම කතා කරන්නට ඉලේරියන් මහත් රුචි කරයි. ඉන් පසු යළි නගරයට යාමේ දී විභාග පොතේ සියලු විශිෂ්ටතා ලකුණු සාමාන්‍ය ඒවා බවට පත් කිරීමට මට සිදු වේ.

එහෙත් සැබැවින් ම මා අයත් වන එක ම තැන මගේ ගම නිසාත්, මුළු මහත් ලෝකයෙන් මා වැඩියෙන් ම ආදරය කළේ අත්තම්මාටත්,



ඉලේරියන්ටත්, ඉලිකෝටත් නිසා මේ සියල්ල විඳ දරාගනිමින් මා ඔවුන් වෙත යා යුතු ය...

ඉතිං දැන් මම අපේ ගම කරා වූ වංගු ගැසුණු මාවත දිගේ පිය නගමින් සිටිමි. පොළොව ද, තණකොළ ද, වටපිට වූ සියල්ල ද ටික වේලාවකට පෙර වට වැස්සෙන් තෙමීගෙන ය. මුළුමනින්ම තෙමී බත්ව හුන් මා ද මඩෙහි දිගින් දිගටම ලිස්සුවේ ය. මාවත තද බෑවුමක් ව ඉහළ නගී. පියවර ඉක්මන් කළ මම මුළු කන්ද ම මෙන් නැග්ගේ දුවමිනි. නිම්නයෙහි වැතිරගත් මගේ ගම මගේ ම අල්ලෙහි වූවාක් මෙන් එක්වරම මා ඉදිරිපිට විවරව පෙනෙන්නට විය.

මගේ දණිස් කඩා වැටුණි, මම ගලක් මතට වාරු වූයෙමි. මගේ උගුරෙහි ගුළියක් හිරවිණි. කඳුළු ගිලගනිමින් සහ ඔහේ බලාගනිමින් මම දිගු වේලාවක් එතැන හිඳගෙන සිටියෙමි... අත්තම්මා ගෙයින් පිටට එන සැටි අන්තිමේ මම දුටුවෙමි. පසුගිය වසරේ සිටියාට වඩා ඈ දැන් කුදු ගැසිලා ය. එහෙත් ඈ කඩිසරව ගමන් කළා ය. උඩ පැන නැගිටගත් මම, බරින් තොර මගේ සූට්කේසය ඩැහැ ගනිමින්, මහ හඬින් කෑමොරදෙමින් කන්ද පහළට දුවන්නට වුණෙමි.

"ආ...තම්...මේ!"

තවත් මිනිත්තුවක දී අපි එකිනෙකා වැළඳ ගතිමු. පළමුව කතා කළේ අත්තම්මා ය.

"එහෙනම් නුඹ තාම පණපිටින් ඈ පුතේ!"

"ඒකා මැරිලා, ඒත් ඒකා ඒක පිළිගන්නේ නෑ!" ඉලේරියන් සෝපාහාසීව කතාවට දායක වූයේ හිටිහැටියේ කොහෙන්දෝ මතු වෙමිනි.

"පුතේ උඹට බඩගිනි ඇති නේද?"

"ඒකට කමක් නෑ. මං මුළු ගිම්හානෙ පුරාවට ම ඒකාට කන්ඩ දෙන්නම්කෝ, මගේ සෙරපියෝනාට කෑම දෙන ගමන් ම!" ඉලිකෝ ද පෙනී සිටිමින් ප්‍රීතිමත් ව අත් එකට අතුල්ලමින් කීවේ ය.

"හොඳා ඉතිං අපට ටිබිලිසියේ අලුත් ආරංචි කියාපන්කෝ! උඹ ගොළුවෙලා වත් ද? ඒක විභාගයක් නං නෙවෙයි අම්මපා!"යි කී ඉලේරියන් මගෙන් පිළිතුරක් ලැබෙන්නට පෙර අත්තම්මා දෙසට හැරුණි.

"මොන වයින් ද මං ගේන්ඩ ඕනෑ ඔල්ගා හාමිනේ?"

"නුඹ ගාව තියෙන හැම ජාතිය ම!"

"නුඹේ සූට්කේස් එක පුරෝලා තියෙන්නේ ඊයම්වලින් වත් ද?"
ඉලිකෝ ඇසුවේ මගේ සූට්කේසය පහසුවෙන් උඩ දමමිනි.

"වැඩියක් ම වෙන්ඩ පුළුවන් පොත් ගොන්නක්!" ඉලේරියන් මෝඩ සිනාවක් පාමින් කීවේ ය.

"තවත් නං පොත් ඕන නෑ! ඉගෙනගැනිලි ඕනැත් නෑ! එයා දැන් ටිකක් විවේක ගන්ඩ ඕනෑ! නිකං බලාපල්ලා එයාගෙ හැටි, දැතිගොයියෙක් ගාබට කෙට්ටු වෙලා ගිහින්!" අත්තම්මා හඬ තැලුවා ය.

"ඇත්තම තමා ඔල්ගා හාමිනේ, ඔහේ හරියට ම හරි. අසරණ කොල්ලා පාඩම් වැඩවලින් තමන්ව ම නාස්ති කරගන්නවා!"යි කියමින් ඉලිකෝ හිකි හිකි ගෑවේ ය.

"නුඹ එයාගෙ පුස්තකාලෙ බලන්ඩයි තිබ්බේ!" ඉලේරියන් අලගු තැබී ය. "එයාගෙ කාමරේට ඇතුළු වුණාම ගඩොලකුත් එක්ක පොතක් නං ඔළුවට වැටෙනවාමයි. එයාගෙ දුප්පත් අත්තම්මා යවන සල්ලි එයා වියදං කරන්නෙ පොත්වලටා!"

"මොනවා පුතේ මේ කියන්නෙ හැබෑ ද?" අත්තම්මා බියපත්ව තැගැව්වා ය. "උඹට කොහොම ද එහෙම කරන්ඩ පුළුවන් වුණේ? මං උඹට හාමතේ ඉන්ඩ අරින්නෙ නෑ! උඹට ඔය තරං පොත් මොහොකට ද? සල්ලිවලින් කෑම ටිකක් අරන් කාපන්, නැත්තං මං තවත් නං සල්ලි එවන්නෙ නෑ උඹට!"

"ඉලේරියන් මෙවර්නාඩ්සේ, මේ ගොනාට ඇන්දිලි නවත්තනවා!" මම බියපත්ව කීවෙමි.

"අපි මේ හිතුවෙ නුඹේම හොඳට. ඇත්තවශයෙන් ම ඉගෙනීම් කරන්ඩ ඕනෑ, හැබැයි ශරීර සනීපෙට හානි කරගෙන නෙම නෙවෙයි!" ඉලිකෝ කී ය.

"අනේ අත්තම්මේ දෙයියන්ගෙ නාමෙට ඉක්මනට කෑම ලෑස්ති කරමුකෝ! මේ විසකුරු නාකියො දෙන්නගෙ කටවල් කෑම ඔබලාවත් නවත්තන්ඩ බලන්ඩ!" මම හඬ තැළිමි.

"විනාඩියෙන් දෙනවා පුතේ!"

විනාඩි කීපයකට පසු අපි මේසය වටා හිඳගෙන කදිම ආහාර වේලක් ගතිමු.

"මම ඇතුළට එන්ඩ ද?" හුරුපුරුදු කටහඬක් දොරකඩින් ඇසිණි.

"කවුරු වුණත් කමක් නෑ එමු!"





ප්‍රීතියෙන් ද ලැජ්ජාවෙන් ද දිලිසෙමින් මේරි ඇතුළට පියමැන්නා ය. ඈ ඉතා සුන්දර අලුත් ගවුමක් හැඳ සිටියා ය.

"මට ඔයාගෙ පෙනේරෙ ටිකකට දෙන්නැකි ද අත්තම්මේ... ආ, සුරිකෝ!"

"මේරි!" මේසයෙන් නැගිටිමින් මම කීවෙමි.

"ආන් අතන දොර පිටිපස්සේ බිත්තියේ එල්ලලා දරුවෝ." අත්තම්මා කීවා ය.

"එන්න මේරි, මෙතනින් ඉඳගන්න!"

"බෑ, මං යන්ඩ ඕනි."

"ගෑනු ළමයව ගෙදර ඇරලවාපන් සුරිකෝ!" ඒ ඉලිකෝ.

"අපොයි එපා, ඕන නෑ." මේරි විරෝධය පෑවා ය.

"ඔව්, ඇරලුවානං හොඳා." ඉලේරියන් සිනාපාමින් කීවේ ය.

කඩිමුඩියේ සමුගත් මේරි පිටව ගියේ පෙනේරය ගැන මුළුමනින් ම අමතක වෙමිනි. මම ඇය පසුපස ගියෙමි. අත්තම්මාත්, ඉලිකෝත්, ඉලේරියනුත් දොරකඩට ආහ.

මේරි හා එක් වූ මම ඇය සමග නිහඬව ඇවිද ගියෙමි. කාරුණික දෑස් හයක් අප මත වැටී ඇති බව අප දෙදෙනාට හැඟිණි.

...මගේ පැමිණීමෙන් තුන්වැනි හෝ හතරවැනි දින ඉලිකෝ අපේ වත්තට ආවේ ය.

"ඒයි මගෝඩියා, කොහේ ද?"

"නුඹට මොකට ද එයාව?" අත්තම්මා ගෙතුළ සිට ඇසුවා ය.

මා සිටියේ සුවපහසුවට කවිච්චියේ දිගා වී ගනිමිනි.

"මට ඉල්ලීමක් කරන්ඩ තියෙනවා, ඔල්ගා හාමිනේ! මගේ මිදිවත්ත කොටාගන්ඩ තියෙනවා. ඒත් මට ඒක තනියම කරගන්ඩ තරං හයියක් නෑ. මට ඔහේගෙ මගෝඩියාව දවස් දෙකෙකට කුලියට දෙන්ඩකෝ දවස තිස්සේ මෙලෝ වැඩක් නොකර මස්මිදුලු වීක නාස්තිවෙලා යන්ඩ ඉස්සර!"

"නොදකින් උඹේ කට නාස්තිවෙලා පලච්චාවේ! නෑ, රත්තරනේ, සුරිකෝ තවත් නං උඹලගෙ පහිනිපත් කරන කොල්ලා නෙවෙයි. එයා විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්!"

"එයාගෙ කකුල් පලසකින් ඔතලා, උරේට සාළුවක් පොරෝනවා හොඳා! ශිෂ්‍යයෙක්, පුත්! මං මේ ඒකගේ ශරීර සනීපෙ ගැනයි බැලුවේ. බීජ නිෂ්පාදනේට යන තරුණ ගොයියකුට ඔය සනීපෙ

සැහෙන්නෙ නෑ. ඒත් ඔහේලට දැනෙන්නේ ඔහොම නං මං මොකට කරදර වෙනව ද?"

"මට වදදෙන එක නවත්තනවා ඉලිකෝ!" මම එළියට එමින් කීවෙමි.

"මොට්ටයා! උඹ වයින්වලට ආසයි නේද? එතකොට මේ වද කරදර ඔක්කොම මං තනියෙන් ම උහුලන්ඩ ඕනැ ද, ගුණමකුවෝ?'

"වැඩ කරන එක මට තහනං කරලයි තියෙන්නේ. ආණ්ඩුව මාව මෙහේට එවුවේ විවේකයක් අරන් සනීප වෙන්ඩ, පැහැදිලියි ද? මං වැඩකරනවා හෙම කවුරුහරි දැක්කොත්, දැකලා නගරෙට ගිහින් කීවොත් මළඉලව්වක් තමා වෙන්නේ!"

"ඒ ගැන වදවෙන්ඩ එපා. මං උඹට බොරු කොණ්ඩයක් දාන්නං. ආයි යකාවත් උඹව අඳුනාගන්න එකක් නෑ."

එකඟ වෙනවා හැර මට තෝරාගත හැකි කිසිවක් නොවිණි.

මුළු දවස පුරාම ඉලිකෝත් ඉලේරියනුත් මමත් මිදි වත්තෙහි දහදියෙන් තෙමීගෙන වැඩ කළෙමු.

"හෙට ඉර පායපු හැටියේ වරෙල්ලා!" වැඩ අවසන් කළ විට ඉලිකෝ අණ කළේ ය. හිස නැමූ අපි ගෙවල් බලා පා ඇද්දීමු. ටික වේලාවක් අපි නිහඬව ගමන් කළෙමු.

"මෙක හරියන්නෙ නෑ!" ඉලේරියන් හිටිහැටියේ ම නිවේදනය කළේ ය. "අපි මොනවා හරි හිතන්ඩ ඕනෑ, නැත්තං අර හත්තිලව් මිදි වත්ත අපේ මිනීවළ වෙනවාමයි!"

"ඒකෙ නං දෙකක් නෑ!" මම ස්ථිර කළෙමි. "එතන වැඩ අවුරුදු සීයකටවත් අපට ඉවර කරන්ඩ වෙන්නෙ නෑ."

"එහෙනං මොකක් හරි හිතාපන්! නුඹ දැන් ඉගෙනගත්ත මිනිහෙක් නෙ!"

"මට මොනවා හිතතැහැකි ද? ඉලිකෝව රවට්ටන්ඩ අමාරුයි..."

"ඒක නං හැබෑ තමා..."

බොහෝ රෑ බෝ වන තුරු මම ඉලේරියන්ගේ ගෙදර ගත කළෙමි.

රසවත්ව සීත කළ වයින් පිරි කුඩා මැටි ජෝගුවක් මේසය මත විය. අපි වයින් තොලගාමින් ඉලිකෝගේ ශෝභමාන පෙනුමින් යුත් වාල් වැටෙන් මගහරින මගක් සිතමින් මොළය කාල් ගෑවෙමු.

"මට මේ ජෝගුව හම්බ වුණේ පස් අස්සේ තිබිලා." අපගේ වීදුරු පුරවාලමින් ඉලේරියන් කීවේ ය. "නිධානයක් හම්බ වුණා තමා කියලා මං පිස්සු වැටෙන්ඩ තරං ගියා!"





"නිධානයක් තිබ්බෙ නැද්ද?"

"මොන... ජෝගුව පිරිලා තිබ්බේ මැටිවලින්..."

"ඉස්සර කාලේ විනාශ වෙච්ච නැව්වල හිටි මිනිස්සු බෝතලේක හරි ජෝගුවක පණිවිඩයක් ලියලා දාලා මුද්‍රා තියලා මුහුදට විසි කරනවා." මම කීවෙමි.

"එතකොට?"

"එතකොට කවුරු හරි ඕක ගොඩගන්නවා. ගොඩ අරන් පණිවිඩය කියවලා ඒ විනාශ වෙච්ච නැවේ මිනිස්සුන්ට අත් වෙච්ච ඉරණම ගැන දැනගන්නවා..."

"මොකක් ද නුඹ කීවේ?" ඉලේරියන් මහත් ප්‍රීතියෙන් හඬගෑ ය. "පණිවිඩයක් ද? මුද්‍රා කළ ජෝගුවක ද? අතර්සයි!"

"ඔහේට මක් වුණා ද?"

කුඩා මේසය ද පෙරළාගෙන උඩ පැන ගත් ඉලේරියන් මා වැළඳ, දෙකපොල ම සිප ඉක්බිති තදින් කොත් හඬලමින් ද, අත් එකට අතුල්ලමින් ද කාමරය වටා නැටුවේ ය.

"හිටින් ඔහොම හිටින් ඉලිකෝ විගොගිඩ්සේ! ලෝකෙ මෙච්චර කාලෙකට දැක්කෙ නැති උගුලක් මං උඹට අටවන්නං! පණිවිඩයක් ඈ? මං උඹට ලියන්නංකෝ පණිවිඩයක්, ආයෙ සැහෙන කාලෙකට අමතක නොවෙන එකක්!"

ඉලේරියන්ගේ විකාර දෙස මම විමතියෙන් බලා හුනිමි. කාමරයට දිවූ ඔහු කඩදාසියක් ද, තීන්ත කුඩුවක් ද, පෑනක් ද ගෙනැවිත් මේසය මත තබා මට කෑගැවේ ය.

"ඉදගනින් සුරිකෝ! ඉදගනින්. දැන් ලියාපන්! නෑ, ඉස්සෙල්ල කඩදාසිය පොඩි කරහං!"

"ඉලේරියන්!"

"පොඩි කරහන් ඕක, කියන දේ අහලා! ආන් හරි. දැන් ඒක දිගෑරලා අතගාහන්! ආන් හරි! දැන් ලියාපන්!"

සිගරැට්ටුවක් දල්වා ගත් ඉලේරියන් බිත්තියට හේත්තු වී, දෑස් වසාගෙන හඬනඟා කියන්නට විය:

"ලෙවාර්සි විගොගිඩ්සේ වන මම මේ ලියුම ලියන්නෙ මරණය අද්දර ඉඳගෙනයි. මගේ ජීවිතයේ සතුටක් තිබුණේ ම නැති තරමයි. අමාරුවක දි ගන්ඩ කියලා මම නොකා නොබී යාන්තං මුදලක් ඉතිරි කළා. මං මගේ ශරීර සනීපය නැතිබංග කරගත්තා. දැන් මං ඉන්නේ මරණයේ දොරකඩ. මගේ එකම සැනසීම මගේ මහන්සිය අපතේ

නොගැඹුරි. ඇපල් ගහ යට තියෙන ගල යට මම රත්කාසි දහතුන ජෝගුවක් වළලා තියෙනවා. දෙවියන්ගේ කැමැත්තට අනුව මගේ කොලුවා එය සොයාගනු ඇති. ඔහු එය සොයා නොගත්තොත් දෙවියෝ මගේ ඉලිකෝ ආරක්ෂා කරත්වා. ආමෙන්!"

ඉලේරියන්ගේ සිතේ හටගත් ගුප්ත සැලැස්ම දැන් පැහැදිලි ය. එහෙත් මට සැකයක් තිබිණි.

"ඔහේ හිතන්නේ එයා මේ ලියුම විශ්වාස කරයි කියල ද? 'ඇයි එයා මේ රන් කාසි පොළොවෙ වළලුවේ, ඇයි මට කෙළින් ම අතට නොදුන්නේ?' කියලා එයා හිතාවි."

"ඒත් අසරණ ලෙවාර්සි මැරෙද්දී ඉලිකෝට යාන්තං මාස කීපයයි! එයාට ඉඩක් තිබුණේ නෑ රත්කාසි පුතාට දෙන්ඩ."

"එහෙනං ඇයි එයා ඒවා බිරිඳට නොදුන්නේ?"

"කතාගෙනා මළේ ඊටත් කලිං, දරු උපතෙ දී හන්දා."

"එහෙනං ඔක්කොම හරි. මිනිහා බිලී කොක්කයි, නූලයි, බරුවයි ඔක්කොම ටික ගිලිනවාමයි!"

ලිපිය රෝල්කොට කඩමාල්ලකින් එතූ අපි ඒ මත වතුර බිඳක් ඉස ජෝගුවට දැමුවෙමු. ඉන් පසු ජෝගුව මුද්‍රා කොට පිටත් වීමු.

පසුදා උදෑසන අපි හරියටම නියමිත පැයේ දී වැඩට වාර්තා කළෙමු. ඉලිකෝ අපට වොඩ්කා වීදුරුවක් සහ සීතල වෙල්ලවැහුම් කැබැල්ලක් බැගින් දුන්නේ ය. අපි වැඩට බැස්සෙමු.

හිරු අහස මුදුනට නැග තිබිණි. එහෙත් අපි තවමත් වැඩ කරමින් හුනිමු. මම කනස්සල්ලට පත් බැල්මක් ඉලේරියන් වෙත හෙළීමි – අපේ සැලැස්මට මක්වෙලා ද? – එවිට ම ඉලිකෝගේ ඉස්කෝප්පය කිසියම් තද දෙයක් මත වැදිණි. සාප කරමින් ඉස්කෝප්පය ඇදගත් ඉලිකෝ තලය පරීක්ෂා කොට බලා යළිත් පොළොවට ඇන්නේ ය. මැටි බඳුනක් බිඳී යන හඬකි. දණිස් නවා පහත් වූ ඉලිකෝ බුරුල් වූ පස අත පත ගා බලන්නට විය. අන්තිමේ ජෝගුවක කටක් ද, ඉක්බිති ඉතිරිය ද ගොඩගත් ඔහු විස්මයෙන් අප දෙස බැලී ය.

"මේ මොකක් ද?" මුළුමනින් ම අහිංසක විස්මයකින් යුතුව ඉලේරියන් ඇසුවේ ය.

ඉලිකෝ පිළිතුරු නොදුනි. ඔහු රෙදිකඩ ඇද වෙවුලන ඇඟිලිවලින් ලිපිය දිග හැරියේ ය.

"කෝ මං කියවන්ඩ." මම ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වුණෙමි.





"පැත්තකට වෙයන්, මටත් කියවන්ඩ දෙන්ඩ,"යි කියා ඉත්ත ඔහු එය මහ හඬින් කියවන්නට විය.

"ලෙවාර්සි විගෙටිබොගේ පුත මම මේ ලියුම ලියන්නෙ මරණ අද්දර ඉඳගෙනයි. මගේ ජීවිතයේ හොඳක් තිබුණේ ම නැති තරම්. අමාරුවක දී ගන්ඩ කියලා මම හොයාගත්ත යාන්තං ඉතුරු කරපු ... කළා. මං මගේ ශරීර සනීපය නැතිකර ගත්තා. දැන් මං ඉන්නේ මරණයේ දොරකඩ. මගේ එක ම සැනසීම මගේ ... නොගැඹුරි. ඇපල් ගහ යට..."

උඩුර හිරව ගිය ඔහු කතිත්තට විය.

"කියවාපන්!"

අවතාරයක් සේ සුදුමැලිව හුන් ඉලිකෝ කෙළ ගිල ඉලේරියන් වෙත රුදුරු බැල්මක් හෙළී ය.

"මොනව ද තියෙන්නෙ, ඉතුරු ටිකත් කියවාපන්!"

මම ලිපිය ගැනීමට අත දිගු කළෙමි. එහෙත් මගේ අත පසෙකට තල්ලු කළ ඉලිකෝ කඩදාසිය දෑසට ළංකොට ගොරෝසු හඬින් කියවන්නට විය:

"ඇපල් ගස යට ගල උඩ... මම දිවා ඊ. දෙක් ඉඳගෙන උන්නා... ඉතිං ඒ විදිහට මගේ ජීවිතේ ගෙවුණා... දෙවියෝ මගේ ඉලිකෝ රකිත්වා... ආමෙන්..."

වෙවුලන අත්වලින් ලිපිය නැමූ ඉලිකෝ එය තමාගේ සාක්කුවේ ලා ගති.

"මට නං ඒක තේරෙන්නෙ නෑ. ඇයි එයා මේ ලියුම වළලලා තිබ්බේ? එයා මේ ලියුම තියා තියන්ඩ තිබුණේ මෙසේ උඩතේ..." ඉලේරියන් කීවේ ය.

මට ,තවදුරටත් .උහුලාගෙන සිටිය නොහැකි විය. හිනාව පැනීමෙන් මුළු කුමන්ත්‍රණය ම සවුත්තු වී යෑම වළකා ගන්නට මම දිව ගිලෙන තරම් පිපාස බව කියමින් උල්පත දෙසට දිවුවෙමි.

එතැන බිම වැතිරගත් මම පණ යන තුරු සිනාසුණෙමි. මා ආපසු එන විට ඉලිකෝ සහ ඉලේරියන් තණගොල්ලෙහි හිඳ දුම් බොමින් උන්හ.

"හා මේ එන්නේ! අපි එහෙනං ආයෙ වැඩට බහිමු!"යි කියමින් ඉලේරියන් නැගිට්ටේ ය.

"අදට අපි වැඩ නවත්තමු ඉලේරියන්. මට සනීප නෑ වගේ." ඉලිකෝ කී ය.

"ඇයි මොකක් ද අසනීපේ?"

ඉලේරියන් ඉලිකෝගේ නාඩි අල්ලා බැලී ය. ඉලිකෝගේ පෙනුම සැබෑ ලෙඩකුගේ සේ ම විය.

"ගිහින් ටිකක් ඇලවෙනවා ඉලිකෝ, අපි තව ටිකක් කොටන්නං."

"එපා ඉලේරියන්, නුඹලාත් විවේකයක් ගනිල්ලා."

"විවේක ගන්ඩ වෙලාවක් නෑ ඉලිකෝ!"

"මං කිවුවේ උඹලට යන්ඩ කියලා!"

"නුඹව මෙතන තනියම දාලා? අසනීපකාරයෙක්ව දාලා? ඒක නං කොහෙත්ම කරන්ඩ බෑ!"

"ඒක හරියන්නෙ නෑ." මම ද එකතු කළෙමි.

"මොකක් ද මේ හිටි හැටියේ වැඩ කරන්ඩ හැදිච්ච පිස්සුව බැල්ලිගෙ පුතෝ? මං බොලාට කීවේ ගෙදර යන්ඩ කියලා, නොදකින් තොපි!" ඉලිකෝගේ ඉවසීම සිඳුණි.

"ඒත් දවස පටන් ගත්තා විතරනේ ඉලිකෝ!" ඉලේරියන් කීවේ සානුකම්පිත හඬිනි.

"උඹලා බීරි වෙලා ද ඈ? මං කීවේ බොලාට යන්ඩයි කියලා, මට තනියම ඉන්ඩ ඇරලා පලයල්ලා!"

"නුඹ තනියම ඉන්ඩ හොඳ නෑ."

"ඉලේරියන් ෂෙවර්නාඩ්සේ! ක්‍රිස්තුගේ නාමෙට පලයං යන්ඩ!"

"එතකොට මිදි වත්ත!"

"ඒකෙන් උඹ කාරියක් නෑ!"

"නාකියා, උඹට මක් වෙලා ද මේ?"

"මට තනියම ඉන්ඩ ඇරපියව් බොලව්!" මුළුමනින් ම ප්‍රකෝප වූ ඉලිකෝ බෙරිහන් දුනි. "යන නරකාදියක පලයව් යන්ඩ මෙතනින්! මේක මගේ ඉඩම! මං කැමති දෙයක් ඒකට කරනවා! ඇහුණ ද තොපිට?"

"හොඳා එහෙනං නුඹේ කැමැත්තක්... හෙට අපි එන්ඩ ද?"

"හෙට එපා, අනිද්දත් එපා, සතියකින්වත් එපා! මට උඹලගෙ උදවු ඕන නෑ! මකබෑවියව්!" ඉලිකෝ යටිගිරියෙන් හඬ තැලී ය. "පලයා...ව්!"

මහත් ආනන්දයෙන් යුතුව අපි කඩිනමින් පිට වීමු.

...පසුදා උදෑසන වන තුරු ඉවසා සිටිය නොහැකි තරම් වූ අපි හිමිදිරියේ ම කුතුහලයෙන් දැවෙමින් ඉලිකෝගේ වත්තට සෙමෙන් බඩගෑවෙමු. ඇපල් ගස යට වූ, සවිමත් මිනිසුන් දුසිමකටවත්



සෙලැවිය නොහැකි දැවැන්ත කළු ගල ඉවතට පෙරලා දමා තිබිණි. ඒ වෙනුවට එතැන වූයේ බලියාගත් කළුවර ගුලකි. එහි පත්ලේ සිට පස් කැටි එළියට වීසිවෙමින් ආ අතර හතිලන හඬ අසාගත හැකි විය.

"මිනිහා වැඩට බැහැලා." ඉලේරියන් කෙඳිරුවේ ය.

"ඌ තිස්සෙම වැඩ කරන්ඩ ඇති!" මම කීවෙමි.

"ඉලිකෝ!" ඉලේරියන් හඬගෑවේ ය.

මුලින්ම පෙනුණේ ඔහුගේ දෑත් ය, ඉක්බිති ලේන්සුවක් බැඳි ඔහුගේ හිස ය. අන්තිමේ සම්පූර්ණ ඉලිකෝ පෙනී සිටියේ ය.

"මොනව ද නුඹලට ඕනෑ? මොන හත්තිලව්ව ද උඹලාව මෙහාට ඇදන් ආවේ?"

"මං ආවේ නුඹව බලලා යන්ඩ... මං හිතුවේ නුඹ අසනීපෙන් වැටිලා කියලා... ඒත් බැලින්නං මේත් මෙතන... මොකක් ද මේ කරන්නේ ඉලිකෝ?"

"මම ළිඳක් හාරනවා."

"ළිඳක්? ඒත් නුඹට ළිඳකුයි ඒ මදිවට කඳිම උල්පතකුයි තියෙනවානේ!"

"ඔව් තියෙනවා තමා. ඉතිං දැන් මම තව ළිඳක් හාරනවා! උඹ ඒකට විරුද්ධ ද?"

"අපි එතකොට මිදිවත්තේ වැඩට යන්නෙ නැද්ද?" මම ඇසීමි.

"පලයව් යන්ඩ!" ඉලිකෝ වළෙන් එළියට බඩගාමින් කෑගැසී ය. "පලයව් යන්ඩ වදකාරයෝ!"

මැඩගත් සිනාව නිසා හතිලමින් ඉලේරියනුත් මමත් පාරට දිවුවෙමු.

...ඉලිකෝ මුළු සතියක් ම වළ හාරමින් ගෙවී ය. ඇපල් ගස යට ගුල ගැඹුරු වළක් බවට පැමිනුණි. කිසිවක් සොයාගත නොහැකි වූ තැන ඉලිකෝ තවත් තැනක් හාරන්නට ගති. තවත් දින ගණනාවක් ගෙවිණි. ඉලිකෝගෙන් දිස්වූයේ දුක්බර දසුනකි. ඔහු වැහැරී ගියේ ය, නිතර කෝපයට පත් විය, තෙහෙට්ටුව නිසා පාරේ ඇවිද ගියේ අසීරුවෙනි.

"දැන් හොඳට ම ඇති!" ඉලේරියන් කියා සිටියේ ය. "ඔහොම ගියොත් මිනිහා නවතින්නේ මිනීවළේ... අපි ඒක අද ඌට නවත්තන්ඩ ඕනෑ!"

රැය උදා වූ විට ඇපල් ගස නොදුරෙහි රහසිගතව වැතිර ගත් අපි අපේ මහා කුමන්ත්‍රණයෙහි ජයග්‍රාහී සමාප්තිය තෙක් මැඩගත් හුස්මෙන් යුතුව බලා හුනිමු.

දොර කිරි කිරි හඬ නගන විට මැදියම් රැයට ළං වී තිබිණි. සතුරු මුරපොළකට ඇදෙන ස්වෙච්ඡා සෙබළකු මෙන් ඉලිකෝ වළ දෙසට ඇදෙනු අපි දුටුවෙමු. තවත් මිනිත්තුවක දී ඔහු වළ තුළ නොපෙනී ගියේ ය.

අපි වළේ ගැට්ය ළඟට ම බඩගෑවෙමු. වළේ ඇදිරිය තුළින් හතිලන හඬත්, හැරූ පස් පොඩි කරන හඬත් අපට ඇසිණි. එක්වර ම යකඩයක් කිසියම් තද දෙයක වදින හඬ ආවේ ය. සැඟවෙනු පිණිස අපි අසල වූ පඳුරු වෙත හනිකට බඩගෑවෙමු. මිනිත්තු කීපයකට පසු ඉලිකෝ දණිපනි ගා වළෙන් ගොඩවූයේ විසල් මැටි හට්ටියක් අතේ ඇතිව ය. ඇපල් ගස යට හිඳගත් ඔහු කුරුසය ලකුණු කොට පියන හැර එතුළට අත දැම්මේ ය... එක්වර ම ඔහුගේ මුහුණ විකෘති වී ඇද වී ගියේ ය. අත ගස්සා ඇදගත් ඔහු එය සිඹ බැලී ය. වැළමිට තෙක් තැවරී තිබුණේ කිසියම් දහජරා දියරයකි. වෙනත් මොහොතක, වෙනත් අයුරකින් ඉලේරියන් සහ මා ඇගේ ගා ගත්තේ මේ දියරය ම ය.

දිගු වේලාවක් යන තුරු ම ඉලිකෝ නිසලව හිස බිමට නවාගෙන හුනි. ඉක්බිති, තමාට ම කියා ගන්නාක් සේ පහත් හඬින් කියවන්නට විය:

"ඉලේරියන් ෂෙවර්නාඩ්සේ, දැන් ඉතිං උඹට සනීප ඇතිනේ! උඹ මාව මුළු ලෝකෙ ඉස්සරහම ලැජ්ජාවට පත් කළා. මේ හත් ජරාව ගන්ඩ උඹ මා ලවා ළිං දෙකක් කැප්පෙව්වා!" ඔහු මුට්ටියට තදින් පයින් ගැසී ය. "හොඳා එහෙනං! ඒක එහෙම වෙච්චාවේ! මං දන්නවා උඹ ළඟපාතක ම පඳුරක් අස්සේ හැංගිලා පණ යනකං හිනාවෙනවා කියලා... හිනාවෙයං ඇති තරං. හැබැයි මට පේන්ඩ නං එන්ඩ එපා! ආවොත් මං උඹව මරණවාමයි! බඩවැල් එළියට අදිනවාමයි! එතකොට කෝ අර බැල්ලිගෙ පුතා සුරිකෝ? ඌත් උඹ එක්කම වෙන්ඩැති! වෙන කොහේ ඉන්ඩ ද?... අනිත් අතට මං මට ම මිසක් වෙන කාටවත් බැනලා වැඩක් තියේ ද... අනේ මං වගේ මෝලෙක්! තඹයක් අතේ නැතුව හිටිය මගේ තාත්තා නිධානයක් හැංගුවාය කියලා හිතපු හැටි! අනේ මට මේ මුට්ටිය බොලාගේ නීච ඔළුගෙඩිවල ගහලා පොඩි කරන්ඩ ඇත්තං, මට සාමයෙන් මැරෙන්ඩ පුළුවනි! මට ටිකක් සංසුන් වෙන්ඩ ඇරලා ඇවිත් ජය සමරාපල්ලා! හැබැයි දැන් නං මට පේන්ඩ එපා! මං උඹලා දෙන්න ම මරණවාමයි! උඹලව මැරුවේ නැත්තං මං මාව ම මරාගන්නවා. මාරක පවක් කරගන්ඩ මාව පොලඹවන්ඩ එපා!"





ඉලිකෝ නැඟිට ගේ දෙසට පියනැඟී ය. එක්වර ම ඔහු අප සැඟව හුන් පඳුරු දෙසට හැරුණේ ය.

"මං බලාපොරොත්තු වෙනවා උඹලා හෙට උදේ ඉර පායද්දි මගේ මිදි වත්තෙ වැඩට වාර්තා කරයි කියලා! පරක්කු වුණොත් බලාගන්ඩ පුළුවනි, රස්තියාදුවෝ!"

...සැඟවුම්පොළෙන් පිටතට ආ අපි ඉස්කෝප්ප දෙකක් සොයාගෙන රැයේ ඉතිරි මුළු කාලය පුරා ම අපේ ආදරණීය කටසැර ඉලිකෝගේ මිදිවත්ත කෙටුවෙමු.

## පාකිසෝ

අත්තම්මාටත්, ඉලිකෝටත්, ඉලේරියන්ටත් මටත් පොදුවේ අයිති එළදෙනක් සිටියා ය. ඇගේ නම පාකිසෝ ය. ඇයට මගේ අත්තම්මාට තරම් වයස ය. අඩුතරමේ ඉලිකෝට තරම්වත් වයස ය. අවුරුදු පහක් තිස්සේ ම පාකිසෝ මාතෘත්වයේ කටයුත්ත සැපිරීම ප්‍රතික්ෂේප කරමින් සිටී. අපි ඇයට වඩාත් පෝෂ්‍යදායි ආහාර දුනිමු. සෑම වර්ගයක ම ඔසු සහිත පානයන් පෙව්වෙමු. එහෙත් කිසිදු පලක් වූයේ නැත. තවත් නම් වසු පැටවුන් මෙලොවට ගෙන ඒම පාකිසෝ ප්‍රතික්ෂේප කළා ය. එසේ නමුදු ඈ නොකඩවා ම අපට කිරි ලබා දුන්නා ය. එහෙයින් අපි ඇගේ පැටවුන් ලැබීමේ ලැදියාවේ අඩුව අමතක කළෙමු. අපේ පන්ගුකාරීත්වයේ නීති අනුව අත්තම්මා සහ මා සමඟත්, ඉලිකෝ සමඟත්, ඉලේරියන් සමඟත් පාකිසෝ මාරුවෙන් මාරුවට ජීවත් වූවා ය. ඇය ඇගේ සියලු ස්වාමිවරු කෙරේ සමාන සෙනෙහසක් පෑවා ය. එහෙත් ඇය සිහිකල්පනාවෙන් තොර එකියකි. ඇර තිබෙන කුමන හෝ ගේට්ටුවෙන් ඇතුළු වන ඇය ඕනෑ කෙනකුට තමාගෙන් කිරි දොවා ගන්නට ඉඩ හැරියා ය.

කෙසේ වුව ද මේ ගිම්හානයේ පාකිසෝ ගොඩ නොඑන තරමට ම අසනීපයෙන් වැටුණා ය. ඈ තවදුරටත් කිරි දීම නතර කළා ය. ඇගේ කෑම රුචිය නැතිව ගියෙන් කෙට්ටුවන්නට වූවා ය. සැමටමත් වඩා ඇගේ මානසික හැකියාව නැතිව ගිය වගක් පෙනුණි. අත්තම්මා, ඉලිකෝ හෝ ඉලේරියන් යාන්තමින් හඳුනාගත් ඈ මට සැලකුයේ මුළුමනින් ම අමුත්තකු ලෙසිනි. කොටින් ම, එළදෙන ඇගේ ජීවිතයේ අවසානයට ළඟා වී තිබිණි. ඇගේ සම පවා අළු පැහැව ගොසිනි. ඈ වෙනත් කාට හෝ තෑගි කරන්නට අපි මුල දී උත්සාහ කළෙමු. එහෙත් ඈ බාරගන්නට කිසිවෙක් නැති බව පෙනුණු හෙයින් අපි වටමේස සාකච්ඡාවක් ඇරඹීමු.

"හැමදේට ම සීමාවක් තියෙනවා!" අත්තම්මා ඇරඹුවා ය. "ඉතිං එළදෙනකටත් එහෙම තමා. ඒත් අපි මේ සතාට මොකද කරන්නේ?"

"විකුණමු!" ඉලේරියන් කීවේ ය.

"මොනව ද නුඹ විකුණන්ඩ යන්නේ? ඇට කෑලි ටික ද? ඒවායින් කාටවත් ඇති පලේ මොකක් ද?" ඉලිකෝ කීවේ ය.

"ඇයි ඇට? මස්!"

"කොහේ ද නුඹට මස් පේන්නේ?"

"අපි ඇව ආණ්ඩුවට විකුණමු, මස් සම්පාදක අංශෙට." ඉලේරියන් කීවේ ය.

"බාරගන්න එකක් නෑ."

"නුඹ හරි වෙන්ඩ පුළුවනි..."

"බාගෙදා හමටවත් මොනවා හරි ගෙවන්නෙ නැතෑ?"

"මං හිතන්නේ ඒකි වයස හින්දා මැරෙයි." මම කීවෙමි.

"මට ඕනෑ කරන අන්තිම දේ තමා ඒකි වළලන්ඩ කරදර වෙන එක!" ඉලේරියන් කීවේ ය.

"අපි ඒකිව සැපයුම් කාර්යාලෙට අරන් ගිහින් බලමු, මොකද වෙන්නේ කියලා."

ගමන සඳහා අපි උදේ පාන්දරින් ම සූදානම් වන්නට වීමු. මම පාකිසෝ පිස දැමීමි, ඉලේරියන් ඇයට ලුණුමය පානයක් දුනි, ඉලිකෝ ඇයට අලුත් තණකොළ ටිකක් කන්නට බල කළේ ය, අත්තම්මා ඇගේ දණිස් උණු දියෙන් තැව්වා ය. හැන්දෑවේ දෙක වෙද්දී ඇය ඉතා කඩවසම් විය – හරියට ම වයින් මල්ලක් සේ පිරුණේ විය. අපි ඇයව ගාම්භීර පූර්වකව ගේට්ටුව තුළින්



දැක්කුවෙමු. සම්පාදක කාර්යාලයට කිලෝමීටර් තුනක පමණ ගමන් දුරකි. මීටර් සීයක් යන්නට ද පෙර අත්තම්මා හඬගෑවා ය.

"නැවතියල්ලා, අපි ආපහු යමු!"

"මොකද ඔල්ගා හාමිනේ? දැන් ඈ පිටට ගත්ත හින්දා අපිට දැන් නවතින්ඩ බෑ!" ඉලිකෝ කී ය.

"මට ඇගෙන් දොවාගන්ඩ බැරිවුණා!"

"සුරිකෝ බැරල් එකක් අරන් එනවා!" ඉලේරියන් හඬ තැළී ය.

මම ආපසු ගෙදර දිවගොස් තේ බොන වීදුරුවක් ගෙන ආවෙමි. අත්තම්මාත්, ඉලිකෝත්, ඉලේරියනුත් මාරුවෙන් මාරුවට පාකිසෝගෙන් කිරි දෙවූහ. ඒ අතර මම ඇය වැටීමෙන් වළකන්නට ඇගේ අංවලින් අල්ලාගෙන සිටියෙමි. අන්තිමේ ඔවුහු පෙණ කැටි සහිත දියරයෙන් යුතු වීදුරුව මට දුන්හ.

"අපි පස්සේ ඕක කොටස්වලට බෙදමු." ඉලිකෝ කඹය ගස්සමින් මහ හඬින් සිනාසුණි.

පාකිසෝ මහත් නොකැමැත්තෙන් අඩියක් එසැවූවා ය.

ගම පසු කළ අපි දැන් සිටින්නේ මහ මඟෙහි ය. හිටිහැටියේ ම පළමුව එක් පයක් ද එසැණින් තවෙකක් ද දණිස්වලින් නැමී ඇද වැටුණු පාකිසෝ උම්බෑ හඬින් ලතෝනි දුන්නා ය.

"මොකද, මහ පාර මැද්දේ යාච්ඤා කරන්ඩ ගත්ත ද?" ඉලිකෝ කීවේ තර්ජනාත්මකව ය.

"ඈ පොඩ්ඩක් විවේක ගත්තාවේ!" අත්තම්මා කීවා ය.

"මෙහෙම ගියොත් නං සුමානෙකින් මෙහා යන්ඩ බැරිවෙයි." ඉලේරියන් කන්කෙඳිරි ගෑ ය.

"ඒකිට ඔය බෝතලේ පොඩ්ඩක් ඉව කරන්ඩ දෙනවා." ඉලිකෝ මට කී ය.

මම ලුණු පුසුඹින් යුතු බෝතලය පාකිසෝගේ නාසයට ළං කළෙමි. ඇය කිවිසුමක් හැර කන් සෙලැවූ නමුදු නැගිට්ටේ නැත.

"ඕකිගේ වල්ගේ කරකවලා බලනවා!" ඉලිකෝ අණ කළේ ය.

ඉලේරියන් එළදෙනගේ වලිගය කරකැවී ය. උඩ පැන නැගිටගත් පාකිසෝ පිම්මේ දුවන්නට වූවා ය.

"ඈ පස්සෙන් දුවපල්ලා, කොල්ලනේ!" අත්තම්මා අණ දුන්නා ය.

"ඒකිව අල්ලාගනිල්ලා නැත්තං කොහේ යයි ද දන්නෑ!" ඉලිකෝ ප්‍රමෝදයෙන් සිනා පෑ ය.

"හැබැටම ඉලිකෝ, කවුරුහරි ඒකිව හොරා ගත්තොත් හෙම?" අත්තම්මා විරෝධය පෑවා ය.

යාර විස්සක පමණ වේගවත් ධාවනයකින් පසු නැවතුණු පාකිසෝ මඟබඩ වූ තණ මත වැතිර ගත්තා ය.

"අපොයි අම්මේ! මෙහෙම ගියොත් නං ඒකි පණපිටින් අරන් යන්ඩ ඉතුරු වෙන්නෙ නෑ." ඉලිකෝ කීවේ ය.

පාකිසෝ දෑස් පියාගත්තා ය. ඉතිං අපි යළිත් ඇගේ වලිගය ඇඹරීමු. එසැණින් උඩ පැන නැඟිට ගත් ඇය කොතෙක් වේගයෙන් පිම්මේ දිවුවේ දැයි යත් මොහොතකින් පාරේ වංගුවෙන් නොපෙනී ගියා ය.

බිම හිඳගෙන දුමක් බිවූ අපි කඩිමුඩියෙන් තොරව සෙමින් ඇවිද ගියෙමු. වංගුවෙන් පසු පාර එක දිගට කෙළින් ඇදෙයි. එහෙත් පාකිසෝ පෙනෙන තෙක් මානයක නොවූවා ය.

"කෝ එළදෙන?" අත්තම්මා බියපත්ව හඬගෑවා ය.

අපි පියවර ඉක්මන් කළෙමු. ඊළඟ වංගුව හැරෙනවාත් සමඟ ම අන්තිමේ අපට පාකිසෝ දකින්නට හැකි විය. ඇය මඟබඩ පඳුරක සෙවණේ විවේක ගනිමින් උන්නා ය.

"නැඟිටහන් පාකිසෝ!" ඉලේරියන් කියා සිටියේ ය.

එළදෙන ඔහු වෙත හෙළූ බැල්ම මෙසේ අසන්නාක් වැනි විය:

"යාළුවේ නුඹලා ඔක්කොම ඉන්නව ද?"

"හා හා ඉතිං නැඟිටහන්!" ඉලිකෝ ද කීවේ ය.

පාකිසෝ ඔහු නොසලකා හැරියා ය.

"නුඹට නැඟිටගන්ඩ බෑ වගේ ද පාකිසෝ?" අත්තම්මා කාරුණික හඬින් ඇය ඇමතුවා ය.

උදාසීනව වලිගය වැනූ ඇය හිස බිම හොවා දෑස් පියා ගත්තා ය.

අපි දොම්නස් නිහැඬියාවකින් දැහැන්ගතව ඇය වටා සිටගෙන සිටියෙමු.

මගියෙක් ආවේ ය. ඔහු පාකිසෝ දෙස දිගු වේලාවක් දෑස් හයා බලා හිඳ ඉක්බිති සානුකම්පිත ලෙසින් කතා කළේ ය.

"මැරිලා, එහෙම ද?"

"නින්දට වැටිලා!" ඉලිකෝ පිළිතුරු දුනි.

මගියා අප වෙත ආයාසකර බැල්මක් හෙළා පා ඉක්මන් කොට සිය ගමන යන්නට ගියේ ය.





"හා දැන්වත් ඉතිං නැඟිටහන්," ඉලේරියන් එළදෙන වෙත නැඹුරු වී කීවේ ය.

"නැඟිටපිය බොල, හම ගහන්ඩ කලින්!" ඉලිකෝ අපේක්ෂා භංගව කෑගැසී ය.

පාකිසෝ කනකුඩු නොසෙල්වූවා ය.

ඔසොවාගෙන යාම හැර වෙනත් කළ හැකි දෙයක් නොවිණි.

"ඉස්සරහින් ඉලේරියන්!"

"දෙමු තල්ලුවක්!"

"කකුලෙන් අල්ලාපන්! ඔය කකුලෙන් නෙවෙයි, අනිකෙන්!"

"වලිගෙන් ඇදපන්!"

"බෙහෙත් ඇබින්දකුත් ගේන්ඩයි තිබ්බේ!"

"හරි අල්ලමු හා!"

"වල්ගෙන් අල්ලාගන්ඩ ඔල්ගා හාමිනේ!"

"කකුලෙන් අල්ලන්ඩ! ඉස්සරහට! හරි...! දැන් තව පාරක්! ඔන්න යනවා!"

"තව ඩිංගක් අල්ලාගෙන හිටින් පාකිසෝ!"

"උඹ තාම එච්චරට නාකි නෑ බං හැබැටම!"

මෙසේ අපි අන්තිමේ සැපයුම් කාර්යාලය වෙත ළඟාවන විට අඳුර වැටෙමින් තිබිණි. ගේට්ටුව ළඟ දී පාකිසෝ වැතෙන්නට වූවා ය. පැහැදිලිව ම ඒ තවත් වරක් බිම වැතිරගන්නට ය.

"ලුණු!" ඉලේරියන් කොඳුරා කීවේ ය. "කොහෙ ද බත් බලන්නේ සූරිකෝ නොදකින් විතරක්!"

"මට මේ මළඉලව් රස්සාව ඇති වෙලා!"යි කියවූ මම ලුණු බෝතල් බාගයක් ම එළදෙනගේ නාසයට වීසි කළෙමි.

පාකිසෝ පිම්මේ මිදුලට වැදුණා ය.

"ඒකිව තරාදියට නග්ගාපන්! ඉක්මනට හා!" මගේ කනට කෙඳිරූ ඉලේරියන් කාර්ය භාර නිලධාරියා වෙත ගමන් ගති.

"සුබ සැන්දෑවක්! අපි එළදෙනක් ගෙනාවා..."

"නම?"

"එළදෙනගෙ ද?"

"අයිතිකාරයගේ!"

"වෂලොම්ඩ්සේ, විගොගිඩ්සේ, ෂෙවාර්නාඩ්සේ..."

"නම!"

"අයිතිකාරයින්ගෙ ද?"

"එළදෙනගේ!"

"පාකිසෝ!"

මිනිසා පාකිසෝ වෙත පැමිණ ඈ දෙස දිගු වේලාවක් බලා හුනි.

"ඔහේ හිතන්නේ මොකක් කියල ද?"

"ඇයි, එළදෙනක් නෙවෙයි ද?" ඉලේරියන් ඇසුවේ ය.

"එළදෙනකගේ හෙවණැල්ලක්!"

"ඒකි පැත්තෙන් ඇබින්දක් කෙට්ටුයි නං තමා!" ඉලිකෝ පිළිගත්තේ ය.

"මොකෝ ඈ තරාදියෙ ලැගලා ඉන්නේ?"

"ඒකෙ වෙනස මොක ද? ලැගලා උන්නත්, හිටගෙන උන්නත් බර එකමයි!"

"බාගෙදා ඒකි මැරිල ද?"

"උඹ මේ මොනවා කියනව ද පුතේ? දැක්කෙ නැද්ද මිදුලට පිම්මේ පැනං ආපු හැටි?" අත්තම්මා තර්ක කළා ය.

"ඒකි මෙතැනට එනකම්ම පැන පැන නට නටා ආවේ!" ඉලේරියන් ස්ථිර කළේ ය.

මිනිසා තරාදිය වෙත පැමිණ, නැවී බලා, පාකිසෝ ස්පර්ශ කොට පහත් හඬින් කතා කළේ ය.

"මේ එළදෙන මැරිලා."

"ඒක වෙන්ඩ බෑ!" ඉලේරියන් විරෝධය පෑ ය. "ඒකි නිදාගෙන වෙන්ඩ ඕනෑ!"

"ඒකි මැරිලා! හුස්ම ගන්නෙ නෑ!"

"බාගෙදා ඔහේ ඒකි නින්දෙන් ගොරෝනවා අහන්ඩ කැමති ඇති?"

මම පාකිසෝ වෙත ගොස් බෙල්ලේ නහරයක් අල්ලා බැලීමි. ඈ ඇත්තවශයෙන් ම මියගොස් සිටියා ය.

"මේකාව වත්තෙන් අහක් කරගන්නවා." මිනිසා අණ කළේ ය.

අපි පාකිසෝ වත්තෙන් එළියට ඇදගෙන ගොස්, ගොළුව, බලාපොරොත්තු සුන්ව පාර අයිනේ හිඳගතිමු.

"මළකුණ පාරේ අයිනෙ හෙම දාලා යනවා නෙවෙයි හොඳේ!" මිනිසා මිදුලේ සිට කෑගැසුවේ ය. "එක්කො වළදානවා, නැත්තං ගෙදර ගෙනියනවා!"

…අන්තිමේ ඉලේරියන් නිහැඬියාව බිඳින විට අහසේ තාරකා දිලිසෙන්නට ගෙන තිබිණි.



"අපි පාකිසොව වළලන්ඩ ඕනෑ…"

"ඒකි ඔය ඉන්න හැටියෙන් ඉන්ඩ ඇරලා පැනගත්තොත් මොක ද?" ඉලිකෝ යෝජනා කළේ ය.

"එහෙම කරන්ඩ බෑ! මළ මිනියක් නං ශිෂ්ට විදිහට වළලන්ඩ ඕනෑ!" ඉලේරියන් කෝප වී කීවේ ය.

"අපි මළගිය කෙනාගේ ඥාතීන්ට දන්වමු. සුරිකෝ ටෙලිග්‍රෑම් ලියාපන්." ඉලිකෝ මට උපදෙස් දුනි.

"එකැස් යක්ෂයා, මේක හිනාවෙන්ඩ දෙයක් කියලා හිතුව ද?" ඉලේරියන් පුපුරා හැලුණි. "දැනගනිං මේ එළදෙන මට මගේ අම්මටත් වඩා ළඟයි, මං හැදුණේ ඒකිගෙ කිරිවලින්!"

"ඔල්ගා හාමිනේ අපි මොකද කරන්නේ?" නිහඬව කඳුළු සලමින් හුන් අත්තම්මාගෙන් ඉලිකෝ ඇසී ය.

"අපි ඇව වළලන්ඩ ඕනෑ, ඒත් කොහේ ද? එතකොට අපි කොහෙන් ද සල්ලි ගන්නෙ?"

"ඇත්ත!" ඉලේරියන් කීවේ කල්පනාබරව ය.

පාවහන් නොලෑ, වැරහැලි හැඳි කොලු පැංචෙක් පාර දිගේ ආවේ ය. ඔහු ආවේ ප්‍රීතිමත් ගීයක් සිවුරුහං කරමිනි.

"ඒයි කොලුවෝ මෙහේ එනවා!" ඉලේරියන් ඔහුට කතා කළේ ය. ළමයා ආවේ ය.

"මොකක් ද නුඹේ පවුලෙ නම?"

"සිමොනිෂ්විලි."

"කොහේ ද නුඹ ඉන්නේ?"

"ආන් අරෙහෙ…" ළමයා අඳුරට අත දිගු කළේ ය.

"මොකක් කියල ද නුඹට කතා කරන්නේ?"

"මරට්!"

"එතකොට නුඹෙ තාත්තට තව හුඟක් මරට්ලා ඉන්නව ද?"

"ගෑනු ළමයි හයයි, එක පිරිමි ළමයයි."

"සුබපැතුම්! නුඹට මේ එළදෙනව පේනව ද?"

"මේ එළදෙනක් ද?"

"කට වහගන්නවා! මේ එළදෙන උඹ වගේ නිකම්මු සියක් හදාවඩා ගන්ඩ උදවු කළා කිරි, චීස්, බටර් දීලා. තේරුණා ද? හිතන්ඩ එපා ඒකි නිකං අයාලෙ ගිය එකියක් කියලා. අපි තමා ඒකිගේ අයිතිකාරයෝ. ඇත්තවශයෙන් ම ඒකි දැන් මැරිලා, ඒත් කොහොම වුණත් ඒකි පණ ඇති එළදෙන්නු ගාණකට වඩා වටිනවා. සමහර

ශුද්ධ වූ සත්තු හැටියට...
රටවල්වල එළදෙන්නු සලකන්නේ
මොකක් ද ඒ රටට කියන නම සූරිකෝ?

"ඉන්දියාව!"

"ආන් හරි. ඉන්දියාවෙ දි එළදෙනට වන්දනාමාන කරනවා...
එළදෙනක්..."

"මේ, මට කියනව ද මාමේ ඔහේට මොනව ද ඕනෙ කියලා, මට
යන්ඩ හදිස්සියි!" ළමයා බාධා කළේ ය.
මේ එළදෙනව වළලන්ඩයි ඕනෑ...

"මට ඕනෑ ඉලව්වක් නෑ. ගෙදර දුවලා ගිහින් ඉස්කෝප්ප
මෙතන දහයක් තියෙනවා. උඹේ සහෝදරියො ටික එක්කලා ඇවිත් මේ
දෙකකුත් එක්ක
එළදෙනව වළදාපන්. පැහැදිලි ද?"

"රූබල් දහයක් මදි!"

"එහෙනං මෙන්න තව දහයක්!"

"ඒත් මදි!"

"මෙන්න තව පහක්!"

"මදි...!"

"එහෙනං තව තුනක්!"

"මදි...!"

"මොකක්ද කාලකණ්ණියෝ 'මදි' කියන එකේ තේරුම? රූබල්
විසි අටක් මදි ද මැරුණු එක එළදෙනකට?"

"එහෙනං බම්බු ගහගන්නවා." මරට් යන්නට හැරුණි.

"නැවතියන්! මෙහෙට වරෙන් අසික්කිතයා! එතකොට උඹට
කීයක් ඕනෑ ද?"

"රූබල් පනහක්!"

"රූබල් පනහක්?" ඉලේරියන් දත් කුරු කමින් දහයේ නෝට්ටු
පහක් ගැන්නේ ය. "ඒකිව අද ම වළලාපන්, ඇහුණ ද?"

"අද නං බෑ. දැන් රෑ වෙලා වැඩි. මං හෙට පාන්දර ම ඒකිව අහක්
කරන්නං..."

"අහක් කරන්ඩ නෙවෙයි, කාලකණ්ණියෝ!... මගේ ඇහැ දිහා
කෙළින් බලාපන්, හොඳට මතක තියාගනින්. හෙට උදේ මං
මෙතෙන්ට එද්දී වළක් මෙතන නොතිබ්බොත් මං උඹේ ගේ ගිනි
තියනවා, පැහැදිලි ද?"

"ඔව්!"යි කී මරට් අන්ධකාරය තුළ අතුරුදන් විය.



...සතියකට පසු මම දොරකඩට වී සිටගෙන අත්තම්මාටත්,
ඉලිකෝටත්, ඉලේරියන්ටත් ඇසෙන සේ ලිපියක් කියවමින්
සිටියෙමි. ගමේ සෝවියට් සභාවේ මුරකරු විසින් ගෙන ආ එය
ප්‍රාදේශීය සනීපාරක්ෂක පරීක්ෂක කාර්යාලයෙන් එවූවකි.

"පුරවැසියන් වන වෂලොම්ඩසේ, විගොගිඩසේ සහ
ෂෙවර්නාඩසේ වෙත, ජූලි නම වැනිදා ඔබ විසින් දිස්ත්‍රික් මහා
මාර්ගය අයිනේ වැස්සියකගේ මළ කුණක් අතහැර දමා ගොස් තිබේ.
වසංගත රෝගයක් ඇතිවීමේ ඇති හැකියාවත්, අප්‍රසන්න ගඳ
පැතිරීමත් නිසා අසල්වැසි පදිංචිකරුවන්ගේ සාධාරණ කෝපයට
එය ලක් වී තිබේ. එහෙයින් රූබල් 300ක දඩයකට ඔබව යටත් කරනු
ලැබේ."

ලිපිය අත්සන් කොට තිබුණේ 'දිස්ත්‍රික් සෞඛ්‍ය පරීක්ෂක
කාර්යාලයේ ප්‍රධාන වෛද්‍යවරයා' විසිනි.

"මං හිතන්නේ, මේ දඩය ගෙවන්ඩ ඕනෑ ඉලේරියන්." මඳ
නිහැඬියාවකින් පසු ඉලිකෝ කීවේ ය.

"ඇයි ඉලේරියන්?" එසේ ඇසුවේ අත්තම්මා ය.

"මොකද ඔය එළදෙන එයාගෙ අම්මටත් වඩා කිට්ටුවෙන් උන්නු
හින්දායි, එයා හැදුණේ ඒකිගෙ කිරිවලිනුයි හින්දයි." ඉලේරියන්
පිළිතුරු දුනි.

"එතකොට කවුද කීවේ එළදෙනව සැපයුම් කාර්යාලෙට අරන් යං
කියලා?" ඉලේරියන් කීවේ කෝපයෙනි.

"ඔහේ තමා!" මම ඔහුට සිහිපත් කළෙමි.

ඉලේරියන් තවත් වදනකුදු නොදෙඩී ය. ගෙදර ගොස් කාමරයට
වැදී දොර වසාගත් ඔහු සැන්දෑ වෙන තුරු එළියට නාවේ ය.

මේ අතර මහමග දිගේ ගමන් ගත් ඉලිකෝ සහ මම අපට හමුවන
සැම පිරිමි ළමයකු ම නවතා මිහිරි ම ස්වරයෙන් ඔහුගේ නම ඇසීමු.
එහෙත් කිලෝමීටර් විස්සක් පුරා ඇවිද ගිය ද මරට් නමක් දැරූ
කිසිවෙක් මුණගැසුණේ නැත...

මම තවදුරටත් ගම්බද කොල්ලා සූරිකෝ නොවෙමි. මම දැන්
උසස් අධ්‍යාපනයක් සහිත වැඩිහිටියෙක්මි. සූරාබ් ව්ලැඩිමිරෝවිච්
වෂලොම්ඩසෙ වන මා අර්ථ ශාස්ත්‍රඥයකු ලෙස සුදුසුකම් සපුරා
ඇති බවත්, සෝවියට් ජනරජයේ ඕනෑ ම සමූහාණ්ඩුවක්, නගරයක්,
ගමක් සඳහා එය වලංගු බවත් මගේ ඩිප්ලෝමා සහතිකය කියයි. මම
මගේ කබා කරපටියෙහි විශ්වවිද්‍යාල උපාධි සලකුණ පලඳිමි. ඒ

සඳහා මගේ අලුත් ම ඇඳුම් කට්ටලය හිල් කිරීමට සිදුවීම ගැන මම මදක් හෝ කනගාටු නොවීමි.

අලුත් තේජවන්තයා බලාපොරොත්තුවෙන් අත්තම්මාත්, ඉලිකෝත්, ඉලේරියනුත්, මෙරිත් වසන මගේ උපන් ගමට මම එමින් සිටිමි. මම ගෙදර ගොස් අලුත මිදි වත්තක් වවා අවුරුදු තුනකින් පසු පළමු 'ට්සොල්කව්රි' මිදි අස්වැන්න නෙළා ගනිමි. මම මගේ ගමේ ම ජීවත්වෙමින් වැඩ කරමි. මට නිවෙසක් තිබෙනු ඇති අතර මිදුලේ මුරාඩා නම් බල්ලෙක් සිටිනු ඇත. මට මෙරි හිමිවනු ඇති අතර අපට දරුවන් දොළහක් ලැබෙනු ඇත. ඉන් එකොළහක් පුතුන් වනු ඇති අතර දොළොස්වැනියා සුන්දර, නිල් පැහැ ඇස් ඇති සීරා නම් දුවක් වනු ඇත. මම නිතර නිතර නගරයට ගොස් බිරිඳට සහ දරුවන්ට තෑගි ද, එසේ ම පොත් ද ගෙන එමි. මම අත්තම්මාට ද ඇය ප්‍රීතියෙන් හඬවාලන තරම් කදිම තෑගි ගෙන එමි.

මම ඉලිකෝ සහ ඉලේරියන්ට ද තෑගි ගෙන එමි. ඔවුන් මට සිනාසෙන්නට එඩිතර නොවන තරම් ඒ තෑගි කදිම ඒවා වනු ඇත. මම මාර්තා නැන්දා බලන්නට යමි. ඇයට මම අත්තම්මා දෙන තෑගි ගෙන යමි. මාර්තා නැන්දා ද ප්‍රීතියෙන් හඬනු ඇත.

ඔවුන් සැම දෙනට – ඉලිකෝට, ඉලේරියන්ට සහ මාර්තා නැන්දාට – මගේ නිවෙසේ පදිංචියට එන මෙන් ආරාධනා කරමි. අපි සියලු දෙනම එකට ජීවත් වන්නෙමු. අපට බොහෝ දරුවන් ද, මුණුබුරන් ද, මී මුණුබුරන් ද සිටිනු ඇත. අපි මහ තොගයක්, මුළු ගමක් වනු ඇත. තවත් පසු කලෙක අප ඊටත් වඩා වැඩි පිරිසක් වී මුළු ලෝකය ම අප වනු ඇති. අපි කිසිදාක මිය නොයන්නෙමු, අපි සදහට ම ජීවත් වන්නෙමු.

අපේ ගම දෙසට වූ මගෙහි බර අඩි තබන මගේ සිතුවිලි එවන් විය. මාවත තද බෑවුමැතිව ඉහළ නඟියි. කන්ද මුදුනට ළඟා වී, ගලක් මත හිඳගත් මම මගේ ම අල්ලේ වූවාක් සේ පෙනෙන, නිම්නයෙහි වැතිර ගත් මගේ ගම දෙස බැලුවෙමි. අපේ ගෙදර දුම් හටයෙන් කැරලි ගැසෙමින් ඉහළට දුම් නැඟිණි. එහෙත් මිදුලෙහි අත්තම්මා සිටිනු දකින්නට මට නොහැකි විය. මම බොහෝ වේලාවක් බලා සිටියෙමි. අන්තිමේ මම පල්ලම දිගේ වේගයෙන් දුවන්නට වුණෙමි.

"අත්තම්මේ!" වත්තට ඇතුළු වෙමින් මම හඬ තැළීමි.

කිසිදු පිළිතුරක් නැත. මම දොරකඩට දිවුවෙමි. සියල්ල නිහඬ ය. මම කාමරයට ඇතුළු වුණෙමි. එතුළ අඩ අඳුරියකි. අත්තම්මා ඇඳේ



වැතිර සිටියා ය. මම ඇය වෙත නැමුණෙමි. ඈ නින්දේ ය. ඇඟිලි තුඩුවලින් ආපසු දොරකඩට ආ මට එහි සිටින ඉලිකෝත් ඉලේරියනුත් මුණගැසුණි.

"ඉලිකෝ! ඉලේරියන්!" මම සතුටින් සිනා පෑවෙමි.

"සුරිකෝ!" ඔවුහු උපේක්ෂා සහගතව පිළිතුරු දුන්හ.

"නුඹලා දෙන්නට මක්වෙලා ද?"

"එයා ඊයේ ඇද වැටුණා… අපි හිතුවෙ නෑ උඩේ වෙනකංවත් ඉඳී කියලා… විදුලි පණිවුඩේ ලැබුණෙ නැද්ද?"

"මොන විදුලි පණිවුඩේ ද?"

"එයාගෙ තත්ත්වෙ නරකයි… අන්තිම ගානයි…" ඉලිකෝ අසීරුවෙන් කීවේ ය.

මම ආපසු කාමරය දෙසට දිවුවෙමි.

"එයා නිදාගත්තාවේ…"

මම කීකරුව හිඳ ගත්තෙමි.

…අත්තම්මා සැන්දෑ වෙන තුරු ම නිදාගත්තා ය. එක්වර ම දෑස් හැරි ඇය මා දෙස බැලුවා ය. දිගු වේලාවක් මා දෙස බලා සිටි ඇය මෘදු ලෙසින් ඇමතුවා ය.

"ඉලේරියන්, මං මේ හීනයක් දකිනව ද, නැත්තං හැබෑට ම මේ මගේ දරුව ද මෙතන ඉඳගෙන ඉන්නේ?"

"මේ මම අත්තම්මේ!" ඇඳ ළඟ දණගැසූ මම ඇය වැළඳ ගතිමි.

"එහෙනං උඹ ආවා, මගේ රත්තරනේ! උඹට උඹේ හදවත කියන්ඩැති උඹේ අත්තම්මාට අමාරුයි කියලා… මගේ අන්තිම වෙලාව ඇවිත්… දරුවට මොකුත් කන්ඩ දුන්න ද ඉලිකෝ?"

"ඔව් අපි දුන්නා ඔල්ගා හාමිනේ."

"වයින් ටිකක් දුන්න ද?"

"එයාට ඕන නෑ කියලා කීවේ…"

"ඇයි එපා කීවේ පුතේ? ගිහින් වීදුරුවක් අරන් වරෙන්… ඒකෙන් උඹේ හිතට සහනයක් දැනෙයි. එතකොට මගෙ මරණෙට එන අසල්වැසියන්ට ඇති තරමට බොන්ඩ දෙන්ඩ ඕනෑ…"

"මොනව ද අත්තම්මේ මේ කියන්නේ!"

"ඕං දැන් ඉතිං උඹේ නිකට වෙනුලනවා හෙම මට පේන්ඩ අරින්ඩ එපා… පුංචි මෝඩයෝ!… මං දැන් මගේ ගමනේ අන්තිමට ඇවිත්… අවුරුදු හැත්තෑ තුනක් කියන්නේ මහ හුගක්… මට ඇති වෙලා… ඒත් මගේ ජීවිතේ ඔක්කොම පිරිලා නැහැ, දෙවියන්

වහන්සේ මට සමාවෙන සේක්වා!… පේන හැටියට ඒ තමා මනුස්ස හදවතේ හැටි. තව පොඩ්ඩක් විතර ජීවත් වෙන්ඩ තියේ නං මං මනාපයි…"

"ඇයි ඔල්ගා හාමිනේ, ඔහේ අපි ඔක්කොට ම වඩා කල් ජීවත් වෙනවා!" ඉලේරියන් විහිළුවක් කරන්නට යත්න දැරී ය.

"ඉලේරියන් ෂෙවර්නාඩ්සේ, ඉස්සෙල්ලා ඔය කඳුළු පිහදාගෙන ඊට පස්සේ විහිළු කරාපන්… පුතේ උඹේ ඉගෙනගැනීම් ඉවර කළා ද?"

මම ඩිප්ලෝමා සහතිකය පෙන්නීමි. එය අතගා බැලූ අත්තම්මා එය ඇයට ඇසෙන සේ කියවන්නැයි ඉලිකෝට කීවා ය. එය කියැවූ ඉලිකෝ ආපසු ඇය අතට ම දුන්නා ය. අත්තම්මා දිගු වේලාවක් නිහඬව උන්නා ය. ඇගේ දෙකපොළ දිගේ කඳුළු කඩා වැටිණි. ඉන් පසු ඩිප්ලෝමා සහතිකය යළි මට දුන් ඇය කතා කළා ය:

"දැන් ඉඳගෙන මං කියන දේ අහගනිං පුතේ… මං උදේ වෙනකං ජීවත් වෙන එකක් නෑ. අන්තිම මොහොතේ නුඹව දකින්ඩ ඉඩ ඇරියට දෙවියන් වහන්සේට මං ස්තුතිවන්ත වෙනවා. මං කිසිම අන්තිම කැමැත්තක් ලියලා නැහැ, ඒත් උඹ වටේ පේන්ඩ තියෙන හැමදේම උඹගේ."

"ඔයා මා එක්ක ඉන්නවා නං මට මොනවාවත් ඕන නෑ!"යි හඬ තැළූ මම අත්තම්මාගේ ඇඳෙහි හිස තබාගෙන ඉකි බින්දෙමි.

"ඔක්කොම හරියාවි පුතේ… අඬාපන්, කමක් නෑ. නැතුව කොහොම ද? තමන්ගෙ ආතම්මගෙ මරණ මංචකේ ළඟ මුණුබුරෙක් අඬන්ට ඕනෑ… ඉතිං දැන් ඇඬුවා ඇති, හොඳට ම ඇති පුතේ." අත්තම්මා මගේ හිස අතගෑවා ය. "මේ දෙන්නාව බලාගනින් පුතේ. ඉලේරියන්ටයි, ඉලිකෝටයි මේ මුළු ලෝකෙන් ම ඉන්නේ උඹ විතරයි. උන්ට ආදරෙන් වගේ ම කීකරුව ඉඳින්…"

ඉලිකෝත් ඉලේරියනුත් මුහුණු බිත්තිය දෙසට හරවාගෙන ළමුන් සේ ඉකිබිඳිමින් උන්හ.

"මට මගේ දරුවා එක්ක තනියම ඉන්ඩ ඇරලා පලයල්ලා..."

ඉලිකෝත් ඉලේරියනුත් ඉවත් නොවූහ.

"කාමරෙන් පලයල්ලා එකැස් යකුනේ! තාම පණපිටින් ඉන්න එකකු හින්දා විලාප තියනවා කවුරු නං අහලා තියේ ද අම්මපා!"

ඔහු දෙදෙන අප තනිකොට පිටවූහ.

"පාත්වෙයන් පුතේ, මට උඹව ඉඹගන්ට…"



මම අත්තම්මා වෙත නැමුණෙමි. ඈ මගේ නළල ද, හිසකේ ද, දෑස් ද, මුහුණ ද, දෑත් ද සිප ගත්තා ය. ඉක්බිති මා වැළඳගත් ඇය මා ඇගේ සිරුරට තදකොට ගෙන දිගු වේලාවක් උන්නා ය.

"මට වයින් වීදුරුවක් දියන් පුතේ!"

මම ඇයට කිරි ටිකක් දුන්නෙමි. අත්තම්මා නිහඬව එය පානය කළා ය.

"දැන් මේ වීදුරුවට වයින් ටිකක් වත්කරහන් පුතේ…"

මම එය ඉටු කළෙමි. වීදුරුව අතට ගෙන ඇඳේ හිඳගත් ඈ දෑත් වහලය දෙසට එසැවූවා ය:

"සර්ව බලධාරී දෙවියනි, කන්‍යාමරියතුමියනි, දේව මාතාවෙනි, මම මගේ දරුවා ඔබ වෙත බාර කරමි… ඔහුට ආදරය ද රැකවරණය ද දෙනු මැනවි… සියලු නපුර ඔහු වෙතින් ඈත් කරනු මැනවි… ඔහුගේත් ඔහුගේ දරු පරම්පරාවේත් ජීවිතය දිගු කරනු මැනවි… ආමේන්…"

වයින්වලින් ටිකක් බිවූ ඇය ඉක්බිති වීදුරුව මට දී සන්සුන් හඬින් කතා කළා ය.

"දැන් ඉතිං එළිය නිවලා එළියට පලයං පුතේ…"

මම කීකරු වීමි. මිනිත්තු කීපයකට පසු මා ආපසු එන විට අත්තම්මා තවදුරටත් හුස්ම නොගත්තා ය.

මම ඇය මතින් නැමී දිගු වේලාවක් පුරා මියගිය ඇගේ සෙනෙහෙබර මුහුණ දෙස බලා සිටියෙමි. කිසිවෙක් කාමරයට ඇතුළු වී මා පිටුපසින් නතර විය. හුස්ම ගන්නා හඬ මට ඇසිණි. මේ හුස්ම මගේ මුළු දිවිය පුරා මා කැටුව යන බව මම දැන සිටියෙමි. මම හැරී නොබැලුවෙමි. ඒත් ඒ මේරි බව, ඇඳිරි කාමරය ඇගේ පෙනී සිටීමෙන් ම ආලෝකවත් කරන මගේ මේරි බව මම දැන සිටියෙමි. මම ආලෝකය දකින්නට හැරුණෙමි. ඒ ආලෝක රැස්වලින් මම මගේ ඉලිකෝත්, මගේ ඉලේරියනුත්, මගේ අත්තම්මාත් දුටුවෙමි…